චතුරාර්යසත්‍යාවබෝධයට ධර්ම දේශනා

මහමෙව්නා
සදහම් ප්‍රකාශන

# ඒ භාග්‍යවතුන් වහන්සේගේ
# ශ්‍රාවකයා වෙමි මම

පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි

**මහමෙව්නා සදහම් ප්‍රකාශන**
මහමෙව්නාව භාවනා අසපුව
වඩුවාව, පොල්ගහවෙල.
දුර / ෆැක්ස් : 037 2244602
ඊ මේල් :asapuwa1@sltnet.lk
www.mahamevna.org | www.gautamabuddha.org

මහමෙව්නා සදහම් ප්‍රකාශන

# ඒ භාග්‍යවතුන් වහන්සේගේ
# ශ්‍රාවකයා වෙමි මම

ශ්‍රී බු.ව. 2551 ක් වූ පොසොන් මස

© පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි

**පරිගණක අකුරු සැකසුම,**
**පිටකවර නිර්මාණය සහ ප්‍රකාශනය**

මහමෙව්නා සදහම් ප්‍රකාශන
මහමෙව්නාව භාවනා අසපුව
වඩුවාව, පොල්ගහවෙල.
දුර / ෆැක්ස් : 037 2244602
ඊ මේල් : asapuwa1@sltnet.lk
වෙබ් අඩවි : www.mahamevna.org
www.gautamabuddha.org

දසබලසේලප්පභවා නිබ්බානමහාසමුද්දපරියන්තා

අට්ඨංග මග්ගසලිලා ජිනවචනනදී චිරං වහතූති

*දසබලයන් වහන්සේ නමැති ශෛලමය පර්වතයෙන් පැන නැගී*

*අමා මහා නිවන නම් වූ මහා සාගරය අවසන් කොට ඇති*

*ආර්ය අෂ්ඨාංගික මාර්ගය නම් වූ සිහිල් දිය දහරින් හෙබි*

*උතුම් ශ්‍රී මුඛ බුද්ධ වචන ගංගාව (ලෝ සතුන්ගේ සසර දුක නිවාලමින්)*

*බොහෝ කල් ගලාබස්නා සේක්වා !*

*(සළායතන සංයුත්තය - උද්දාන ගාථා)*

# හැඳින්වීම

සම්මා සම්බුදු රජානන් වහන්සේ නමක් ලෝකයේ පහළ වන්නේ සංසාර ගත සත්වයාට සංසාර දුකින් නිදහස් වන උතුම් නිවන් මාර්ගය පෙන්වා දීමට යි. සම්බුදු දහම් මැනවින් ශ්‍රවණය කරන කෙනෙකුට මිච්ඡා දිට්ඨිය බැහැර කොට ලෞකික සම්මා දිට්ඨියට පැමිණීමටත්, ලෞකික සම්මා දිට්ඨිය ඉක්මවා ලෝකෝත්තර සම්මා දිට්ඨිය කරා ගොස් නිවනින් සැනසීමටත් හැකියාව ඇත. ධර්මය ඇසීමට ලැබුනත් නුවණින් කල්පනා කිරීමේ හැකියාව නැති නම් ඒ අවස්ථාව උදාකර ගත නො හැකිය.

බොහෝ කලක් තිස්සේ තමන් විසින් ධර්මය යැයි සිතාගෙන පුරුදු පුහුණු කළ දෘෂ්ඨි, භාග්‍යවතුන් වහන්සේගේ විචිත්‍ර උපමා උපමේය සහිත පැහැදිලි කිරීමේ ඉදිරියේ අනාථව සද්ධර්මය නුවණින් විමසා ලෝකෝත්තර සම්මා දිට්ඨියට පැමිණි, නිගණ්ඨ ශ්‍රාවක උපාලි ගෘහපතියා අන්වර්ථ පද සියයකින් භාග්‍යවතුන් වහන්සේ වර්ණනා කළ අයුරු **උපාලි සූත්‍රයෙන්** දත හැකිය.

ධර්මයේ හැසිරීම යනු අකුසල් බැහැර කරමින් කුසල් දියුණු කිරීම යි. ඒ සඳහා සත්කාර කළ යුතු ගරු කළ යුතු කරුණු හතක් **සක්කාර ගරුකාර සූත්‍රයෙන්** හෙළිකර දෙයි. ගෙවල් දොරවල් නැතිව, ඇඳුම් පැළඳුම් නැතිව, කෑම බීම නැතිව අසරණ වූ අනාථ පිරිස් පිළිබඳව අප ඇස දැක ඇත. නමුත් ඒ සියල්ල සහිතව ම අපිදු අනාථව සිටින බව අපට පෙන්වා වදාළේ බුදු සමිඳාණෝ ය. **පඨම නාථකරණ සූත්‍රයෙන්** මේ බව තේරුම් ගෙන පිළිසරණ සදා ගන්න.

දන් දීම පිළිබඳව අපේ රටේ විවිධ මතවාද ඇත. ඒ සියළු මතවාදයන්ට සුදුසු පිළිතුරක් **දක්ඛිණ විභංග සූත්‍රයෙන්** හමුවේ. මුදල් වියදම් කළ පමණින් දානයක් මහත්ඵල මහානිසංස නො වන බව මේ සූත්‍රය කියවා තේරුම් ගන්න. අපි කවුරුත් ලබා ඇති මේ මිනිස් දිවියේ වටිනාකම පිළිබඳව ඉතාම හොඳින් තේරුම් ගැනීමට ඔබට හැකියාව ලැබෙන්නේ ඉතා ඉවසීමෙන් යුතුව **අක්ඛණ සූත්‍රය** කියවා බැලීමෙනි. යමෙක් මේ සූත්‍ර දේශනය තේරුම් ගන්නේ නම් ඔහු අනිවාර්යයෙන් ම සීලවන්ත, ගුණවන්ත පුද්ගලයෙකු වනු නො අනුමාන ය.

භාග්‍යවතුන් වහන්සේගේ පුරිසදම්ම සාරථී ගුණය පිළිබඳව ඉතාම විචිත්‍රවත් ලෙස පැහැදිලි කර දෙන්නේ **කේසී සූත්‍රයෙනි**. එකළ භාරතයේ සිටි ගිහි ශ්‍රාවක පිරිස් පවා භාග්‍යවතුන් වහන්සේගේ පැසසුමට ලක් විය. එවැනි එක් පුද්ගලයෙකි, විශාලා මහනුවර වාසය කළ උග්ග සිටුවරයා. ඔහුගේ ආශ්චර්යයවත් අද්භූත ගුණ අටක් පිළිබඳව **වේසාලික උග්ග සූත්‍රයෙන්** කියැවේ.

හේතු ඵල දහම නො දැනීම සංසාර දුකට හේතුව බව අපි දනිමු. එනිසා ම මේ හේතු ඵල දහම නැවත නැවතත් විවිධාකාරයෙන් නුවණින් විමසා දත යුතුය. ඒ සඳහා ඔබට උපකාර වන්නේ **පටිච්ච සමුප්පාදය** ගැන විස්තර ඇතුළත් දේශනය යි. භාග්‍යවතුන් වහන්සේ විසින් සම්මා දිට්ඨිය ඉතාම විසිතුරු ආකාරයට දේශනා කළ අවස්ථාවක් **කච්චානගොත්ත සූත්‍රය**ට ඇතුළත් වේ. මේ දේශනය තුළින් උන්වහන්සේගේ විශ්මිත ප්‍රඥාව තේරුම් ගත හැකිය. ශ්‍රද්ධාව යනු දියුණු කළ යුතු දෙයකි. ශ්‍රද්ධාව පරිපූර්ණ වන්නේ කෙලෙස් නැසීමෙනි. කෙලෙස් නැසීම දක්වා ආර්ය ශ්‍රාවකයා ශ්‍රද්ධාව දියුණු කළ යුතු ආකාරය **චූල හත්ථිපදෝපම සූත්‍රයෙන්** හෙළි වේ.

තෙරුවන් කෙරෙහි අප්‍රමාණ ශ්‍රද්ධාවෙන් ගෞරවයෙන් යුතුව මේ උතුම් ග්‍රන්ථය ඔබ අතට පත් කරන්නේ ගෞතම බුදු සසුන තුළ ජීවිතයට පිළිසරණක් ලබා දීම වෙනුවෙනි. උතුම් සූත්‍ර දේශනා දහය බැගින් ඇතුළත් වන පරිදි නිර්මාණය කොට ඇති මෙම පොත් පෙළෙහි දෙවැනි කොටස වශයෙනි මෙය ඔබ අතට පත්වන්නේ. මෙහි පළමු කොටස **"නිවන්නට භව ගිමන් - දෙසූ සදහම් නිවන්"** නමින් මීට ටික කලකට ඉහතදී එළිදැක්වුන අතර, ඊට ලැබුණු අසීමිත සැදැහැවත් ශ්‍රාවක ප්‍රතිචාර මත මෙම ග්‍රන්ථය එළිදැක්වීම මෙතරම් ඉක්මනින් සිදුකළ යුතු විය.

මෙහි ඇතුළත් ඉතාම වටිනා බුද්ධ දේශනා ඉමහත් ගෞරවයෙන් යුතුව කියවා බලන්න. නැවත නැවතත් කියවා හොඳින් ජීවිතයට ගලපා ගන්නට උත්සාහ කරන්න. ඔබට ද මේ ගෞතම බුදු සසුන තුළ සනාතන රැකවරණය ලබා ගැනීමේ දුර්ලභ භාග්‍යය උදාවේවා!

**ඔබ සැමට තෙරුවන් සරණයි!**

**මහමෙව්නා සදහම් ප්‍රකාශන**
**මහමෙව්නාව භාවනා අසපුව,**
**යටිගල්ඔලුව, වඩුවාව,**
**පොල්ගහවෙල.**

# පෙළගැස්ම


11-1. ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයා වෙමි මම
- උපාලි සූත්‍රය ........................................ 07

12-2. ගෞරව සත්කාර දැක්විය යුතු අසිරිමත් කරුණු හත
- සක්කාර ගරුකාර සූත්‍රය .................... 35

13-3. අනාථ නොවී සනාථ වෙමු
- පඨම නාථකරණ සූත්‍රය ...................... 67

14-4. දානයේ අනුසස්
- දක්ඛිණා විභංග සූත්‍රය ....................... 90

15-5. දුර්ලභ මොහොතින් ඵල ලබමු
- අක්ඛණ සූත්‍රය ..................................... 110

16-6. අසිරිමත් දමනය කිරීම
- කේසී සූත්‍රය ........................................ 130

17-7. ආශ්චර්ය අද්භූත කරුණු අටක්
- වේසාලික උග්ග සූත්‍රය ...................... 148

18-8. ඉපදුනේ ඇයි?
- පටිච්ච සමුප්පාදය ............................. 165

19-9. අන්ත වලට නො වැටී හරි මග තේරුම් ගන්න
- කච්චානගොත්ත සූත්‍රය ...................... 198

20-10. පිය සටහන් හඳුනයි නම්...
- චූල හත්ථිපදෝපම සූත්‍රය ................222



# ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයා වෙමි මම

## ~උපාලි සූත්‍රය~

*ශ්‍රද්ධාවන්ත පින්වතුනි,*

බුදුරජාණන් වහන්සේ සම්බුද්ධත්වයට පත්වෙලා, උන්වහන්සේ ලෝකෙට ලබා දීපු දේ තේරෙන්නෙ, උන්වහන්සේ කළේ කොයිතරම් විස්මිත දෙයක් ද කියල තේරෙන්නෙ, මේ ධර්මය ටික ටික හරි තේරෙන්නෙ මේ ධර්මය කෙරෙහි අපි හිත පහදවා ගත්තොත්. ඔබ මතක තියාගන්න, අපි ඉස්සෙල්ල ම කරන්න ඕනෙ හිත පහදවා ගන්න එක. ධර්මය ගැන හිත පහදවාගන්නෙ නැතිව අවබෝධ කරන්න කල්පනා කරනවා කියමු. ඔන්න දැන් එයා නුවණින් විමසන්න කියල පටන් ගන්නවා. එහෙම පටන් ගන්න කොට එයා හිතාගෙන ඉන්නෙ මට මේක අවබෝධ කරන්න පුළුවන් කියලා. නමුත් මෙයා පටන් ගන්න ක්‍රමය තුළ මෙයාට මොකක් හරි තේරුණා කියමු. ඊට පස්සෙ එයා එන්නෙ මාන්නයට. මම තමයි මේක දන්න එක්කෙනා. එතකොට මාන්නය ඉස්සරහට යනවා. එතන ඇත්ත අවබෝධය නෑ.

### ඉස්සෙල්ලාම කරන්න ඕනෙ දේ...

එහෙනම් අපි ඔක්කොට ම ඉස්සර වෙලා කරන්න ඕනෙ මොකක් ද? සිත පහදවා ගන්න එක. සිත පහදවා ගන්න එක හරියට කරගත්තෙ නැත්නම්, අපට ඉස්සරහට යන්න බෑ. සිත පහදවා ගත්තොත් මාන්නය පස්සට ගිහිල්ලා පැහැදීම ඉස්සරහට එනවා.

එතකොට මේ මාන්නයත් එක්ක මෙච්චර තියෙන අර්බුදය මොකක් ද? අපි එක එක්කෙනාට තියෙනව පෞද්ගලික ප්‍රතිරූපයක්. තියෙනව ද? නැද්ද? අපි ඒකට ඇලුම් කරනව ද? නැද්ද?

## මම ඉන්නෙ කොතැනද?

අපි හිතමු අපි ගෲප් ෆොටෝ එකක් ගත්ත කියල. දැන් ඔයාට දුන්නොත් ගෲප් ෆොටෝ එක ඔයා ඉස්සෙල්ලා බලන්නෙ කවුරු ගැන ද? "ආ... මං ඉන්නෙ කොතන ද? හැඩ ද? ලස්සනට පේනවද මාව?" ඊළඟ එක්කෙනාට දුන්නම එයා බලන්නෙ එයා ඉන්න තැන. අපේ ජීවිතයට මේක කා වැදිල තියෙන්නෙ. ඒකට තමයි ආත්ම දෘෂ්ඨිය කියන්නෙ. එතකොට ඒක සිඳල බිඳල දාන ආකාරයට අවබෝධය එන්න නම්, අපට ඉස්සෙල්ල ම තියෙන්න ඕනෙ පැහැදීම. පැහැදීම කියන්නෙ ශ්‍රද්ධාව.

අන්න ඒ පැහැදීම බුදුරජාණන් වහන්සේ කෙරෙහි ආපු දවසට අර මාන්නය පස්සට යනවා. පැහැදීමත් එක්ක එනවා අහිංසක නිහතමානීකමක්. හොඳට හිතල බලන්න සමිති සමාගමක් ගත්තොත් අර්බුදයක් තියෙනව. මොකට ද ඒ අර්බුදය තියෙන්නෙ? තනතුරුවලට. ආයතනයක් ගත්තොත් අර්බුදයක් තියෙනව. මොකට ද ඒ අර්බුදය තියෙන්නෙ? තනතුරුවලට. වැඩසටහනක් සංවිධානය කරන්න ගියොත් අර්බුදයක් තියෙනව. මොකට ද ඒ අර්බුදය තියෙන්නෙ? තනතුරුවලට. මොකක් ද මේ අර්බුදයේ ඇත්ත. ඒ තමයි පෞද්ගලික ප්‍රතිරූපය ඉස්සරහට ගන්න තියෙන කැමැත්ත. පෞද්ගලික ප්‍රතිරූපයට ගෞරවය දෙන්න තියෙන අර්බුදය. ඒ අර්බුදයට කියන්නෙ ආත්ම දෘෂ්ඨිය කියල.

## අර්බුදය ආත්ම දෘෂ්ඨිය යි...

ඒකත් එක්ක එනව ඉරිසියාව. ඒකත් එක්ක එනව අනුන් හෙලාදැකීම. ඒකත් එක්ක එනව අනුන්ව පාගාගෙන ඉන්න ඕනෙ කියන එක. ඒකත් එක්ක එනව තමන් ඉස්මතු වෙන්න ඕනෙ කියල. නමුත් ඒ ආත්ම දෘෂ්ඨිය, ඒ අර්බුදය පස්සට යනවා පැහැදීම අවංකව ම ඇතිවුනොත්. පැහැදීම ඇතිවුනා කියල කෙනෙකුට බොරුවටත් කියන්න පුළුවන්. ඒ වගේ ම පැහැදුන කෙනෙක් හැටියට ඉන්නත් පුළුවන්. නමුත් එතන ඒ තියෙන්නෙත් ආත්ම දෘෂ්ඨිය. ඕක සිඳබිඳ ගෙන පැහැදීම ඉස්සරහට ගන්න නම්, පැහැදීම ගැන සීයයට සීයක් ම අවංක වෙන්න ඕනෙ.

ධර්ම මාර්ගය දියුණු කරන්න ලේසි ද? අමාරු ද? ලේසියෙන් දියුණු කරන්නත් බෑ. දියුණු කරන්න දෙන්නෙත් නෑ. බුද්ධ ශාසනය ඉදිරිපත් කරන්න කියල ඉදිරිපත් වෙච්ච සියලු දෙනා ම නැතිවුණා. මම උදාහරණයක් කියන්නම් ඔබට මේක තේරෙන්න.

## මේ සිර මැදුරෙන් පැනයන්නට ඇත්නම්...

දැන් බුදුරජාණන් වහන්සේ පාවිච්චි කරනවනේ කෙලෙස් වලට බන්ධනය කියන වචනය. උන්වහන්සේ පංච නීවරණවලට පාවිච්චි කරනවා බන්ධනාගාරය කියල. ඒ කියන්නෙ හිරගෙයක් කියල. දැන් ඔබ හිතන්න මෙහෙම. හිරගෙයක් තියෙනවා. හිරගෙදර ඉන්න අයට හරි ම දුක්, කරදර, පීඩා, බය, සංතාප, තැවුල්. හැබැයි මේකෙන් යන්න බෑ. කැමැත්තෙන් ගේට්ටු ඇරලා 'දැන් උඹේ කාලය ඉවරයි. එළියට පලයන්' කියල යන්න බෑ. ඒක ඇතුළෙ තමයි මැරි මැරී ඉපිද ඉපිද ඉන්න තියෙන්නෙ. හැබැයි මේකෙන් පැනගත්තොත් නිදහස්. බය, සෝක නෑ.

උදාර පුරුෂයෝ ඉන්නව නුවණ පාවිච්චි කරලා, මේකෙන් පනිනවා. පැනලා මැප් එකක් එවනවා. මෙන්න පනින සැලැස්ම කියලා. දැන් ඔන්න මැප් එක ආවා හිර ගේ ඇතුළට. දැන් මොකද කරන්නෙ? දැන් මේක එයා පාවිච්චි කරන්නෙ කෑ ගගහ ද? "ඔන්න මැප් එක අහුවුනා..." කියල ද? කොහොමද එයා ඒක පාවිච්චි කරන්නෙ? හරි ම කල්පනාවෙන්.

## පනින්න ද හදන්නෙ?

දැන් එයාට හිරගෙදරින් පැනල යන්න ඕනෙ නම්, නිකම් පැනල යන්න බෑනෙ. ඉන්නවනෙ හැම තැන ම පිරිස දාල එයාව හිරකරන්න. ඒත් යන්න ඕනෙ. කොහොමද යන්නෙ? කාටවත් තේරෙන්නෙ නැතිවෙන්න. දැන් ඔන්න එයා මැප් එකට අනුව පාර හොයාගෙන යනවා. අරගොල්ලන්ට ඉව වැටෙනවා. "කොහෙද කොහෙද යන්නෙ?" "මම මේ පනින්න යනවා" එතකොට ඒ පැත්තට යන්න තියෙන මාර්ගය ඒ පිරිස අහුරනව ද? නැද්ද? ඊට පස්සෙ එයාට ඒ ටිකත් නෑ.

නුවණ තියෙන කෙනෙක් ඉන්නව. ඒ පැත්තෙන් යනව. "කොහෙද යන්නෙ?" "නෑ... මම මේ නිකං බලාගෙන ඇවිදිනව" නමුත් එයාගෙ හිතේ තියෙන්නෙ මොකක් ද? ඒ වගේ තමයි, මග-ඵල ලබන්න ඕනෙ කියල කෑ ගගහ ඉන්න අය ඔක්කොම වැටෙනවා. යන්න බැහැ. යන්න දෙන්නෙ නෑ. කවුද දෙන්නෙ නැත්තෙ? නො පෙනෙන ලෝකය.

යන්නත් බෑ. යන්න දෙන්නෙත් නෑ. ඕක තමයි ඇත්ත. ඒ නිසා කටින් කිය කිය ධර්මය දියුණු කරන්න බෑ.

## බොරු කයිවරු ගහල වැඩක් නැහැ...

ඇයි මේක මේ අපේ ඉස්සරහට එන්නෙ? “ඔන්න බලන්නකො මම යන තාලෙ. ඔය කවුරු කොහොම කිව්වත් මම යනව නිවන කරා. මාව නවත්වන්න කාටවත් බෑ.” එහෙම කියන අය නැද්ද? ඇයි අපි ඒ වගේ ඉමෝෂනලි කථා කරන්නෙ. අපි තුළ තියෙන ප්‍රතිරූපය නිසා. බලන්න අපි කොච්චර හිතන්න ඕනෙ පැත්තක් ද කියල. ලේසි නැහැ.

එහෙම වෙන්න හේතුව මොකක් ද? මෙච්චර අවංක ධර්මයක් තියෙද්දි මොකද එහෙම වුනේ? හේතුව මේකයි. මේ ධර්මයට පුළුවන් මනුෂ්‍යත්වය ශ්‍රේෂ්ඨත්වයට පත්කරන්න. එතකොට මේ ධර්මය තුළ මනුෂ්‍යත්වය ශ්‍රේෂ්ඨත්වයට පත්වෙන කොට, සියලු ලෝක අභිබවා යනවා. කවුරුත් කැමති නෑ. ඇයි ඒගොල්ලො ඉන්නෙත් ප්‍රතිරූප වල. තම තමන් මවාගත්තු ප්‍රතිරූපවල ඉන්නෙ නො පෙනෙන ලෝකෙත්. මනුෂ්‍යත්වය තුළ මේක දියුණු වෙන කොට සියලු ලෝක අභිබවා යනවා. ඒකට ඉරිසිය යි.

## අපිත් ටික ටික කරගෙන යනවා....

ඉතින් නුවණ තියෙන, කයිවාරු ගහන්නෙ නැති අය අහන කොට “අනේ ඉතින් අපිත් කැමතියි මේ ධර්මයට. කරගෙන යනවා. හරියයි ද දන්නෙත් නෑ. වරදියි ද දන්නෙත් නෑ. පින තියෙනවද දන්නෙත් නෑ.” එහෙම කිය කිය ඉන්න එක්කෙනා යන්තම් ඕක දියුණු කරනවා. යනව නේද කයිවාරු ගහගෙන, විඳවයි කෙළවරක් නැතිව. ඔන්න ඇත්ත.

මම මේ ජීවිතයේ හොඳ දේවල් ඉගෙන ගත්තා. එතකොට බාහිර ලෝකෙන් මාර්ග ඵල ලාභී අය නැද්ද මේකට උදව් කරන්නෙ? මේ ලෝකය තුළ දැන් තියෙන්නෙ දිව්‍ය බලය නෙවෙයි. අසුර බලය. සම්පූර්ණයෙන් ම මේ ලෝකය අල්ලල තියෙන්නෙ. මම කියන එක කොහොම තේරුම් ගනී ද දන්නෙ නැහැ. ඒත් මේක තමයි ඇත්ත.

ඉතින් ඒ නිසා ඔබට කරන්න තියෙන්නෙ හිත පහදවා ගන්න එක. නැත්නම්, සාමාන්‍යයෙන් කල්පනා කළොත් ලෝකෙ බැනුම් ඇසිය යුතු අය පැත්තක. බැනුම් නො ඇසිය යුතු මම තමයි බැනුම් අහන්නෙ. බැනුම් ඇසිය යුතු අය වැජඹෙනවා. ඒක එන්නෙ අරකෙන්. මේක හරිම රසවත්.

## අස්වැන්න ගන්න නම් වැටක් බඳින්න ම වෙනවා...

ඒ නිසා ප්‍රතිරූප සිඳබිඳගෙන අවබෝධය කරා යනව කියන එක නුවණ, වීරිය, නිහතමානීකම, නුවණ පාවිච්චි කරන පිළිවෙල මේ ඔක්කෝමත් එක්ක තියෙන කුසලතාවයක්. මේක තිබුනොත් වාසනාව.

අපි කියමු මේ ලෝකය කියන්නේ කුඹුරක්. මේ කුඹුරේ දක්ෂ කෙනෙක් එනවා වගා කරන්න. ඇවිල්ල මේ කුඹුරට වැටක් බඳිනවා. වගා කරන්න කලින් සත්තුන්ගෙන් හානිවෙනවට වැටක් බඳිනවා. වැටක් බැඳලා වගාකරනවා. වැට දැම්මත් වැටෙන් රිංගල හරි එකෙක් දෙන්නෙක් එයි. නමුත්, ලොකු හානියක් නෑ. අස්වැන්න ගන්න බැරි ද? පුළුවන්.

එයා කියනව කාලයක් ගියා ම "මම මේ ගහපු වැට අවුරුදු සීයක් පවතින්නයි වැට ගැහුවෙ. ඔය අවුරුදු සියය ඇතුළට ඕනෙ ම කෙනෙකුට ඇවිල්ල වගාකරගෙන අස්වැන්න ගන්න පුළුවන්." අවුරුදු සීයෙන් පස්සෙ අර වැටට මොකද වෙන්නෙ? වැට කැඩිල යනවා. ඊට පස්සේ කුඹුර තියෙනවා. බීජ තියෙනවා. නමුත් වගා කරගන්න බෑ. සත්තු එනවා හරියට. පදිංචි වෙලා වටේට. බුද්ධ ශාසනය එහෙම එකක්.

## ඇයි මේ තරම් විරුද්ධ?

බුදුරජාණන් වහන්සේ බුදු මුවින් දේශනා කළා "පින්වත් මහණෙනි, මාගේ ශාසනය අවුරුදු දාහක් පවතිනවා." පන්දාහක් තියෙනව කියල තියෙන්නෙ අටුවාවෙ. ඒ දාහෙන් පස්සෙ මාර්ගඵල ලාභීන් පල්ලෙහාට වැටුනා. වේගයෙන් මාර්ගඵල ලාභීන් ලෝකෙ නැතිවෙලා ගියා. වැට කැඩිලා. එක එක දෘෂ්ඨි, මතවාද, අසුර බලවේග විසින් සම්පූර්ණයෙන් ම විනාශ කළා. බුදු දහම ඉන්දියාවෙ නැත්තට ම නැතිවීම මට තවමත් පුදුමයි. මෙච්චර සුන්දර ධර්මයක් කොහොමද මේ රටට අහිමිවුනේ කියල. අසුර බලය නිසයි. හරිම විරුද්ධයි මේ බුදුරජාණන් වහන්සේගේ ධර්මයට. පුදුම විදිහට විරුද්ධයි.

ඇයි විරුද්ධ වෙන්නෙ? මේ ධර්මය තුළ තමයි මෙයා සියලු දේවල් අභිබවා යන්නෙ. බුද්ධ කාලෙත් ඒ වගේ අර්බුද තිබුණෙ නැද්ද? ඇයි **කරණීය මෙත්ත සූත්‍රය** දේශනා කළේ. වනාන්තරයකට ගියපු වෙලාවෙ දෙවිවරුත් ප්‍රශ්න දැම්මනෙ.

දැන් ඉතින් ශීලාදී ගුණධර්ම දියුණු කරගෙන, බණ භාවනා කරගෙන යන්න හදන කොට, "අන්න මෙයා යන්න හදන්නෙ අපිවත් පෙරලගෙන" ඔන්න දෙනව වැඩේ. ඒ නිසා අපිට මේ ඇහැට පේන ලෝකයට වඩා මේ මනුෂ්‍ය වර්ගයාගේ සසර ගමන අතිශයින් ම සංකීර්ණයි. දුක්ඛදායකයි. ඒ නිසා මේකෙන් ගැලවෙන්න අපිට තියෙන මූලිකම සුදුසුකම තමයි අපේ ප්‍රතිරූපය යි, අහංකාරකමයි පැත්තකට දාලා පැහැදීම ඉස්සරහට ගන්න එක. ඒ පැහැදීම කියන එක ඉස්සරහට ගන්න පුළුවන් වෙන්නෙ ප්‍රතිරූපය යි, අහංකාරකම යි පස්සට දාන්න පුළුවන් ආකාරයට මොළේ පාවිච්චි කරන්න පුළුවන් කෙනාට විතරයි. අනිත් එක්කෙනාට කැරකි කැරකි ප්‍රතිරූපය ම යි ඉස්සරහට එන්නෙ.

## අදාල නැති දේ අමතක කරල දාන්න...

දැන් දඹදිව වඳින්න යනව අම්මල. මම ඇහුව අම්ම කෙනෙක්ගෙන් "මොකක්ද හොඳට ම මතක හිටියෙ" කියල. "බරණැස් රජ්ජුරුවන්ගෙ මාලිගාව" කිව්ව. ඒක අර ස්ථාන හතරට අයිති නෑනෙ. ඕනෙ දේ නෙවෙයි මතක හිටින්නෙ. ඒ වගේ තමයි මේ බණ ඇහිල්ලත්. ඕනෙ දේ නෙවෙයි හිතට යන්නෙ. හොඳට මතක හිටින්න ඕනෙ මේ දැන් කියපු කාරණාවලින් එකයි. ඒ තමයි හිත පහදවා ගැනීම. ඒක විතරයි මතක තියෙන්න ඕනෙ. අනිත් ඒවා අමතක වුනාට කමක් නැහැ. නැත්නම් ඕනෙ දේ අමතක වෙලා කිසිසේත්ම ඕනෙ නැති, අදාළ නැති එකක් මතක් වෙනවා.

දැන් අපි ඉගෙන ගන්නෙ **මජ්ඣිම නිකායේ තියෙන උපාලි සූත්‍රය.** ඒ දවස් වල බුදුරජාණන් වහන්සේ වැඩහිටියේ **නාලන්දා නුවර.** රජගහ ඉඳල ටිකක් දුර විශාලා මහනුවර පැත්තට. නාලන්දා කියන ගමේ පාවාරික කියන අඹ වනයේ. ඔය නාලන්දාව, විශාලාව අල්ලගෙන හිටපු කෙනා තමයි, නිගණ්ඨනාථපුත්ත. එයාගෙ දුෂ්කර වැඩපිළිවෙලට මිනිස්සු බොහෝ දෙනෙක් පැහැදිලා හිටියෙ. සාමාන්‍යයෙන් මනුෂ්‍යයන් කරන්නෙ බුද්ධියට තැන දෙන එක නෙවෙයිනෙ. ඒ නිසා හරි ලේසියි ලෝකෙ පහදවාගන්න එක.

## පිණ්ඩපාතේ ගිය නිගණ්ඨයා...

නිගණ්ඨනාථපුත්ත නාලන්දාවේ මහා නිගණ්ඨ පිරිසක් එක්ක හිටිය. නිගණ්ඨනාථපුත්තට හිටියා ගෝලයෙක් දීඝතපස්වී කියල. දීඝතපස්විත් නාලන්දාවෙ පිණ්ඩපාතෙ ගියා. එතකොට ඒගොල්ලොත්

ඒ කාලෙ ජීවත්වෙලා තියෙන්නෙ පිණ්ඩපාතෙන්. පිණ්ඩපාතෙ ගිහින් හවස් වෙලා කල්පනා කළා 'මම යන්න ඕනෙ පාවාරික අඹ වනයට' කියල. ගියා. එතකොට බුදුරජාණන් වහන්සේව දැක්කා. ළඟට ගියා. කථා බස් කළා. කථා බස් කරලා පැත්තකින් හිටගත්තා. එතකොට බුදුජාණන් වහන්සේ කියනවා "දීඝතපස්වී, මේ තියෙන්නෙ වාඩි වෙන්න ආසනයක්. වාඩිවෙන්න" කියල. ඉතින් මේ නිරුවත් තපස්වී වාඩිවුණා.

## කර්ම කර්ම ද? දණ්ඩ දණ්ඩ ද?

වාඩිවුණාට පස්සේ බුදුරජාණන් වහන්සේ අහනවා දීඝතපස්විගෙන් 'තපස්වී, නිගණ්ඨනාථ පුත්ත කර්ම කීයක් ගැන කථාකරනව ද?' පාප කර්ම සිදුවෙන්න කර්ම කීයක් හේතු වෙනව කියල එයා කථා කරනව ද කියල. එතකොට මේ දීඝතපස්වී උත්තර දෙනවා, "ආයුෂ්මත් ගෞතමයෙනි, ඔය කර්ම කර්ම කියන කථාව නිගණ්ඨනාථ පුත්‍රයන්ට රුචි නෑ. කර්ම කර්ම කියන කථාව නෙවෙයි නිගණ්ඨනාථ පුත්‍රයා කියන්නේ දණ්ඩ දණ්ඩ කියලා. කර්මය නෙවෙයි ඒකට කියන්නේ දඬුවම කියල."

ඉතින් බුදුරජාණන් වහන්සේ කියනවා "හරි...හරි... ඉතින් කියන්න බලන්න නිගණ්ඨනාථ පුත්‍ර පාප කර්මයන්ගේ පැවැත්මට දඬුවම් කීයක් ගැන කථා කරනව ද කියල." එතකොට අරයා කියනවා, "ආයුෂ්මත් ගෞතමයනි, අපේ නිගණ්ඨනාථ පුත්‍රයන් පාප කර්ම කිරීමට, පාප කර්මයන්ගේ පැවැත්මට දඬුවම් තුනක් තියෙනවා යැයි කියලා කියනවා." ඒ තමයි කාය දණ්ඩ, වචී දණ්ඩ, මනෝ දණ්ඩ. එතකොට නිගණ්ඨනාථ පුත්‍ර ඒ කාලෙ කියල තියෙන බණේ තියෙන්නෙ කර්ම කථාව නෙවෙයි. දණ්ඩ තුනක්. ඒ තමයි කාය දණ්ඩ, වචී දණ්ඩ, මනෝ දණ්ඩ.

## බරපතල දේ මොකක් ද?

බුදුරජාණන් වහන්සේ අහනවා, "දීඝතපස්වී, කාය දණ්ඩ කියන්නේ වෙන එකක් ද? වචී දණ්ඩ කියන්නේ තවත් එකක් ද? මනෝ දණ්ඩ කියන්නේ තවත් එකක් ද?" "ආයුෂ්මත් ගෞතමයනි, එසේය. කාය දණ්ඩ කියන්නේ වෙන එකක්. වචී දණ්ඩ කියන්නේ තව එකක්. මනෝ දණ්ඩ කියන්නේ තව එකක්."

එතකොට බුදුරජාණන් වහන්සේ අහනවා දීඝතපස්වීගෙන්, "ඔය දණ්ඩ තුනෙන්, විග්‍රහ කරගෙන යද්දී, නිගණ්ඨනාථ පුත්‍ර බරපතල

ම දණ්ඩය කියල කිව්වෙ මොකක් ද?" කියල ඇහුවා. එතකොට දීඝතපස්වී උත්තර දෙනවා, "ආයුෂ්මත් ගෞතමයනි, නිගණ්ඨනාථ පුත්‍ර මේ දණ්ඩ විස්තර කරගෙන යද්දී, කාය දණ්ඩයෙන්, වචී දණ්ඩයෙන්, මනෝ දණ්ඩයෙන් මහා බරපතල ම දෙය කියල කියන්නේ කාය දණ්ඩය කියල. වචී දණ්ඩ, මනෝ දණ්ඩ එච්චර බරපතල නැහැ" කිව්වා.

බුදුරජාණන් වහන්සේ එයාගෙන් ආයෙමත් අහනවා, "කාය දණ්ඩය ද?" "එසේය, ආයුෂ්මත් ගෞතමයනි, කාය දණ්ඩය තමයි."

බුදුරජාණන් වහන්සේ දෙවෙනි වතාවටත් අහනවා, "අෑ.. තපස්වී, ඒ කියන්නේ කායදණ්ඩය ද?" "එසේය, ආයුෂ්මත් ගෞතමයනි, කාය දණ්ඩය තමයි."

බුදුරජාණන් වහන්සේ තුන්වෙනි වතාවටත් අහනවා, "අෑ.. තපස්වී, ඒ කියන්නේ කායදණ්ඩය ද?" "එසේය, ආයුෂ්මත් ගෞතමයනි, කාය දණ්ඩය තමයි."

## බුදු දහමේ දණ්ඩ කථාවක් නෑ...

ඔන්න එතකොට බුදුරජාණන් වහන්සේ තුන්පාරක් ම ඒ කාරණය ඇහුවා. ඊට පස්සේ දීඝතපස්වී අහනවා බුදුරජාණන් වහන්සේගෙන් "ආයුෂ්මත් ගෞතමයනි, තමුන් වහන්සේ කර්මයන් කිරීමට, කර්මයන්ගේ පැවැත්මට දණ්ඩ කීයක් පණවනවා ද?" කියලා ඇහුවා. බුදුරජාණන් වහන්සේ පිළිතුරු දෙනවා, "දීඝතපස්වී, බුදුරජාණන් වහන්සේට ඔය දණ්ඩ දණ්ඩ කථාවල් හරියන්නෙ නෑ. තථාගතයන් වහන්සේ පණවන්නේ කර්මය කර්මය කියන වචනය" කියල කිව්වා.

"එහෙමනම් ඔබවහන්සේ කියන්න බලන්න පාපකර්ම කිරීමට, පාපකර්මයන්ගේ පැවැත්මට කර්ම කීයක් තමුන්වහන්සේ ලෝකයාට කියනව ද?"

"තපස්වී, මම පාපකර්මයන්ගේ කිරීමට හේතුභූත වන, පාපකර්මයන්ගේ පැවැත්මට හේතු වන, කර්ම තුනක් මම කියනවා. ඒ කර්ම තුන තමයි කාය කර්ම, වචී කර්ම, මනෝ කර්ම."

## මනෝ කර්මය තමයි බලවත්...

එතකොට අරයා අහනවා "අෑ... ආයුෂ්මත් ගෞතමයනි, එතකොට කාය කර්මය කියන්නේ වෙන එකක් ද? වචී කර්මය

කියන්නේ තවත් එකක් ද? මනෝ කර්මය කියන්නේ තවත් එකක් ද?" "එසේය, දීඝතපස්වී. කාය කර්මය කියන්නේ වෙනින් එකක්. වචී කර්මය කියන්නේ වෙනින් එකක්. මනෝ කර්මය කියන්නේ තව එකක්."

බුදුරජාණන් වහන්සේ අහපු ප්‍රශ්නය ම යි මෙයා මේ අහන්නේ. "ආයුෂ්මත් ගෞතමයනි, ඔය කාය කර්ම, වචී කර්ම, මනෝ කර්ම තුන විග්‍රහ කරගෙන යද්දී, මහා බරපතලයි කියලා තමුන්වහන්සේ කියන්නේ කොයි කර්මයට ද?" බුදුරජාණන් වහන්සේ පිළිතුරු දෙනවා, "තපස්වී, ඔය කාය කර්ම, වචී කර්ම, මනෝ කර්ම කියන තුන විග්‍රහ කරගෙන යද්දී මහා බරපතලයි කියලා මම කියන්නේ මනෝ කර්මය යි." මනෝ කර්මය තරම් කාය කර්ම හෝ වචී කර්ම බරපතල නැහැ කියල කිව්වා.

දැන් මෙයා අර විදිහට ම බුදුරජාණන් වහන්සේගෙන් අහනවා, "ඈ... එතකොට තමුන්නාන්සේ කියන්නේ මනෝ කර්ම කියල ද?" "එසේය තපස්වී, මනෝ කර්ම තමයි බරපතල." දෙවෙනි වතාවටත් අහනවා, "ඈ... එතකොට තමුන්නාන්සේ කියන්නේ මනෝ කර්ම කියල ද?" "එසේය තපස්වී, මනෝ කර්ම තමයි බරපතල." තුන්වෙනි වතාවටත් අහනවා, "ඈ... එතකොට තමුන්නාන්සේ කියන්නේ මනෝ කර්ම කියල ද?" "එසේය තපස්වී, මනෝ කර්ම තමයි බරපතල." " හා... හොඳයි එහෙනම් මම ගිහිල්ලා එන්නම්" කියල තපස්වී පිටත් වුනා.

## මොකද මේ පරක්කු වෙලා....

පිටත් වෙලා කෙලින් ම ගියේ නිගණ්ඨනාථ පුත්‍ර හොයාගෙන. යනකොට නිගණ්ඨනාථ පුත්‍ර විශාල ශ්‍රාවක පිරිසක් වටකරගෙන වාඩි වෙලා ඉන්නවා. මෙතන උපාලි කියල සිටුවරයෙක් හිටියා. එයත් මෙයාගෙ ශ්‍රාවකයෙක්. වාඩිවෙලා හිටියා. නිගණ්ඨනාථ පුත්‍ර දැක්කා මේ පිරිස මැද්දෙන් දීඝතපස්වී ඈතින් එනවා. දැකලා අහනවා, "ඔහේ මේ දවල් වෙලා කොහේ ගිහිල්ලා එන ගමන් ද?"

"ස්වාමීනී, මම මේ එන්නේ ශ්‍රමණ ගෞතමයන් සිටි තැන ඉඳලයි." ශ්‍රමණ ගෞතමයන් එක්ක කථාබහක් ඇතිකරගෙනයි මම මේ එන්නෙ.

"මොන වගේ කථාවක් ද ශ්‍රමණ ගෞතමයන් එක්ක ඇතිවුණේ? ඉතින් ඔක්කෝම කිව්වා. කර්මය ගැන ඇහුවා. මම කිව්වා නාථපුත්‍රයන්ට කර්මය රුචි නෑ. නාථපුත්‍රයන් පණවන්නේ දණ්ඩ ය.

මේකෙ මහා බරපතලය කියන්නෙ කාය දණ්ඩය කියල මම පැහැදිලි කරල දුන්නා. මං ඇහුවා එතකොට ශ්‍රමණ ගෞතමයන් දණ්ඩ පණවනව ද කියල. එතකොට ශ්‍රමණය ගෞතමයන් මට උත්තර දුන්නා දණ්ඩ දණ්ඩ කියල කථාවක් මේකෙ නැත. කර්මය කියලයි පණවන්නෙ කියල. ඒකෙ මොකක්ද කියල ඇහුවා මහා බරපතල දේ. එතකොට ශ්‍රමණ ගෞතමයන් කියනවා, මනෝ කර්මය යි බරපතල කියලා."

## නියම නිගණ්ඨයෙක්...

ඕක අහගෙන ඉඳලා නිගණ්ඨනාථ පුත්‍ර කියනවා "සාදු... සාදු ... තපස්වී, හරි හොඳයි ඒ දීපු උත්තරේ. හොඳට අවබෝධය ඇති ශ්‍රාවකයෙක්, තමන්ගේ ශාස්තෘන් වහන්සේගේ ශාසනය ගැන දැනගත්තු ශ්‍රාවකයෙක්, දැනගන්න විදිහට තමයි ශ්‍රමණ ගෞතමයන්ට ඔය උත්තරේ දීල තියෙන්නෙ."

"දීඝතපස්වී, මේ ලාමක මනෝ දණ්ඩය කියන්නේ මොන කෙහෙල්මලක් ද?" මේ කවුද කියන්නේ? නිගණ්ඨනාථ පුත්‍රයා. "මේ මොන කෙහෙල්මලක් ද මේ මනෝ දණ්ඩය කියන්නේ? මේ මෙච්චර ඕළාරික, ගොරෝසු කාය දණ්ඩය තියාගෙන මනෝ දණ්ඩය ගැන මොකක් ද මේ කියන්නෙ." ඒ නිසා මේ පාප කර්ම කිරීමට, මේ පාප කර්ම පැවැත්මට බරපතල විදිහට තියෙන්නෙ මනෝ දණ්ඩත් නොවේ ය, වචී දණ්ඩත් නොවේ ය කියල කිව්වා.

## හරියට ම උත්තර දීල තියෙනවා...

එතකොට එතන හිටිය උපාලි. උපාලි කියන්නෙ හොඳ නිර්භීත මනුස්සයෙක්. කෙලින් මිනිහෙක්. නමුත් මේ වෙනකොට එයා බෞද්ධ නෙවෙයි. නිගණ්ඨනාථ පුත්‍රගෙ ශ්‍රවකයෙක්. උපාලි මේ කථාව අහගෙන ඉඳලා අත්දෙක වැඳගෙන දීඝතපස්විට කියනවා, "ස්වාමීනී, දීඝතපස්වී සාදු... සාදු... තමුන්නාන්සේ නම් අවබෝධයක් ඇති, දැනඋගත් ශ්‍රාවකයෙක් කටයුතු කරන ආකාරයට ම යි, කටයුතු කරල තියෙන්නෙ. ශ්‍රමණ ගෞතමයන්ට හොඳ උත්තරයක් දීල තියෙනවා. ඔය ලාමක මණෝ දණ්ඩය කියන්නේ ඇති වැඩක් තියෙන දෙයක් යැ. කාය දණ්ඩය තමයි මේකෙ බරපතල. වචී දණ්ඩත් නෙවෙයි, මනෝ දණ්ඩත් නෙවෙයි."

## විවාද කණ්ඩායමේ නායකයා...

ඊට පස්සේ නිගණ්ඨනාථ පුත්‍රගෙ පැත්තට හැරිලා කියනවා, "ස්වාමීනී, හොඳ කාරණයක් ඕක. මං යන්නම් දැන් ශ්‍රමණ ගෞතමයන්

ළඟට. මං ගිහිල්ලා උන්නැහේව වාදයකට පටලෝ ගන්නවා. ස්වාමීනී, මම වාදයකට පටලෝගෙන හිට බලන්න මම කරන වැඩේ. දිග ලොම් තියෙන එළු නාම්බෙක් අල්ලගෙන හිට, ඒ ලොම් වලින් අල්ලල කරකෝල කරකෝල පැත්ත දානව වගේ, මම ශ්‍රමණ ගෞතමයන්ව වාදය නැමැති ලොම් වලින් අල්ලගෙන හිට, කරකෝල කරකෝල පැත්ත වැටෙන්න දානව" කිව්වා.

ඊළඟට කියනවා, "ස්වාමීනී, ඔය සුරා පෙරන මිනිස්සු, ඒ සුරා වර්ග වලට ගන්න පිටි ටික අරන් පැදුරෙ ඔතල වතුරෙ දාල කලම්බනව වගේ මම ශ්‍රමණ ගෞතමයන්ව වාදෙන් හොඳ හැටියට කලම්බල පැත්ත දානව කිව්ව. සුරා පෙරන මිනිස්සු සුරාපෙරන මිනිස්සුන්ගෙ පෙරහන්කඩේ එහාට මෙහාට ගසල ගසල වීසි කරනව වගේ, මම ශ්‍රමණ ගෞතමයන්ව වාදයෙන් ගසල ගසල වීසි කරනව" කිව්වා.

ඒ වගේ ම ස්වාමීනී, "හැට වයස් පිරුණු, මහා හස්තිරාජයෙක් පොඩි වතුර පොකුණකට බැහැලා මේ වතුර පොකුණ කලම්බනව වගේ මමත් මේ ශ්‍රමණ ගෞතමයන් එක්ක වාදයට පැටලිලා, ශ්‍රමණ ගෞතමයන්ව කලම්බල කලම්බල දානවා අර ඇතාගේ ක්‍රීඩාව වගේ"

## අඬන්න ඉන්න කෙනාට ඇඟිල්ලෙන් ඇන්න වගේ...

"ඒ නිසා ස්වාමීනී, මම යනවා මේකට." කියල කිව්වා. එතකොට මේ නිගණ්ඨනාථ පුත්‍රට සතුටක් ඇතිවෙන්න ඇති. ඇයි ඉතින් ඇඟිලි ගණන් කර කරනෙ ඉන්නෙ. බුදුරජාණන් වහන්සේට නින්දාවක් අපහාසයක් කරන්න ඇඟිලි ගැන ගැන ඉන්නෙ. "ගෘහපතිය, ඔහේ යන්න. ගිහින් ශ්‍රමණ ගෞතමයන්ව වාදයට පටලව ගන්න. ශ්‍රමණ ගෞතමයන් එක්ක වාදයට පටලවගන්න නම් එක්කො මං යන්න ඕනෙ. එක්කො දීඝතපස්වී යන්න ඕනෙ. එහෙම නැත්නම් ඔබ යන්න ඕනෙ."

දීඝතපස්වී කියනවා "හා... හා... ස්වාමීනී, ඕකට විතරක් කැමති වෙන්න එපා. මුන්නැහේව යවන්න එපා. ශ්‍රමණ ගෞතමයන් ගාවට වාදයට විතරක් නම් මෙයාව යවන්න එපා. ශ්‍රමණ ගෞතමයන් කියල කියන්නේ හරිම මායාකාරී. තමන්ගේ ළඟට එන අයව කරකවල ඇදල ගන්නව. අන්‍යාගමිකාරයෝ ඔක්කොම කරකවල ඇදල ගන්නව කිව්වා තමන්ගේ ළඟට.

## මගේ විශ්වාසය....

එතකොට මේ නිගණ්ඨනාථ පුත්‍ර කියනවා "අනේ යනව යන්න. ඕක කොහේ කරන්න ද? එක දෙයක් වෙයි. දැන් මේ උපාලි ශ්‍රමණ ගෞතමයන් ළඟට වාදෙට ගියා ම එක දෙයක් වෙයි. ශ්‍රමණ ගෞතමයන් උපාලිගේ ගෝලයෙක් වෙනවා. ඔහේ හිතන්නේ ශ්‍රමණ ගෞතමයන්ගේ ගෝලයෙක් වෙයි කියලනෙ උපාලි. කොහෙ කරන්නද? මොනවද මේ කියන්නෙ?" කියල කිව්වා.

එතකොට දීඝතපස්වී කියනව දෙවෙනි වතාවටත් "අනේ ස්වාමීනී, එහෙම කියන්න එපා. ඕකට නම් කැමති වෙන්න එපා. මුන්නැහේ වාදෙට යවන්න එපා. ශ්‍රමණ ගෞතමයන් ළඟ තියෙනව මායා. තමන් ළඟට එන අයව කරකෝල ඇදල ගන්නෙ. අන්‍යාගම්කාරයො ඔක්කොම කරකැවිල ඇදිල ගියෙ."

## සුපිරි තරු පිරිවරා...

දැන් බලන්න මේ කාලෙ මේ ධර්මයට ගරහන්නෙ බෞද්ධයො ම නෙ. ඒ කාලෙ කොහොම අභියෝග උන්වහන්සේට තියෙන්න ඇද්ද? එතකොට දෙවෙනි වතාවෙත් නිගණ්ඨනාථ පුත්‍ර කියනවා අර පිරිස මැද්දෙ "අනේ යන්න ඔහෙ. මෙයාට යන්න අරින්න. මෙයාගෙ ගෝලයෙක් වෙනව මිසක් ශ්‍රමණ ගෞතමයා, ශ්‍රමණ ගෞතමයන්ගෙ ගෝලයෙක් බවට පත්වෙන එක මෙයා වෙන දෙයක් නෙවෙයි" කිව්වා. එතකොට මේකෙන් තේරෙනවා උපාලි කියලා කියන්නේ හොඳ සුපර් ස්ටාර් එකක්. ඔහේ ගිහින් වාද කරලා එන්න කියනවා පරද්දල.

පිටත්වෙන්න ඉස්සෙල්ල නිගණ්ඨනාථ පුත්‍රට හොඳට වැඳල, පැදකුණු කරල ඔන්න ගියා. දැන් එතකොට උන්වහන්සේ ළඟට බණ අහන්න ද යන්නෙ? වාද කරන්න යන්නෙ. මනාපෙකින් ද යන්නෙ? අමනාපෙකින් යන්නෙ. නිහතමානීව ද යන්නෙ? අහංකාරකමෙන් යන්නෙ. බුදුරජාණන් වහන්සේ ළඟට ගිහින් චාරිත්‍රානුකූලව වැඳලා පැත්තකින් වාඩි වුණා.

## සත්‍යය තුළ පිහිටලයි කථා කරන්න ඕනෙ...

පැත්තකින් වාඩිවෙලා අහනවා, "ස්වාමීනී, දීඝතපස්වී අපේ නිගණ්ඨයන් වහන්සේ මෙහෙ වැඩිය ද?" බුදුරජාණන් වහන්සේ උත්තර දෙනවා "ඔව්. දීඝතපස්වී මෙහෙ ආවා තමයි." "තමුන්වහන්සේ සමඟ මෙන්න මේ වගේ කථාබහක් වුනා ද?" "ඔව් උපාලි. මම මෙහෙම ඇහුවා. එතකොට දීඝතපස්වී මෙහෙම උත්තර දුන්නා. ඊට පස්සෙ

දීඝතපස්වී මගෙන් මෙහෙම ඇහුවා. මම එතකොට මෙහෙම උත්තර දුන්නා."

එතකොට උපාලි ගෘහපතියා බුදුරජාණන් වහන්සේට කියනවා "ස්වාමීනී, ඒ දීඝතපස්වීන් වහන්සේ දැනඋගත් ශ්‍රාවකයෙක් ශාස්තෘ ශාසනයෙහි පිහිටලා කටයුතු කරන විදිහට ම යි කටයුතු කරලා තියෙන්නෙ. බොහොම හරි ඒ කථා කරලා තියෙන විදිහ. ස්වාමීනී, ඔය ලාමක මනෝ දණ්ඩය මොකක් ද? මේ ඖළාරික කාය දණ්ඩයත් එක්ක සංසන්දනය කළාම මොන ලාමක දෙයක් ද ඔය මනෝ දණ්ඩය කියන්නෙ. ඒ නිසා කාය දණ්ඩය තමයි පාප කර්ම කිරීමට, පාප කර්ම වල පැවැත්මට පදනම වෙලා තියෙන මූලික බරපතල ම එක. වචී දණ්ඩ හෝ මනෝ දණ්ඩ නෙවෙයි."

බලන්න හරි ලස්සනයි බුදුරජාණන් වහන්සේ මුහුණ දීපු ඒවා. එතකොට බුදුරජාණන් වහන්සේ අහනවා, "ගෘහපතිය, හැබැයි ඔබ සත්‍යය තුළ පිහිටලා මාත් එක්ක කථා කරන්න එනව නම්, අපි දෙන්නගෙ මේ කථාව ඉස්සරහට ගෙනියන්න පුළුවන්." එතකොට එයා කියනවා. "හොඳයි ස්වාමීනී, මම සත්‍යය තුළ පිහිටලා කථා කරන්න කැමතියි. අපි මේ කථාව ඉස්සරහට ගෙනියමු."

## වතුරට සිත බැඳුණ වෙලාව...

බුදුරජාණන් වහන්සේ අහනවා, "උපාලි, නිගණ්ඨනාථ පුත්‍ර ගේ ශ්‍රාවකයො ඉන්නවා, ලෙඩ වෙච්ච, හොඳට ගිලන් වෙච්ච, ඒගොල්ලො සීතල වතුර ප්‍රතික්ෂේප කරනවා. උණුවතුර පරිහරණය කරනවා. නමුත් සීතල වතුර නො ලැබීමේ හේතුවෙන් ඒ අය මරණයට පත්වෙනවා. මේ වගේ අයට ඒ අය පණවන්නේ කොහේ උපදිනවා කියල ද?" "ස්වාමීනී, මනෝ සත්තා කියල ලෝකයක් තියෙනව. මනෝ සත්තා කියල දෙවිවරු ඉන්නව. අන්න එහෙ තමයි ඒ අය ගිහින් උපදින්නෙ." "ඒ මොකද එහෙ ගිහින් උපදින්නෙ?" එතකොට කියනවා "ස්වාමීනී, ඒ අය වතුර සම්බන්ධයෙන් හිත බැඳිල තියෙන වෙලාවෙ තමයි මැරුණෙ."

බුදුරජාණන් වහන්සේ කියනවා "උපාලි, කල්පනාවෙන් උත්තර දෙන්න ඕනෙ. කලින් කියපු එකට දැන් කියන එක ගැලපෙන්නෙ නෑ. දැන් කියන එකට කලින් කියපු එක ගැලපෙන්නෙ නෑ. දැන් ඔහේ කිව්ව නේද සත්‍යයේ පිහිටල මාත් එක්ක කථා කරනවා කියල. එතකොට ඔහේ කිව්වනේ කාය දණ්ඩය තමයි මහා බරපතල දේ කියල. වචී දණ්ඩ, මනෝ දණ්ඩ නෙවෙයි කියලනෙ ඔහේ කිව්වෙ."

## චතුයාම සංවරයටත් මුල සිත...

ඊට පස්සෙ උන්වහන්සේ ඊළඟ ප්‍රශ්නය අහනවා. "උපාලි, නිගණ්ඨනාථ පුත්‍ර යාම සංවර කියල හතරක්, චතුයාම සංවරය පෙන්වල දෙනව. ඒ තමයි සියලු ජලයෙන් වෙන් වී සිටීම, සියලු පවින් වැලකී සිටීම, සියලු පව් දවා හැරීම, සියලු පව් දවා හැරිය බව ස්පර්ශ කිරීම. හැබැයි එයා කියනවා ඇවිදින කොට, ආපහු එන කොට චූටි චූටි සත්තු මැරෙන්න පුළුවන්. කූඹි වගේ සත්තු මැරෙන්න පුළුවන් මෙයා මේකෙන් වැලකිලා හිටියට. එතකොට චතුයාම සංවරයෙන් සංවර වෙලා ඉන්න කෙනා එහාට මෙහාට යනකොට චූටි චූටි සත්තු මැරුණොත්, ඒකෙ විපාක නිගණ්ඨනාථ පුත්‍ර කොහොමද කියන්නෙ" කියල ඇහුවා.

"ඒක ස්වාමීනී, චේතනාව නැති නිසා මහා බරපතලයි කියල කියන්නෙ නැහැ" කිව්වා. එතකොට චේතනාව නැති නිසානෙ මහා බරපතල නැත්තෙ. බුදුරජාණන් වහන්සේ අහනවා චේතනාවක් තිබුණොත්? "ස්වාමීනී, එහෙම වුණොත් මහා බරපතලයි" කිව්වා.

"උපාලි, නිගණ්ඨනාථ පුත්‍ර චේතනාව පණවලා තියෙන්නෙ කොයි විදිහට ද?" "ස්වාමීනී, චේතනාව පණවලා තියෙන්නේ මනෝ දණ්ඩයට."

බුදුරජාණන් වහන්සේ කියනවා "ගෘහපතිය... ගෘහපතිය, කල්පනාවෙන් උත්තර දෙන්න ඕනෙ. කලින් කියපු එකට දැන් කියන එක ගැලපෙන්නෙ නෑ. දැන් කියන එකට කලින් කියපු එක ගැලපෙන්නෙ නෑ. සත්‍යයේ පිහිටල මාත් එක්ක කථා කරනවා කියල කිව්ව නේද?" "ස්වාමීනී, එහෙම කිව්ව තමයි. ඒත් කාය දණ්ඩ ම යි බරපතල කියලයි මට හිතෙන්නේ, වචී දණ්ඩ, මනෝ දණ්ඩ නෙවෙයි කියල ම යි මට නම් හිතෙන්නේ" කියල මෙයා කිව්වා.

## එක මොහොතින් සුණු විසුණු කරන්න පුළුවන් ද?

බුදුජාණන් වහන්සේ ඊළඟට කියනවා. "ගෘහපතිය, එහෙම නම් ඔයා හිතන්න දැන් නාලන්දාව ගැන. මේ නාලන්දාව හරි දියුණුයි. කන්න බොන්න තියෙනවා. මිනිස්සු ඉන්නවා හරියට. දැන් මේ නාලන්දාවට මනුස්සයෙක් එනවා කඩුවක් උස්සගෙන. ඇවිල්ල කියනවා 'යම් තාක් නාලන්දාවේ සෙනඟ ඉන්නවද, මම එක ක්ෂණයකින් ඔය ඔක්කොම මම මේ කඩුවෙන් පෙති ගහනව' කියල. ගෘහපතිය, ඒක කරන්න ඔය මිනිහට පුළුවන් ද? කාය කර්ම නම් බරපතල කඩුවක් අරගෙන එකපාරට ම මේක පෙති ගහන්න පුළුවන් ද?"

එතකොට මෙයා කියනවා, "අනේ ස්වාමීනී, එක මිනිහෙකුට නෙවෙයි, දෙන්නෙකුට නෙවෙයි, තුන්දෙනෙකුට නෙවෙයි, පනස් දෙනෙකුට, සිය දෙනෙකුට වුනත් මේක එකපාරට කරන්න බැහැ. එක ක්ෂණයකින් සම්පූර්ණ මිනිස්සු මරල ගොඩක් ගහනව කියන එක කරන්න බැහැ." කිව්ව.

"ගෘහපතිය, අපි කියමු සෘද්ධිවශීප්‍රාප්ත සෘෂි වරයෙක් හරි තාපසයෙක් හරි මෙතනට එන්න පුළුවන්. එතකොට ඒ සෘද්ධි බල සම්පන්න එක තාපසයෙකුට මනසින් සිදු කරන එක ශාපයකින් බැරිද මේ නාලන්දාව අලු කරන්න." "ස්වාමීනී, මේ එක නාලන්දාවක් නෙවෙයි, නාලන්දාවල් දහයක් විස්සක් වුණත් අලුකරන්න පුළුවන් මේ එක සෘෂිවරයෙකුට. නාලන්දාව කියන්නේ ඒ වගේ සෘෂිවරයෙකුට මහා සුළු ලාමක දෙයක්" කිව්ව.

"ගෘහපතිය... ගෘහපතිය, හොඳට කල්පනාවෙන් උත්තර දෙන්න ඕනෙ. ඔහේ කලින් කියපු එකට දැන් කියන එක ගැලපෙන්නෙ නෑ. දැන් කියන එකට කලින් කියපු එක ගැලපෙන්නෙ නෑ. ඔහේ කථා කළේ සත්‍යයේ පිහිටල මාත් එක්ක කථා කරනවා කියල කිව්ව නේද?" "ස්වාමීනී, එහෙම කිව්ව තමයි. ඒත් කාය දණ්ඩ ම යි බරපතල කියලයි මට හිතෙන්නේ, වචී දණ්ඩ, මනෝ දණ්ඩ නෙවෙයි කියලම යි මට නම් හිතෙන්නේ" කියල මෙයා කිව්වා.

## සෘෂිවරුන්ගේ සාපය...

එතකොට අහනවා, "ගෘහපතිය, ඔබ අහල තියෙනව ද දණ්ඩක කියන වනාන්තරය." "අහලා තියෙනවා." "ඔබ අහල තියෙනව ද කාලිංග කියන වනාන්තරය" "අහලා තියෙනවා." "ඔබ අහල තියෙනව ද බෙජ්ජ කියන වනාන්තරය" "අහලා තියෙනවා." "ඔබ අහල තියෙනව ද මාතංග කියන වනාන්තරය" "අහලා තියෙනවා." "මේවා ඔක්කොම වනාන්තරගත වුනේ, පාළු වෙලා ගිහිල්ලා වල් බිහි වෙලා වනාන්තර ගත වුනේ මොකද?"

"ස්වාමීනී මම අහලා තියෙනවා දණ්ඩක ආරණ්‍යයේ, කාලිංග ආරණ්‍යයේ, බෙජ්ජ ආරණ්‍යයේ, මාතංග ආරණ්‍යයේ මේවා ඔක්කොම ආරණ්‍ය බවට පත් වුනේ සෘෂි වරුන්ගේ සාප වලින්. සෘෂි වරුන්ගේ සාප වලින් මේවා වනාන්තර බවට පත්වුනේ."

## මුල් උත්තරෙන් ම පැහැදුනා...

බුදුරජාණන් වහන්සේ කියනවා, "ගෘහපතිය... ගෘහපතිය,

කල්පනාවෙන් උත්තර දෙන්න ඕනෙ. කලින් කියපු එකට දැන් කියන එක ගැලපෙන්නෙ නෑ. දැන් කියන එකට කලින් කියපු එක ගැලපෙන්නෙ නෑ. ඔහේ කිව්වා සත්‍යයේ පිහිටල මාත් එක්ක කථා කරනවා කියල. කිව්ව නේද?" "ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, පළවෙනි උත්තරෙන් ම මම පැහැදුනා. නමුත්, මේ ලස්සන කථාව, ඔබවහන්සේ විස්තර කරන මේ ලස්සන උපමා, මේ විස්තරය අහන්න මට ආසාව ඇතිවුණා. ඒ නිසයි මම කිව්වෙ කාය දණ්ඩ තමයි බරපතල කියලා. ස්වාමීනී, පළවෙනි එකෙන් ම මට අවබෝධ වුනා මනෝ කර්මය තමයි බලවත් කියලා. නමුත් ඔබ වහන්සේගේ විචිත්‍ර ප්‍රතිභාව අහගන්න ඕනෙ නිසා ම යි මම ආයෙ ආයෙමත් ඒ මතය කීවෙ."

"ස්වාමීනී, භග්‍යවතුන් වහන්ස, යටට හැරවිච්ච දෙයක් උඩට හැරෙව්වා වගේ. වහල තිබිච්ච දෙයක් ඇරල පෙන්නුව වගේ. පාර වැරදිච්ච කෙනෙකුට මාර්ගය පෙන්නුව වගේ. කරුවලේ හිටපු කෙනෙකුට එළිය ඇතිකළා වගේ. ආලෝකය දැල්වුවා වගේ රූප බලන්න. ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, මම ඔබවහන්සේව සරණ යනවා." කියල සරණ ගියා. අන්න පැහැදීම.

## ඔබ බුද්ධිමත් නම්....?

**දීඝ නිකායේ පොට්ඨපාද සූත්‍රයෙත්** ඔය වගේ දෙයක් තියෙනවා. බුදුරජාණන් වහන්සේ අන්‍යාගමික ආරාමයකට ගිහිල්ල කථා බස් කරන කොට ඒකෙ ප්‍රධානියා උන්වහන්සේ කෙරෙහි පහදිනවා. පැහැදිලා කියනවා "භාග්‍යවතුන් වහන්ස, ඇත්ත ම ඇත්තයි, සුගතයන් වහන්ස, ඇත්ත ම ඇත්තයි. ඉතින් උන්වහන්සේ කරුණු පැහැදිලි කරලා වැඩියා. ඒ ආරාමයේ හිටපු ගෝල පිරිස මුන්නැහේව වටකරගත්තා. "ඔහේ හරි පුද්ගලයෙක් තමයි. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ කියන කියන එකට ඔහේ කියනව ඒක නම් හරි. ස්වාමීනී, ඒක නම් හරි කියනවා." එතකොට මෙයා කියනවා "තමුසෙලා කොහොම කිව්වත්, බුද්ධිමත් කෙනෙක් හැටියට මෙච්චර කරුණු සහිතව, මෙච්චර සාධාරණ පදනමක් මත, ඇත්ත කථා කරද්දි, මම බුද්ධිමත් කෙනෙක් හැටියට, පිළිනොගන්නෙ කොහොමද? බුද්ධිමත් කෙනෙක් හැටියට මට මේක ප්‍රතික්ෂේප කරන්න පුළුවන්ද? මට බැහැ ප්‍රතික්ෂේප කරන්න. මට ඕනෙ මේක පිළිගන්න" කියල කිව්වා.

## ඇස් ඇත්තෝ රූප දකිත්වා...

බුදුරජාණන් වහන්සේ ළඟට මෙයා යනවා. ගිහින් කියනවා, "ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, ඔබවහන්සේ වැඩිය වෙලාවෙ මගේ

ගෝලයෝ ටික ඔක්කොම මාව වටකරගෙන, මට බනින්න ගත්තා. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ කියන කියන එකට ඒක නම් ඇත්ත, ඒක නම් ඇත්ත කිය කිය කිව්වා. අනේ ස්වාමීනී, බුද්ධිමත් කෙනෙක් හැටියට මම කොහොම ද මේක ප්‍රතික්ෂේප කරන්නෙ.” දැන් මේ කියන්නෙ බෞද්ධයෙක් ද? වෙන ආගමක නායකයෙක්.

ඉතින් බුදුරජාණන් වහන්සේ එයාට කිව්වා. “ඔබ විතරයි ඔය පිරිසේ ඉන්න ඇස් තියෙන කෙනා. අනිත් ඔක්කොම අන්ධයි. ඇස් නැහැ.”

දැන් බලන්න උපාලි ආවෙ කොහොමද? නිගණ්ඨනාථ පුත්‍ර ගාව ඉඳන් මෙයා ආවෙ මහා කෝළාහල කරලා, අර දිග ලොම් තියෙන එළු නාම්බෙක් අල්ලගෙන හිට, කරකෝල කරකෝල පැත්ත වැටෙන්න දානව කියල. සුරා හදන මනුස්සයෙක්ගෙ සුරා පිටි පැදුරෙ ඔතල කලම්බනව වගේ කලම්බනව කියල. සුරා පෙරන පෙරහන්කඩේ ගසනව වගේ ගසනව කියල. හැට වයස් පිරුණු හස්තිරාජයෙක් වතුරේ බැහැලා කලම්බන සෙල්ලම කරනව වගේ, කලම්බනව කියල.

## උපාලි දැන් තෙරුවන් සරණ ගිය ශ්‍රාවකයෙක්...

නමුත් බලන්න මනුස්සයගෙ මොළේ. අන්න ඒක තමයි වැදගත් වෙන්නෙ. නිකම් පෙරළීගෙන වැඳගෙන එන මෝඩයට වඩා, කල්පනාවෙන් එන නිදහස් මනසක් තියෙන ස්වාධීන පුද්ගලයා ඉස්සරහට යනවා. එතකොට එයා විවෘත මනුස්සයෙක් නේද? කලින් එහෙම කිව්වට ඒ මතය ම ග්‍රහණය කරගෙන හිටියෙ නැහැ. බුද්ධිමත් නිසා. බුද්ධිමත් විතරක් නෙවෙයි පුදුම නිර්මාණශීලි යි.

එයා කිව්වා “මම බුදුරජාණන් වහන්සේ විතරක් නෙවෙයි, බුදුරජාණන් වහන්සේ ගේ ධර්මයත් මම සරණ යනවා. මම ඒ ශ්‍රාවක සංඝරත්නයත් සරණ යනවා. අනේ ස්වාමීනී, මාව ජීවිතය ඇති තාක් තෙරුවන් සරණ ගිය ශ්‍රාවකයෙක් හැටියට පිළිගන්නා සේක්වා”

බුදුරජාණන් වහන්සේ කියනවා, “උපාලි, ඔබ වගේ ප්‍රසිද්ධ කෙනෙක් ඔය වගේ එක පාරට ම තීරණයක් ගත්ත එක හරි නෑ. ඒක කල්පනා කරල බලල තීරණය කළොත් නේද හොඳ.”

## හිතල බලල වැඩකරන්න ඕනෙ...

උපාලි ගෘහපතියා කියනවා, “අනේ ස්වාමීනී, මම තවත් පැහැදුනා. මම වගේ ප්‍රසිද්ධ කෙනෙක් කල්පනා කරල කළොත් නේද

හොඳ කියල ඔබවහන්සේ කිව්වා. ස්වාමීනී, මම වගේ ප්‍රසිද්ධ කෙනෙක් වෙන ආගමකට ගියා නම්, ඒගොල්ලෝ ස්ටේජ් ගහනවා මාව පිළිගන්න. ඒගොල්ලො වෙනම උත්සවයක් මං වෙනුවෙන් පවත්වනවා. හැම තැනම බැනර් ගහනවා. නමුත් බුදුරජාණන් වහන්සේ මට කියනවා, ඔබ වගේ ප්‍රසිද්ධ කෙනෙක් කල්පනා කරල වැඩ කළොත් නේද හොඳ. ස්වාමීනී, දෙවෙනි වතාවටත් මම ඔබවහන්සේව සරණ යනවා. දෙවෙනි වතාවටත් ධර්මයත් මම සරණ යනවා. මම ඒ ශ්‍රාවක සංඝරත්නයත් සරණ යනවා."

ඊට පස්සේ බුදුරජාණන් වහන්සේ උපාලිට කියනවා, "උපාලි, ඔබේ නිවස නිගණ්ඨ පිරිසට පැන් පොකුණක් වගේ. ඔබ බොහෝ කාලයක් තිස්සේ ඒ අයට හොඳට සැලකුවා. උපාලි, ඒ සැලකීම දිගට ම කරන්න."

## නිගණ්ඨයින්ට පැන් පොකුණක් වගේ...

ඊට පස්සේ උපාලි කියනවා "ස්වාමීනී, මම තවත් පැහැදුනා. ඔබවහන්සේ කියනවා බොහෝ කාලයක් තිස්සේ ඔබේ නිවස නිගණ්ඨයින්ට පැන් පොකුණක් වගේ තිබුනෙ කියලා. බොහෝ කාලයක් දන් පැන් පිදුවා. ඒක දිගට ම කරගෙන යන්න කියලා. අනේ ස්වාමීනී, මම ඔබවහන්සේ ගැන අහල තිබුණෙ මීට හාත්පසින් ම විරුද්ධ කතාවක්. මම අහල තිබුනෙ ඔබවහන්සේ කියනව කියල 'මට ම යි දෙන්න ඕනෙ. මගේ ශ්‍රාවකයන්ට ම යි දෙන්න ඕනෙ. මට දුන්නොත් තමයි මහත්ඵල වෙන්නෙ. මගේ ශ්‍රාවකයන්ට දුන්නොත් තමයි මහත්ඵල වෙන්නෙ' කියන කථාව තමයි මේ හැමතැනම පැතිරිලා තියෙන්නෙ. ඔබවහන්සේ කියනවා බොහෝ කාලයක් තිස්සේ ඔබේ නිවස නිගණ්ඨයින්ට පැන් පොකුණක් වගේ තිබුනෙ කියලා. බොහෝ කාලයක් දන් පැන් පිදුවා. ඒක දිගට ම කරගෙන යන්න කියලා කියනවා. එතකොට නිගණ්ඨයන් කෙරෙහිත් ඔබවහන්සේ මාව දානයෙහි සමාදන් කරනවා. ස්වාමීනී, ඒකට වුවමනා කරන කාලය ගැන දැන් මම දන්නවා." ඒ කියන්නෙ එයා ඒක තීරණයක් අරගෙන කරන්නම් කියල. "ස්වාමීනී, තුන්වෙනි වතාවටත් මම ඔබවහන්සේව සරණ යනවා. තුන්වෙනි වතාවටත් ධර්මයත් මම සරණ යනවා. තුන්වෙනි වතාවටත් මම ඒ ශ්‍රාවක සංඝරත්නයත් සරණ යනවා."

## පැහැදීම තමයි එකම පිහිට...

පින්වත්නි, උපාලි බුදුරජාණන් වහන්සේ ගැන පැහැදුනානෙ. අඩුගානෙ ඒ පැහැදීමවත් ඇතිකරගන්න. එහෙම නැත්නම්, නිකම්

හිස් වෙලා යනවා. පැහැදීම අවබෝධයෙන් නැතිව, නිකම් කථා කර කර ඉදල කිසි පලක් නෑ. පැහැදීම තියෙන්නෙ ඕනෙ බුදුරජාණන් වහන්සේ කෙරෙහි, ධර්මය කෙරෙහි, ශ්‍රාවක සංඝරත්නය කෙරෙහි සහ කල්‍යාණ මිත්‍රයා කෙරෙහි. ඒ පැහැදීම ආවොත් තමයි එයාට ධර්මයේ ඉස්සරහට යන්න පුළුවන්. පුද්ගලික ප්‍රතිරූපය කොච්චර ඉස්සරහට ගත්තත් ඒකත් එක්ක ධර්මය යන්නෙ නෑ.

බුදුරජාණන් වහන්සේ තේරුම් ගත්තා මෙයා දැන් හොඳ චිත්තප්‍රසාදයකින් ඉන්නෙ. පිළිවෙලින් දාන කතා, සීල කතා, සුගතියේ උපත, කාමයේ ආදීනව, කෙලෙසුන්ගේ පීඩා, කෙලෙසුන්ගෙන් නික්මීමේ අනුසස් ප්‍රකාශ කරගෙන ගියා. ඒක බුදුරජාණන් වහන්සේලාට විතරක් පිහිටපු දේශනාවක්. දේශනා කුසලතාවයක්. ඒකට කියන්නේ **සාමුක්කංසික දේශනාව** කියල. ඒ කියන්නේ ආර්ය සත්‍යාවබෝධයට කෙමෙන් කෙමෙන් කුළුගන්වන්න පුළුවන් කථාව තුළින්. ඒක බුදු කෙනෙක් විතරක් කරන එකක්.

## දහම් ඇස පහළ විය...

මෙයාගෙ හිත සම්පූර්ණයෙන් ම ශාන්ත වුනා. නීවරණයන්ගෙන් බැහැර වුනා. හිත ප්‍රබෝධමත් වුනා. ප්‍රසන්න වුනා. බුදුරජාණන් වහන්සේ ඊළඟට එයාට පැහැදිලි කළා (**දුක්ඛං, සමුදයං, නිරෝධං, මග්ගං**) චතුරාර්ය සත්‍යය. ඒ වාඩිවෙලා ඉන්න ආසනයේ දීම කෙලෙස් මළ රහිත වූ, අවිද්‍යා මළකඩ රහිත වූ, දහම් ඇස පහළ වුනා. දහම් ඇස කියන්නෙ ධර්මයෙන් ලෝකය බලන්න පුළුවන් හැකියාව. ඒ තමයි හේතු ප්‍රත්‍යන්ගෙන් හටගන්නා යමක් ඇද්ද, ඒ සියල්ල හේතු නිරුද්ධ වීමෙන් නිරුද්ධ වී යන ස්වභාවයෙන් යුක්තයි. ඊට පස්සෙ වැඳලා 'ස්වාමීනී, මට අවසරයි' කියල පිටත් වුනා.

## නිගණ්ඨයින්ට තහනම් !

ඊට පස්සේ එයාගෙ මාළිගාවට ගිහිල්ලා එයාගෙ දොරටුපාලයට කියනවා, "එම්බා දොරටුපාලය, අද ඉඳලා මේ දොරටුව නිගණ්ඨනාථ පුත්‍රගේ පිරිසට විවෘත නෑ. අද ඉඳලා මේ දොරටුව විවෘත වෙන්නේ භාග්‍යවතුන් වහන්සේටයි, භික්ෂූන් වහන්සේලාටයි, භික්ෂුණීන් වහන්සේලාටයි, උපාසකවරුන්ටයි, උපාසිකාවන්ටයි. කවුරු හරි නිගණ්ඨයෙක් ආවොත් කියන්න 'ස්වාමීනී, උපාලි ගෘහපතියා භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෙක් බවට පත්වුණා. ඒ නිසා මේ දොරටුව විවෘත නෑ. ඒ නිසා ඔහොම වැඩඉන්න. මේ දොරටුව දැන්

විවෘත බුදුරජාණන් වහන්සේටත්, සිව්වණක් පිරිසටත්. ඒ නිසා ඔබවහන්සේට දානෙ මෙහෙන් දෙන්නම් කියල දානෙ ගෙනල්ල පූජා කරල පිටත් කරන්න." එතකොට බුදුරජාණන් වහන්සේගේ වචනයත් මෙයා ඉටුකරනවා.

දැන් ඔන්න මේ කතාව පැතිරුණා. "උපාලි ගෘහපතියා බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෙක් වුනා." දැන් මේ ගැන කල්පනාවෙන් හිටියෙ කවුද? දීඝතපස්වී. දීඝතපස්වී නිගණ්ඨනාථ පුත්‍ර ළඟට ගිහිල්ලා කිවුවා "ස්වාමීනී, හරි වැඩේනෙ. මට දැන් ආරංචියක් ආවා, උපාලි ගෘහපතියා ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවකයෙක් වුනා ය කියල." එතකොට නිගණ්ඨනාථ පුත්‍ර හිනාවෙලා කියනවා. " උපාලි ගේ ශ්‍රාවකයෙක් වෙනවා ශ්‍රමණ ගෞතමයන්. එහෙම ඇර ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවකයෙක් වේවි ද උපාලි. ඔහේ මොකක් ද මේ දොඩවන්නෙ." දෙවෙනි වතාවෙත් කිව්ව. තුන්වෙනි වතාවෙත් කිව්වා.

## විශ්වාසය තහවුරු කරගන්න ඕනෙනෙ...

ඊට පස්සෙ "නෑ... එහෙම නම් මම ගිහිල්ල ම බලාගන්නම්" කියලා දීඝතපස්වී ගියා. මම බලාගෙන එන්නම් මෙයා හැබෑවට ම ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවකයෙක් බවට පත්වුනා ද, නැද්ද කියලා. වෙනද වගේ කඩාගෙන බිඳගෙන යන්න ගියා. දොරටුපාලයා ඇවිල්ලා "හා... හා... ඉන්න ඉන්න" කියල කිව්වා. "අද ඉඳල උපාලි ගෘහපතිතුමා ගෞතමයන් වහන්සේගේ ශ්‍රාවකයෙක් බවට පත්වුනා. දැන් ඉතින් ඇතුලට එන්න බෑ. තමුන්නාන්සේ පිට ඉන්න. ඇතුළට එන්න අවසර තියෙන්නේ ගෞතමයන් වහන්සේටයි, සිව්වණක් පිරිසටයි විතරයි. ඒ නිසා දානෙ ගෙනත් දෙන්නම්. ඔහොම ඉන්න" කිව්වා. "ඔහේගෙ දානෙන් මට ඇති වැඩක් නෑ" කියල හැරිලා ගියා.

ඊට පස්සේ නිගණ්ඨනාථ පුත්‍ර ළඟට යනවා දීඝතපස්වී. දීඝතපස්වී ගිහින් කියනවා "ස්වාමීනී, මේක ඇත්ත. මම ඒකයි විරුද්ධ වුනේ. මට මේකට කිසිම උනන්දුවක්, ඕනෙකමක් තිබුනෙ නෑ. මම දන්නවා ඔය ශ්‍රමණ ගෞතමයන් මායාකාරියි. එන එන එක්කෙනාව කරකෝල ගන්නවා. අන්‍යාගම්කාරයන්ව ගත්තා." ඒත් නිගණ්ඨනාථ පුත්‍ර පිළිගන්නෙ නෑ. දෙවෙනි වතාවෙත් කිව්වා. ඒත් පිළිගත්තෙ නෑ.

## කාගෙ ශ්‍රාවකයෙක් ද?

නිගණ්ඨනාථ පුත්‍ර කියනවා, "එහෙනම් තපස්වී මම ම යනවා. මම ම ගිහිල්ලා බලනවා මේ කාරණය හැබෑවක් ද. මේ උපාලි ශ්‍රමණ

ගෞතමයන්ගෙ ශ්‍රාවකයෙක් වුණාද නැද්ද කියල මම ම ගිහිල්ලා බලනවා" කියල. මහා නිගණ්ඨ පිරිසක් සමඟ ගියා.

නිගණ්ඨනාථ පුත්‍ර ඇතුළුවෙන්න හදන කොට ම දොරටුපාලයා කියනවා, "ස්වාමීනී, නවතින්න. ඇතුළුවෙන්න එපා. "අද ඉදල උපාලි ගෘහපතිතුමා ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ ශ්‍රාවකයෙක් බවට පත්වුනා. දැන් ඉතින් ඇතුලට එන්න බෑ. ඇතුළට එන්න අවසර තියෙන්නේ ගෞතමයන් වහන්සේටයි, සිව්වණක් පිරිසටයි විතරයි. ඒ නිසා දානෙ ගෙනත් දෙන්නම්. ඔහොම ඉන්න" කියල කිව්වා.

"දානෙ කථාවක් නෙමෙයි. ගිහින් කියාපන් උපාලිට නිගණ්ඨනාථ පුත්‍ර මහා පිරිසක් සමඟ ඇවිල්ල එළියෙ ඉන්නව කියල. මට දැන්ම උපාලිව මුණගැහෙන්න ඕනෙ කියල කියාපන්" කියල කියන්න කිව්වා. දැන් මෙයා ගියා. දොරටුපාලයා ගිහින් උපාලිට කිව්වා විශාල පිරිසක් එක්ක නිගණ්ඨනාථ පුත්‍ර ඇවිල්ලා ඉන්නවා කියලා. "එහෙනම් මේ මැද ශාලාව සූදානම් කරන්න. ඉක්මනට ආසන පණවන්න" කියල උපාලි කිව්ව.

## අවබෝධයෙන් යුතු එක්කෙනයි...

මැද ශාලාවට උපාලි ගෘහපතියා ආවා. ඇවිල්ලා ආසන ඔක්කොම බැලුවා. 'මම මෙච්චර කල් මෙයා යටතේ හිටියෙ. මට ජීවිතය ගැන අල්පමාත්‍ර අවබෝධයක් ඇති වුනේ නෑ. දැන් මෙතන අවබෝධයෙන් ඉන්නෙ මම යි. ඒ නිසා ප්‍රධාන ආසනයෙ අද මම වාඩිවෙනවා' කියල උපාලි හිතුවා. මම කලින් කීවෙ, අමුතු නිර්භීත චරිතයක් මේ උපාලි. වාඩිවෙලා 'එන්න කියන්න' කියල කිව්වා.

දැන් ප්‍රධාන ආසනයේ උපාලි වාඩිවෙලා ඉන්නවා. නිගණ්ඨනාථ පුත්‍රයි, පිරිසයි එනවා. ඉස්සර වුනේ නිගණ්ඨනාථ පුත්‍ර ඇතුළට එනකොට, උපාලි ගෘහපතියා උතුරු සළුවත් අතට අරගෙන, නැමී නැමී ගිහින් පිළිගන්නවා. පිළිඅරගෙන අර ආසනයේ මහා තෙල්කළයක් වාඩි කරවනවා වගේ වාඩි කරවනවා. අර ආසනය පිහදල පිහදල අල්ලගෙන හිමීට හිමීට වාඩි කරවනව. නමුත් දැන් මොකද වෙලා තියෙන්නෙ? උපාලි වාඩිවෙලා කියනව 'ස්වාමීනී, එන්න. මේ ආසන තියෙනව. කැමති එකක වාඩිවෙන්න.'

## ඇස් අන්ධ කරගත්ත නේද?

නිගණ්ඨනාථ පුත්‍ර උපාලිට කියනවා "උපාලි, තමුසෙට පිස්සු ද?" **(උම්මත්තෝසිං ත්වං ගහපති)** අහුවුණා නේද? මහා ලොකුවට

කිව්වෙ කොහොම ද? ස්වාමීනී මං යනව වාද කරන්න කියල නේද ගියේ? වාද කරන්න යනව කියල හරි වැඩේ නේද සිද්ධ වුනේ? කෝෂ දෙකම ඇතිව ගිහින් කෝෂ ඔක්කොම ගලවගෙන ආවා නේද? කියල ඇහුවා. මේ කවුද කියන්නෙ? නිගණ්ඨනාථ පුත්‍ර කියනවා. කෝෂ දෙකත් එක්ක ගිහින් කෝෂ ගලවගෙන ආවා කියනවා. ඊට පස්සෙ කියනවා ඇස් දෙකම එක්ක ගිහින් ඇස් ගලවගෙන ආවා නේද කියල අහනවා. මහා ලොකුවට වාදෙට වාදෙට කියල ගිහිල්ල, අර ආවර්තනී මායාවට අහුවෙලා කරකැවිල ගියා නේද කියල අහනවා.

## ඒ මායාව හරිම සුන්දරයි...

එතකොට මෙයා කියනවා "**(භද්දිකා භන්තේ, ආවට්ටනී මායා)** කරකවල දැම්ම මායාව හරි ෂෝක්. **(කළ්‍යාණී භන්තේ, අවට්ටනී මායා)** ස්වාමීනී, උන්වහන්සේ කරකෝල ගන්න මායාව හරි ලස්සනයි. ස්වාමීනී මගේ සියලු ලේ නෑදෑයෝ ඒ අවට්ටනී මායාවට අසුවෙත්වා! එය මගේ ප්‍රිය වූ ලේ නෑදෑයන්ට බොහෝ කල් හිත සුව පිණිස පවතීවි. ස්වාමීනී, සියලු ක්ෂත්‍රියයෝ ඒ ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ ආවට්ටනී මායාවට හසුවෙත්වා! ස්වාමීනී, සියලු බ්‍රාහ්මණයෝ ඒ ශ්‍රමණ ගෞතමයන්ගේ සුන්දර ආවට්ටනී මායාවට කැරකී එත්වා! ස්වාමීනී සියලු වෛශ්‍යයෝ ඒ අවට්ටනී මායාවට අසුවෙත්වා! ඔවුන්ට බොහෝ කල් හිත සුව පිණිස පවතිනවා. ස්වාමීනී, දෙවියන්, බඹුන්, මරුන් සහිත ලෝකයේ ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත ලෝකයේ සියලු දෙනාම ඔබ වහන්සේලා ඔය කියන ශ්‍රමණ ගෞතමයන්ගේ ආවට්ටනී මායාවට අහුවෙනව නම්, ඒ සියලු දෙනාට ම බොහෝ කල් හිත සුව පිණිස පවතිනවා.

## ඩයි කරන වඳුරු පැටියා...

ස්වාමීනී, මට මතක් වෙනව මේකට උපමාවක්. ස්වාමීනී වයසක, නාකි බමුණෙක් හිටියා. මේ බමුණාට හිටියා ළපටි බිරිඳක්. මේ බිරිඳට දරුවෙක් ලැබෙන්න හිටියා. මේ බිරිඳ බමුණාට කථා කරලා කියනවා "බ්‍රාහ්මණය, අනේ කඩේට ගිහින් වඳුරු පැටියෙක් අරන් වරෙන්. හම්බ වෙන්න ඉන්න බබාට සෙල්ලම් කරන්න." එතකොට බමුණා කියනවා, "සොඳුරිය ටිකක් ඉවසපන්, පුතෙක් ඉපදුනොත් වඳුරු පැටියෙක් අරන් එන්නම්. දුවෙක් හම්බවුනොත් වඳුරු පැටික්කියෙක් අරන් එන්නම්." දැන් මෙයා කියනවා කියනවා, "නෑ... ස්වාමීනී, මට වඳුරු පැටියෙක් ම අරන් වරෙන්" කිව්වා. කඩේ ගිහින් වඳුරු පැටියෙක් ගෙනාවා. ඊට පස්සේ කියනවා, "අනේ ස්වාමීනී, මේ

වඳුරු පැටියව රක්තපාණී කියන ඩයි කරන මනුස්සයා ගාවට මේ වඳුරු පැටියා අරගෙන යන්න. ගිහිල්ල මේ වඳුරු පැටියා ඩයි කරලා අපුල්ලලා අරන් වරෙන් කිව්වා."

## මෝඩයින්ට ඩයි එකක්....

බේරෙන්න බෑ වඳුරු පැටියා අරගෙන ගියා. ගිහිල්ලා ඩයි කරන එක්කෙනාට රක්තපාණීට කියනවා, "අපේ නෝනා කියනවා, රත්තරන් පාටට ඩයි කරලා, හොඳට අපුල්ලල ගේන්න කියලා." එතකොට ඩයි කරන එක්කෙනා කියනවා, "බ්‍රාහ්මණය, මේ වඳුරා වටෙන් නම් පොඩ්ඩක් ඩයි කරන්න පුළුවන්. ඇපිල්ලිලි බෑ කියලා. අපුල්ලන්ඩ, පොඩිකරන්ඩ, මඩින්නට මේ වඳුරු පැටියට බෑ කියනවා. ඒකට මේ එහෙම එකක් නෙවෙයි කියන්නෙ.

අන්න ඒ වගේ තමයි ඔබවහන්සේ කිය කිය ඉන්න බණ මෝඩයින්ට පොඩි ඩයි එකක්. හැබැයි ඕක අපුල්ලන්න බෑ. ඕක හොඳට මැඩල ගන්න බෑ කියනවා.

## බුද්ධිමතුන්ට ධර්මය...

ඊළඟට ස්වාමීනී, බමුණෙකුට හම්බවෙනවා හොඳ අලුත් වස්ත්‍රයක්. වස්ත්‍රය අරගෙන ඩයි කරන මනුස්සයා ගාවට ගිහිල්ලා කියනවා, මේකට හොඳට ඩයි කරලා, අපුල්ලලා, ස්ත්‍රික්ක කරලා දීපන් කියල. මේක හොඳට ඩයි කරන්නත් පුළුවන්. අපුල්ලන්නත් පුළුවන්. ස්ත්‍රික්ක කරන්නත් පුළුවන්. අන්න ඒ වගේ තමයි කියනවා බුදුරජාණන් වහන්සේගේ ධර්මය. ඩයි කරන්න පුළුවන් මනුස්සයා වගේ කියනවා බුද්ධිමත් මනුස්සයා. ඒ බුද්ධිමත් මනුස්සයට හම්බවෙන අලුත් වස්ත්‍රයක් වගේ කියනවා බුදුරජාණන් වහන්සේගේ ධර්මය. හොඳට ඒක පදම් කරලා ගන්න පුළුවන් කියනවා.

එතකොට නිගණ්ඨනාථ පුත්‍ර කියනවා, "රජුන් සහිත සියලු දෙනා දන්නේ, උපාලි, තමුසෙ මගේ ගෝලයෙක් කියල. දැන් උපාලි ඇත්ත කියන්න ඕනෙ. උඹ කාගෙ ශ්‍රාවකයෙක් ද?"

## ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයා වෙමි මම...

**මේ අභිමානය තියෙන එක්කෙනෙක් අපිට මේ යුගයේ දකින්න තියෙනව ද? ඒකත් දුර්ලභයි.** උපාලි නැගිටිනවා. ආසනයෙන් හිටගන්නවා. බුදුරජාණන් වහන්සේ වැඩහිටිය දිසාවට වැඳගන්නවා.

වැඳගෙන කියනවා, "එහෙනම් නිගණ්ඨනාථ පුත්‍රය, අහගන්න මම කාගෙ ශ්‍රාවකයෙක් ද කියලා" **බුදුරජාණන් වහන්සේ ගැන නම් සීයක් කියනවා.** ඒ ගුණ සියය ගාථා දහයකින් කියන්නෙ. කොච්චර නිර්මාණශීලී, විශ්මිත ප්‍රඥාවක් තියෙන, බුද්ධිමත්, මහා නුවණක් තියෙන, මහා එඩිතර කමක් තියෙන, අභිමානවත් මනුස්සයෙක් ද?

**01. ධීරස්ස විගතමෝහස්ස පභින්නඛීලස්ස විජිතවිජයස්ස,**
**අනීඝස්ස සුසමචිත්තස්ස වුද්ධසීලස්ස සාධුපඤ්ඤස්ස,**
**වෙස්සන්තරස්ස විමලස්ස භගවතෝ තස්ස සාවකෝ'හමස්මි.**

මහා නුවණැති හෙයින් **ධීර** නම් වූ, මොහඳුර දුරලූ හෙයින් **විගතමෝහ** නම් වූ, කෙලෙස් හුල් බිඳලූ හෙයින් **පභිණ්ණඛිල** නම් වූ, මාර සේනා ජයගත් හෙයින් **විජිතවිජය** නම් වූ, කෙලෙස් දුක් රහිත හෙයින් **අනීඝ** නම් වූ, සොඳුරු සමසිත් ඇති හෙයින් **සුසමචිත්ත** නම් වූ, වැඩුණු සිල් ඇති හෙයින් **වෘද්ධසීල** නම් වූ, සොඳුරු ප්‍රඥා ඇති හෙයින් **සාධුපඤ්ඤ** නම් වූ, කෙලෙස් දුර්ගයෙන් එතෙරට වැඩි හෙයින් **වෙස්සන්තර** නම් වූ, නිමල ගුණ ඇති හෙයින් **විමල** නම් වූ **භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයා වෙමි මම.**

**02. අකථංකථිස්ස තුසිතස්ස වන්තලෝකාමිසස්ස මුදිතස්ස,**
**කතසමණස්ස මනුජස්ස අන්තිමසාරීරස්ස නරස්ස,**
**අනෝපමස්ස විරජස්ස භගවතෝ තස්ස සාවකෝ'හමස්මි.**

සැකයෙන් එතෙරට වැඩි හෙයින් **අකථංකථී** නම් වූ, සතුටින් පිරුණු සිත් ඇති හෙයින් **තුසිත** නම් වූ, කාම ගුණ බැහැර කළ හෙයින් **වංතලෝකාමිස** නම් වූ, ලොවේ යහපත දැක සතුටු වන හෙයින් **මුදිත** නම් වූ, ශ්‍රමණ ගුණ සපුරා ගත් හෙයින් **කතසමණ** නම් වූ, උතුම් මිනිසෙක් හෙයින් **මනුජ** නම් වූ, අවසන් සිරුර දරනා හෙයින් **අන්තිමසාරීර** නම් වූ, උදාර මිනිසෙක් හෙයින් **නර** නම් වූ, අලාමක සිත් ඇති හෙයින් **අනෝම** නම් වූ, කෙලෙස් දුහුවිලි නැති හෙයින් **විරජ** නම් වූ **භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයා වෙමි මම.**

**03. අසංසයස්ස කුලස්ස වේනයිකස්ස සාරථිවරස්ස,**
**අනුත්තරස්ස රුචිරධම්මස්ස නික්කංඛස්ස පභාසකරස්ස,**
**මානච්ඡිදස්ස වීරස්ස භගවතෝ තස්ස සාවකෝ'හමස්මි.**

සංකා රහිත සිත් ඇති හෙයින් **අසංසය** නම් වූ, හැමට යහපත සදනා හෙයින් **කුල** නම් වූ, ලෝ සතුන් දමනය කරනා හෙයින් **වේණයික** නම් වූ, දහමේ මැනවින් හික්මවන උතුම් රථාචාර්යා බඳු හෙයින් **සාරථීවර** නම් වූ, උදාර ගුණ ඇති හෙයින් **අනුත්තර** නම් වූ, පිරිසිදු දහම් ඇති හෙයින් **රුචිරධම්ම** නම් වූ, නිසැක ගුණ ඇති හෙයින් **නික්කංඛ** නම් වූ, නුවණින් ලොව එළිය කරනා හෙයින් **පභාසකර** නම් වූ, මානය සිඳලූ හෙයින් **මානච්ඡිද** නම් වූ, මහා වීර ගුණ ඇති හෙයින් **වීර** නම් වූ **භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයා වෙමි මම.**

**04.** **නිසභස්ස අප්පමෙය්‍යස්ස ගම්භීරස්ස මෝනපත්තස්ස,**
**ඛේමංකරස්ස දේවස්ස ධම්මට්ඨස්ස සංවුතත්තස්ස,**
**සංඝාතිගස්ස මුත්තස්ස භගවතෝ තස්ස සාවකෝ'හමස්මි.**

අසම ගුණ ඇති හෙයින් **නිසභ** නම් වූ, පමණ කළ නො හැකි ගුණ ඇති හෙයින් **අප්පමෙය්‍ය** නම් වූ, ගැඹුරු නුවණැති හෙයින් **ගම්භීර** නම් වූ, මුනි දහමට පත් වූ හෙයින් **මෝනපත්ත** නම් වූ, බිය රහිත ගුණයෙන් යුතු හෙයින් **ඛේමංකර** නම් වූ, ලොවෙහි දෙවියන් බඳු හෙයින් **දේව** නම් වූ, ධර්මයෙහි පිහිටි හෙයින් **ධම්මට්ඨ** නම් වූ, සංවර සිත් ඇති හෙයින් **සංවුතත්ත** නම් වූ, කෙලෙස් ඉක්ම ගිය හෙයින් **සංඝාතික** නම් වූ, දුකින් නිදහස් වූ හෙයින් **මුත්ත** නම් වූ **භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයා වෙමි මම.**

**05.** **නාගස්ස පන්තසේනස්ස ඛීණසංයෝජනස්ස මුත්තස්ස,**
**පටිමන්තකස්ස ධෝනස්ස පන්නද්ධජස්ස වීතරාගස්ස,**
**දන්තස්ස නිප්පපඤ්චස්ස භගවතෝ තස්ස සාවකෝ'හමස්මි.**

මහා ඇත් රජෙකු වැනි හෙයින් **නාග** නම් වූ, ඈත වනයේ වසනා හෙයින් **පංතසේන** නම් වූ, කෙලෙස් බැඳීම් ගෙවා දැමූ හෙයින් **ඛීණසංයෝජන** නම් වූ, කෙලෙසුන්ගෙන් නිදහස් වූ හෙයින් **මුත්ත** නම් වූ, නුවණින් යුතු කථාබහ ඇති හෙයින් **පටිමංතක** නම් වූ, කෙලෙස් සෝදා හළ හෙයින් **ධෝණ** නම් වූ, මානධජ බිම හෙලූ හෙයින් **පන්නද්ධජ** නම් වූ, වීතරාගී හෙයින් **වීතරාග** නම් වූ, දමනය වූ හෙයින් **දමිත** නම් වූ, කෙලෙස් සිතිවිලි රහිත වූ හෙයින් **නිප්පපංච** නම් වූ **භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයා වෙමි මම.**

**06. ඉසිසත්තමස්ස අකුහස්ස තේවිජ්ජස්ස බ්‍රහ්මපත්තස්ස, නහාතකස්ස පදකස්ස පස්සද්ධස්ස විදිතවේදස්ස, පුරින්දදස්ස සක්කස්ස භගවතෝ තස්ස සාවකෝ'හමස්මි.**

සත් බුදුවරුන් අතරේ සත් වැනි මහා ඍෂි වූ හෙයින් **ඉසිසත්තම** නම් වූ, කුහක ගති නැති හෙයින් **අකුහ** නම් වූ, ත්‍රිවිද්‍යාව ලද හෙයින් **තේවිජ්ජ** නම් වූ, ශ්‍රේෂ්ඨත්වයට පත් වූ හෙයින් **බ්‍රහ්මපත්ත** නම් වූ, කෙලෙස් සෝදා හළ හෙයින් **නහාතක** නම් වූ, දහම් පද මැනවින් දෙසනා හෙයින් **පදක** නම් වූ, සැහැල්ලු සිත කය ඇති හෙයින් **පස්සද්ධ** නම් වූ, දුටු දහම් ඇති හෙයින් **විදිතවේද** නම් වූ, හැමට පළමුව ධර්ම දානය බෙදා දුන් හෙයින් **පුරින්දද** නම් වූ, සියලු ගුණයට දක්ෂ හෙයින් **සක්ක** නම් වූ **භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයා වෙමි මම.**

**07. අරියස්ස භාවිතත්තස්ස පත්තිපත්තස්ස වෙය්‍යාකරණස්ස, සතිමතෝ විපස්සිස්ස අනභිනතස්ස නෝ අපනතස්ස, අනේජස්ස වසිප්පත්තස්ස භගවතෝ තස්ස සාවකෝ'හමස්මි.**

ආර්ය ගුණ ඇති හෙයින් **අරිය** නම් වූ, වඩන ලද සිත් ඇති හෙයින් **භාවිතත්ත** නම් වූ, උතුම් ගුණයට සපැමිණි හෙයින් **පත්තිපත්ත** නම් වූ, දහම මැනවින් තෝරා දෙන හෙයින් **වෙය්‍යාකරණ** නම් වූ, මනා සිහි නුවණ ඇති හෙයින් **සතිමා** නම් වූ, නුවණින් ලොව දක්නා හෙයින් **විපස්සී** නම් වූ, රහත් ගුණයෙන් යුතු හෙයින් **අනභිනත** නම් වූ, සියලු නුගුණින් බැහැර වූ හෙයින් **අනපණත** නම් වූ, තෘෂ්ණා නැති හෙයින් **අනේජ** නම් වූ, වසඟ කළ සිත් ඇති හෙයින් **වසිප්පත්ත** නම් වූ **භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයා වෙමි මම.**

**08. සම්මග්ගතස්ස ඣායිස්ස අනනුගතන්තරස්ස සුද්ධස්ස, අසිතස්ස අප්පහීනස්ස පවිවිත්තස්ස අග්ගපත්තස්ස, තිණ්ණස්ස තාරයන්තස්ස භගවතෝ තස්ස සාවකෝ'හමස්මි.**

යහපත් මග වැඩි හෙයින් **සම්මග්ගත** නම් වූ, ධ්‍යාන වඩනා හෙයින් **ඣායී** නම් වූ, කෙලෙස් හා එක් නො වූ සිත් ඇති හෙයින් **අනනුගතන්තර** නම් වූ, පාරිශුද්ධ සිත් ඇති හෙයින් **ශුද්ධ** නම් වූ, කෙලෙස් රහිත හෙයින් **අසිත** නම් වූ, නැති නො වන ගුණයෙන් හෙයින් **අප්පහීණ** නම් වූ, හුදෙකලාවේ ඇලුණු

සිත් ඇති හෙයින් **පවිවිත්ත** නම් වූ, ලොවෙහි මුදුනට පත් වූ හෙයින් **අග්ගපත්ත** නම් වූ, සසරෙන් එතෙරට වැඩි හෙයින් **තිණ්ණ** නම් වූ, අනුන් එතෙර කරවන හෙයින් **තාරයන්ත** නම් වූ **භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයා වෙමි මම.**

**09. සන්තස්ස භූරිපඤ්ඤස්ස මහාපඤ්ඤස්ස වීතලෝභස්ස, තථාගතස්ස සුගතස්ස අප්පටිපුග්ගලස්ස අසමස්ස, විසාරද්ස්ස නිපුණස්ස භගවතෝ තස්ස සාවකෝ’හමස්මි.**

ශාන්ත විහරණ ඇති හෙයින් **සන්ත** නම් වූ, ගම්භීර ප්‍රඥා ඇති හෙයින් **භූරිපඤ්ඤ** නම් වූ, මහා ප්‍රඥා ඇති හෙයින් **මහාපඤ්ඤ** නම් වූ, ලෝභය දුරු වී ඇති හෙයින් **වීතලෝභ** නම් වූ, සත්‍යයට පත් වූ හෙයින් **තථාගත** නම් වූ, සොඳුරු ගමනක් වැඩි හෙයින් **සුගත** නම් වූ, එවැනි වෙන කෙනෙකු නැති හෙයින් **අප්පටිපුග්ගල** නම් වූ, සමාන කෙනෙක් නැති හෙයින් **අසම** නම් වූ, විශාරද ඥාණ ඇති හෙයින් **විසාරද** නම් වූ, සියුම් නුවණැති හෙයින් **නිපුණ** නම් වූ **භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයා වෙමි මම.**

**10. තණ්හච්ඡිදස්ස බුද්ධස්ස විතධූමස්ස අනුපලිත්තස්ස, ආහුණෙය්‍යස්ස යක්ඛස්ස උත්තමපුග්ගලස්ස අතුලස්ස, මහතෝ යස්ග්ගපත්තස්ස භගවතෝ තස්ස සාවකෝ’හමස්මි.**

තණ්හාව සිඳලූ හෙයින් **තණ්හච්ඡිද** නම් වූ, අවබෝධයට පත් වූ හෙයින් **බුද්ධ** නම් වූ, කෙලෙස් දුම් බැහැර කළ හෙයින් **වීතධූම** නම් වූ, කෙලෙස් හා නො තැවරී සිටිනා හෙයින් **අනුපලිත්ත** නම් වූ, පුද පූජාවන්ට සුදුසු හෙයින් **ආහුණෙය්‍ය** නම් වූ, ශ්‍රේෂ්ඨ උතුමෙකු හෙයින් **යක්ඛ** නම් වූ, උතුම් පුද්ගලයෙකු හෙයින් **උත්තමපුග්ගල** නම් වූ, අසාමාන්‍ය ගුණ ඇති හෙයින් **අතුල** නම් වූ, මහා ගුණ ඇති හෙයින් **මහා** නම් වූ, මහා යසසට පත් වූ හෙයින් **මහතෝයසග්ගපත්ත** නම් වූ **භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයා වෙමි මම.**

*සාදු ! සාදු !! සාදු !!!*

## කවදද දැන ගත්තේ...

ඉතින් උපාලි ගෘහපතිතුමා වැඳගෙන, බුදුරජාණන් වහන්සේ වැඩ ඉන්න පැත්තට හැරිලා ඔන්න ඔය නම් සියය කිව්වා. නිගණ්ඨනාථ පුත්‍ර උඩ ගිහින් බිම වැටුණා. නිගණ්ඨනාථ පුත්‍ර අහනවා ඇස් ලොකු කරගෙන, හක්ක පළල් කරගෙන අහනවා, "එම්බා ගෘහපතිය, ශ්‍රමණ ගෞතමයන්ගේ ඔය කියපු ගුණ තොප මෙච්චර ඉක්මනට එකතු කළේ කවදද?"

එතකොට කියනවා "ස්වාමීනී, ඒක මේ වගේ දෙයක්. දක්ෂ මල්කාරයෙක් ඉන්නවා. මේ මල්කාරයට ලස්සනට මල් මාලා ගොතන්න පුළුවන්. මෙයාට ලස්සන මල් ගොඩක් හම්බවෙනවා. එයා ඒ ලස්සන මල් එකතු කරගෙන ලස්සනට මල් අමුණනවා. ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේ අනේක වර්ණනා ගුණයෙන් යුක්තයි. අනේක සිය ගණන් වර්ණනා ගුණයෙන් යුක්තයි. ඒ වර්ණනා ගුණය ගැන බුද්ධිමත් කවුද වර්ණනා නො කර ඉන්නෙ?" කියල කියන කොට ම ඉවසගන්න බැරිව ගියා. එකපාරට ම කටින් ලේ වමනෙ ගියා. ඒකෙන් ම ලෙඩවෙලා අරගෙන ගිහින් ඊට පස්සෙ තමයි නැතිවුණේ.

## හඳුනාගන්න සැබෑ ශ්‍රාවකයා...

දැන් බලන්න පින්වතුනි, ශ්‍රාවකයෙකුගේ අභිමානය. ශ්‍රාවකයෙකුගේ ජීවිතයේ තියෙන්නෙ නෝන්ජල්කමක් කියල හිතන්න එපා. අනික මෙයා පෘථග්ජන කෙනෙක් ද? සෝවාන් වෙච්ච මාර්ගඵල ලාභී ශ්‍රාවකයෙක්. අර නිගණ්ඨනාථ පුත්තගෙ කලින් ප්‍රධාන ශ්‍රාවකයා. ගෞතම බුදුරජාණන් වහන්සේගේ අවබෝධයෙන් ම පැමිණි මාර්ග ඵල ලාභී ශ්‍රාවකයා. බලන්න මේ ශ්‍රද්ධාව දිහා. මේ සෝතාපත්ති අංග නේද? බලන්න මේ පැහැදීම.

මේ නිසා අපි තුළත් ඉස්සෙල්ලාම ඇතිවෙන්න ඕනෙ පැහැදීම. ඒ පැහැදීම තිබුණොත් එයා බුදුරජාණන් වහන්සේ ගැන, ධර්මය ගැන, සංඝ රත්නය ගැන, ඒ ධර්මය කාගෙන් ද ලැබුනෙ කියල කල්‍යාණ මිත්‍රයා ගැන පහදිනවා. හැබැයි ඒ බුද්ධිමත් එක්කෙනා. පැහැදුනාට පස්සේ එයා ආත්ම දෘෂ්ඨිය නෙවෙයි ඉස්සරහට ගන්නේ. ප්‍රතිරූපය නෙවෙයි ඉස්සරට ගන්නේ. පැහැදීම. අන්න ඒ පැහැදීම ඇතිකරගැනීමට හැම දෙනාට ම වාසනාව උදාවේවා.

*සාදු ! සාදු !! සාදු !!!*

# ගෞරව සත්කාර දැක්විය යුතු අසිරිමත් කරුණු හත

## ~සක්කාර ගරුකාර සූත්‍රය~

*ශ්‍රද්ධාවන්ත පින්වතුනි,*

අපි **අංගුත්තර නිකායේ හත්වෙනි නිපාතය**ට අයිති, සාරිපුත්ත මහ රහතන් වහන්සේත්, භාග්‍යවත් බුදුරජාණන් වහන්සේත් අතර ඇතිවුන ධර්ම සාකච්ඡාවක් සඳහන් දේශනාවක් තමයි අද ඉගෙන ගන්නෙ. මේ දේශනාවේ නම **සක්කාර ගරුකාර සූත්‍රය**. සක්කාර ගරුකාර සූත්‍රය කියන්නේ ගෞරව සත්කාර දැක්වීම ගැන වදාළ දෙසුම.

### විවේක සුවයෙන් භාවනා කරද්දී....

**සාරිපුත්ත මහරහතන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ** වැඩ වාසය කරද්දී දවල් දානෙ වළඳල ටිකක් විවේක අරගෙන හුදෙකලාවෙ භාවනා කළා. උන්වහන්සේ භාවනා කරද්දී මෙන්න මේ අදහස හිතට ආවා. **"අකුසල් බැහැර කරන්නෙ කුසල් වර්ධනය කරන්නෙ කවර දෙයකට සත්කාර ගෞරව කළොත් ද?"**

මෙන්න ශ්‍රාවකයො වෙච්ච අපට තියෙන ඉලක්කය. අපේ ජීවිතයේ තියෙන එක ඉලක්කයක් අකුසල් බැහැර කිරීම. ඊළඟට කුසල් උපදවා ගැනීම. එතකොට මේ ඉලක්කය සපුරාගන්න අපි ගෞරව සම්මාන දැක්විය යුත්තේ කෙබඳු ආකාරයෙන් ද කියල තමයි උන්වහන්සේට කල්පනාවක් ඇති වුනේ.

## ශාස්තෘන් වහන්සේ ව ඇසුරු කිරීම...

ඊට පස්සේ උන්වහන්සේට මෙහෙම හිතුනා. **ශාස්තෘන් වහන්සේට ගෞරව දක්වල, සත්කාර කරල ඇසුරු කරගෙන තමයි අකුසල් බැහැර කරන්න තියෙන්නෙ. කුසල් දියුණු කරන්න තියෙන්නෙ.**

**'ඒ අමා නිවන් දුටු රහතන් වහන්සේලා'** කියල අපි සිංහලයට පරිවර්තනය කරලා තියෙනවා **ථේර ථේරී ගාථා.** මේකෙ රහතන් වහන්සේලා තමන්ගේ ජීවිතයේ ඇතිවෙච්ච, ඒ නිවන් සුව විඳිද්දී ඇතිවෙච්ච සංතෝසෙ කියද්දී කියනවා "මම බුදුරජාණන් වහන්සේව ගෞරවයෙන් ඇසුරු කළා" කියල.

## බුදුරජාණන් වහන්සේ ව ඇසුරු කරන ක්‍රම දෙක...

බුදුරජාණන් වහන්සේව ඇසුරු කරන ප්‍රතිපත්ති දෙකක් තියෙනවා. එකකට කියනවා **මෛත්‍රී ප්‍රතිපත්තිය** කියල. අනෙකට කියනවා **වෛරී ප්‍රතිපත්තිය** කියල. බුදුරජාණන් වහන්සේ එක තැනක දේශනාවක කියනව "පින්වත් මහණෙනි, මාව වෛරී ප්‍රතිපත්තියෙන් ඇසුරු කරන්න එපා" කියල. වෛරී ප්‍රතිපත්තිය කියල කියන්නේ උන්වහන්සේ අවබෝධ කරන්න දේශනා කරපු එක අත්හැරල සිටීම. උන්වහන්සේ අවබෝධ කරන්න ඕනෙ කියල දේශනා කළා නම් යමක්, ශ්‍රාවකයෝ ඒ අදහසට ඇවිල්ල නෑ. ශ්‍රාවකයො ඉන්නෙ කෙලෙස් නසන මාර්ගයක නෙවෙයි. එතකොට ඒ ශ්‍රාවකයෝ ඉන්නේ වෛරී ප්‍රතිපත්තියෙ. බුදුරජාණන් වහන්සේ දේශනා කළා යම් ධර්මයක හැසිරෙන්න, යම් ධර්මයක් අවබෝධ කරන්න කියල. ශ්‍රාවකයෝ ඒ මතයෙ ඉන්නවා නම් ශ්‍රාවකයෝ ඒක පුරුදු කරනවා නම්, ශාස්තෘන් වහන්සේ කෙරෙහි මෛත්‍රී ප්‍රතිපත්තියෙන් වාසය කරන කෙනෙක්. ශ්‍රාවකයා ඒ විදිහට යහපත් ව සිටියොත් තමයි ශාස්තෘන් වහන්සේට ඒ ගෞරවය ලැබෙන්නෙ.

## මෛත්‍රී ප්‍රතිපත්තියෙන් කල් ගෙවන්න...

ශ්‍රාවකයෝ ඒ විදිහට හිටියෙ නැත්නම් ඒකෙ ගෞරවය ශාස්තෘන් වහන්සේට ලැබෙන්නෙත් නෑ. ශ්‍රාවකයා ධර්මානුධර්ම ප්‍රතිපදාවෙන් වාසය කිරීම තමයි මෛත්‍රී ප්‍රතිපත්තිය. ඉතින් ඒකයි රහතන් වහන්සේලා ප්‍රකාශ කරල තියෙන්නෙ මම බුදුරජාණන් වහන්සේව ගෞරවයෙන් ඇසුරු කළා. මම බුදුරජාණන් වහන්සේ ඇසුරු කළා. මං ශාස්තෘන් වහන්සේ ව කිට්ටුවෙන් ඇසුරු කළා කියල. දැන් මේ

කාලෙ අපට ශාස්තෘන් වහන්සේව කිට්ටුවෙන් ඇසුරු කරන්න බැරිද? පුළුවනි.

එතකොට සාරිපුත්ත මහරහතන් වහන්සේට මතක් වුනා පළවෙනි කාරණය. අකුසල් දුරු කිරීම පිණිස, කුසල් දියුණු කර ගැනීම පිණිස ශාස්තෘන් වහන්සේට ගෞරව සත්කාර දැක්විය යුතුයි.

## ශ්‍රී සද්ධර්මයටත් ගෞරව සත්කාර දැක්විය යුතුයි...

දෙවෙනි එක අකුසල් දුරු කිරීම පිණිස, කුසල් දියුණු කිරීම පිණිස ශාස්තෘන් වහන්සේ වදාළ ශ්‍රී සද්ධර්මයට ගෞරව සත්කාර දැක්විය යුතුයි. ගෞරව කළ යුතුයි. ඔය ගෞරව කිරීම ගැන උදායි කියන සූත්‍රයේ මෙහෙම තියෙනව.

වේරහච්චානි කියන ගෙදර හිටපු ගෘහපතිනියට ආරංචි වුනා හාමුදුරුවරු හොඳට ධර්මය කියනව කියල. ආරංචි වෙලා කියනව 'අනේ මටත් ආසයි බණ ටිකක් අහගන්න. හාමුදුරු කෙනෙක් මට වඩම්මල දෙන්න' කියල. වැඩියට පස්සේ දානෙ දුන්න. දානෙ දුන්නට පස්සේ ඒ ස්වාමීන් වහන්සේ පුටුවක වාඩිවෙලා හිටිය. දැන් මෙයා බෞද්ධ කෙනෙක් නෙවෙයි. දැන් මෙයාට බණ අහන්න ආසයි. එයා මොකද කළේ, සෙරප්පු දෙකකුත් දාගෙන, ඔලුව එයාගේ සාරි පොටෙන් වහගෙන ඒ වගේ ම සමාන ආසනේක වාඩිවෙලා කියනවා 'හා... දැන් කියන්න බලන්න බණ. මාත් අහන්න ආසයි' කියල. ඊට පස්සේ කිව්වා 'පින්වතී, බලමුකෝ දවසක ධර්මය කතා කරන්න අවස්ථාවක් ගම්මුකො' කියල පිටත් වුනා. බණ කිව්වෙ නෑ.

## ධර්මයට ගෞරව කළොත් බණ කියනවා...

ඊට පස්සේ අර මනුස්සයාට අඬගහල කිව්ව 'කෝ ඉතින්, ඔහේ ධර්මය දේශනා කරනව කිව්වට මම කිව්වනෙ බණ කියන්න කියල. බණ කිව්වෙ නෑනෙ.' මේ එතකොට එයා කෙළින් ම ගියා ස්වාමීන් වහන්සේව හම්බ වෙන්න. ඊට පස්සේ ඇහුවා 'මෙහෙම බණ කියන්න කියද්දිත් ස්වාමීන් වහන්සේ බණ කිව්වෙ නැද්ද?' කියල. 'ඒ ක්‍රමයට බණ කියන්න මට බෑ. ධර්මයට ගෞවරය නැතිව බණ කියන්න බෑ' කිව්ව. 'කොහොමද ධර්මයට ගෞරව දක්වන්නෙ' කියල ඇහුව. එතකොට කිව්වා 'සෙරප්පු දෙක ගලවල ඔය වහපු ඔලුව පොඩ්ඩක් ඇරගෙන, පාත ආසනේක මිටි ආසනේක වාඩිවෙලා ඉන්න ඕනෙ' කියල.

අනිත් දවසෙ මෙයා එහෙම කළා. ඊට පස්සේ ධර්මය කිව්වා. එතකොට අපට පේනවා මේ ධර්ම ගෞරවය කියන එක කොයිතරම් ශ්‍රාවකයන් තුළ තිබිල තියෙනව ද? ඉතින් සැරියුත් හාමුදුරුවන්ට මතක් වුනා දෙවෙනි කාරණය හැටියට ධර්මයට ගෞරව දැක්වීම.

## ආර්ය මහා සංඝරත්නයටත් ගෞරව සත්කාර දැක්විය යුතුයි...

තුන්වෙනි කාරණය තමයි අකුසල් දුරු කිරීම පිණිස, කුසල් උපදවාගෙන වැඩි දියුණු කරගැනීම පිණිස ආර්ය සංඝරත්නය කෙරෙහි ගෞරව සම්මාන දැක්වීම. මේකත් තියෙන්න ඕනෙ අපේ කුසල් දියුණු වීමටත්, අකුසල් දුරු කිරීමටත්.

## සිල්පද ගැන ගරු සත්කාර දක්වන්න...

හතරවෙනි කරුණ සිල් පද වලට ගෞරව කිරීම. ගෞරව සම්මාන දැක්වීම. ගෞරවයෙන් ශික්ෂා පද ඇසුරු කිරීම. මෙය අකුසල් දුරු වීමටත් කුසල් වර්ධනයටත් උපකාර වෙනව.

## සමාධියටත් ගරු කරන්න...

පස්වෙනි කරුණ සමාධියට ගෞරව සත්කාර දැක්වීම. සමාධියට ගරු බුහුමන් කිරීම. කුසල් දියුණු කිරීමටත්, අකුසල් දුරු කිරීමටත් හේතු වෙනව.

## අප්‍රමාදයටත් ගෞරව සත්කාර දැක්විය යුතුයි...

හයවෙනි එක අප්‍රමාදය. අපේ වචන වලින් කියනව නම් කැපවීමට ගෞරව කරනව නම්, ඒ කැපවීම ගෞරවයෙන් ඇසුරු කරනව නම් අකුසල් දුරු වීමත්, කුසල් වර්ධනයත් සිදුවෙනව.

## දහම් පිළිසඳරට ගරු සත්කාර දක්වන්න...

හත්වෙනි එක දහම් පිළිසඳරට ගෞරව සත්කාර කරනව නම්, ගෞරවයෙන් දහම් පිළිසඳරෙහි යෙදෙනව නම්, අකුසල් දුරු වෙනව. කුසල් වැඩෙනව.

සාරිපුත්ත මහරහතන් වහන්සේ ගේ හිතේ ඇතිවෙච්ච මේ කරුණු ටික ලස්සනට ගලපගත්තා. ඒ කරුණු හත තමයි,

- **ශාස්තෘන් වහන්සේට ගරු සත්කාර දැක්වීම.**
- **ශ්‍රී සද්ධර්මයට ගරු සත්කාර දැක්වීම.**
- **ආර්ය මහා සංඝරත්නයට ගරු සත්කාර දැක්වීම.**
- **ශික්ෂා පද වලට ගරු සත්කාර දැක්වීම.**
- **සමාධියට ගරු සත්කාර දැක්වීම.**
- **අප්‍රමාදයට ගරු සත්කාර දැක්වීම.**
- **දහම් පිළිසඳරට ගරු සත්කාර දැක්වීම.**

එතකොට සාරිපුත්ත මහ රහතන් වහන්සේට සංතෝෂයක් ඇති වුනා 'හරි ලස්සන අදහසක් මා තුළ ඇතිවුනා නෙ. හරි පිරිසිදු අදහසක් නෙ මගේ හිතට ආවෙ' ඒකෙ තේරුම සාරිපුත්ත මහ රහතන් වහන්සේ මේක කලින් අහල නෑ. ඊට පස්සේ සාරිපුත්ත මහරහතන් වහන්සේ හිතුවා මං මේ මගේ හිතේ ඇතිවෙච්ච සුන්දර අදහස, පිරිසිදු අදහස බුදුරජාණන් වහන්සේ ළඟට ගිහින් කියන්න ඕනෙ. එතකොට මේ අදහස තවත් ලස්සනට බබලාවි. තව ඔපමට්ටම් වෙලා යාවි.

## රන් භාණ්ඩ ඔපදමනවා වගේ...

මනුස්සයෙකුට ස්වර්ණාභරණයක් ලැබුනට පස්සේ, රත්තරන් හම්බ වුනාට පස්සේ මෙයා මේ රත්තරන් අරගෙන යනව රත්තරං ඔප දාන එක්කෙනෙක් ගාවට. ගෙනිච්චහම එයා මේක තවත් ඔපමට්ටම් කරල දෙනව. තිබුනට වඩා බබලන්න. ඒ වගේ මේක මං බුදුරජාණන් වහන්සේ ළඟට ගිහින් සැල කරන්න ඕනෙ. උන්වහන්සේ මේක ලස්සනට ඔපමට්ටම් කරල දේවි.

ඊට පස්සේ සාරිපුත්ත මහරහතන් වහන්සේ හවස් වරුවෙ බුදුරජාණන් වහන්සේ ළඟට වැඩිය. උන්වහන්සේට වන්දනා කළා. පැත්තකින් වාඩිවෙලා කියනව "ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, අද මං හවස භාවනා කර කර හිටිය. මම භාවනා කර කර ඉඳිද්දි මට මෙන්න මේ අදහස මගේ හිතේ ඇතිවුනා, අකුසල් දුරු වීමටත්, කුසල් වැඩීමටත් කවුරු නම් කෙනෙකුට සත්කාර සම්මාන කළ යුතුද? ගෞරව කළ යුතුද? කියල මට මේ සිතුවිල්ල ඇතිවුනා. ඉතින් ස්වාමීනී, මම මේ ගැන හිතන්න පටන් ගත්තා. හිතන්න පටන් ගත්තහම මට මේ කරුණු හතක් වැටහුණා. මේ කරුණු හත තමයි මේකට ඕනෙ කියල."

මොනවද ඒ කරුණු හත? "ස්වාමීනී, ශාස්තෘන් වහන්සේට

ගෞරව සත්කාර දක්වලා වාසය කරන එක්කෙනාට තමයි අකුසල් දුරු කරන්න පුළුවන්. කුසල් වර්ධනය කරන්න පුළුවන්. ශ්‍රී සද්ධර්මයට ගෞරව සත්කාර දක්වලා වාසය කරන එක්කෙනාට තමයි අකුසල් දුරු කරන්න පුළුවන්. කුසල් වර්ධනය කරන්න පුළුවන්. ආර්ය මහා සංඝරත්නයට ගෞරව සත්කාර දක්වලා වාසය කරන එක්කෙනාට තමයි අකුසල් දුරු කරන්න පුළුවන්. කුසල් වර්ධනය කරන්න පුළුවන්. ශික්ෂා පද වලට ගෞරව සත්කාර දක්වලා වාසය කරන එක්කෙනාට තමයි අකුසල් දුරු කරන්න පුළුවන්. කුසල් වර්ධනය කරන්න පුළුවන්. සමාධියට ගෞරව සත්කාර දක්වලා වාසය කරන එක්කෙනාට තමයි අකුසල් දුරු කරන්න පුළුවන්. කුසල් වර්ධනය කරන්න පුළුවන් වෙන්නෙ. අප්‍රමාදයට ගෞරව සත්කාර දක්වලා වාසය කරන එක්කෙනාට තමයි අකුසල් දුරු කරන්න පුළුවන්. කුසල් වර්ධනය කරන්න පුළුවන් වෙන්නෙ. දහම් පිළිසඳරට ගෞරව සත්කාර දක්වලා වාසය කරන එක්කෙනාට තමයි අකුසල් දුරු කරන්න පුළුවන්. කුසල් වර්ධනය කරන්න පුළුවන්" කියල.

## පිරිසිදු අදහස තව තවත් ඔප දමන්න...

"ස්වාමීනී, මට මේ අදහස ඇතිවෙච්ච ගමන් ම මට භාග්‍යවත් බුදුරජාණන් වහන්සේව මතක් වුනා. මතක් වුනේ මේ විදිහට යි. 'මට මෙන්න පිරිසිදු බබලන සිතුවිලි ටිකක් ඇතිවුනා. ලස්සන අදහසක් මට ඇතිවුනා. මම මේ ලස්සන අදහස බුදුරජාණන් වහන්සේ ළඟට ගිහිල්ල ඉදිරිපත් කරන්න ඕනෙ. එතකොට උන්වහන්සේ මේ අදහස තව ඔපමට්ටම් කරල දේවි. ඒක මොකක් වගේ ද? රත්තරන් හම්බ වෙච්ච කෙනෙක් රත්තරන් ඔපදාන එක්කෙනෙක් ළඟට ගෙනියනව වගේ. එතකොට එයා ඒ රත්තරන් ලස්සනට ඔපමට්ටම් කරල දෙනව. ඔපදාල දෙනව. තිබුනට වඩා බබලන්න.

ඉතින් ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, මට හිතුනා ඒ වගේ මගේ මේ හිතේ ඇතිවෙච්ච පාරිශුද්ධ අදහස බුදුරජාණන් වහන්සේට කියා සිටියහම උන්වහන්සේ මේක ලස්සනට පිරිසිදු කරල දේවි කියල."

## බුදු සමිඳුන් ද අනුමත කළා...

එතකොට බුදුරජාණන් වහන්සේ දේශනා කරනව, "සාදු සාදු සාරිපුත්ත, හරියට ම හරි කිව්වා. ශාස්තෘන් වහන්සේට ගෞරව සත්කාර දක්වලා වාසය කරන එක්කෙනාට තමයි අකුසල් දුරු කරන්න පුළුවන්. කුසල් වර්ධනය කරන්න පුළුවන්. ශ්‍රී සද්ධර්මයට ගෞරව

සත්කාර දක්වලා වාසය කරන එක්කෙනාට තමයි අකුසල් දුරු කරන්න පුළුවන්. කුසල් වර්ධනය කරන්න පුළුවන්. ආර්ය මහා සංඝරත්නයට ගෞරව සත්කාර දක්වලා වාසය කරන එක්කෙනාට තමයි අකුසල් දුරු කරන්න පුළුවන්. කුසල් වර්ධනය කරන්න පුළුවන්. ශික්ෂා පද වලට ගෞරව සත්කාර දක්වලා වාසය කරන එක්කෙනාට තමයි අකුසල් දුරු කරන්න පුළුවන්. කුසල් වර්ධනය කරන්න පුළුවන්. සමාධියට ගෞරව සත්කාර දක්වලා වාසය කරන එක්කෙනාට තමයි අකුසල් දුරු කරන්න පුළුවන්. කුසල් වර්ධනය කරන්න පුළුවන් වෙන්නෙ. අප්‍රමාදයට ගෞරව සත්කාර දක්වලා වාසය කරන එක්කෙනාට තමයි අකුසල් දුරු කරන්න පුළුවන්. කුසල් වර්ධනය කරන්න පුළුවන් වෙන්නෙ. දහම් පිළිසඳරට ගෞරව සත්කාර දක්වලා වාසය කරන එක්කෙනාට තමයි අකුසල් දුරු කරන්න පුළුවන්. කුසල් වර්ධනය කරන්න පුළුවන් වෙන්නෙ" කියල බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරපු ගමන් ම ඔපවැටෙන්න පටන් ගත්ත.

## ශාස්තෘන් වහන්සේට ගෞරවයක් නැත්නම්...

සාරිපුත්ත හාමුදුරුවෝ කියා හිටියා "ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, මට දැන් මේක විස්තර වශයෙන් තේරෙනව" කිව්ව. ඒ මෙහෙමයි.

"ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, යමෙක් ශාස්තෘන් වහන්සේට ගෞරවයක් නැතිව ධර්මයට ගෞරවයක් ඇතිව ඉන්නවා කියන එක කවදාවත් වෙන්න බෑ" කිව්ව. යමෙක් ශාස්තෘන් වහන්සේට ගෞරවයක් නැත්නම් ධර්මයටත් එයා ගෞරවයක් නෑ.

ඊළඟට සාරිපුත්ත හාමුදුරුවො දේශනා කරනව "යමෙක් ශාස්තෘන් වහන්සේටත් ගෞරවයක් නැතුව, ධර්මයටත් ගෞරවයක් නැතිව ආර්ය මහා සංඝයාට ගෞරව සහිතව වාසය කරනවා කියන එක කවදාවත් වෙන්න බෑ." යමෙක් ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරවයක් නැත්නම්, ධර්මය කෙරෙහි ගෞවරයක් නැත්නම්, ආර්ය මහා සංඝයා කෙරෙහිත් ගෞරවයක් නෑ.

ඊළඟට සාරිපුත්ත හාමුදුරුවො දේශනා කරනව "යමෙක් ශාස්තෘන් වහන්සේටත් ගෞරවයක් නැතුව, ධර්මයටත් ගෞරවයක් නැතිව ආර්ය මහා සංඝයාටත් ගෞරවයක් නැතිව, සිල් පද වලට ගෞරව සහිතව වාසය කරනවා කියන එක කවදාවත් වෙන එකක් නෙවෙයි" කිව්ව. යමෙක් ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරවයක්

නැත්නම්, ධර්මය කෙරෙහි ගෞරවයක් නැත්නම්, ආර්ය මහා සංඝයා කෙරෙහි ගෞරවයක් නැත්නම්, එයා සීලයට කෙරෙහිත් ගෞරවයක් නෑ.

"යමෙක් ශාස්තෘන් වහන්සේටත්, ශ්‍රී සද්ධර්මයටත්, ආර්ය මහා සංඝයාටත්, සීලයටත් ගෞරවයක් නැතිව ඉඳගෙන සමාධියකට ගෞරව දක්වාවි කියන කාරණය වෙන්න බෑ" කිව්ව. එයා ඒ හතරට ගෞරවයක් නැත්නම් සමාධියටත් ගෞරවයක් නෑ.

"යමෙක් ඒ ශාස්තෘන් වහන්සේටත්, ශ්‍රී සද්ධර්මයටත්, ආර්ය මහා සංඝයාටත්, සීලයටත්, සමාධියටත් ගෞරවයක් නැතිව ඉඳගෙන අප්‍රමාදයට ගෞරව දක්වාවි කියන කාරණය වෙන්න බෑ" කිව්ව. එයා ඒකටත් ගෞරවය නෑ ම යි කියල කිව්ව.

"යමෙක් ශාස්තෘන් වහන්සේට ගෞරවයක් නැතිව ඉඳගෙන, ධර්මයට ගෞරවයක් නැතිව ඉඳගෙන, ආර්ය ශ්‍රාවක සංඝයාට ගෞරව නැතිව ඉඳගෙන, ශික්ෂා පද වලට ගෞරව නැතිව ඉඳගෙන, සමාධියට ගෞරව නැතිව ඉඳගෙන, අප්‍රමාදයට ගෞරව නැතිව ඉඳගෙන ධර්ම සාකච්ඡාවට ගෞරව දක්වාවි කියන කාරණය කිසිසේත් ම වෙන්නෙ නෑ" කිව්ව.

## නියම ධර්ම සාකච්ඡාවක් නම්...

එහෙනම් අපට නියම සාර්ථක ධර්ම සාකච්ඡාවක් අහන්න නම්, ශාස්තෘන් වහන්සේට ගෞරව කරන, ධර්මයට ගෞරව කරන, ශ්‍රාවක සංඝයාට ගෞරව කරන, සිල්පද වලට ගෞරව කරන, සමාධියට ගෞරව කරන, අප්‍රමාදයට ගෞරව කරන පිරිසක් ඉන්න ඕනෙ.

එතකොට මේකෙ සාරිපුත්ත මහ රහතන් වහන්සේ ඊළඟට කියනව 'ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, යම්කිසි කෙනෙක් ශාස්තෘන් වහන්සේට ගෞරව දක්වනවා නම්, එයා ධර්මයට ගෞරව දක්වනවා.' එතකොට මේකෙන් අපට පේනවා අපි ඉස්සෙල්ලාම අකුසල් ප්‍රහාණය කිරීම පිණිස, කුසල් දියුණු කිරීම පිණිස, ඉස්සෙල්ලා ම කරන්න ඕනෙ දේ.

## මේ විදිහට ම සිද්ධ වෙන්න ඕනෙ...

සමහර විට අපිට තේරෙන්නෙ නැතුව, අපි හදන්නෙ මේ ගෞරව කිරීම් හරියට කරන්නෙ නැතිව අකුසල් දුරු කිරීමත්, කුසල්

වර්ධනය කිරීමක් කරන්න. නමුත් ඒක වෙන්න නම් මේ සිදුවීම් මාලාව මේ විදිහට මේ කරුණු හත මේ විදිහට ම වෙන්න ඕනෙ.

දැන් බුදුරජාණන් වහන්සේ ගේ කාලෙ හිටිය ශ්‍රාවකයන් තුළ මේ කරුණු පිහිටල තිබුණා. පිහිටල තිබුණ නිසා ඒ පිහිටල තිබුණ අය අකුසල් දුරු කළා, කුසල් වර්ධනය කළා. මේක පිහිටල නැති අය හිටිය. ඒ ගොල්ලන්ට අකුසල් දුරුකරන්න හම්බ වුනේ නෑ. කුසල් වර්ධනය කරන්න හම්බ වුනෙත් නෑ. එහෙනම් මේ හත නැතුව අපි හිටියොත් අපිටත් කුසල් දියුණු කරන්න හම්බවෙන්නේ නෑ. අකුසල් ප්‍රහාණය කරන්න හම්බවෙන්නේ නෑ. මේ හත ඇතිව සිටියොත් කුසල් දියුණු කරන්න පුළුවන් වෙනව. අකුසල් දුරුකරන්නත් පුළුවන් වෙනව.

## ශාස්තෘන් වහන්සේ ව හඳුනාගන්න...

ශාස්තෘන් වහන්සේ කියන වචනයේ තේරුම තමයි මාර්ගය පෙන්නන කෙනා, මාර්ගෝපදේශකයා. එතකොට දැන් අපි අපේ ජීවිතය සම්බන්ධයෙන් තීරණ ගැනීමේ දී කල්පනා කිරීමේදී අපි සිත, කය, වචනය, මෙහෙයවීමේ දී අපි තවත් කෙනෙකුගේ අදහස, තවත් කෙනෙකුගේ මතය අනුගමනය කරනවා නම්, ඒ තමයි ශාස්තෘන් වහන්සේ. එතකොට අපි ඒකට තෝරගත්තෙ කාවද? ගෞතම බුදුරජාණන් වහන්සේව. එතකොට මේ අදහස අපට තිබුනොත් තමයි, අපේ ශාස්තෘන් වහන්සේ වෙන්නෙ. එහෙම නැත්නම් අපේ ශාස්තෘන් වහන්සේ වෙන්නෙ නෑ.

බුදුරජාණන් වහන්සේව ගුණ වශයෙන් හඳුනා ගන්න ඕනෙ. උන්වහන්සේ ම තමයි අපට උන්වහන්සේගේ ගුණ ටික හඳුන්වා දුන්නෙ. හෙළිදරව් කරල දුන්නෙ. දැන් අපි ගත්තොත් ඉතිපිසෝ පාඨය, ස්වාක්ඛාතෝ පාඨය, සුපටිපන්නෝ පාඨය කිසිකෙනෙක් හදපු ඒව නෙවෙයි. ඒවා බුදුරජාණන් වහන්සේ විසින් ම දේශනා කරල කියා දීපුව. බාහිර කෙනෙක් කියපු ඒව නෙමෙයි. ඉතින් උන්වහන්සේ අපට හඳුන්වල දුන්න උන්වහන්සේගේ ගුණ නමයක් තියෙනව කියල. ඒ නවය උන්වහන්සේගේ ක්‍රියාකාරීත්වය තුළ ඔප්පු වෙලා තියෙනව.

## කිසිදා නො වෙනස්...

උන්වහන්සේ අරහං කියල උන්වහන්සේ හඳුන්වල දුන්න. උන්වහන්සේගේ අරහං ගුණය තමයි පිරිනිවන් පානා තෙක් ම දිස් වුනේ. උන්වහන්සේ සම්මා සම්බුද්ධයි කියල ලෝකයට ප්‍රතිඥා දුන්නා.

උන්වහන්සේ අවබෝධ කරගත්තු දේවල් මේ බාහිරින් අහල නෙවෙයි කියල. අදටත් ඒක එහෙම ම යි නේද?

මනුස්සයාගේ සිත කිලුටු වීමෙන් මනුස්සයා කිලුටු වන බවත්, මනුස්සයාගේ සිත පිරිසිදු වීමෙන් මනුස්සයා පිරිසිදු වන බවත් වෙන කිසිම තැනක නෑ. ඒක තියෙන්නේ බුද්ධ දේශනාවේ විතරයි. දැන් අපි ගත්තොත් මනුස්ස වර්ගයාගේ ඉතිහාසයේ ඉඳල මිනිස්සු අහස උසට ගොඩනැගිලි හදන්න ඇති. වැව් පොකුණු ඉදිකරන්න ඇති. උද්‍යාන ඉදිකරන්න ඇති. නොයෙක් ගස් වැල් වවන්න ඇති. නමුත් ඒ මනුස්සයාගේ සිත පිරිසිදු නො වීම නිසා හටගන්නා ප්‍රශ්න වලට හැමදාම මූණ දෙන්න ඕනෙ. එහෙම නේද?

## සිත පිරිසිදු නැති නිසයි...

නමුත් ලෝකෙ හැමදාම පතන්නෙ මොකක්ද? යුද්ධ නැති, අර්බුද නැති, ආරවුල් නැති, සාමය පිරුණු, කිරියෙන් පැණියෙන් ඉතුරුණු අමුතුම ලෝකයක් පතනව. එතන්ට යන්න බැරි මොකද? මනුස්සයාගේ හිත පිරිසිදු නෑ. බලන්න බුදුරජාණන් වහන්සේ හරියට ම හොයා ගත්තනෙ ඒක. උන්වහන්සේ තේරුම් ගත්තා මේ ප්‍රශ්නය එක එක්කෙනා තුළ තනි තනිව විසඳන්න ඕනෙ කියල. කොච්චර හරිද බලන්න.

ධර්මයේ ලක්ෂණය ඒකනෙ. ඕපනයික කියන්නෙ ඒකනෙ. එක එක්කෙනා තුළ තනි තනිව විසඳෙන්න ඕනෙ ප්‍රශ්නය. ඉතින් ඒ සඳහා උන්වහන්සේ දේශනා කරපු උන්වහන්සේගේ අවබෝධය, කර්මය ගැන එහෙම නැත්නම් විඤ්ඤාණය ගැන, සිත ගැන, සංස්කාර ගැන, ඊළඟට දිව්‍ය ලෝක - පෙරේත ලෝක ආදිය ගැන, අපාය ගැන, නිවන් මඟ ගැන, ආර්ය අෂ්ටාංගික මාර්ගය ගැන බුදුරජාණන් වහන්සේගේ අවබෝධය ලෝකෙ වෙන කිසිම විෂයක දකින්න නෑ. වෙන කිසිම පොතක නෑ. එතකොට අපට මේකෙන් තේරෙන්නේ මොකක් ද? උන්වහන්සේ ඒකාන්තයෙන් ම අවබෝධ කරල තියෙන්නෙ. මේ ලෝකයේ නැති එකක් උන්වහන්සේ දේශනා කළානෙ.

## කිසිදා නො ඇසූ දහමක්...

පළවෙනි ධර්ම දේශනාවේ දී කොහොමද දේශනා කළේ? **(ඉදං දුක්ඛං අරිය සච්චන්ති මේ භික්ඛවේ පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු)** මම කිසිම දවසක මේ ජීවිතයේ දී අහපු නැති එකක් කියල. එතකොට දුක ගැනත් උන්වහන්සේ එහෙමයි දේශනා කළේ. දුක හටගන්නා

ආකාරයත් කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා ගැනත් උන්වහන්සේ දේශනා කළේ එහෙමයි. ඒක නිරුද්ධ වීම ගැනත්, ආර්ය අෂ්ඨාංගික මාර්ගයත් හැම එකක් ගැන ම උන්වහන්සේ දේශනා කළේ (**පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු**) කවදාවත් මේක අහල නෑ කියල. එතකොට අපටත් එහෙම නම් කවදාවත් අහල නැති දේවල් නේද මේ බුද්ධ දේශනාවල් වලින් අපි දැනගන්නේ. උන්වහන්සේ සම්මා සම්බුද්ධයි. මේ කෙරෙහි අපි හිත පහදවා ගන්න ඕනෙ.

## කියපු දේ ඒ විදිහට ම සිද්ධ වෙනව...

එතකොට උන්වහන්සේ ජීවත් වුනේ අවබෝධයෙන් යුක්තවයි. අවබෝධයෙන් යුක්තව ජීවත් වෙනවා කියන කාරණය අපේ ජීවිතවලට වඩා ලොකු වෙනසක් තියෙනවා. ඒ කියන්නෙ උන්වහන්සේ අවබෝධයෙන් දේශනා කරපු දේ ඒ විදිහට ම සිද්ධවෙනව. ඒක වෙන විදිහකට සිද්ධවෙන්නෙ නෑ. ඒකයි ඒ අවබෝධයේ තියෙන වටිනාකම. අනිත් එක තමයි මේ අවබෝධය තව කෙනෙකුට අත්දකින්න පුලුවන් එකක් නෙ.

දැන් අපි ගත්තොත් ලෝකෙ එක එක මිනිස්සු පර්යේෂණ කරලා මොනව හරි කරල, තර්ක කරල ගොඩනගල මොනව හරි ඉදිරිපත් කරනව කියමුකො. එතකොට ඒ ඉදිරිපත් කිරීම කරන කොට ඒ ඉදිරිපත් කරපු දේ අපට තියෙන්නෙ දැනුමක් හැටියට ගන්න විතරයි.

දැන් බුදුරජාණන් වහන්සේ ආර්යෂ්ඨාංගික මාර්ගය ඉදිරිපත් කළාට පස්සේ ඒක කෙනෙක් ප්‍රගුණ කළා ම එයාටත් ඒ විදිහට ම නිකෙලෙස් වෙන්න පුළුවන් නම්, නිවන කරා යනව නම් ඒක සාමාන්‍ය දැනුම ඉක්මවා ගිය එකක් නේද?

## කරුණු පහක් ඉක්මවා ගියා....

බුදුරජාණන් වහන්සේ දේශනා කරපු ධර්මය කරුණු පහක් ඉක්මවා ගිය එකක්. ලෝකයේ සාමාන්‍යයෙන් දැනුම කියන එක එකිනෙකා ගණුදෙනු කරන්නේ කරුණු පහක් ඔස්සේ. **සද්ධා, රුචි, අනුස්සව, ආකාර පරිවිතක්ක, දිට්ඨි නිජ්ඣානක්ඛන්ති.** මේ පහෙන් තමයි ලෝකයේ දැනුම තියෙන්නෙ. දැන් බලන්න බුදුරජාණන් වහන්සේ මේක ප්‍රකාශ නො කරන්න අපි දන්නෙ නෑනෙ.

ඒකෙ තේරුම තමයි ලෝකයේ මනුෂ්‍යයා තුළ දැනුම තියෙන්නෙ එක්කො ශ්‍රද්ධාව මත. ශ්‍රද්ධාව කිව්වෙ පැහැදීම මත. එක්කො කැමත්ත

මත. එක්කො අහපු දෙයක් මත. එක්කො තර්ක කර කර ගැලපීම මත, එක්කෝ මතවාද වශයෙන් බැස ගැනීම මත. බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ මේ පහ ඉක්මවා ගිය එකක්. ඒකට කියන්නේ **(සච්ඡිකාතබ්බා)** සාක්ෂාත් කළ යුතුයි. අත්දැකිය යුතුයි. ඊට පස්සේ ඒක තමාගේ දෙයක්. ඒකනේ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයන් වෙන කාටවත් අනිත් පැත්තට හරවන්න බැරි. හරියට ධර්ම මාර්ගයේ ගියා නම් ශ්‍රාවකයෙක් හරවන්න බෑ. ලෝකෙ කාටවත් ඒ අවබෝධය වෙනස් කරන්න බෑ. ඒ අවබෝධයට අභියෝග කරන්න බෑ. ශ්‍රාවකයා තුළ එහෙම නම් ශාස්තෘන් වහන්සේ ගැන කවර කතා ද?

## අවබෝධයෙන් ම හැසිරුනා...

එතකොට ඒ බුදුරජාණන් වහන්සේගේ අවබෝධයෙන් යුක්ත හැසිරීම, විජ්ජා චරණ සම්පන්න බව ගැන පහදින්න ඕනෙ. ඊළඟට උන්වහන්සේ සුගත. මනා ගමනක් වැඩියා. ඒ තමයි ආර්ය අෂ්ඨාංගික මාර්ගය. ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ගමන් කරල සුන්දර නිවනට වැඩියා. ආර්ය අෂ්ඨාංගික මාර්ගයට උන්වහන්සේ නමක් පාවිච්චි කළා **(මජ්ඣිමා පටිපදා)** මධ්‍යම ප්‍රතිපදාව.

## අපිත් දැන් මධ්‍යම ප්‍රතිපදාවේ යන අය...

අපේ අයත් කියනව දැන් ඒක. 'අපි ඉතින් මධ්‍යම ප්‍රතිපදාවේ ඉන්නවා' කියනව. ඒ මොකක් ද ඒ කියන්නෙ. අපිට ලොකු සැපකුත් නැහැ. ලොකු දුකකුත් නැහැ කියල. නමුත් බුදුරජාණන් වහන්සේ අදහස් කළේ ඒක නෙවෙයි. උන්වහන්සේ මධ්‍යම ප්‍රතිපදාව කියන්නේ ආර්ය අෂ්ඨාංගික මාර්ගය. ඉතින් හරියට බැලුවොත් අපි මධ්‍යම ප්‍රතිපදාවෙ ඉන්නව කියල කියන්න පුළුවන් වෙන්නෙ මාර්ග ඵල ලාභීන්ට විතරයි. ඇයි ආර්ය අෂ්ඨාංගික මාර්ගය අනුගමනය කරන්නෙ ඒ මාර්ගයට පැමිණිච්ච අයනෙ. ඉතින් ඒ මාර්ගයෙ ගමන් කරල සුන්දර නිවනට පත්වුන නිසා උන්වහන්සේට සුගත කියල කියනව. බුද්ධ දේශනා හැම එකකම මේ ලක්ෂණ තියෙනව.

## ශාස්තෘන් වහන්සේගේ හැකියාව මනින්න බෑ..

ඊළඟට බුදුරජාණන් වහන්සේ ලෝකවිදූ. ලෝක ගැන උන්වහන්සේගේ අවබෝධය පුදුමෙනුත් පුදුමයි. බුදුරජාණන් වහන්සේ ගෙන් දවසක් ආනන්ද හාමුදුරුවො අහනව, "ස්වාමීනී, භාග්‍යවතුන්

වහන්ස, සිඛී බුදුරජාණන් වහන්සේගේ ශාසනයේ අභිභූ කියන ශ්‍රාවකයා මේ දහසක් ලෝක ධාතුවට ම ඇහෙන්න කථා කළා කියල අහල තියෙනව. ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, ශ්‍රාවකයෙකුට එහෙම පුලුවන් නම්, ශාස්තෘන් වහන්සේට කොච්චර පුළුවන් ද?" කියල. "ශාස්තෘන් වහන්සේට පුළුවන් දේ මිම්මකින් හොයන්න යන්න එපා. මිම් වලින් මනින්න බෑ."

ඇයි ඒ? බුද්ධ විෂය අචින්ත්‍ය නිසා. ආනන්ද හාමුදුරුවන්ට දැන් මේක ගැන අහගන්න තියෙන ආශාව වැඩියි. ආයෙමත් ඒක ඇහුව. ආයෙමත් ඇහුව. අහන කොට ආනන්ද හාමුදුරුවන්ට බුදුරජාණන් වහන්සේ හරි ලස්සනට මේක විස්තර කරනව. "ආනන්දය, මේ සූර්යයා එළිය කරන ලෝකෙ වගේ ලෝක දාහකට කියනව සහස්සී ලෝක ධාතුව කියල. සහස්සී ලෝක දහසකට කියනවා චූලනිකා ලෝක ධාතු කියල. ඒ වගේ ඒවා දාහකට කියනව මහා සහස්සී ලෝක ධාතු කියල. තථාගයන් වහන්සේට පුළුවන් මේ ඔක්කොට ම ඇහෙන්න කථා කරන්න" "ස්වාමීනී මට තේරෙන්නෙ නෑ මේක කරන්නේ කොහොමද කියල" බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා ඉස්සෙල්ලාම උන්වහන්සේ ආලෝකය පතුරුවනවා. ඊට පස්සේ ස්වරයෙන් විඤ්ඤාණය යවනව කිව්ව. ශබ්දය යවනව කිව්ව. හරි පුදුමයි.

## සිත පහදවා ගැනීමේ ආනිසංසය...

ඉතින් බුදුරජාණන් වහන්සේ එහෙම දේශනා කළාම ආනන්ද හාමුදුරුවො කියනව "අනේ මට පුදුම සංතෝසයක් අද තියෙන්නෙ. ඇයි මම සරණ ගිය මාගේ ශාස්තෘවරයන් වහන්සේ මේ සා ආනුභාව සම්පන්න මහේශාක්‍ය වූ ශාස්තෘන් වහන්සේ නමක් නෙ" කියල කියන කොට එතන හිටිය තව හාමුදුරු කෙනෙක් උදායි කියල. උදායි හාමුදුරුවො කියනව "ඉතින් ඔහේට මොකද? ඔහේ ද එහෙම කරන්නෙ" කියල.

ඒ කාලෙත් එහෙම නම් මේ කාලෙ වගේ ම තමයි. ඔහේට මොකද කියල ඇහුව. ඔහේට වැඩක් නෑ, ශාස්තෘන් වහන්සේනෙ එහෙම කරන්නෙ කියල. ඔහේ මොකද ඔච්චර සතුටු වෙන්නෙ කියල. එතකොට බුදුරජාණන් වහන්සේ උදායී හාමුදුරුවන්ට කියනව "හා... හා... උදායි ඔහොම කියන්න එපා. ඔය පැහැදීම සුළු එකක් නෙවෙයි. ඔය පැහැදීමට පුළුවන් හත් වතාවක් සක්විති රජකම දෙන්න."

බලන්න බුදුරජාණන් වහන්සේ ඒ ක්ෂණයකින් ආනන්ද හාමුදුරුවන්ගේ සිතත් දැක්කා. ඒකෙ විපාකත් දැක්කා. ඒ වගේ ම

ඔය පැහැදීමට පුළුවන් කිව්ව දිව්‍ය ලෝකයේ ආත්ම භාව හතක් උපද්දවන්න. ඔය මොහොතට ඇතිවෙච්ච පැහැදීම. නමුත් එහෙම උපදින්නෙ නෑ. ආනන්දයන් මේ ජීවිතයේ දී ම රහත් වෙනව කිව්ව.

## විචිත්‍ර සිත...

එතකොට බලන්න බුදු රජාණන් වහන්සේ ගේ ශාස්තෲත්වය අපි මේ උඩින් පල්ලෙන් තේරුම් ගන්න හදන එකක් නෙවෙයි. උන්වහන්සේ ලෝක විදූ. දිව්‍ය ලෝක ගැන, බ්‍රහ්ම ලෝක ගැන, තිරිසන් අපාය ගැන, ප්‍රේත ලෝකය ගැන මුළු ලෝක ධාතුව ගැන දේශනා කොට වදාළා. තිරිසන් අපාය ගැන තියෙනව අපි හිතපු නැති පැත්තක්. උන්වහන්සේ දේශනා කළා "පින්වත් මහණෙනි, මට මේ බුදු ඇසින් බලද්දි, තිරිසන් ලෝකෙ තරම් අනේක වූ විචිත්‍ර වූ ලෝකයක් මං වෙන දකින්නෙ නෑ" කියනව. එතකොට තමා අපට මතක් වෙන්නෙ " හා... ඇත්ත නේන්නම්." තිරිසන් ලෝකය ඒ වගේ විචිත්‍ර එකක්නෙ. ඇයි එක එක පාට කොළ පාට සත්තු ඉන්නව, කහපාට සත්තු ඉන්නව, සුදු පාට සත්තු ඉන්නව, හොට තියෙන සත්තු ඉන්නව, කට තියෙන සත්තු ඉන්නව, හොම්බ තියෙන සත්තු ඉන්නව, දිව තියෙන සත්තු ඉන්නව, කකුල් තියෙන සත්තු ඉන්නව, කකුල් හතරෙ සත්තු ඉන්නව, කකුල් හයේ සත්තු ඉන්නව, කකුල් සියගාණක් තියෙන සත්තු ඉන්නව, කකුල් නැති සත්තු ඉන්නව, වරල් තියෙන සත්තු ඉන්නව. මොන තරම් විචිත්‍රයි ද?

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "පින්වත් මහණෙනි, මේ විචිත්‍රත්වය එකම දෙයක ඇති වෙච්ච විචිත්‍රත්වයක්. ඒ සිතේ ඇති වෙච්ච විචිත්‍රත්වය යි." කවුද මේක මේ විදිහට කිව්වෙ. කවුරුවත් දන්නෙ නෑ. හිතේ තමයි මේ විචිත්‍රත්වය නිර්මාණය වෙලා තියෙන්නෙ කියල. කොච්චර නම් අවබෝධයක් ද? ඒ නිසා හිත පහදවා ගන්න.

## අසිරිමත් පුරුෂේන්ද්‍රිය ඤාණ...

ඊළඟට උන්වහන්සේ අනුත්තරෝ පුරිස දම්ම සාරථී. උන්වහන්සේට පුළුවන් දමනය කරන්න. හැබැයි පින් තියෙන කෙනාව තමයි. පච්කාරයන්ව නම් ඉතින් දමනය කරන්න බැහැ. දැන් අර දේවදත්ත ගැන එකතැනක තියෙනවා, බුදුරජාණන් වහන්සේ **අංගුත්තර නිකායේ පුරුෂේන්ද්‍රිය ඤාණ** කියන සූත්‍රයේ.

ආනන්ද හාමුදුරුවො අචිරවතී ගඟට නාන්න යනව. ගිහිල්ල ගඟෙන් එගොඩ වෙලා මේ අව්වට ඉන්නව ඇඟ වේලෙන කම්. එතකොට එක හාමුදුරු කෙනෙක් ඇවිල්ල ආනන්ද හාමුදුරුවන්ගෙන් අහනව, දැන් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශයක් කරල තියෙනව දේවදත්ත ස්ථිරව ම නිරයට යනව කියල. දේවදත්තව බේරගන්න පිළිවෙලක් නැතෙයි කියල. පිළියම් යොදන්න බැරිය කියල. කල්පයක් නිරයේ පැහෙනව කියනව. ඒක හැබෑවට ම කොහොමද එහෙම කිව්වෙ කියල. ආනන්ද හාමුදුරුවො කියනව, ඉතින් බුදුරජාණන් වහන්සේ එහෙම ප්‍රකාශ කළා නම්, ඒක එහෙම ම තමයි කියල.

## හඳුනාගන්න ඒ බුදුරජාණන් වහන්සේ...

ආනන්ද හාමුදුරුවො ඇවිල්ල බුදුරජාණන් වහන්සේට මේ සිද්ධිය කිව්ව. හරි ලස්සන කියමනක් බුදුරජාණන් වහන්සේගේ මුවින් පිටවෙනව. "ආනන්ද, එහෙමනම් ඔය භික්ෂුව අලුත මහණ වෙච්ච එක්කෙනෙක් වෙන්න ඇති නේද? වයසක එක්කෙනෙක් නම් බාල අව්‍යක්ත එක්කෙනෙක් වෙන්න ඇති නේද?" ඒ කිව්වෙ බුදුරජාණන් වහන්සේ හඳුනාගත්තු නැති එක්කෙනෙක් නේද කියන එකයි ඒකෙ තේරුම.

ඊට පස්සේ බුදුරජාණන් වහන්සේ වදාළා "මම දේවදත්ත ගැන තරම් වෙන කවුරුවත් ගැන විමසුවේ නෑ. එච්චර විමසල බැලුව මේ පුද්ගලයව බේරගන්න අශ්ව ලෝමයක අග තැවරෙන්න මට්ටමේ වත් කුසල් බිංදුවක් තියෙනවද කියල." එච්චරකුත් නැතෙයි කිව්ව. උපමාවක් වදාළා. පිරිසිදු මනුස්සයෙක් ඉන්නව. මේ මනුස්සයාට දකින්න ලැබෙනව මනුස්ස ප්‍රමාණයට වඩා වළක පිරී ඉතිරී තියෙන අසූචි ගොඩක අසූචි වලක්. මේ වැසිකිලි වලේ පුද්ගලයෙක් වැටිල ඉන්නව. ඉතින් අර එළියෙ ඉන්න මනුස්සයා එයා වටේට දුවනව මෙයාගේ එක කෙස් ගහක් හරි අසූචි තැවරිච්ච නැති තියෙනවද බලන්න. එහෙමවත් නෑ කිව්ව. ඒ වගේ කුසල් දශමයක් වත් නෑ කිව්ව.

ඊට පස්සේ බුදුරජාණන් වහන්සේ ආනන්ද හාමුදුරුවන්ට දේශනා කරනව "ආනන්දය, තථාගතයන් වහන්සේ ගේ පුරුෂේන්ද්‍රිය ඤාණ ගැන දන්නවද?" කියල. "අනේ ස්වාමීනී, දන්නෙ නැහැ." කිව්ව. පුරුෂේන්ද්‍රිය ඤාණය කියන්නේ මොකක්ද කියල අහගන්න කිව්ව.

## කුසල් මුල් තිබ්බොත්...

මේ ලෝකෙ ඉන්න මනුස්සයන්ගේ කුසල් අකුසල් දෙකම තියෙනව. මෙයා මොකද කරන්නෙ කලක් යනකොට මෙයාගේ හිතේ අකුසල් වැඩෙනවා. හැබැයි කුසල මුල් තියෙනව ඉතුරු වෙලා. කුසල මුල් නැසිල නෑ. අකුසල් වැඩුනට මෙයාට කල්‍යාණ මිත්‍ර සේවනය, යෝනිසෝ මනසිකාරය මේවා කුසල් කියල හඳුනාගන්න තරම් අර කුසලය ඉදිරිපත් වෙනවා. ඊට පස්සේ කලක් යනකොට අකුසල් යට ගිහිල්ල නැතිවෙලා කුසල් ඉස්මතුවෙන අය ලෝකේ ඉන්නව.

තව මනුස්සයෙක් ඉන්නව කුසල් අකුසල් දෙකම තියෙනව. කලක් යනකොට මෙයාගේ අකුසල් යටගිහිල්ල කුසල් මුල් ඇවිල්ල ඉස්සරහට. මෙයා පින් කරනවා, භාවනා කරනවා, දාන දෙනවා, නොයෙක් ආකාරයේ වැඩ කටයුතු කරනවා. හැබැයි අකුසල් මුල් ඇතුලෙ තියෙනව. අකුසල් මුල් ටික ඇතුලෙ වැඩකරනව. කලක් යන කොට අර කුසල් නැතිවෙලා අකුසල් ටික ඉස්මතු වෙලා ඇවිල්ල මෙයාව සම්පූර්ණයෙන් ම පිරිහෙනව. එහෙමත් මනුස්සයන් ලෝකයේ ඉන්නව කියනව.

## අකුසලයෙන් වෙලී යන ජීවිතය...

තව මනුස්සයෙක් ඉන්නව කුසල් අකුසල් දෙක ම තියෙනව. නමුත් කාලයක් යනකොට මෙන්න මෙයාගේ කුසල් කියල යම් කොටසක් තිබ්බද, අශ්ව ලෝමයකින් අග තවරල ගන්න පුලුවන් ආකාරයටවත් කුසල් බින්දුවක්වත් නැතිවෙලා යන මට්ටමට එනවා. සම්පූර්ණයෙන් ම අකුසලයෙන් වැහෙනව. එහෙම අයත් ලෝකයේ ඉන්නව. එතකොට මොකෙන්ද මේක කියන්නේ. උන්වහන්සේට තියෙන පුරුෂේන්ද්‍රිය ඥාණ වලින්.

ඊට පස්සේ බුදුරජාණන් වහන්සේගෙන් ඇහුවා ආනන්ද හාමුදුරුවො “ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, මේ විදිහට තවත් අය ඉන්නවද?” කියල. “ඉන්නව” කියල කිව්ව.

කුසල් අකුසල් දෙක ම තියෙන කෙනෙක් ඉන්නව. එයා අකුසල් මැඩගෙන කුසල් දියුණු කරන්න හදනවා. කාලෙකින් ඒ අකුසල් මර්දනය වෙලා කුසල් වැඩෙනව. එතකොට මේකෙන් පේනවා පුද්ගලයො දෙන්නෙක් අවිනිශ්චිතයි. මොකද ඒ අකුසල් මුල් යට තියෙන එක්කෙනා අවිනිශ්චිතයි. මොකද හේතුව? බිම බලාගෙන ඇවිද්දට, ලස්සනට

මිහිරි වචන කිව්වට හොයන්න බෑ. අකුසල මුල් කොයි වෙලාවෙ හරි නැගිටල ඇවිදිල්ල එයාගේ කුසල් වනසන්න පුලුවන්.

## අකුසල් තිබුනට ....

පිරිහෙන ස්වභාවයේ තව එක්කෙනක් ඉන්නවා. අකුසල් කර කර ඉන්නව. නමුත් එයාගේ ඇතුළෙ කුසල මුල් තියෙනව. අංගුලිමාල ඒ වගේ එක්කෙනෙක්. දැක්කනේ එයාට කුසල් මුල් තිබුන. ඒ වගේ අකුසල් තිබිච්ච අය හිටිය. අකුසල් තිබුන නමුත් කුසල් මුල් තිබුන. කුසල් මුල් නැතිවුනේ නෑ. ඒ නිසා ඒ අකුසල් සම්පූර්ණයෙන් ම ප්‍රහාණය කරල කුසල් වර්ධනය කරගන්න පුළුවන් වුනා.

## අකුසල් නැත්තට ම නැති කරනවා...

සමහර කෙනෙක් ඉන්නවා කුසල් අකුසල් දෙකෙන් ම ඉන්නව. කලක් යනකොට යම් අකුසල් ඇද්ද අශ්වලෝමයක අග තැවරෙන තරමේවත් අකුසල බිංදු මාත්‍රයක්වත් හොයාගන්න බරි තරමට අකුසල් ප්‍රහාණය කරනවා. කුසල් වර්ධනය කරනවා. එයා මේ ජීවිතයේ පිරිනිවන් පානවා. බුදුරජාණන් වහන්සේ අවබෝධ කරගත් ආකාරය.

## දඩයක් නිසා....

දවසක් උදේනි නගරයට බුදුරජාණන් වහන්සේ වඩිනවා ශ්‍රාවක පිරිසත් එක්ක. රජ්ජුරුවො නියෝගයක් නිකුත් කළා සියලුම රටවැසියන් බුදුරජාණන් වහන්සේ පිළිගන්න යන්න ඕනෙ. නො ගියොත් දාහක් දඩ. ආනන්ද හාමුදුරුවන්ගේ යාලුවෙකුත් ගියා. ආනන්ද හාමුදුරුවො දැකල කතා කරල,

'කොහොමද තිසරණයේ පිහිටල ද ඔයත් ඉන්නෙ'

'මට මොන තිසරණය ද? මට නෑ එහෙම එකක්'

'එහෙනම් ආවෙ මොකද?'

'මට දඩ ගෙවන්න බෑ'

'ඈ... ඒ මොකක් ද?'

'අපිට කලින් දැනුම් දීල තියෙන්නෙ නාවොත් දාහක් දඩ ගහනව කියල. අපිට මේ දඩ ගෙවන්න බැරි කමට ම යි ආවෙ'

ඉතින් ආනන්ද හාමුදුරුවෝ කල්පනා කළා අනේ මෙහෙමත් කරනවද රජවරු කියල. මේ නම්බුව ගන්නනෙ මේ කරන්නෙ.

## අද කාලෙත් එහෙම තමයි...

මටත් මේ මේවචර පිළිගැනීමේ උත්සව වලට දැන් කාලෙත් එහෙමයි. වාහන වලින් අරගෙන යන්නෙ නොමිලේ. දැන් කාලෙත් එහෙම තියෙනව නේද? බත් පාර්සලයක් දෙනව කිව්වම, මොනවද දෙනව වීදුරුවකට. එතකොට යනවනෙ පේන්න. එතකොට ලොකු සේනාවක් ඉන්නව වගේ.

ආනන්ද හාමුදුරුවන්ට හරි දුකයි. දැන් මෙයාගෙ යාලුවෙක් නෙ. ඉතින් බුදුරජාණන් වහන්සේට කියා හිටිය

"ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, මේ රජවරු කරල තියෙන දේවල්. දාහක් දඩ ගහලනෙ මේ මිනිස්සු කැඳවල තියෙන්නෙ. අනේ මගෙ යාලුවෙකුත් ඉන්නව. කිසි පැහැදීමක් නෑ. අනේ භාග්‍යවතුන් වහන්ස, මෙයාට ධර්මය අවබෝධ කරන්න පුළුවන් කියලයි මම හිතන්නෙ. මෙයා පැහැදුනොත් නම් ධර්මය අවබෝධ කරයි."

## මහා කරුණාවක මහිම...

බුදුරජාණන් වහන්සේ කුටියට වැඩිය. උන්වහන්සේ මෛත්‍රී සිත පැතිරෙව්ව එයාට. එළදෙන නැතිවෙච්ච වහු පැටිය කිරි බොන්න පිපාසයෙන් කෑ ගහගෙන දුවගෙන එනව වගේ මෙන්න සෙනඟ පීරගෙන තරුණයෙක් දුවනව 'බුදුරජාණන් වහන්සේ කෝ... මගේ ශාස්තෲන් වහන්සේ කෝ...' කිය කිය. එතකොට කෙනෙක් කිව්ව 'අන්න අර කුටියෙ ඉන්නවා. ගිහිල්ල දොරට තට්ටු කරන්න. උන්වහන්සේ දොර අරීවි' කියල.

එක පිම්මේ දුවගෙන ගියා. ගිහිල්ලා දොරට තට්ටු කළා. බුදුරජාණන් වහන්සේ දොර ඇරිය. මෙයා බිම පෙරළිලා මාගේ ශාස්තෲන් වහන්සේ ඔබ වහන්සේ කිය කියා වඳින්න පටන් ගත්ත. හොඳයි කියල බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කළා. එතනම සෝවාන් ඵලයට පත්වුනා. එතකොට බලන්න **අනුත්තරෝ පුරිස දම්ම සාරථී** සම්බුදු ගුණය. හරිම ආශ්චර්යය යි.

ඉතින් උන්වහන්සේගේ තොරතුරු දැනගන්නෙ මොකෙන්ද? මේ බුදුරජාණන් වහන්සේගේ ධර්මය තුළින්. නැත්නම් අපි ඕව කොහොමද දන්නෙ.

## මෙත් සිතින් ඇසුරු කරන්න...

උන්වහන්සේ දෙවි මිනිසුන්ගේ ශාස්තෘන් වහන්සේ. **සත්තා දේව මනුස්සානං.** උන්වහන්සේ අදටත් අපේ ශාස්තෘන් වහන්සේ වෙලා තියෙනවනෙ. ඉතින් අපි මතක තියාගන්න ඕනෙ අපි අපේ ශාස්තෘන් වහන්සේ ඇසුරු කරන්න ඕනෙ කොහොමද? මෛත්‍රී චිත්තයෙන් ද? වෛරී චිත්තයෙන් ද? මෛත්‍රී චිත්තයෙන් ඇසුරු කිරීම කියන්නෙ මේ ධර්මය අවබෝධ කරගන්න මහන්සි ගැනීම. එතකොට උන්වහන්සේගේ ශාස්තෘත්වය අංග සම්පූර්ණ එකක්. මාර්ගය පරිපූර්ණ වූ දෙයක්. ඒකෙ අපිට ආයෙමත් අලුතෙන් කෑලි දාන්න, කෑලි අස්කරන්න, සංස්කරණය කරන්න කිසිම දෙයක් නෑ. ඉතින් අපිට ඒක ගැන පැහැදීමක් තියෙන්න ඕනෙ.

## අවබෝධ කරවීම පිණිස දහම් දෙසුවා....

උන්වහන්සේ බුද්ධ. (**බුද්ධෝ සෝ භගවා බෝධාය ධම්මං දේසේති**) ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ බුද්ධ අවබෝධය පිණිස දහම් දෙසනවා. එහෙනම් අන් අයට ඒ ධර්මය දේශනා කළේ අන් අයට අවබෝධ කරවා දෙන්නයි. ඊළඟට උන්වහන්සේ ඒ සියලු ගුණයන්ගෙන් පරිපූර්ණයි, භාග්‍යවන්තයි. පින්වතුනි, අන්න ඒ ශාස්තෘන් වහන්සේව ගුණ වශයෙන් හඳුනාගෙන හිත පහදවා ගන්න ඕනෙ.

ඒ ශාස්තෘන් වහන්සේගේ ශාසනය තුළ අකුසල් ප්‍රහාණය කරගෙන කුසල් වර්ධනය කරගන්නා ශ්‍රාවකයෙක් වෙන්න ඕනෙ. අන්න ඒක තමයි පළවෙනි එක. එතන ඉඳල ඒ ශ්‍රද්ධාවට පැමිණිච්ච මොහොතෙ ඉඳල අපිට ධර්ම මාර්ගය විවෘත වෙනවා.

## අසිරිමත් සිරි සදහම් ගුණත් හඳුනාගන්න...

බුදුරජාණන් වහන්සේ දේශනා කරපු ධර්මය ලක්ෂණ හයකින් යුක්තයි. පළවෙනි එක තමයි **ස්වාක්ඛාත.** ඒ කිව්වෙ සම්මා සම්බුදු රජාණන් වහන්සේ නමකගේ දේශනා මනාකොට දේශනා කරල තියෙන්නෙ. ඒ දේශනා මිස වෙන මොනවද මනාකොට දේශනා කරල තියෙන්නෙ.

දවසක් උත්තර කියන ස්වාමීන් වහන්සේ නමක් එක්ක සක් දෙවිඳු ධර්ම සාකච්ඡාවක් කළා. ඒ කිව්වෙ සක් දෙවිඳුට උත්තර කියන රහතන් වහන්සේ දවසක් කියල දුන්න මේ මනුස්සයන් ස්ත්‍රී වේවා පුරුෂ වේවා ඕනෑම කෙනෙක් ජීවිතය ගැන හිතන්න ඕනෙ

පැත්තක් තමයි අපේ ජීවිතය අනිත්‍යය වූ දෙයක්. අනිත් එක මේ ඔක්කොම ගෙවිල යනව. අනිත් එක තමයි අපිට කර්මය තමයි දායාද කරගන්නෙ. ඊළඟ එක තමයි ප්‍රිය මනාප වූ යමක් ඇද්ද, ඒ සියලු දෙයින් අපිට වෙන්වෙන්නට සිද්ද වෙනව. මේවා කියනකොට සක් දෙවිඳුට මේක අවබෝධ වුනා. සක් දෙවියො අහනවා හරි ලස්සන කතාවක් නෙ ඔබවහන්සේ කිව්වෙ. ඕක ඔබවහන්සේගේ නුවණින් හිතල ද ඔය කිව්වෙ. නෑ... එහෙම එකක් නෙවෙයි. සක් දෙවිඳුනි, මේ ලෝකයේ යම්තාක් සුභාෂිත ඇද්ද ඒ සියල්ල භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ.

## ලොව යම්තාක් සුභාෂිත ඇත්ද....

ඊට පස්සේ මේ උත්තර රහතන් වහන්සේ සක්‍ර දෙවියන්ට උපමාවක් කියනව. යම්කිසි ප්‍රදේශයක ලොකු ධාන්‍ය කන්දක් තියෙනව. මිනිස්සු එක එක්කෙනාට ගෙනියන්න පුළුවන් තරමේ භාජන අරගෙන ඇවිත් ඒකෙන් ධාන්‍ය පුරෝගෙන අරගෙන එනවා. මිනිස්සු දැකල අහනව කොහෙන්ද ඔය ධාන්‍ය ගේන්නෙ කියල. එතකොට කියනව ඒ අය අන්න අතන තියෙනව ධාන්‍ය කන්දක්. මම ඒ කන්දෙන් තමයි මේවා අරගෙන එන්නෙ. මේ වගේ ලෝකෙ යම්තාක් සුභාෂිත වූ ධර්ම ඇද්ද ඒ සියල්ල බුදුරජාණන් වහන්සේගේ.

මෙන්න මේ අදහස අපි තුළ තියෙන්න ඕනෙ. එතකොට තමයි අපිට නිහතමානීව අපේ දෙයක් අපි අවබෝධ කරගෙන වගේ හුවා දක්වන්නෙ නැතුව ශ්‍රාවකයෙක් හැටියට පිහිටල සිටින්නට පුළුවන් වෙන්නෙ. එතකොට ඒකට උපකාර වෙනවා ධර්මය කෙරෙහි ඇති පැහැදීම. ධර්ම ගෞරවය.

## මේ ජීවිතයේ දී ම අවබෝධ කරන්න පුළුවන්...

ඒ ධර්මයේ තියෙන ඊළඟ ලක්ෂණය තමයි **සන්දිට්ඨික.** මේ ජීවිතයේ දී අවබෝධ කරන දෙයක්. පුරුෂේන්ද්‍රිය ඤාණ වලදී බුදුරජාණන් වහන්සේ විස්තර කරල තියෙනවා, මේ ලෝකයේ කෙනෙක් ඉන්නව කුසල් අකුසල් දෙකම තියෙනවා. මෙයා යම්කිසි වැඩපිළිවෙලක යෙදීම නිසා එයාගේ යම් අකුසල් ඇද්ද සියල්ල අශ්ව ලෝමයක අග නො තැවරෙන පරිද්දෙන් ප්‍රහාණය කළා නම් එයා පිරිනිවන් පානවා.

එතකොට එයා ඒ ඔක්කොම කරන්නෙ කොයි ලෝකයේ දී ද? මේ ලෝකෙදි. සෝවාන් වෙන්නෙ, සකදාගාමී වෙන්නෙ, අනාගාමී

වෙන්නෙ, අරහත් වෙන්නෙ මේ ලෝකයේ දී ම යි. පිරිනිවන් පාන්නෙත් මේ ලෝකයේ දී ම යි. මේ ධර්මය සන්දිට්ඨික යි.

ධර්මය සන්දිට්ඨික නැත්නම් කොටසක් එලොවට ගෙනියන්න ඕනෙ නෙ. මොලොව දී ම සියල්ල සාක්ෂාත් කරපු අය එක්කෙනෙක්ද හිටියෙ. ලෝකෙ ලක්ෂ ගණන් රහතන් වහන්සේලා හිටියනෙ.

ඒ ධර්මය **අකාලික** යි. ඒ ධර්මය කාලයකට වලංගු නෑ. දැන් බුදුරජාණන් වහන්සේගේ කාලෙ හිටපු මනුෂ්‍යයන් ම තමයි දැනුත් ඉන්නෙ. දැන් ඉන්න මිනිස්සු බුද්ධිමත් ද, නැද්ද? බුද්ධිමත්. හැබැයි ඒ කාලෙ මිනිස්සුන්ට යමක් තේරුම් ගැනීමේ දී ක්ෂණිකව නුවණ පාවිච්චි කිරීමේ කුසලතාවය තිබුන. මේ කාලෙ වෙනකොට ඊට වඩා අධර්ම රාගය තියෙනව. මිනිස්සු ඉන්නෙ කෙලෙස් අවුස්සගත්තු ගමන්. එහෙම වෙන්නෙ එන්න එන්න ම ආයුෂ අඩුවීමත් එක්කයි.

## නෙළුම් පොකුණ අදත් තියෙනවා...

නමුත් බුදුරජාණන් වහන්සේ දැකපු ලෝකය තාමත් තියෙනව. උන්වහන්සේ දැකපු ලෝකෙ තමයි නෙලුම් පිපිච්ච පොකුණක් වගේ කියල. එතකොට ඒ පොකුණෙ මෝරපු නෙලුම් පොහොට්ටු තියෙනවා අහම්බෙන් තියෙනව. එතකොට එහෙනම් අදත් ඒ අයට ධර්මය අවබෝධ කරන්න පුලුවන්. ඒ නිසා අපට ඒ අවබෝධ කරන එක්කෙනා මොන වගේ ද කියල පිටින් හොයන්න නම් පුලුවන් කියල හිතන්න අමාරුයි.

ඒ කියන්නේ සමහර විට පාඩම් හිටින්නෙ නැති එක්කෙනෙක් වෙන්න පුළුවන්. රූප ලස්සන නැති කෙනෙක් වෙන්න පුලුවන්. දක්ෂ නැති එක්කෙනෙක් වෙන්න පුළුවන්. නමුත් සමහර විට එයා තමයි අවබෝධ කරන එක්කෙනා.

## ගලපා බලන්නේ තමන්ටයි...

ඊළඟට මේ ධර්මයේ තියෙන ලක්ෂණය තමයි **ඒහිපස්සික.** ඒහිපස්සික කිව්වෙ ඇවිත් බලන්න. **ඕපනයික** කියන්නේ තමාගේ ජීවිතයට පෞද්ගලිකව පමුණුවාගන්න ඕනෙ. දැන් අපි සීලය ගත්තොත් ඕපනයික නැද්ද? යෝනිසෝ මනසිකාරය මේ ඔක්කොම තමන් තුළ ම ඇති කරගත්තොත් විතරනෙ ප්‍රතිඵල තියෙන්නෙ. එහෙම නැතුව සිල්වත් එක්කෙනෙකුගේ ඇගේ හේත්තු වෙලා හිටියට තමන් සිල්වත් වෙනවද? එහෙම වෙන්නෙ නෑනෙ. ඊළඟට කියනව මේ අපි

දැන් මහමෙව්නාවේ වැඩසටහන් දහයකට ආව. දැන් දහ අට වෙනි එකයි කියනවා. දැන් විස්සක් ආවයි කියනව. ඒ ආපු ගමනින් තමන්ට ධර්මාවබෝධ වෙනවද? ඒ එහෙම වුනා කියලනෙ කියන්නෙ. එහෙම වෙන්නෙ නෑ. අවබෝධ වෙන්නෙ තමන් යෝනිසෝ මනසිකාරයේ යෙදනව නම්, ඕපනයික වුනොත් විතරයි.

ධර්මය ඕපනයික වෙච්ච ගමන් **පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහී**. බුද්ධිමත් එක්කෙනා තමන්ගේ ම දෙයක් හැටියට ඒ ධර්මය ප්‍රත්‍යක්ෂ කරගන්නව. එතකොට මේ ධර්මය කෙරෙහි ගෞරවයෙන් ඇසුරු කරන්න ඕනෙ. අකුසල් ප්‍රහාණය කරන්න කැමති, කුසල් වර්ධනය කරගන්න කැමති, නුවණ තියෙන එක්කෙනා ඉතින් මේ මනුෂ්‍ය ජීවිතයේ දී එහෙම එකක් කරගත්තොත් නම් මට නම් වෙන මොකවත් ඕනෙ නෑ. ඔබට කොහොමද? ඒක තමයි අපිට ලබා ගන්න බැරිවෙච්ච දේ. මේ සංසාරෙ ඔයගොල්ලො ඔක්කොම ඔටුණු දාල ඇති. ඔටුන්නක් දාපු නැති එක්කෙනෙක් ඉන්න විදිහක් නෑ. සංසාරෙ ඔක්කොට ම වල්ගෙ තිබ්බිච්ච අවස්ථා ඇති. එහෙම තමයි මේක අවෙ. බඩගාගෙන යන්න ඇති. අපි සංසාරෙ හරියට වරල් වලින් පීනන්න ඇති.

ඒ වගේ ම අපි එදා වේල කන්න නැතිව හිඟා කකා ඉන්නත් ඇති. ඒ නිසා ඒ ඔක්කොම පහුකරගෙන ඇවිල්ල තියෙන්නෙ. ඒ නිසා අපට අමුතුවෙන් ලෞකික ලෝකෙ අමුතු දෙයක් ලබන්න නෑ. ලබා ගන්න ඕනෙ නම් මෙන්න ධර්මය. අකුසල් දුරු කිරීමත්, කුසල් වර්ධනය කරන්නත් තියෙන ධර්මය තමයි අල්ලගන්න තියෙන්නෙ.

## ඒ අසිරිමත් ශ්‍රාවක සංඝරත්නයත් හඳුනාගන්න...

ඊළඟට ආර්ය සංඝයා කෙරෙහි ගෞරවයෙන් වාසය කිරීම. හොඳට මතක තියාගන්න ආර්ය සංඝයා පිළිබඳව ගොඩක් අයට මතක් වෙන්නේ එච්චර පළල් අර්ථයෙන් නෙවෙයි. දැන් සමහර විට හාමුදුරුවරු එක නමක්, දෙනමක්, තුන්නමක් එක්කො විසි තිස් නමක්, එක්කො සියක් නමක් දැකල පහදිනව. ඒක නෙමෙයි මේ කියන්නෙ. දැන් බුදුරජාණන් වහන්සේ ගේ ධර්මය තුළ **සුපටිපන්නෝ, උජුපටිපන්නෝ ...** ආදී වශයෙන් විස්තර කරන්නෙ සෝවාන්, සකදාගාමී, අනාගාමී, අරහත් කියන මාර්ගඵල ලාභී ශ්‍රාවකයා. මේ ශ්‍රාවකයන්ගෙ රහතන් වහන්සේලා කී නමක් මේ බුද්ධ ශාසනයේ පහළ වුනා ද කියල අපිට ගණන් කරන්න පුළුවන්ද? බෑනෙ. ඒ සියලු දෙනා ශ්‍රාවක සංඝයා. අනාගාමී වෙච්ච පිරිස කීයක් ද කියල අපිට ගණන් කරන්න පුළුවන් ද? සකදාගාමී වෙච්ච පිරිස, සෝවාන් වෙච්ච පිරිස මෙතෙකැයි කියල අපිට කියන්න පුළුවන් ද?

## නො වෙනස් ගුණ සමුදාය...

එහෙම නම් අපිට ශ්‍රාවක සංඝයා කිවුවහම බුදුරජාණන් වහන්සේ ගේ පැවිදි ශ්‍රාවකයන් වහන්සේලා අතර මෙච්චරයි කියල කියන්න බෑ. එච්චර ප්‍රමාණයක් මේ ධර්මය අවබෝධ කළා. ඒ සියලු ශ්‍රාවක පිරිස තුළ තිබුන එකම ස්වරූපයේ ගති ලක්ෂණ. ඒ තමයි **සුපටිපන්න, උජුපටිපන්න, ඤායපටිපන්න, සාමීචිපටින්න.** ඒවා වෙනස් වෙන්නෙ නෑ. ඒ නිසා උන්වහන්සේලා කෙරෙහි සිත පහදවා ගන්නවා. එයා තමයි කුසල් වඩන, අකුසල් නසන එක්කෙනා.

ඊට පස්සේ බුදුරජාණන් වහන්සේ ශික්ෂා පද පෙන්වනවා. උපසම්පදා ස්වාමීන් වහන්සේලාට පෙන්වා දෙනව ප්‍රාතිමෝක්ෂ සංවර සීලය. සාමණේර ස්වාමීන් වහන්සේලාට පෙන්වා දෙනව දස ශික්ෂා පද. ගිහි අයට පෙන්වා දෙනවා අෂ්ඨාංග උපෝසථ සීලය, පංච ශීලය. මේ ශික්ෂා පද කෙරෙහි ගෞරවයක් තියෙන්න ඕනෙ.

## සිල්පද නො කඩා දියුණු වෙන්න පුළුවන් ද?

අපි කිව්වොත් එහෙම නෑ. "මේ කාලෙ සිල් පද කඩාගන්නෙ නැතිව ඉන්න බෑ. පොඩ්ඩක් සිල් පද කැඩුනාම මොකද වෙන්නෙ. දැන් කාලෙ සිල් පද කඩාගන්නෙ නැතිව දියුණු වෙන්න බෑ." එහෙම කියන අය ඉන්නවා. එතකොට තේරෙනවා මේ බෞද්ධ නාමයෙන්, බෞද්ධ වේශයෙන් ඉන්න පිරිසක් ඉන්නවා. ඒ අය විවිධාකාර චිත්‍ර මවනවා මේ ධර්මයට එන්න බැරි වෙන්න. ඒ ගොල්ලො කියනවා ලෞකික ජීවිතය ගත කරනව නම් සාර්ථක වෙනව නම්, සාර්ථක වෙන්නෙ ධර්මයට ආවොත් නෙමෙයි. ධර්මයට නැව්ල්ල හිටියොත්. අනිත්‍ය ගැන මෙනෙහි කරන්න ගියොත්, සිල් පද රකින්න ගියොත් ලෞකික ජීවිතය සාර්ථක වෙන්නෙ නෑ. ඔය සිල් පද රකිනව නම් ලෞකික ජීවිතය අතහරින්න. ඔහොම කතා කරන අය තමයි ඉන්නෙ.

## සීලය හරියට ම තේරුම් ගන්න.

ඊළඟ එක තමයි සීලය කියන්නෙ මොකක්ද කියල හරියට තේරෙන්නෙ නෑ. ඒ නිසා හොඳට මතක තියාගන්න. අපි හරියට තේරුම් ගන්න ඕනෙ පංච ශීලය, අෂ්ඨාංග උපෝසථ සීලය. දැන් ගිහි ජීවිත ගතකරන කෙනා සෙන්ට්, පවුඩර් එහෙම පාවිච්ච කරන්නෙ නැත්තෙ, නැටුම්, ගැයුම්, වැයුම් නැත්තෙ, උච්චාසයන - මහාසයන නැත්තෙ, විකාල භෝජනය නැත්තෙ, බ්‍රහ්මචාරී වෙන්නෙ උපෝසථ

දවසට. ගිහි ජීවිතය ගත කරන කෙනා අනිත් දවස් වලට පංච ශීලයෙන් යුක්තව පංච ශීලය ආරක්ෂා කරගෙන සදාචාර සම්පන්නව, උසස් මනසකින් යුක්තව ප්‍රඥාවන්ත ගිහි කෙනෙක් වගේ ඉන්නවා.

එතකොට ඒ කෙනා බණ භාවනා කරගෙන යන කොට ධර්මයේ හැසිරෙන කොට මේ සමාජය කැමති එයාව නිකම් තටු හැලිල දාල වගේ තියෙන්න. ඔන්න ලස්සනට ඇඳගෙන ගියොත් "ආ.... මේ ඔයා භාවනා වැඩසටහන් වලට යන එක්කෙනෙක් නේද?" බැරිවෙලාවත් එයා නියපොතු ටිකක් එහෙම පාට කරල ඔය තොල් පාට කරල මඟුල් ගෙදරක එහෙම ගියොත් "ආ... ඔයා එදා අසුභ භාවනාව කරන තැන හිටිය නේද?" ඒ මොකක්ද ඒ කියන්නෙ. උඹ ඕව හෝදපන්. උඹ හිටපන් අර තෙම්ච්ච කිකිලියක් වගේ. ඒ මොකද? මේ හිතේ තියෙන්නේ මොකක් ද? ඊර්ෂ්‍යාව. ඒ ඊර්ෂ්‍යාවට අහුවෙන්න හොඳ නෑ.

## ඇයි දැන් සතුටෙන් ඉන්නේ...

මම නම් කියන්නෙ පංච ශීලය එයා ආරක්ෂා කරන ගමන් ලස්සනට ඉන්න ඕනෙ. එයා අවංකව ඉන්න ඕනෙ. සෘජුව ඉන්න ඕනෙ. ලස්සනට එයාගේ වැඩ කරන්න ඕනෙ. එතකොට අනිත් එක්කෙනා අහනව "ඔයා ඉස්සරට වඩා සතුටෙන් ඉන්නෙ ඇයි?" අන්න එතන විතරයි අර්ථය තියෙන්නෙ. නැත්නම් නියපොතු පාට කළා කියල, කොණ්ඩෙ කැරළි ගැස්සුව කියල, ලස්සන ඇඳුම් ඇන්ඳ කියල, ඇඳුමට බෝඩර් වැටුන කියල අර්ථය හිටිනව ද? අර්ථය නෑ. අර්ථය තියෙන්නෙ ඇඳුම එක්ක නෙවෙයි. ජීවිතාවබෝධයත් එක්කයි.

## සිල්පද මුල් කරගෙන අනුන්ව හෙලා දකින්න එපා...

ඉතින් එතෙන්ට එන්න ශික්ෂා පද ආරක්ෂා කිරීමෙන්. ශික්ෂා පද කෙරෙහි ගෞරවය ඇති කරගන්නව. හොඳට මතක තියාගන්න ශික්ෂා පද කෙරෙහි ගෞරව තියෙන එක්කෙනා සීලය නිසා තමන් උසස් කරගන්නෙත් නෑ, අනුන් පහත් කරල හෙලා දකින්නෙත් නෑ. සීලය නිසා තමුන් උසස් කරල, අනුන්ව පහත් කරල හෙලා දකිනව නම් එයා සිල්පදයේ අර්ථය දන්නෙ නෑ. සිල් පද තියෙන්නෙ ඒකට නෙවෙයි. ලෝකෙන් ලකුණු ගන්න නෙවෙයි. තමන්ගේ ධර්ම මාර්ගයට යි. එතකොට ශික්ෂා පද කෙරෙහි ගෞරවයෙන් ඉන්න කෙනා අකුසල් ප්‍රහාණය කරනව, කුසල් වර්ධනය කරනව.

## සමාධිය විශ්වාස කරන්න....

ඊළඟට සමාධිය. දැන් අපි කියමු අපි ඔක්කොට ම සමාධියක්

නෑ කියල. කාටවත් සමාධියක් නෑ. බුදුරජාණන් වහන්සේගේ ධර්මයේ තියෙනව සීල - සමාධි - ප්‍රඥා. සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි කියල මාර්ගාංග තියෙනව. නමුත් අපි ඔක්කොට ම සමාධිය නෑ කියල අපි කිව්වොත් 'නෑ සමාධියක් ඕනෙ නෑ' කියල ඒක හරි ද? සම්පූර්ණයෙන් ම වැරදියි.

සමාධියක් නෑ කියල සමාධියට තියෙන ගෞරවය නැතිවෙන්න ඕනෙ නෑ. සමාධියට ගෞරව කරන්න ඕනෙ. සමාධිය මේ ධර්ම මාර්ගයේ අංගයක් හැටියට තියෙන බවට තමාගේ හිතේ පැහැදීමක් තියෙන්න ඕනෙ. එතකොට කෙනෙක් සමාධියක් වඩනවා නම් ඒ සමාධිය වඩන එක්කෙනා කෙරෙහි, එයාගේ හිතේ පැහැදීමක් ඇතිවෙනව.

## භාවනාව පේන්න බැරි අයත් ඉන්නවා...

එහෙම වුනේ නැත්නම් සමාධියක් ඕනෙ නෑ කියල සමාධිය වඩන කෙනාටවත් සමාධිය වඩන්න දෙන්නෙ නෑ. භාවනා කර කර ඉන්නව නම් එයාව රුස්සන්නෙ නෑ. ඇස් වහගෙන වාඩිවෙලා ඉන්නව දකින කොට රුස්සන්නෙ නැති අය ඉන්නව. එයා හයියෙන් අතුගාන්න පටන් ගන්නව. එක්කො කතා කරනව. සද්දෙ ඇහෙන්න සෙරප්පු දෙක දාගෙන එනව. දැන් අරය බලාගෙන යනව භාවනා කරන කෙනා ඇස් අරිනවද කියල. එයා ඇස් අරින්නේ නැත්නම් හයියෙන් කථා කරනවා. ඒත් ඇස් අරින්නේ නැත්නම් ළඟට ගිහිල්ල හොල්ලනව. ඇස් ඇරියම "කෝ සීනි බෝතලේ කෝ" කියල අහනව. දැන් එයාගේ ඉලක්කය සීනි බෝතලේ ද? නෑ. ඉලක්කය භාවනාවෙන් දුරු කරන එක. සීනි බෝතලේ තියෙන තැන එයා දන්නව. එහෙම කියන්නේ එයාට වේදනාවක් තියෙනව.

නමුත් ධර්මයේ හැසිරෙන කෙනා එහෙම නෙවෙයි. භාවනා කරනව නම් ඒකට සහයෝගය දෙනව. නිශ්ශබ්ද වෙනව. සද්ද කරන්නෙ නෑ. අනිත් අයට ශබ්ද කරන්න එපා කියනව. ඒක තමා සමාධියට ගෞරවයක් ඇති වෙන දේවල්. ඒ වගේ සමාධිය කෙරෙහි ගෞරවය ඇති වෙන දේවල් කරනව. සමාධිය හෙලා දකින්නෙ නෑ. එතකොට ඒ සමාධි ගෞරවය.

## අප්‍රමාදය කියන්නෙ කැපවීමට...

ඊළඟට අප්‍රමාදය. අප්‍රමාදය කියන්නේ කැපවීම. එහෙම නම් මතක තියා ගන්න ආර්ය අෂ්ටාංගික මාර්ගයේ දියුණුව සම්පූර්ණයෙන් ම තියෙන්නේ කැපවීම මතයි. ඔබ දැන් යම්කිසි ධර්මඥානයක් ලැබුව

නම් ඒ කැපවීම මත නෙවෙයි ද? ඔබ සීලයක රැඳිල ඉන්නව නම් කැපවීම මත නෙවෙයිද? ඇයි ඕනෙ තරම් එන්න පුලුවන් මේ සිල්පද වල අගෞරව ඇතිවෙන විදිහේ දේවල්. නමුත් ඒවයින් ඔබ මගඇරල ඉන්නව නම් ඒ කැපවීම නිසා නෙවෙයි ද?

## පොඩි හරි දියුණුවක් තියෙනව නම් ඒ කැපවීම නිසා...

ඔබ පොඩ්ඩක් හරි සමාධියක් උපදවා ගන්නව නම් ඒ කැපවීම මත නේද? ඔබ අකුසල් ප්‍රහාණය කරනව නම්, ඒ කැපවීම මත. කුසල් වඩනව නම් ඒ කැපවීම මත. තව කෙනෙකුට උදව්වක් කරනවා නම් කැපවීම මත. බුදුරජාණන් වහන්සේ දේශනා කළා සමස්ථ ධර්මය ම තියෙන්නෙ එක වචනයක් මත කියල. ඒ තමයි අප්‍රමාදය.

අප්‍රමාදය කියන වචනයේ තේරුම එක පාරට ම හිතට එන්නෙ නෑ. පමා නොවීම කියන්නෙ කැපවීම. එයා ධර්මාවබෝධයට කැපවීම නැත්නම් එයා වෙන වෙන දේවල් වලට තමා ඒ කැපකිරීම කරන්නෙ.

## වැඩ නැත්නම් වැඩක් නෑ...

ඉතින් බුදුරජාණන් වහන්සේ වදාළා වෙන වෙන දේවල් වලට අපේ හිත යනව. එක්කො **(කම්මාරාමතා)** වැඩ වලට ආසකරනව. වැඩ නැත්නම් වැඩ මවනව. මොකක්වත් වැඩක් නැත්නම් එයා මොනව හරි වැඩක් මවනව. හොයාගන්නව. එහෙම එකක් නැද්ද? තියෙනවනෙ. වැඩක් නැත්නම් වහලෙත් තීන්ත ගායි. මෙයාට වැඩක් ඕනෙ. එතකොට වැඩට ඇලුම් කරනව. ඊට පස්සේ එයා කියනව කොහෙද මේ මට මොකුත් කරගන්න බෑනෙ. වැඩ... වැඩ.... වැඩ.... එතකොට එයා කැපවෙලා තියෙනන්නේ ධර්මය අවබෝධ කරන්න නෙවෙයි. වැඩට. ඒක ප්‍රමාදයට කාරණාවක්.

## මෙරිගෝ රවුමේ රවුමක් යමුද?

ඊළඟට බුදුරජාණන් වහන්සේ දේශනා කරනව කතාව, කයිවාරුව. අන්න ඒකට අහුවුනොත් ඊට පස්සේ එයාට මොකද වෙන්නේ? කැරකි කැරකි ඒකට ම තමයි යෙදෙන්නෙ. ඒකෙම තමයි කැරකි කැරකි ඉන්නෙ. එතනින් එයාට ගැලවෙන්න බෑ. හරියට මෙරිගෝ රවුමෙ නැග්ග වගේ. නවතිනකම් බහින්න බෑනෙ.

සමහරු මට ඇවිල්ල කියනව, "අනේ ස්වාමීනී, මට ඕක තමයි තියෙන ප්‍රශ්නෙ. මේ කථා වලට අහුවුනාට පස්සේ ගැලවෙන්න බෑ.

හරියට සම්ප්‍රප්ඵලාප වලට අහුවෙනව.” ඉතින් කරන්න තියෙන දේ තමයි කට්ටිය කියද්දී ඒක නො කියා ඉන්න ඕනෙ. තමන්ගෙන් උත්තරයක් නැති නිසා අරයට ඕනෙ ටික කියල ඉක්මනට එයාගේ කථාව ඉවර වෙනව. එහෙනම් මම යන්නම් කියල යන්නයි තියෙන්නෙ.

එහෙම නැත්නම් අර මෙරිගෝ රවුමෙ නැග්ග වගේ තමයි. එයා රට ගැන කතා කරල කරල ගම් වටේ, ලෝකෙ වටේ, යුද්ධ හරහා ඔය නලු නිළි තේරීම් හරහා ගිහිල්ල එනකොට සෑහෙන්න කාලෙ ගිහිල්ල. අන්න ප්‍රමාදය.

## තනියම ඉන්න බෑ...

ඊළඟට **(සංඝනිකාරාමතා)** කාණ්ඩෙත් එක්ක එකට ඉන්න එක. ඒකෙන් සතුටු වෙනව. තනිවෙලා ඉන්න හිතෙන්නෙ ම නෑ. කවුරු හරි දැක්කද ඇදිල යනව. කාන්දම වගේ. ගිහිල්ල ඔන්න පටන්ගන්නව. කෙනෙක් තනිවම අතුගානව නම් මෙයත් යනව කොස්සක් හොයාගෙන. මෙයාට අතුගාන්න නෙවෙයි ඕනෙ. හේත්තු වෙලා ඉන්න.

හුදෙකලාව තමන් තනියම පොතක් බලාගෙන දහම් පොතක් බැලිල්ල, භාවනා කිරීම මේවා පුරුදු වෙන්න ඕනෙ. එතකොට තමයි ඒක හරියන්නෙ. එතකොට තමයි ඔන්න ටිකෙන් ටික අප්‍රමාදයට එන්නෙ. අන්න ‘මම කැපවුනේ නැත්නම්, මට මේකෙන් ගැලවෙන්න බෑ. ඒ නිසා මම කැපවෙන්න ඕනෙ’ කියන අදහස එනවා.

## වැරදි නිවැරදි කරගන්න...

ඊළඟට එයා ගෞරව කරන්න ඕනෙ දහම් පිළිසඳරට. ඒ කියන්නේ ධර්මය හැටියට කතා කරනව නම් ගෞතම බුදුරජාණන් වහන්සේ ගේ ධර්මය දැනගෙන තමයි අපි කතා කළ යුත්තේ. ඊළඟ එක තමයි ධර්මය නො දැන, ධර්මය ගැන ඔහේ මොකක් හරි අදහසක් ඉදිරිපත් කළා කියල, ධර්මය දන්නෙ නැතුව ඕක ඔහොම වුනාට මෙහෙමයි මෙහෙමයි කියල කිව්වා කියල ඔබ කිව්ව කියමු.

ඔබට බුද්ධ දේශනා හදාරාගෙන යද්දී අවබෝධ වුනොත් ඔබ කලින් හිටපු මතය වැරදියි කියල ඔබ මොකද කරන්න ඕනෙ. ඉක්මනට ම නිවැරදි කරන්න ඕනෙ මම එදා මෙහෙම කිවව. හැබැයි මං ඒක කිව්වෙ දන්නෙ නැතුව. මට බුදුරජාණන් වහන්සේ ගේ දේශනාවක් හම්බ වුනා ඕක එහෙම නෙවෙයි තියෙන්නෙ. අන්න ඒකයි දහම් පිළිසඳර.

## ඉලක්කය හඳුනා ගන්න දක්ෂ වෙමු...

එහෙම නැතිව තමන් ඒකෙදි අවතක්සේරුවට පත්වෙයිද, තමන්ව දැනුම නැති කෙනෙක් හැටියට සම්මත වෙයි ද කියල ඒව හොයන්න යන්න එපා. එතනදි නිවැරදි වෙච්ච ගමන් දිගට ම නිවැරදි වෙනව. ඒක තමයි ක්‍රමය. එතකොට බුදුරජාණන් වහන්සේ ගේ දේශනා තමන් හොඳට නුවණින් විමසල තේරුම් අරගෙන ඒ ඉලක්කෙ හොඳට හඳුනාගන්න ඕනෙ.

## ධම්ම කාමෝ භවං හෝතු...

මේ දහම් පිළිසඳරට ගෞරව කිරීමේ වටිනාකම ඒකයි. වාද විවාද කරන්න ධර්මය ඉගෙන ගන්නෙ නෑ. සමාජයෙන් නම්බුව ගන්න ධර්මය ඉගෙන ගන්නෙ නෑ. සමාජයේ ගෞරවය ලැබීම ඉලක්ක කරගෙන ධර්ම කථාවක් කරන්නෙ නෑ. වෙනත් ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා ආසාවෙන් ධර්ම සාකච්ඡාව කරන්නෙ නෑ. එයා ධර්ම සාකච්ඡාව කරන්නෙ ධර්මය අවබෝධ කරන්න කැමති පිරිසක් එක්කයි.

ඒ ධර්ම සාකච්ඡාව තමයි සැබෑම ධර්ම සාකච්ඡාව වෙන්නෙ. හැබෑම ධර්ම සාකච්ඡාවක සිදුවෙන දෙයක් තමයි ඒ ධර්ම සාකච්ඡාව ඉවර වෙනකොට සිහිය උපදිනව, නුවණ උපදිනව, වීර්යය උපදිනව. මේ ධර්මය අවබෝධ කරන්න ඕනෙ කියල ශ්‍රද්ධාව උපදිනව. වැරදුනොත් වෙන්නෙ පිල් බෙදෙන එක. වාද කරල සිත් වේදනා ඇතිකරගෙන හිත් අවුල් කරගන්නව. ඒ නිසා නියම ධර්ම සාකච්ඡාව තුළ මේ ධර්ම මාර්ගයට එයා වැටෙනව. ඒක තමයි බුදුරජාණන් වහන්සේගේ ධර්ම සාකච්ඡාවෙන් වෙන්න ඕනෙ.

## මේ ගමන නම් අනතුරුදායක ම යි...

එතකොට බලන්න කුසල් වර්ධනය කිරීමටත්, අකුසල් දුරු කර ගැනීමටත් මේ කරුණු හත ඉවහල් වෙන්නෙ නැද්ද? අනිවාර්යයෙන් ම මේ කරුණු හත තමයි ඉවහල් වෙන්නෙ. එතකොට අපි බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෝ හැටියට අපේ වාසනාවට බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය අපේ දෙසවන් අතරට ගියා. අපේ හිතට මේ ගමන අනතුරුදායකයි කියන පණිවුඩය ලැබුණා.

මේ අනතුර ඇතිවෙලා තියෙන්නෙ කවුරුත් නිසා නෙවෙයි. තමා තුළ ම පවතින අකුසල් නිසා. සක්කාය දිට්ඨිය ආදී සංයෝජන

නිසා. කෙලෙස් නිසා මේ අනතුර බිහි වෙලා තියෙන්නෙ. එතකොට මේක අපි තේරුම් ගත්තෙ නැද්ද? බුදුරජාණන් වහන්සේගේ ධර්මයෙන් තේරුම් ගත්තා මේක නම් අනතුරුදායක සංසාර ගමනක්. එතකොට අපිට අවශ්‍යතාවයක් ඇති වුනා මේකෙන් එතෙර වෙන විදිහේ මාර්ගයකට අපි බැසගන්න ඕනෙ කියල. එතකොට කෙලෙස් නිසා නම් මේ අනතුර තියෙන්නෙ, රැකවරණය තියෙන්නෙ කොහෙද? ඒ කෙලෙස් නැති තැන. එතකොට ඒ කරා යන්න තියෙන්නේ ආර්ය අෂ්ඨාංගික මාර්ගය. මේ කෙරෙහි අපේ හිත පැහැදුනේ නැද්ද?

## මිත්‍යා මත වලට නො රැවටෙන්න...

කෙනෙක් කිව්වොත් මෙහෙම. භාවනාව විතරක් කළා ම ඇති. වෙන මොකුත් ඕනෙ නෑ කියල හරිද? වැරදියි. කෙනෙක් කිව්වොත් නෑ බුදුරජාණන් වහන්සේගේ කාලෙ වාඩිවෙලා ඉන්දෙද්දි බණ අහල අවබෝධ කළේ. ඒ නිසා අපිත් ඒ විදිහට කරමු කිවුවොත් ඒක හරිද? වැරදියි.

අපි හිත පහදවා ගන්න ඕනෙ එහෙම නෙවෙයි. මේ සිත තුළ ඇති කෙලෙස් දුරුකිරීමටත්, හිත පිරිසිදු කරගැනීමටත් බුදුරජාණන් වහන්සේ දුකෙන් නිදහස් වෙන මාර්ගය හැටියට, ඒකායන මාර්ගය හැටියට, ඍජු මාර්ගය හැටියට පෙන්වා දුන්නේ ආර්ය අෂ්ඨාංගික මාර්ගය. ඒ මාර්ගයේ ගමන් කිරීමෙන් ම යි කියල. තමන් තමන්ගේ මාර්ගය අධිෂ්ඨාන කරන්න ඕනෙ.

ඒ මාර්ගයේ තමන් යන්න සිතෙන් කයෙන් වචනයෙන් අප්‍රමාදී වෙන්න ඕනෙ. සිතෙන් කයෙන් වචයෙන් කැපවෙන්න ඕනෙ. එතකොට ඒකට කොච්චර ලේසි ක්‍රම උන්වහන්සේ පෙන්වල දීල තියෙනව ද?

## සංවර වෙන්න ලේසි කොහොම ද?

හොඳට හිතල බලන්න. සිල්පදයක් ඔස්සේ සංවර වෙන එක ද ලේසි? සිල් මොකුත් නැතිව සංවර වෙන එකද ලේසි? සිල්පදයක් ඔස්සේ සංවර වෙන එක ලේසියි. දැන් බලන්න බුදුරජාණන් වහන්සේ කොච්චර ලස්සනට අපිට මේ මාර්ගය පෙන්වල තියෙනවද කියල. උන්වහන්සේ සිල් පද පැනෙව්වෙ නැත්නම් අපි දන්නෙ නෑ සංවර වෙන සීමාව. සිල් පද පණවපු නිසා සිල්පදය ඉක්මවා ගියොත් අපිට එකපාරට ම තේරෙනව මේ සිල්පදය මගේ අතින් කැඩුණ. ඊට පස්සේ ආයෙ හිතට අරගෙන සංවර වෙලා අයෙ එතෙන්ට අපි එනව.

එතකොට බලන්න මේ ආර්ය මාර්ගයට ම යි බුදුරජාණන් වහන්සේ වදාළ ශික්ෂා පද පවා තියෙන්නේ.

ඉතින් මේ නිසා පින්වතුනි අපි හොඳට තේරුම් ගන්න ඕනෙ සාරිපුත්ත මහරහතන් වහන්සේ බුදුරජාණන් වහන්සේ ඉදිරියේ බොහෝම ලස්සනට එහෙම දේශනා කළාට පස්සේ බුදුරජාණන් වහන්සේ ඒ කාරණය ඒ විදිහට ම අනුමත කළා. උන්වහන්සේ වදාළා සාරිපුත්ත ඔය ඇත්ත ම යි. යමෙක් ශාස්තෘන් වහන්සේට ගෞරවයක් නැතිව ධර්මයට ගෞරවයක් ඇතිව ඉන්නවා කියන එක කවදාවත් වෙන්න බෑ කිව්ව. යමෙක් ශාස්තෘන් වහන්සේට ගෞරවයක් නැත්නම් ධර්මයටත් එයා ගෞරවයක් නෑ.

## මේ කරුණු හත පිහිටුවා ගන්න...

ඊළඟට දේශනා කරනව යමෙක් ශාස්තෘන් වහන්සේටත් ගෞරවයක් නැතුව, ධර්මයටත් ගෞරවයක් නැතිව ආර්ය මහා සංඝයාට ගෞරව සහිතව වාසය කරනවා කියන එක කවදාවත් වෙන්න බෑ. යමෙක් ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරවයක් නැත්නම්, ධර්මය කෙරෙහි ගෞරවයක් නැත්නම්, ආර්ය මහා සංඝයා කෙරෙහිත් ගෞරවයක් නෑ.

යමෙක් ශාස්තෘන් වහන්සේටත් ගෞරවයක් නැතුව, ධර්මයටත් ගෞරවයක් නැතිව ආර්ය මහා සංඝයාටත් ගෞරවයක් නැතිව, සිල් පද වලට ගෞරව සහිතව වාසය කරනවා කියන එක කවදාවත් වෙන එකක් නෙවෙයි කිව්ව. යමෙක් ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරවයක් නැත්නම්, ධර්මය කෙරෙහි ගෞරවයක් නැත්නම්, ආර්ය මහා සංඝයා කෙරෙහි ගෞරවයක් නැත්නම්, එයා සීලයට කෙරෙහිත් ගෞරවයක් නෑ.

යමෙක් ශාස්තෘන් වහන්සේටත්, ශ්‍රී සද්ධර්මයටත්, ආර්ය මහා සංඝයාටත්, සීලයටත් ගෞරවයක් නැතිව ඉඳගෙන සමාධියකට ගෞරව දක්වාවි කියන කාරණය වෙන්න බෑ කිව්ව. එයා ඒ හතරට ගෞරවයක් නැත්නම් සමාධියටත් ගෞරවයක් නෑ.

යමෙක් ඒ ශාස්තෘන් වහන්සේටත්, ශ්‍රී සද්ධර්මයටත්, ආර්ය මහා සංඝයාටත්, සීලයටත්, සමාධියටත් ගෞරවයක් නැතිව ඉඳගෙන අප්‍රමාදයට ගෞරව දක්වාවි කියන කාරණය වෙන්න බෑ කිව්ව. එයා ඒකටත් ගෞරවය නෑ ම යි කියල කිව්ව.

යමෙක් ශාස්තෘන් වහන්සේට ගෞරවයක් නැතිව ඉඳගෙන, ධර්මයට ගෞරවයක් නැතිව ඉඳගෙන, ආර්ය ශ්‍රාවක සංඝයාට ගෞරව නැතිව ඉඳගෙන, ශික්ෂා පද වලට ගෞරව නැතිව ඉඳගෙන, සමාධියට ගෞරව නැතිව ඉඳගෙන, අප්‍රමාදයට ගෞරව නැතිව ඉඳගෙන ධර්ම සාකච්ඡාවට ගෞරව දක්වාවි කියන කාරණය කිසිසේත් ම වෙන්නෙ නෑ කිව්ව.

## මෙන්න ආරම්භය...

එතකොට අපිට පේනවා මේ ඔක්කොම ආරම්භ කරන්නේ ගෞතම බුදුරජාණන් වහන්සේව ශාස්තෘන් වහන්සේ හැටියට ගෞරවයෙන් පිළිගැනීම තුළ. එතන ඉඳල තමයි සියලුම දියුණුව ආරම්භ වෙන්නෙ. එහෙනම් අපට දැන් හිතන්න කරුණක් තියෙනව. මෛත්‍රී බුදු රජාණන් වහන්සේට හිත ගියේ මක් නිසාද? මේ හතෙන් තොර වීම නිසා. මෛත්‍රී බුදුරජාණන් වහන්සේ ළඟ නම් අපි හිත පිහිටුවාගෙන ඉන්නෙ අපි උන්වහන්සේ දේශනා කරපු ධර්මයකුත් නෑ තාම. උන්වහන්සේ සම්බුද්ධත්වයට පත් වෙලත් නෑ තාම. එහෙනම් අපට මේ සියල්ල අහිමි වෙනව නේද?

## මේ නිධානයේ සැබෑ හිමිකරුවා ඔබ විය හැක.

එතකොට බලන්න අපේ හිත එතෙන්ට යන්න නම් මෙතන අපිට අහිමි වෙන්න ඕනෙ. මෙතන අපි හිමිකරුවෙක් නම් වෙන කොහේවත් අපේ හිත පිහිටයි ද? නෑ. ගෞතම බුදුරජාණන් වහන්සේ ගේ ශාසනයේ ම හිත පිහිටනවා.

ඔබට ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරවයක් තියෙනවා නම්, ශ්‍රී සද්ධර්මය කෙරෙහි ගෞරවයක් තියෙනවා නම්, ආර්ය මහා සංඝරත්නය කෙරෙහි ගෞරවයක් තියෙනවා නම්, ශික්ෂා පද කෙරෙහි ගෞරවයක් තියෙනවා නම්, සමාධිය කෙරෙහි ගෞරවයක් තියෙනවා නම්, කැපවීම කෙරෙහි ගෞරවයක් තියෙනවා නම්, දහම් පිළිසඳර කෙරෙහි ගෞරවයක් තියෙනවා නම් ඔබ හිමිකාරයෙක්.

නූපන් අකුසල් උපදවා ගන්න ඔබ හිමිකාරයෙක්. අකුසල් පරදවා ජය ගන්න ඔබ හිමිකාරයෙක්. කුසල් උපදවා ගන්න ඔබ හිමිකාරයෙක්. ඒ සියල්ල තියෙන්නේ මේ හතට දක්වන ගෞරවය මත. ඔබේ කුසල් දියුණු වේවි. අකුසල් පිරිහිලා යාවි. හැබෑ හිමිකාරයෙක් වෙන්න.

# දුර්ලභ මොහොත අපතේ හැරගන්න එපා...

ඔබට ඉතා දුර්ලභ අවස්ථාවක් බුදුරජාණන් වහන්සේයි, සාරිපුත්ත මහරහතන් වහන්සේයි කතා කළ මේ උතුම් දේශනාවෙන් උදාවුනා. ඉතින් ඒ නිසා අපි මේ ගෞතම බුද්ධ ශාසනයේ දී ම අපගේ ධර්ම සේනාධිපති සාරිපුත්ත මහ රහතන් වහන්සේ හුදෙකලාව භාවනානුයෝගීව වැඩ ඉඳිමින් සිටිද්දි උන්වහන්සේගේ පාරිශුද්ධ සංතානයේ පහළ වුනු මේ අකුසල් ප්‍රහාණය කිරීම පිණිස, කුසල් දියුණු කර ගැනීම පිණිස ශ්‍රාවකයෙක් තුළ තිබිය යුතු ගෞරවනීය කරුණු හත අප තුල ද වහ වහා දියුණු කරගෙන, අපි ද මේ ගෞතම බුද්ධ ශාසනයේ දී ම උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කරගැනීමේ දුර්ලභ භාග්‍යයට හිමිකරුවෙක් බවට පත්වෙමු.

*සාදු ! සාදු!! සාදු !!!*

# අනාථ නොවී සනාථ වෙමු

## -පඨම නාථකරණ සූත්‍රය-

*ශ්‍රද්ධාවන්ත පින්වතුනි,*

දැන් අපි අංගුත්තර නිකායේ දේශනයක් ඉගෙන ගන්නේ. අපගේ ස්වාමී වූ ඒ භාග්‍යවත් අරහත් සම්බුදු රජාණන් වහන්සේ කරුණු දහයක් පිළිබඳව වදාළ දෙසුමක් **අංගුත්තර නිකායේ** තියෙනවා. මේ දේශනාවේ නම **පඨම නාථකරණ සූත්‍රය**. නාථ කියල කියන්නේ පිහිට, පිළිසරණ කියන එක යි. අනාථ කියන්නේ පිහිටක් පිළිසරණක් නෑ කියන එක. ඉතින් මේ පිහිට, පිළිසරණ ඇති කරන්නා වූ දේ ගැන වදාළ පළමු වන දෙසුම පඨම නාථකරණ සූත්‍රය.

## අපට පිළිසරණක් නැද්ද?

සාමාන්‍යයෙන් අපේ ජීවිතයේ ඇතිවන යම් යම් කරදර කම්කටොලු අර්බුද ප්‍රශ්න අබියස අපට හිතෙන්න පුළුවනි, “අපිට පිහිටක් නැද්ද? අපට පිළිසරණක් නැද්ද? අපට මුකුත් නැද්ද? යහපතක් උදාකරගන්න ක්‍රමයක් නැද්ද? අපට කවුරුත් නැද්ද උදව් කරන්න” ඔය වගේ අදහස් අපේ හිත් වලට එන අවස්ථා නැද්ද? තියෙනව.

සමහරු කියනවා මේ වර්තමානෙ, ‘බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පාලා. දැන් රහතන් වහන්සේලා දැකගන්ට නෑ. ඒ නිසා අපි

දැන් අනාථයි. නාවිකයෙක් නැති නෞකාවක් වගේ' කියල. නමුත් මේ නාථකරණ සූත්‍රය කියවන කොට ඔබට තේරෙයි අපි අනාථ නෑ. අපට සනාථ පිළිසරණක් තියෙන බවත්, පිහිටක් තියෙන බවත්, මේ ගෞතම බුදු සසුනෙන් පිහිටක් ලබා ගන්න පුළුවන් බවත් කියන කාරණය.

## අනාථ වුනොත් දුකෙන් ඉන්නට වෙනවා...

බුදුරජාණන් වහන්සේ කොයිතරම් පැහැදිලිව මේ කාරණය කියා දෙනවද කියල බලන්න. උන්වහන්සේ මේ දේශනය පටන් ගන්නේ මේ විදිහට යි.

"**(සනාථා භික්ඛවේ විහරථ)** පින්වත් මහණෙනි, පිළිසරණ සහිතව වාසය කරන්න. **(මා අනාථා)** අනාථ වෙලා ඉන්න එපා. **(දුක්ඛං භික්ඛවේ අනාථෝ විහරති)** පින්වත් මහණෙනි, අනාථ වෙච්ච කෙනා දුකෙන් වාසය කරනවා."

අනාථ වෙච්ච කෙනා දුකෙන් වාසය කරනවා නම් සනාථ වෙච්ච කෙනා සැපෙන් වාසය කරනවා. එහෙනම් අපට පේනවා බෞද්ධ ජනතාව අතර යමෙක් දුකෙන් වාසය කරනවා නම් එයා අනාථ වෙච්ච එක්කෙනෙක්. එයා සනාථ වෙච්ච එක්කෙනෙක් නෙමෙයි. නාථකරණ ධර්මයන් එයා තුළ තියෙනවා නම් කිසිදවසක අනාථ වෙන්නෙ නෑ. දැන් මේකෙන් අපට පේනවා බුදුරජාණන් වහන්සේ අපට මේ රැකවරණය සලසන්නේ ධර්මය තුළ ම යි.

## පළමු නාථකරණ ධර්මය
## සිල්වත් වීම

ඉතින් බුදුරජාණන් වහන්සේ විස්තර කරනවා පළමු වෙනි නාථකරණ ධර්මය. මොකක් ද මේ පළමු වෙනි රැකවරණය සළසන්නා වූ, පිළිසරණ ඇති කරදෙන ධර්මය? **(සීලවා හෝති)** සිල්වත් වීම.

මේක භික්ෂූන් වහන්සේලාට විශේෂයෙන් දේශනා කරල තියෙන්නේ. "**(පාතිමොක්ඛ සංවර සංවුතෝ විහරති)** ප්‍රාතිමෝක්ෂ සංවර සීලයෙන් යුක්තව වාසය කරනවා." **ප්‍රාතිමොක්ෂ සංවර ශීලය** කියල කියන්නේ මූලිකව ම පිහිටාධාර පිණිස පවතින ශීලය.

## නිවනට මුල් වෙන ශීලය...

ප්‍රාතිමෝක්ෂ සංවර ශීලයට තව වචනයක් තියෙනවා. ඒ තමයි

**ආදි බ්‍රහ්මචරියක ශීලය**. බ්‍රහ්මචරිය කියන්නේ නිවනට කියන නමක්. ආදි කියන්නේ මුල් වෙන. එතකොට යෙදෙන්නේ නිවනට මුල්වෙන ශීලය කියලයි. ආදි බ්‍රහ්මචරියක ශීලය කියන්නෙත් **ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය** කියන්නෙත් එක ම යි.

ඒකෙ තියෙනව ගිහි පිරිසගේ නිවනට මුල් වෙන ශීලය. ඒ කියන්නේ ප්‍රාණඝාතයෙන් වෙන් වෙලා ඉන්න ඕනෙ. සොරකමින් වෙන් වෙලා ඉන්න ඕනෙ. වැරදි කාම සේවනයෙන් වෙන් වෙලා ඉන්න ඕනෙ. බොරු කීමෙන් වෙන් වෙලා ඉන්න ඕනෙ. මත් පැන් මත් ද්‍රව්‍ය භාවිතයෙන් වෙන් වෙලා සිටින්න ඕනෙ. සාමාන්‍ය ජීවිතයේ දී ඒක එයාට උපකාර වෙනව. ඊට පස්සේ ගිහි කෙනාත් රහතන් වහන්සේ අනුගමනය කරමින් උපෝසථ ශීලයෙහි හික්මෙන්නට ඕනෙ. පැවිදි කෙනාට ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය ආරක්ෂා කරන්න තියෙනවා. පිරිසිදු බ්‍රහ්මචාරී බව, බඹසර කිලුටු වුනොත් ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය බිඳෙනවා.

## තල්ගහක කරටිය කැඩුනොත් මොකද වෙන්නෙ...

බුදුරජාණන් වහන්සේ ඒක පෙන්නල දෙන්නේ හරියට තල්ගහක කරටිය කැඩුණ වගේ කියලයි. තල්ගහක කරටිය කැඩුනොත් මොකද වෙන්නෙ? කිසි දවසක ආයෙ ඒක හැදෙන්නේ නෑ. ඉතින් භික්ෂුවක් පාරාජිකා වුනොත් බඹසර කිලුටු වීමෙන් එයාට ඒ සංවරයෙන් ඉඳගෙන කිසිදවසක නිවන් අවබෝධ කරගන්න බෑ. මොකද හේතුව? **පාරාජිකා** ආපත්තියකට පත් වුන ගමන් එයා ගිහියෙකුටත් වඩා පහළට වැටෙනවා. එතනදි ගිහියා ශ්‍රේෂ්ඨයි. තිසරණ පන්සිල් තියෙන ගිහි කෙනා ශ්‍රේෂ්ඨයි. මොකද අරයට තිසරණෙත් නෑ. සීලෙත් නෑ.

## සොරකමට අහුවුනොත්...

සොරකම නිසාත් එයාගේ ප්‍රාතිමෝක්ෂ සංවර සීලය බිඳෙනවා. සොරකම ගැන පෙන්වා දෙනවා, ඒ දඬුවම ලැබිය යුතු ආකාරය ගැන. රටින් පිටමන් කළ යුතු ආකාරය, සොරකමට සම්බන්ධ වීම නිසා සොරෙක් කියලා චෝදනා කළ යුතු ආකාරය සඳහන් වෙනවා. සොරකමට සම්බන්ධ වුනොත් එයාගේ ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය බිඳෙනවා. බිඳුණු ගමන් ම මහණකම නැතිවෙනවා. එතකොට ඒකට කියන්නේ මොකක් ද? පාරාජිකා වෙනව කියල.

ඊළඟට මනුෂ්‍ය ඝාතනයට සම්බන්ධ වුනොත්, නූපන් මිනිස්

කලලයේ ඉඳලා අවසානයේ මරණ ඇඳේ සිටින මනුෂ්‍යයා දක්වා මනුෂ්‍ය ඝාතනයකට සම්බන්ධ වුනොත් පාරාජිකා වෙනවා. මහණකම නැතිවෙනවා. ඉතින් බුදුරජාණන් වහන්සේ එක එක උපමා වලින් පෙන්වා දෙනවා. "පින්වත් මහණෙනි, ලොකු ගලක් දෙකට කැඩුනාම තිබ්ච්ච විදිහට ආයෙ හදන්න පුළුවන් ද? පැරණි වළඳක් කැඩුනම ඒක ආයෙ හදන්න පුළුවන් ද?" කියල අහනව. ඒ වගේ තමයි පාරාජිකා වුනා ම.

## නැති මාර්ග ඵල කීවොත් ඉවරයි...

ඊළඟට කියනවා මාර්ග ඵල නො ලබා ධ්‍යාන අභිඥාවන්ද මාර්ග ඵල තියෙනවා කියල බොරුවට පෙනී හිටියාමත් පාරාජිකා වෙනවා. දැන් ඔය කීවේ ප්‍රධාන ශික්ෂා පද හතරයි. ඒවාට කියන්නේ සතර පාරාජිකා කියල. එයින් එකකට පත්වෙච්ච ගමන් එයා භික්ෂුවක් නෙවෙයි. කවුරුහරි කෙනෙක් ඒකට සම්බන්ධ වුනොත් ඒ වෙලේ ඉඳලා තිබෙන්නේ වස්ත්‍රය විතරයි. තිසරණයත් නෑ, සීලෙත් නෑ. ඊට පස්සේ එයා ඒකෙන් පිරිසිදු වුනේ නැත්නම්, (**යථාභතං භික්ඛවේ ඒවං නිරයේ උප්පජ්ජති**) හරියට ඔසවා තබා ගත්තු බරක් බිම තබන්නේ යම් ආකාරයෙන් ද, අන්න ඒ වගේ නිරයේ උපදිනවා. එතකොට ඒකෙන් වැලකී සිටින්නට නම් හිරිඔතප් තියෙන්නට ඕනෙ.

දැන් ශීලය තියෙන්න නම් හිරිඔතප් තියෙන්න ඕනෙ. ඒ කියන්නේ පවට ලැජ්ජාව හා බය තියෙන්න ඕනෙ. "අපායට යන දේවල් මට නම් කරන්නට බෑ" කියල එයාට තියෙන්න ඕනෙ. ඒක ගිහි කෙනෙකුටත් තියෙන්න ඕනෙ, පැවිදි කෙනෙකුටත් තියෙන්න ඕනෙ. ප්‍රාතිමෝක්ෂ සංවර ශීලයෙන් යුතුව වාසය කරන කොට, ප්‍රධාන ශික්ෂා පද හතරක් තියෙනව.

## තවත් බරපතල සික්ෂා පද 13ක්...

තවත් තියෙනවා ඒ සමාන බර පතල නැතත් බර පතල ශික්ෂා පද දහ තුනක්. ඒ ශික්ෂා පදයක් බිඳුනොත්, කැඩුනොත්, ඒකට අදාළ සංඝයා බුදුරජාණන් වහන්සේ සම්මත කර තියෙනවා යම් යම් ක්‍රම තියෙනවා ඒ ආයති සංවරයේ පිහිටන්න. ඒ විදිහට ඒ පිළිවෙත් පුරල සංවර භාවයට පත් වෙන්න, පිරිසිදු වෙන්න පුළුවන්. ඒවාට කියන්නේ සංඝාදිසේස කියල. සංඝයා ඉදිරියේ යටහත් පහත්කම් දක්වලා සංඝයාගෙන් අවසර අරගෙන පිරිවෙස් මානත් ආදිය පුරල පිරිසිදු සංඝයා විසින් ආයිත් එයාව සංඝයාට ඇතුල් කරගන්නවා. ඒවාට

කියන්නේ (ඒ ආපත්ති වලට කියන්නේ) **සංඝාදිසේස.** එතකොට පාරාජිකා, සංඝාදිසේස බරපතල ආපත්ති.

තව තියෙනව ආපත්ති. ඒ තමයි නිස්සග්ගිය පාචිත්තිය කියල කියන්නෙ. සමහර වැරදි තියෙනවා ඒවායෙන් නිදහස් වෙන්න තියෙන්නේ ඒවා අත හැරීමෙන්. දැන් අපි ගත්තොත් මුදල් පරිහරණය අපි ගනිමු. පිරිසිදු උපසම්පදාවක් තියෙන භික්ෂුවක් මුදල් පරිහරණය කරන මොහොතක් පාසා නිස්සග්ගිය පාචිත්ති ආපත්තියක් සිද්ධ වෙනව. ඒකෙන් පිරිසිදු වෙන්න බෑ එයාට ඒක අත්හරින්නේ නැතිව. ඒක අත්හැරලා එයා ආපත්ති දේශනා කළහම පිරිසිදු වෙනව. මේ වගේ තියෙනවා නිස්සග්ගිය පාචිත්තිය.

## තුන් ලොවෙහි ම උතුම් ම සීලය...

බලන්න එතකොට බුදුරජාණන් වහන්සේ මේ හැම එකකින් ම වලක්වල තියෙන්නේ පව්දි වෙච්ච එක්කෙනා ධර්මයෙන් පිට යන එක වලක්වන්න. එතකොට මේ **නිස්සග්ගිය පාචිත්තිය** 30 ක් තියෙනව. ඊළඟට තව තියෙනවා **පචිති** කියලා. ඒත් වැරදි 92ක් තියෙනව. ඊළඟට තියෙනව **පාටිදේසනි** 4ක්. **අනියත** 2ක් තියෙනව. **සේඛියා** 75ක් තියෙනව. ඒ ශික්ෂා පද 220 ක් තියෙනව ප්‍රාතිමෝක්ෂ සංවර සීලයේ. ඊළඟට මේ අර්බුද හටගත්තාම (අර්බුදයට පාලියෙන් කියන වචනය අධිකරණ) ඒවා සමථයකට පත් කරන්න බුදුරජාණන් වහන්සේ පෙන්නලා දීල තියෙනවා **අධිකරණ සමථ** 7ක්. ඒකට කියනවා සප්ත අධිකරණ කියල.

## අධිකරණය වරද්දා ගැනීම...

දැන් ඔය අපේ රටේ ඒ අධිකරණ කියන වචනය පාවිච්චි වෙන්නේ ගොඩක් විට අර්ථ නො දැනයි. නියම වචනය වෙන්න ඕනෙ ඒක නෙවෙයි. දැන් අපි අධිකරණ ශාලාව, අධිකරණය කියල කියනව නේද? ඒකේ තේරුම අර්බුදය, අර්බුද ශාලාව කියන එකයි. ඒකේ නියම වචනය වෙන්න ඕනෙ අධිකරණ සමථ ශාලාව. අධිකරණ සමථය.

දැන් අපේ රටේ සමහර අවස්ථාවල නායක හාමුදුරුවරුන්ට නායකකම් දෙනවා අධිකරණනායක කියල. ඒ කියන්නේ අර්බුද උපදවන්නාගේ නායක. ඒ වචනේ වෙන්න ඕනෙ එහෙම නෙවෙයි. අධිකරන සමථ නායක. එතකොටයි නියම අර්ථය තියෙන්නේ.

## තවත් සික්ෂා පද...

අධිකරණ සමථ හතක් තියෙනව. එතකොට ශික්ෂා පද 227යි. මේ ශික්ෂා පද 227 සංවර කරන අතරේ **(ප්‍රාතිමෝක්ෂ සංවර සංවුතෝ විහරති)** ප්‍රාතිමෝක්ෂ ශික්ෂා පදවලින් සංවර වෙලා වාසය කරල **(ආචාර ගෝචර සම්පන්නෝ)** තව තියෙනව ශික්ෂා පද. ඒවාට කියන්නේ ආභිසමාචාරක ශික්ෂා පද කියල. ඇවැත් සාමාන්‍යයෙන් ඇවතුම් පැවැතුම් යහපත් වීමට උපකාර වන ශික්ෂා පද. ඒවායින් යුක්තව වාසය කරන කොට එයාට ඒක දියුණු කරන්න තියෙන්නේ කොහොමද? **(අණුමත්තේසු වජ්ජේසු භයදස්සාවී)** ඒ කිව්වෙ අනුමාත්‍ර වූ වරදෙහි පවා බිය දකිමින් **(සික්ඛති සික්ඛාපදේසු)** ශික්ෂා පදයන්හි හික්මෙනවා. ඒකයි සීලවා කියන එකේ තේරුම.

## එළවළුයි බතුයි තමයි මගේ සීලය...

සාමාන්‍යයෙන් කෙනෙකුට මේ එළවළුයි බතුයි වළඳනවා දැකලා 'ආ... සිල්වත් කෙනෙක් ආ... සිල්වත් කෙනෙක්' කියල ලෝකෙට පෙන්නුවට දැන් දැක්කනේ ශික්ෂා පද ටික. මේ ශික්ෂා පද ටික දැනගන්නකම් ම සිල්වත් කෙනා හොයන්න බෑ. දැන් බැරිද එළවලුයි බතුයි කමින් ඔය ශික්ෂා පද ටික කඩන්න. දැක්කනේ එතකොට එළවලුයි බතුයි හුවා දක්වන්න පුළුවන් දුසිල් කෙනා මගේ ශීලය මේකයි කියල.

දැන් මම ඒකයි මහමෙව්නාව ඒ ප්‍රතිපත්තියෙන් බැහැර කළේ. මේ යථාර්ථය ඉදිරියේ. නමුත් මුලදී වුනත් සමහරු ඒකට අකමැති වුනා දොස් කිව්වා. නමුත් ශික්ෂා පද දන්නේ අපිනේ. එතකොට මේ ශික්ෂා පද තමයි මේ පෙන්නුවේ.

දක්කනේ පැවිද්දෙක් සිල්වත් වෙන්නේ මොන මොන ශික්ෂා පද වලින් ද කියල. බ්‍රහ්මචාරී වීම පළවෙනි ශික්ෂා පදය. සොරකමට හසු නො වීම දෙවැනි ශික්ෂා පදය. මනුෂ්‍ය ඝාතනයකට හසු නො වීම තුන් වෙනි ශික්ෂා පදය. තමා තුළ නැති මාර්ග ඵල, ධ්‍යාන, අභිඥා ප්‍රකාශ නො කිරීම හතරවෙනි ශික්ෂා පදය යි.

## සාමණේර භික්ෂූන් ගේ සීලය...

මේවා වළකින්න ඕනෙ මහණකම රැකගන්න නම්. එළවලුයි බතුයි නෙවෙයි. එතකොට මෙන්න මහණකම රැකෙන සිල්පද ටික.

ඒවායින් තමයි භික්ෂුවගේ භික්ෂු ජීවිතය ආරක්ෂා වෙන්නේ. එතකොට ශික්ෂා පද කීයක් තියෙනවද උපසම්පදා භික්ෂුවකට. 227 ක් තියෙනව. සාමණේර කෙනෙකුට ශික්ෂා පද 10 ක් තියෙනව. ඒ දහයේ තියෙනව සතුන් මැරීමෙන් වැළකීම, සොරකමින් වැළකීම, අබ්‍රහ්මචාරී ජීවිතයෙන් වැළකීම, බොරු කීමෙන් වැළකීම, මත්පැන් - මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකීම.

මේ පහෙන් එකක් හරි කැඩුනොත් සාමණේර ශීලය නැතිවෙනව. එතකොට එකපාරට ම එයා ඊට අදාලව සංඝයාට දැනුම් දුන්නට පස්සේ ස්වාමීන් වහන්සේලා ඊට අදාළ සමහර ඒවා තියෙනවා දඬුවම් දීලා වැලි දඬුවම් වගේ වත් පිළිවෙත් කරන්න දීලා ඒ ශික්ෂා පදයේ හික්මෙන්නට ඕනෙ. ඇතැම් ඒවා තියෙනවා එයා අවවාදය අහන්නේ නැත්නම් බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා එයා බුදුරජාණන් වහන්සේට අගෞරව කරනවා නම්, ධර්මයට අගෞරව කරනවා නම්, සංඝයාට අගෞරව කරනවා නම්, තවත් වැරදි කීපයක් තියෙනව. ඒවා කරනවා නම් එයාව සිවුරු අරවලා යවන්න කියනව. ඒ මොකද? එයා සිටීමෙන් එයා තුළට සිද්ධවෙන හානිය පිටත් කළාට පස්සේ සිද්ධ වෙන්නේ නෑ. ඒකයි. සමහර ආපත්ති තියෙනවා ඒවාට දඬුවම් දීලා ආයිත් සිල් සමාදන් කරවන්න ඕනෙ. ඉතින් මේ වගේ නිවන් මගේ හික්මවන්නයි මේවා තියෙන්නේ.

## ගිහි අයටත් සිල් පද තියෙනවා...

එතකොට ගිහි ජීවිතේ ගත කරන කෙනෙකුටත් ශික්ෂා පද තියෙනවා. ඒවා කැඩුනොත් ඒ ගිහි කෙනා සික්ෂා පද සමාදන් වුනේ නැත්නම් එයා දුස්සීල කෙනෙක්. දැන් ගිහිකෙනෙක් තිසරණේ පිහිටලා පන්සිල් සමාදන් වෙලා මත් පැන් බීපු ගමන් එයාගේ පංච ශීලය කැඩෙනව. එයා එතකොට ආයිමත් ඒ ශික්ෂා පද ආරක්ෂා කරන්න ඕනෙ. එයින් වෙන් වෙන්නට ඕනෙ. ඒක කරන්න හොඳ නෑ.

ගිහි කෙනෙක් බොරු කීමෙන් වළකින්නට ඕනෙ. වැරදි කාම සේවනයෙන් වළකින්නට ඕනෙ. සමාදන් වුන ශික්ෂා පද කැඩුනාම එයාට පව් රැස්වෙනව. එතකොට පව් රැස් නොවී පිරිසිදු ශීලයකින් හික්මෙන්නට ඕනෙ. ඒක තමයි පළවෙනි නාථකරණ ධර්මය.

## බාහිර ලෝකෙන් පිළිසරණ හොයන්න එපා...

බලන්න කොයි තරම් පැහැදිලි ද කියල මේ ධර්මය. දැන් මේ

බාහිර ලෝකෙන් පිළිසරණ ඉල්ලීමක් ද මේකේ තියෙන්නේ. දැන් බලන්න කොච්චර වෙනස්ද කියල. තමන් ඒ ශික්ෂා පද මනාකොට ආරක්ෂා කිරීමෙන් ඒ පිළිසරණ ඇතිකර ගන්නේ. ඒක තමයි පළමු නාථකරණ ධර්මය. මේක කියන කොට ඔබට තේරෙනවා ඇති ලංකාවේ කී දෙනෙක් අනාථ ද සනාථ ද කියල.

එතකොට මේවායින් තමයි බුදු සසුන රකින්න තියෙන්නේ. වෙන කිසිම දේකින් බුදු සසුන රකින්න නම් බෑ. මොකද බුදු සසුන රකින්න සෑම බාහිර දෙයක් ම බලාගෙන ඉද්දී පුස්ස බින්ඳ වගේ නැතුව යනව. ඒකට හේතුව තමයි, බුදු සසුනේ පෙන්වා දෙනවා මේ ආරක්ෂිත පියවරවල්.

## මෙන්න නියම ව්‍යවස්ථාව...

දැන් මේ පඨම නාථකරණ සූත්‍රය. ඒකට හොඳම සාධකයක් මේක. බුදු සසුන රැකීමේ නියම ව්‍යවස්ථාව තමයි සිල්වත් වීම. හිරි ඔතප් දෙකින් යුතුව අනුමාත්‍ර වරදෙහි පවා බිය දකිමින් වාසය කිරීම.

## දෙවෙනි නාථකරණ ධර්මය
## බහුශ්‍රැත බව

දෙවැනි නාථකරණ ධර්මය **(බහුස්සුතෝ හෝති සුතධරෝ සුත සන්නිචයෝ)** එයා බහුශ්‍රැත යි. සුතධර යි. ඒ කියන්නේ බොහෝ ධර්මය ශ්‍රවණය කරල තියෙනව. සුතධරයි කියන්නේ ඒ ශ්‍රවණය කරපු ධර්මය දරාගෙන ඉන්නව. සන්නිචයෝ කියන්නේ රැස් කරනවා. ශ්‍රවණය කරපු දහම් කරුණු රැස් කරනවා.

## ධර්මය නිවැරදිව හඳුනාගන්න ඕනෙ..

**(යේ තේ ධම්මා ආදි කළ්‍යාණා, මජ්ඣේ කළ්‍යාණා, පරියෝසාන කළ්‍යාණා සාත්ථං සබ්‍යඤ්ජනං කේවළ පරිපුණ්ණං පරිශුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති තථාරූපස්ස ධම්මා ආදි කළ්‍යාණා)** ඒ ධර්මය මුල, මැද, අග යහපත්, සුන්දරයි. එකිනෙකට ගැලපිලා යනව. අර්ථ සහිතයි. පැහැදිලි වචන වලින් යුක්තයි. පැහැදිලි ප්‍රකාශන වලින් යුක්තයි. පිරිසිදු නිවන් මග කිසිදු අඩුවක් නැතිව විස්තර වෙනවා.

එතකොට ඒක තමයි **(සුතා)** බොහෝ අහලා තියෙන්න ඕනෙ. **(ධතා)** දරාගෙන ඉන්නව. ඊළඟට **(වචසා පරිචිතා)** වචනයෙන් පුරුදු

කරනවා. (**මනසානුපෙක්ඛිතා**) නුවණින් විමසා තේරුම් ගන්න බලනවා. (**දිට්ඨියා සුප්පටිවිද්ධා**) පැහැදිලිව තේරුම් ගන්නව. ඒක තමයි කරන්නේ.

මම බුදුරජාණන් වහන්සේ ගේ ධර්මයට ලක්ෂ කෝටි වාරයක් නමස්කාර කරනවා. මොකද හේතුව මම අද කෙළින් ඉන්නේ ඒ නාථකරණ ධර්මය නිසා. එතකොට මේ නාථකරණ ධර්මය ඕනෙ අපිට.

## තුන්වෙනි නාථකරණ ධර්මය කළ්‍යාණ මිත්‍රයන් ඇති බව

තුන්වෙනි නාථකරණ ධර්මය තමයි (**කළ්‍යාණමිත්තෝ හෝති කළ්‍යාණසහායෝ කළ්‍යාණසංපවංකෝ**) කළ්‍යාණ මිත්‍රයන් ඇති බව, කළ්‍යාණ යහළුවන් ඇති බව, කළ්‍යාණ මිත්‍ර යහළුවන් හා නැඹුරු වී සිටින බව. හෘද සාක්ෂියට එකඟව ගෞතම බුදු සසුනේ චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කිරීම පිණිස ධර්මයේ හැසිරෙන කෙනෙක් ඉන් බැහැර කෙනෙකුට කළ්‍යාණ මිත්‍රයා කියල යොදන්නේ කොහොමද කියල මට නම් තේරෙන්නේ නෑ.

## ධර්මය දැනගත්ත පමණින් ම කළ්‍යාණ මිත්‍රයෙක් වෙනවද?

අටුවා වලත් යොදල තියෙනව. ඒකෙ එහෙම යොදන්න පුළුවන් කමක් තියෙනවාද කියන එක දේශනාවට අනුව මට තේරෙන්නෙ නෑ. අටුවා වල ධර්මය ගොඩක් ඉගෙන ගත්තු එක් කෙනාටත් කළ්‍යාණ මිත්‍රයා කියල යොදනව. ධර්මය ගොඩක් ඉගෙන ගත්ත පමණින් කළ්‍යාණ මිත්‍රයා කියලා යොදන්න මම නම් කැමති නෑ. එයාට තියෙන්නෙ ඕනෙ ආකල්ප සම්පත්තියක්. ආකල්ප සම්පත්තියක් හැටියට ධර්මය ගොඩක් ඉගෙන ගෙන දහම් දැනුමක් තියෙනවා කියමු. ඒ දහම් දැනුම පිළිබඳව යෝනිසෝ මනසිකාරයේ යෙදිලා බහුශ්‍රැත භාවය කියන එක ඇතිවෙලා තියෙන්නෙ ඕනෙ. අර්ථ වශයෙන් තේරුම් අරගෙන සසරට බියක් තියෙන්න ඕනෙ. සතර අපායේ වැටෙන ගමනක් තියෙන්නේ. මේක හේතු ඵල ධර්මයක් තියෙන්නෙ කියල තේරුම් අරගෙන මේ ගෞතම බුදු සසුනේ දීම කෙලෙස් නැසීම පිණිස ප්‍රතිපදාවේ බැසගත් කෙනෙක් වෙන්න ඕනෙ කළ්‍යාණ මිත්‍රයා.

## අනාථ වූවෝ ද දහම් දෙසති...

අන්න ඒ කල්‍යාණ මිත්‍රයා තමයි මම නම් කල්‍යාණ මිත්‍රයා හැටියට සළකන්නේ. සමහර විට හොඳ දහම් දැනුමක් තියෙන්න පුළුවන්. නමුත් ධර්ම කථාවේ යෙදෙන ගමන් වෙන දේවල් කියන්න පුළුවන්. ධර්මය කියලා ඉවර වෙලා මේ කාලෙ නම් දැන් ඉතින් බැහැ. ඕනෙ නම් මං බුදු වෙන කොට ලෑස්ති වෙන්න. එතකොට අනිත් කට්ටිය සිහියෙන් නෙමෙයිනේ මේක අහන්නේ. ඒ ගොල්ලන්ටත් සනාථ කරන ධර්මයක් නෑනේ. අනාථ වෙලා නේ ඉන්නේ. ඒගොල්ලො මොකද කරන්නේ. එක හඬින් සාදුකාර දීලා ඒ මතයේ එල්ලෙනව. ඒකට හේතුව හේතුව තමයි නාථකරණ ධර්ම ඒගොල්ලන්ට ලැබෙන්නට විදිහක් නැති නිසා. නාථකරණ ධර්ම තිබුන නම් එයා කියනවා "හා... හා.... එහෙම කියන්න එපා. තමුන්නාන්සේට වැරදිලා ඔය ධර්මයේ තියෙන විදිහට බැලුවොත් එහෙම මේ විදිහටයි ඕක තියෙන්නේ" කියල. නාථකරණ ධර්මයන් තියෙන එක්කෙනා පෙන්වා දෙනව.

ඊළඟට කිව්වොත් "නෑ... නෑ... එහෙම බෑනේ. නමුත් මේ උත්සාහය අපි දිගට ම ගියොත් ඔය කියන විදිහට ආර්ය අෂ්ඨාංගික මාර්ගය එහෙම ලේසියෙන් සම්පූර්ණ කරන්න පුළුවන්ද? ඕවට පාරමී ඕනෙ නේද?" කියල අහන කොට නාථකරණ ධර්ම නැති එක්කෙනා කලබල වෙනවා. කලබලේ වටපිට බලනවා. අහනවා අනිත් එක්කෙනාගෙන්. ඇයි ඒ? එයා අනාථ වෙලානෙ.

## නියම කල්‍යාණ මිත්‍රයා හඳුනාගන්න...

කල්‍යාණ මිත්‍රයා නියම විදිහට හම්බ වුනා නම් අනාථ වෙන්නෙ නෑ. සනාථ වෙනව. බලන්න මිහිඳු මහරහතන් වහන්සේ ලංකාවට කල්‍යාණ මිත්‍රයෙක් වුනේ නැද්ද? අන්න කල්‍යාණ මිත්‍රයා ඇයි ඒ සමස්ත බුද්ධ ශාසනය ම ලාංකීය ජනතාව පිළිඅරගෙන ප්‍රතිඵල ලබාගෙන රහතන් වහන්සේලා හැම තැන ම බිහි වුනා. කල්‍යාණ මිත්‍රයා කියන්නේ ධර්මය පෙන්වා දෙන කෙනා.

කෙනෙක් තවකෙනෙකුට බොහොම ආදරෙයි. කන්න බොන්න අරන් දෙනවා. ඇඳුම් පැළඳුම් අරන් දෙනවා. නැවතැන් දෙනවා. බෙහෙත් දෙනවා. ඉතින් අනිත් අය ප්‍රශංසා කරනවා. මෙයා හරි හොඳයි... හරි හොඳයි... කියල. මනුස්සකම් තියෙනව කියල. ඇත්ත තමයි මනුස්සකම් තියෙනව. එයා කන්න බොන්න, ඇඳුම් පැළඳුම්, යාන වාහන දුන්නත්, කයින් වැරදි කරන කොට, වචනයෙන් වැරදි

කරන කොට, හිතින් වැරදි කරන කොට ඒක හඳුන්න දැන්නෙ නෑ. එතකොට එයා එක පැත්තකින් ප්‍රශංසා ලැබිය යුතු වුනාට, අනිත් පැත්තෙන් ගර්හා ලැබිය යුතුයි.

හේතුව තමයි එයා උදව් කරලා තියෙන්නේ කෑමෙන්, බීමෙන්, ඇඳුමෙන්, පැළඳුමෙන් විතරයි. එයාගේ ජීවිතයට පරලොවට උපකාර වෙන දෙයින් උපකාර කරලා නෑ. පරලොවට උපකාර වෙන දෙයින් උපකාර කරන්න නම් එයා ශීලයේ පිහිටවන්න ඕනෙ. යහපත් මාර්ගය පෙන්වන්න ඕනෙ. වරදින් මුදවාගන්න ඕනෙ. ඒක තමයි නියම මනුස්සකම. එතකොට ඒක සිද්ධ වෙන්නේ කළ්‍යාණ මිත්‍රයාගේ අතින්. කළ්‍යාණ මිත්‍රයා නිරන්තරයෙන් ම ලෝකෙට රැකවරණයක්.

## බුදු සසුනේ කළණ මිතුරෝ...

ආනන්ද හාමුදුරුවෝ දවසක් ශාසනයේ භාගයක් ම තියෙන්නේ කළ්‍යාණ මිත්‍රයන් නිසා කියපු වෙලාවෙ බුදුරජාණන් වහන්සේ මොකක් ද වදාළේ? "හා... හා.... ආනන්ද, එහෙම කියන්න එපා. මේ සම්පූර්ණ බුද්ධ ශාසනය ම පවතින්නේ කළ්‍යාණ මිත්‍රයන් නිසා" කිව්වා. එතකොට කළ්‍යාණ මිත්‍රයා වෙන්නේ කවුද? මේ චතුරාර්ය සත්‍යය ඉක්මනින් ම අවබෝධ කර ගැනීම පිණිස මාර්ගය, ප්‍රතිපදාව පෙන්වන කෙනා. ඒකෙදි මේ මාර්ගය, ප්‍රතිපදාව පෙන්වනව මිසක් තමන්ට ලකුණු දාගෙන ගියොත් හරි අමාරුවක වැටෙනව. "මට අවබෝධ වුනා. මම මඟ ඵල ලැබුවා, මගේ ළඟට වරෙන් කෙටි ක්‍රම තියෙනවා. මං කියා දෙන්නම්" කියල කවදාවත් කළ්‍යාණ මිත්‍රයා කියන්නෙ නෑ.

කළ්‍යාණ මිත්‍රයා බුදුරජාණන් වහන්සේව හඳුන්වා දෙනවා ගුණ වශයෙන් තේරුම් ගන්න හැටි. කළ්‍යාණ මිත්‍රයා ශ්‍රී සද්ධර්මය හඳුන්වලා දෙනවා ගුණ වශයෙන් තේරුම් ගන්න හැටි. කළ්‍යාණ මිත්‍රයා ආර්ය මහා ශ්‍රාවක සංඝරත්නය හඳුන්වලා දෙනවා ගුණ වශයෙන් තේරුම් ගන්න හැටි. මාර්ගයක් ප්‍රතිපදාවක් බුද්ධ දේශනාවේ තියෙන ආකාරය.

## රහස් බණක් නැත්තේ ම ය..

රහස් බණ තියාගන්නේ නෑ. සමහර විට කෙනෙක් සිටින්නට පුළුවනි මේ රහස් බණ තියාගෙන. "ආ... මේ ස්වාමීන් වහන්සේට වෙනම විශේෂයෙන් අවබෝධයක් වෙලා තියෙනව. මේ ස්වාමීන් වහන්සේ කාටවත් නො කියන විශේෂ කරුණු තියෙනව. කිට්ටු වෙලා යාළුවෙලා අහගන්න ඕනෙ." කළ්‍යාණ මිත්‍රයා ද? කළ්‍යාණ මිත්‍රයා නෙවෙයි. මොකක් හරි උප්පරවැට්ටියක්.

## විවෘත වෙන්න ම ඕනෙ බබලන්න...

කල්‍යාණ මිත්‍රයා මොකද කරන්නේ. ධර්මයත් විනයත් විවෘත කරනවා. **(විවටෝ විරෝචති නෝ පටිච්ඡන්නෝ)** විවෘත වුනා ම යි බබලන්නේ. සැඟවුනා ම නෙවෙයි. එතකොට කල්‍යාණ මිත්‍රයා ධර්මයත් විනයත් විවෘත කරනවා. එයා තමයි කල්‍යාණ මිත්‍රයා කල්‍යාණ මිත්‍රයා සසරෙහි බය දකිමින් ධර්මයේ හැසිරෙනවා. ධර්මය කියා දෙනවා. එතකොට යමෙකුට එබඳු කල්‍යාණ මිත්‍රයන් ඇසුරක් තියෙනවා නම් මොකක්ද ඒ තුන්වෙනි නාථකරණ ධර්මය යි. යම් කෙනෙක් අනාථ නොවී සිටීමට වුවමනා කරන කාරණාවයි.

## හතරවෙනි නාථකරණ ධර්මය කීකරු බව

ඊළඟ නාථකරණ ධර්මය තමයි **(සුවචෝ හෝති)** සුවචයි කියන්නේ කීකරුයි. අවවාදයට නැමෙනවා. අවනත වෙනව. කීකරු නැති එක්කෙනාට මොකද කියන්නේ දුර්වච. සුවච කියන්නේ හික්මෙන එක්කෙනා. අවවාදයට නැමෙන්නේ නැති, අවනත වෙන්නේ නැති අය එක්කෙනෙක් හිටියත් ඇති. ඔක්කොම අවුල් වෙනව.

## සුවච සුමුදු ගුණ ඇතිකරවා ගෙන....

**(සෝවචස්සකරණේහි ධම්මේහි සමන්නාගතෝ ඛමෝ පදක්ඛිණග්ගාහී අනුසාසනේ)** මෙන්න හතරවෙනි නාථකරණ ධර්මය. මේක බොහොම දුර්ලභ එකක්. කීකරු බව ඇති කරන ධර්මයන්ගෙන් එයා යුක්තයි. කීකරු බව ඇති කරන ගුණ ධර්ම වලින් කොහොමද ඒකෙ තියෙන්නේ. **(ඛමෝ)** බොහොම ඉවසිලිවන්තයි. **(පදක්ඛිණංගාහී අනුසාසනේ)** අනුශාසනාවක් අවවාදයක් කළහම පැදකුණු කොට පිළිගන්නවා. නිකම්ම නෙවෙයි පැදකුණු කොට පිළිගන්නව. හරි දුර්ලභයි මෙවැනි පුද්ගලයන් සොයා ගැනීම.

එතකොට ඒක තමයි සුවච. අවවාදයක් කළහම ගනන් නො ගෙන ඉන්නවා නම් 'ඕනෙ දෙයක් කියපන් මම ගණන් ගන්නෙ නෑ' කියල සමහරු අහගෙන ඉන්නව. එයා අහගෙන ඉඳලත් කියනවා, කිව්වට කමක් නෑ, මම ගණන් ගන්නෙ නෑ කියල. එහෙම අය නැද්ද? ඒ අයට කියන්නේ මොකක්ද? දුර්වච. දුර්වච එක්කෙනෙක් හිටියොත් ඇති. අවුල හැදෙනව.

## සුවච අය දුර්ලභයි...

සුවච අය දකින්නත් පින් කරන්න ඕනෙ. එච්චරට ම යහපත් සුවච කෙනා ඒක අනාථ නො වන කාරණාවක්. බුද්ධ දේශනා වල තියෙනවා "පින්වත් මහණෙනි, අප්‍රමාදී වෙන්න. මේකෙන් ඉක්මනට ම එතෙර වෙන්න. පින්වත් මහණෙනි, මේ චතුරාර්ය සත්‍යය අවබෝධ කරගන්න." මේ වචනයට ගරු කරනවා නම් නේද සුවච. එහෙම නැතුව මොන චතුරාර්ය සත්‍යය ද? කියාගෙන ඇවිදින බනින අය ඉන්නවා. එතකොට සුවච ද? දුර්වච ද? අන්න ඒ අය දුර්වච යි.

## සමාජයට ම පිළිලයක් වෙනවා...

ඊට පස්සේ ඒ දුර්වච කෙනා සමාජයටත් පිළිලයක්. තමන්ට තමන්ටත් පිළිලයක්. ඒ නිසා ඒක අනාථ කාරණයක්, සනාථ කාරණයක් නෙවෙයි. නාථකරණ ධර්මයක් නෙවෙයි. නාථකරණ ධර්මය වෙන්නේ ධර්මයට විනයට අවනත වීම. අනුශාසනාව පැදකුණු කොට පිළිගැනීම. අවවාදයක් කළා ම ගරුබුහුමන් ඇතිව ඒ අවවාදය පිළිගන්නවා නම්, දියුණු වෙනවා ම යි. අයහපතක් ඇතිවෙන්නෙත් නෑ. ඇයි ඒක නාථකරණ ධර්මයක්. ඒක සුවච බව.

බොහෝ දෙනෙකුට ඕක නෑ. සුවච බවත් එක්කම නිහතමානී බව තියෙන්නත් ඕනෙ. මානන්කාරයින්ට නම් බෑ මේක කරන්න. මාන්නක්කාරයෝ පිත්ත කෙලින් කරා වගේ ඉන්නව. මේ ක්‍රිකට් පිත්ත වගේ ඉන්නව. නැමෙන්නෙ නෑ. නැම්ලි බෑ. අවනත වෙන්නෙ නෑ. අවවාද කරද්දි කරද්දි දඬු ගැහෙනව. හතරැස් වෙනව. නැමෙන්නෙ නෑ. සුවච කෙනා "අනේ ස්වාමීනී, මම මේකට කොහොම හරි සංවර වෙන්න ඕනෙ. මට ම යි මේකේ යහපත. මේක මගේ ජීවිතයටයි යහපත. මට මේකෙන් සැනසිල්ලක් උදාවෙනව. ධර්මයෙන් නම් නපුරක් වෙන්නෙ නෑ" කියල මොකද කරන්නේ. එයා පැදකුණු කරල පිළිගන්නවා.

## නිවනට යන මඟ සිටින පතාගෙන...

නිහතමානී කම තියෙනවා නම් කීකරු කම තියෙනව. නිහතමානී කමයි, කීකරු කමයි තියෙනවා කියන්නේ නිවන් දකින්න පතාගෙන ආපු එක්කෙනෙක් වගේ. එච්චරට ඒක පිහිටක්. සුවච බවයි, නිහතමානී බවයි තියෙන්න ඕනෙ.

## පස්වෙනි නාථකරණ ධර්මය සබ්‍රහ්මචාරීන් වහන්සේලාගේ කුදු මහත් කටයුතු සිදුකිරීම

ඊළඟ එක තමයි (**පුනච පරං භික්ඛවේ භික්ඛු යානිතානි සබ්‍රහ්මචාරීනං උච්චාවචානි කිං කරණීයානි තත්‍ර දක්ඛෝ හෝති අනලසෝ තත්‍රූපාය වීමංසාය සමන්නාගතෝ අලංකාතුං අලං සංවිධාතුං**) සබ්‍රහ්මචාරීන් වහන්සේලා අතර මේක භික්ෂූන් වහන්සේලාට කරපු දේශනාවක්. සබ්‍රහ්මචාරීන් වහන්සේලා අතර කුදු මහත් කටයුතු ඇතිවෙනව.

### වැඩ වලදී දක්ෂ වෙන්න ඕනෙ...

සමහර අවස්ථාවල් එනවා සිවුරු පිළියෙල කරන අවස්ථාවල්, කුටි හදන අවස්ථාවල්, වත් පිළිවෙත් කරන අවස්ථාවල්. ඒවා තමයි පොඩි කටයුතු. පොඩි පොඩි දේවල් එනව. මහත් කටයුතු කියන්නේ මොනවද? සංඝ කර්ම, උපෝසථ කර්ම ඇති වෙන අවස්ථාවල් එනවා. ඊළඟට උපසම්පදා කර්ම ඇතිවෙන අවස්ථාවල් එනවා. මේ වගේ සංඝ කර්ම සංඝයා විසින් කරන ලොකු දේවල්. ඒවා වලදී එයා දක්ෂ වෙනව. එයා ඒවා කරන්න මැදිහත් වෙලා උපකාරී වෙනව. දක්ෂ වෙනව. කම්මැලි නෑ. සමහරු කම්මැලි කමට කියනවා මං විවේකයෙන් ඉන්නෙ. මට කියන්න එපා ඕවා කියල. වත් පිළිවෙත් තියෙනව. නෑ, අපි ආවේ වත් පිළවෙත් කරන්න නෙවෙයි කියනව. ධර්මය ප්‍රචාරය තියෙනව. අපි ආවෙ ධර්ම ප්‍රචාරය කරන්න නෙවෙයි කියනව. ඊළඟට සාමාන්‍ය වත් පිළිවෙත් කරන්න තියෙනව. නෑ... නෑ... අපි වත් පිළිවෙත් කරන්න නෙවෙයි ආවෙ කියනව. සිවුරු පඬු ගහන්න තියෙනව. අපි ආවෙ ඕකට නෙවෙයි කියනව. අපේ සිවුරු පඬු ගහගෙන කියනව. එතකොට ඒක නාථකරණ ධර්මයක් ද? අනාථකරණයක්.

### සංඝ සමඟියට හේතුවක්....

ඇයි ඒ? ඊට පස්සේ සංඝයා අතරේ තියෙන සමඟියට බාධාවක් වෙනව ඒක. එයාටත් බාධාවක් වෙනව. ඒ නිසා සමඟියට උපකාර වෙන ඒ සනාථකරණ ධර්මයක්. මේ කියන්නේ මොකක්ද? සබ්‍රහ්මචාරීන් වහන්සේලාගේ කටයුතු වලදී උපකාරී වීම. සමහර අවස්ථාවලදී ඔන්න එක ස්වාමීන් වහන්සේ නමකට ආපත්තියක් සිද්ධ වුනා. නාථකරණ

ධර්මයන්ගෙන් යුක්ත නම් ඒ ස්වාමීන් වහන්සේව ආපත්තියෙන් මුදවා ගන්නව. අන්න ඒක සංඝයාගේ කටයුත්තක්.

## එදිනෙදා ජීවිතයේදීත් දක්ෂ වෙන්න ඕනෙ...

එතකොට මේ නාථකරණ ධර්ම අතරේ එකක් තමයි ඒ ඒ අවස්ථාවලදි යෙදෙන කුදු මහත් කටයුතු වලදී දක්ෂව අනලසව මනා කොට ක්‍රමාණුකූලව කටයුතු කිරීම. දැන් එහෙනම් ධර්මයේ හැසිරෙන ගෙවල්වල ඉන්න අයටත් මේ විදිහයිනේ. ඒක නාථකරණ ධර්මයක්. ගෙවල් වල ඉන්දෙද්දී ගොවිතැන් කිරීම, එයා ගෙවිතැන ගැන හෙව්වේ නැත්නම් එයා ඒකෙන් අනාථ වෙන්නෙ නැද්ද? ළිඳ ඉහගන්න වුනා. එතකොට එයා ඒක කළේ නැත්නම් ප්‍රශ්න ඇතිවෙන්නෙ නැද්ද? අන්න ඒ වගේ ඒ ඒ අවස්ථාවල මැදිහත් වෙලා ඒ කටයුතුත් කරන්න ඕනෙ සිහිනුවණින් යුක්තව. එතකොට දරුවන්ගේ ගැටලු එනව. මැදිහත් වෙලා කරන්න ඕනෙ. එතකොට ඒක නාථකරණ ධර්මයක්.

### හයවෙනි නාථකරණ ධර්මය
### ධර්මයට විනයට කැමති බව

හයවෙනි නාථකරණ ධර්මය තමයි **(පුනච පරං භික්ඛවේ භික්ඛු ධම්ම කාමෝ)** ධම්ම කාමෝ කිව්වේ ධර්මයට බොහොම කැමතියි. **(ප්‍රියසමුදාහාරෝ)** අනිත් අයට ධර්මය කියා දෙන්න කැමතියි. නාථකරණ ධර්මයක්. තමනුත් ධර්මයට කැමතියි. ධර්මය අනුන්ට කියලා දෙන්නත් කැමතියි. ඒක නාථකරණ ධර්මයක්.

## අභිධර්මය කිව්වෙ මොකක් ද?

**(අභිධම්මේ අභිවිනයේ උළාරා පාමුජ්ජෝ) අභිධම්මේ කිව්වේ සත්තිස් බෝධි පාක්ෂික ධර්ම වලට. ඒ තමයි සතර සතිපට්ඨාන, සතර සම්‍යක් ප්‍රධාන වීර්යය, සතර සෘද්ධිපාද, පංච ඉන්ද්‍රිය, පංච බල, සප්ත බොජ්ඣංග, ආර්ය අෂ්ඨාංගික මාර්ගය කියන මේ ගාම්භීර ධර්මය ගැන.** අභිධර්ම පිටකයෙත් තියෙන්නේ මේවා පිළිබඳ විස්තර තමයි. නමුත් අපට සමාන්‍යයෙන් අවබෝධ කරගැනීමේදී බුද්ධ දේශනා වල තියෙන දේවල් ඉතාමත් පැහැදිලිව අපට තේරුම් අරගෙන දියුණු වෙන්න පුළුවන්.

## සූත්‍ර පිටකය හදාරලා ධර්මය දියුණු කරන්න බැරිද?

කාටවත් ම මේ සූත්‍ර පිටකය හදාරලා ධර්මයේ හැසිරිලා දියුණු වෙන්න බැරි නම් ලෝකේ කාටවත් අපි එකඟ වෙන්න ඕනෙ දියුණු වෙන්න බෑ කියල. නමුත් අපට ඕනෙ තරම් පේනවා දියුණු වෙන්න පුළුවන් කියල. ඒ ධර්මය හදාරලා කෙළෙස් දුරු කරගන්න ආකාරයනේ මේ කියන්නේ. දුක අවබෝධ කරගන්නා ආකාරයයි කියන්නේ. සමුදය ප්‍රහාණය කරගන්න ආකාරයයි කියන්නේ. නිරෝධය සාක්ෂාත් කරන ආකාරයයි කියන්නේ. මාර්ගය වඩන ආකාරයයි මේ දේශනාවල තියෙන්නේ. ඒවා අඩුපාඩු නැතිව තියෙනව.

එතකොට ඒ උතුම් අභිධර්මය සත්තිස් බෝධිපාක්ෂික ධර්ම ගැන එයා බොහොම (**උළාරා පාමොජ්ජෝ**) ප්‍රමෝදයෙන් ඉන්නව. උදාර ප්‍රමුදිත බවක් තියෙනව. හරි සතුටුයි. ධර්මයක් කියන කොට හරි සතුටුයි. අභිවිනයේ කියල කියන්නේ ගැඹුරු විනය.

## සතුටින් ඉන්න හේතුවෙනවා...

අභිධර්මය කිව්වේ සත්තිස් බෝධිපාක්ෂික ධර්ම වලට. අභිවිනය කියල කිව්වේ ගැඹුරු ගැඹුරු සිල්පද වලට. ඒවායේ තියෙන සියුම් කරුණු හොඳට නුවණින් විමසලා ශීල සංවරයේ යෙදෙනවා. එතකොට ප්‍රීතියක් හටගන්නව. එතකොට එයා ධර්මයට කැමැති කෙනෙක් බවට පත්වෙනව. අනුන්ට කියන්නත් කැමති කෙනෙක් වෙනව. ගාම්භීර වූ අභිධර්මය වන සත්තිස් බෝධිපාක්ෂික ධර්ම පිළිබඳවත් උදාර ප්‍රීතියකින් ප්‍රමුදිතව ඉන්න කෙනෙක්. විනය ගැන උදාර ප්‍රීති ප්‍රමුදිතව ඉන්න කෙනෙක්.

## ධර්මයට විනයට හානි වෙන්නෙ නෑ..

එබඳු එක්කෙනෙක් ධර්මය කිව්වොත් මොකද වෙන්නේ? ධර්මයට විනයට කවදාවත් හානියක් වෙන්නේ නැ. අන්න ඒක තමයි එයාගේ හයවෙනි නාථකරණ ධර්මය.

## හත්වෙනි නාථකරණ ධර්මය
## අරඹන ලද වීර්යය ඇති බව

ඊළඟ එක තමයි (**පුනච පරං භික්ඛවේ භික්ඛු ආරද්ධ විරියෝ හෝති**) පටන් ගත් වීර්ය ඇති බව. (**අකුසලානං ධම්මානං පහානාය**)

දැන් බලන්න අකුසල ධර්ම ප්‍රහාණය කරන්න පුළුවන්ද හඳුනගන්නේ නැතිව.

## මුලින්ම අකුසලය හඳුනා ගන්න...

හඳුනගන්නව කියන්නේ, මේ අකුසලය මට කොච්චර හානියක් කරල තියෙනවද? මේ අකුසලය නිසා ලෝකයා කොයිතරම් දුකට පීඩාවකට පත්වෙනව ද? අපායගාමී වෙනවද? එහෙනම් මේ අකුසලය මට අතීතයටත් යහපත පිණිස හේතුවෙන්න විදිහක් නෑ. මං කොච්චරවත් අපායගාමී වෙන්න මේ අකුසලය හේතුවෙන්න ඇති. මේ අකුසලය මට තිබුණොත් මට අනාගතේ කොයිතරම් විපත්ති සිද්ධ වෙයි ද කියල අකුසලයෙහි ආදීනවය විමසන්න ඕන.

## ඊළඟට අකුසලයේ ආදීනවය දකින්න...

අකුසලයේ ආදීනවය විමසද්දි විමසද්දි තමයි අකුසලය ප්‍රහාණය කිරීමට වීරිය හටගන්නේ. නැත්නම් අකුසලයක් තේරුම් ගත්තු පමණින් ඒක නවත්වන්න බෑ. දැන් ඔන්න තරහක් ඇති වුනා. තරහක් ... තරහක්... තරහක්... කියල හිතුව. කවදාවත් එයාට අකුසලය ප්‍රහාණය කරන්න පුළුවන් වෙයිද? ප්‍රහාණය කරන්න බැරි වුනාට මේ තරහ නිසා මේක බද්ධ වෛරයකට හැරෙනවා. පළිගැනීම් වලට හැදෙනවා. මේ නිසා කයෙන් පව් කෙරෙනව. වචනයෙන් පව් කෙරෙනව. සිතෙන් පව් කෙරෙනව. මේ ලෝකයේ මොන තරම් අර්බුද ප්‍රශ්න හට අරන් තියෙනව ද මේ තරහ නිසා. කර්ම රැස් කරමින් නිරයේ උපදිනවා. තිරිසන් අපායේ උපදිනවා. ප්‍රේත ලෝකයේ උපදිනව. ඒ වගේ අකුසලයක් මේ සිතේ දැන් පහළ වෙලා තියෙනව. එහෙනම් මේක මට අතීතයටත් අනර්ථය පිණිස පැවතිලා තියෙනව. නමුත් මට ප්‍රහාණය කරගන්න බැරි වෙච්ච නිසා තවමත් මේ හිතේ පවතිනව. අනාගතයටත් මේක මම ප්‍රහාණය නො කළොත් මට බරපතල ප්‍රශ්න වලට මුහුණ දෙන්න වෙනව. ඒ නිසා මම මේක ප්‍රහාණය කරන්න ඕනෙ. අන්න ඒකට තමයි කියන්නේ යෝනිසෝ මනසිකාරය කියල.

## ආදීනව මෙනෙහි කළොත් අකුසල් ගැන බය ඇතිවෙනවා..

යෝනිසෝ මනසිකාරයට එන්නෙ නැතිව අකුසලය හඳුන ගන්නත් බෑ. ප්‍රහාණය කරන්නත් බෑ. ඒකට වීරිය තියෙන්නත් ඕනෙ. ඒ වීරියෙන් බැහැර වෙන්නෙ නැතිව පවත්වන්නත් ඕනෙ. ඒ වගේ අකුසල්

හඳුනාගෙන හඳුනගෙන ඒවායේ ආදීනවය මෙනෙහි කරන්න ඉස්සෙල්ලා. ඊට පස්සේ ආදීනවය මෙනෙහි කරන කොට එයාට අවශ්‍යතාවයක් ඇතිවෙනවා මම මේවා නැති කරන්න ඕනෙ කියල. ප්‍රහාණය කරන්න ඕනෙ කියල. මේවා නම් හොඳ දේවල් නෙවෙයි කියල. එයා හඳුනාගන්න දක්ෂ වෙන්න ඕනෙ. එතකොට තමයි බය ඇතිවෙන්නේ. ඒකේ ආදීනවය මෙනෙහි කළේ නැත්නම් බය ඇතිවෙන්නේ නෑ.

සිතේ අකුසල් හටගන්න කොට එතන තනිකරම අවිද්‍යාව තියෙනව. මිච්ඡා සති තියෙනව. මිච්ඡා දිට්ඨි තියෙනව. මිච්ඡා සංකප්ප තියෙනව. මිච්ඡා වාචා තියෙනව. මිච්ඡා කම්මන්ත තියෙනව. සම්පූර්ණ මිත්‍යාවේ තමයි අකුසලය උපදින්නේ. එතකොට ඒක අපට එකපාරට ම හොයන්න බෑ. මේක අයහපතක් ද, යහපතක් ද කියල හොයන්න බෑ. ඒ අකුසලය හිත තුළ බැස ගන්නව. ඒක හොයන්න පුළුවන් වෙන්නේ වීරියෙන් ම තමයි. වීරියෙන් යුක්තව නුවණින් විමසලා ආදීනව මෙනෙහි කරන කොට අපිට ඒක බැහැර කරන්න පුළුවන්කම ඇතිවෙනව.

## ආනිශංස සිහිකරන කොට වීරිය උපදිනවා...

සීලය සම්පූර්ණ නැත්නම්, බලවත් විදිහට ශීලයේ අනුසස් මෙනෙහි කරන්නට ඕනෙ. ශීලයයි, ඉන්ද්‍රිය සංවරය යි සම්පූර්ණ නැත්නම් ඉන්ද්‍රිය සංවරයේ අනුසස් මෙනෙහි කරන්නට ඕනෙ. ඊළඟට සිහිය සම්පූර්ණ නැත්නම් සිහිය පිහිටුවා ගැනීමේ අනුසස් මෙනෙහි කරන්න ඕනෙ. සමාධියේ අනුසස් මෙනෙහි කරන්න ඕනෙ. ප්‍රඥාවේ අනුසස් මෙනෙහි කරන්න ඕනෙ. එතකොට අනුසස් මෙනෙහි කරන්න කරන්න මොකද වෙන්නේ වීරිය උපදිනව.

මොකටද උපදින්නේ **(කුසලානං ධම්මානං උපසම්පදාය)** කුසල් දහම් උපදවා ගැනීමට වීරිය උපදිනවා. අනුසස් මෙනෙහි කරන්නේ නැතිව වීරිය උපදින්නේ නෑ. එතකොට මොකද වෙන්නේ **(ථාමවා)** ඔන්න වීරිය පටන් ගන්නවා. **(දළ්හ පරක්කමා)** දැඩි වීරියක් හටගන්නවා **(අනික්ඛිත්තධුරෝ කුසලේසු ධම්මේසු)** කුසල් ධර්මයන් උපදවා ගැනීමේ වැඩපිළිවෙල අත් නො හැර දරා ගෙන යනවා ඉස්සරහට. ඒක මොකක්ද? නාථකරණ ධර්මයක්. හත්වෙනි නාථකරණ ධර්මය.

## නො පෙනෙන ලෝකයකට රැකවරණය ඉල්ලන්න එපා...

දැන් බලන්න බුද්ධ දේශනා තුළ තියෙන රැකවරණය. දැන් සාමාන්‍යයෙන් අනිත් ආගම්වල නම් නො පෙනෙන ලෝකෙට ගිහිල්ලා නො පෙනෙන ලෝකේ දිහා බලාගෙන අත් දෙක උස්සගෙන ඉල්ලන්නේ මේවත් නෙමෙයිනේ. ඉල්ලන්නේ එක එක දේවල්. දේවාල වල නම් ඔය කෙහෙල් ගෙඩියක් දෙකක්, දිවුල් කෑල්ලක්, රතු මල් ටිකක් පාට පහේ මල් චුට්ටක් ගෙනිච්චාම වැඩේ හරි.

නමුත් මේ නාථකරණයේ එහෙම බෑ. මේක තමයි සැබෑ නාථකරණය. මේක තමන්ට ප්‍රායෝගිකව තමන් තුළින් ඇති කරගන්න ඕනෙ දේවල්. **(අත්ථ සරණා)** තමාව තමා පිහිට කර ගන්නවා කියන කාරණය දැන් පේනවනේ.

### අටවෙනි නාථකරණ ධර්මය<br>ලද දෙයින් සතුටු වීම

ඊළඟ එක හරි වැදගත් කරුණක්. **(පුනච පරං භික්ඛවේ භික්ඛු සන්තුට්ඨෝ හෝති)** ලැබිච්ච දෙයින් සතුටු වීම. **(ඉතරීතරේන චීවර පිණ්ඩපාත සේනාසන ගිලානපච්චයා භේසජ්ජ පරික්ඛාරේන සන්තුට්ඨිකා)** ලැබිච්ච දෙයකින්, ලැබිච්ච සිවුරකින්, ලැබිච්ච දානයකින්, ලැබිච්ච කුටියකින්, ලැබිච්ච බෙහෙත් හේත් වලින් සංතෝෂ වෙනව. එතකොට මොකද වෙන්නේ? එයාගේ ජීවිතේ ඒවා පස්සේ දුවන එක නතර වෙනවා. සිවුරු පස්සේ එහෙම දුවන එක නතර වෙනව. සේනාසන පස්සේ දුවන එක නතර වෙනව. බෙහෙත් හේත් පස්සේ දුවන එක නතර වෙනව. ලද දෙයින් සතුටු වෙනව.

## සතුටුව ලද දෙයකින් සුව සේ හිඳ...

චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස ආදියෙන් සතුටු වුනේ නැත්නම්, ලද දෙයින් සතුටු වුනේ නැත්නම් එයා අනාථ වෙනව. එහෙම වුනේ නැත්නම් එක එක මිත්‍යා ආජීවයන්ට එයා පෙළඹෙනවා. පෙළඹිලා මිත්‍යා ආජීවයෙන් මිළ මුදල් හරි හම්බ කරගන්න කල්පනා කරනව. කුඹුරු, වතුපිටි වවන්න කල්පනා කරනව. වෙන වෙන ක්‍රම වලින් වෙළ හෙළඳාම් කරන්න කල්පනා කරනව. යාන වාහන විකුණන්න, වෙළඳාම් කරන්න කල්පනා කරනව. නොයෙක් ආකාරයේ ගණුදෙනු වලට පෙළඹෙනවා. මොකද ඒ ? ලද දෙයින් සතුටු වෙන්න බැරි කම.

ලද දෙයින් සතුටු වුනොත් එයා බොහොම සරළ ජීවිතයකට පුරුදු වෙනවා. ඒ සරළ ජීවිතේ නාථකරණ ධර්මයක්.

## නවවෙනි නාථකරණ ධර්මය තැනට සුදුසු නුවණ ඇති බව

නව වෙනි කරුණ තමයි **(සතිමා හෝති)** සිහිය ඇති එක්කෙනෙක්. **(පරමේනසති නේපක්කේන සමන්නාගතෝ)** ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුතුව, තැනට සුදුසු නුවණින් යුතුව සිහියෙන් ඉන්න පුරුදු වෙනවා. ලස්සන වචන නේද? උතුම් වූ තැනට සුදුසු නුවණ ඇතිව සිහියෙන් ඉන්නවා. ඒක නාථකරණ ධර්මයක්. **(චිරකථම්පි, චිරභාසිතම්පි සරිතා අනුස්සරිතා)** බොහෝ කරපු දේවල්, කියපු දේවල් සිහි කරන්න නුවණින් නැවත සිහිකරන්න පුළුවන්.

එතකොට ඒ කෙනාට තමන්ව මනාකොට ක්‍රමාණුකූලව සකස් කරගන්න පුළුවන්. සමහරු ඉන්නවා මේ කියනවා, මේ අමතකයි. මේ කියනවා, මේ අවවාද කරනවා මතක නැතිව යනව. එතකොට තමන්ගේ ජීවිතය සම්බන්ධව වුනත් ආපස්සට බලලා තමන්ට හරි වැරැද්ද තෝරා ගන්න බෑ. තෝරා ගන්න පුළුවන් වෙනවා. මේ සිහිය මනාකොට තියෙනවා නම්.

මේ සිහිය තියෙන කෙනා කායානුපස්සනාව, වේදනානුපස්සනාව, චිත්තානුපස්සනාව, ධම්මානුපස්සනාව සතර සතිප්ඨානයේ යෙදෙන කෙනෙක්. එතකොට මේ සිහිය තියෙන කෙනාගේ ඒක නාථකරණ ධර්මයක්.

## සිහියෙන් යුතුව ධර්මය අහන්න...

දැන් බුදුරජාණන් වහන්සේගේ කාලෙ මේ සිහිය ගොඩක් බලපානව. ඇයි අපට තියෙන්නේ පොත් නෙ. අපි හැම දේකට ම පොත අතේ තියාගෙනයි ඉන්නෙ. බුදුරජාණන් වහන්සේගේ කාලෙ පොත් නෑනෙ.

දැන් අපි ගත්තොත් සමහර බුද්ධ දේශනා තියෙනවා (දීඝ නිකායෙ එහෙම තියෙන) හරි දිග දේශනා. දැන් මේවා වුනත් දිග දේශනා. දැන් අපි පොත බලාගෙන මේ දේශනා කියනව. නව වැනි එක අහන කොට පළවෙනි එක මතක නෑ. ඊළඟ එක අහන කොට දෙවෙනි එක මතක නෑ. සිහියේ අඩුපාඩු නෙමෙයිද මේවා? සිහියේ අඩුපාඩු.

## සියල්ලට ම ඕනෙ කරන යෝනිසෝ මනසිකාරය...

බුදුරජාණන් වහන්සේගේ කාලේ එහෙම නෙවෙයි. යෝනිසෝ මනසිකාරය කියල කියන්නේ සම්පූර්ණයෙන් ම නුවණින් විමසීම. එතකොට මේ නාථකරණ ධර්ම සියල්ලට ම ඕනෙ යෝනිසෝ මනසිකාරය. ඒකෙ පැහැදිලි වෙනසක් තියෙනව. සිහියත් යෝනිසෝ මනසිකාරයත් අතර. නමුත් යෝනිසෝ මනසිකාරය තමයි හැම දේකට ම මුල් වෙන්නේ. යෝනිසෝ මනසිකාරයෙන් තොරව මේ විදිහට සිහිය දියුණු කරන්න බෑ.

ඉතින් අර බුදුරජාණන් වහන්සේගේ කාලෙ උන්වහන්සේ එක් වරක් දේශනා කළා ම භික්ෂූන් වහන්සේලා අහගෙන හිටියා. අහගෙන හිටපු පමණින් ම මතක තියාගන්නව. ඊට පස්සේ ඉතින් අය 'අද මොකක්ද බුදුරජාණන් වහන්සේ දේශනා කළේ?' 'අන්න අසවල් පිරිසට අසවල් එක දේශනා කළා' 'ඒකෙ මොනවද තිබ්බ කරුණු?' කියල අහනව. 'මේ මේ කරුණු තිබුණා' එහෙමනේ මේක කටපාඩමින් ඔක්කොම ආවෙ.

එතකොට බලන්න කොහොම සිහියක් තිබිල තියෙනව ද කියල. එතකොට ඒ සිහිය නාථකරණ ධර්මයක්.

### දසවෙනි නාථකරණ ධර්මය
### ප්‍රඥාවන්ත වීම

ඊළඟ නාථකරණ ධර්මය තමයි (**පුනච පරං භික්ඛවේ භික්ඛු පඤ්ඤවා හෝති**) ප්‍රඥාවන්තයි. (**උදයත්ථ ගාමිනියා පඤ්ඤාය සමන්නාගතෝ අරියාය නිබ්බේධිකාය සම්මා දුක්ඛක්ඛය ගාමිනියා**) අනිත්‍ය පිළිබඳව දන්නා ප්‍රඥාවෙන් යුක්තයි. ආර්ය වූ අවබෝධයෙන් ම කළකිරෙන දුක් ක්ෂය කරගන්නා වූ ප්‍රඥාව.

## ඇතිවීම - නැතිවීම ගැන තියෙන අවබෝධය...

එතකොට එහෙනම් මේ අනිත්‍යය කියන එක මොකක්ද? අනිත්‍ය පිළිබඳ ප්‍රඥාව කියන්නේ මොකක් ද? අනිත්‍යය මනා කොට දකිනව නම් එයා දුකත් දකිනවා. අනාත්මයත් දකිනවා. අනිත්‍යයි දුකයි අනාත්මයි. අනිත්‍යය දකින්නේ නැත්නම්, එයා දුක දකින්නේ නෑ. අනිත්‍ය දකින්නේ නැත්නම් එයා අනාත්මය දකින්නෙත් නෑ. මේ වෙනස්වීම මත තමයි, ඇතිවීම නැතිවීම මත තමයි දුක තියෙන්නේ. ඇතිවීම

නැතිවීම මත තමයි තමාගේ වසඟයේ පවත්වන්න බැරි බව තියෙන්නේ.

එහෙනම් එයා අනිත්‍යය තුළ දුකත් දකිනවා, අනාත්මයත් දකිනවා. එතකොට බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙන්නේ කොහොමද? **(අනිච්චේ දුක්ඛ සඤ්ඤා)** අනිත්‍ය දේ කෙරෙහි දුක හඳුනාගන්නවා. **(දුක්ඛේ අනත්ත සඤ්ඤා)** දුක් දේ කෙරෙහි තමාගේ වසඟයේ පවත්වන්න බැරි බවත් දකිනවා. තමාගේ වසඟයේ පවත්වන්න පුළුවන් නම් දුකක් තියෙන්න විදිහක් නෑනේ. අන්න ඒ නිසා අනිත්‍ය පිළිබඳ අවබෝධය ම යි ප්‍රඥාව කියන්නේ.

## ගිරා කළකිරීම...

ඒ ප්‍රඥාව තියෙන කෙනා යම්කිසි දෙයක් කෙරෙහි කළකිරෙනවා නම් කළකිරෙන්නේ අවබෝධයෙන් ම යි. ඒක මේ ගිරවු වගේ කළකිරෙන එකක් නෙවෙයි. ගිරවු වගේ කළකිරෙනවා කියන්නේ එක්කෙනෙක් කියනවා මම කළකිරිලා ඉන්නෙ කියල. ඒක පාඩම් කරගෙන අනිත් එක්කෙනත් ඒක ම කියනව. අන්තිමට බලපුවා ම ඉස්සෙල්ලා කිව්ව එක්කෙනා විතරයි කළකිරිල තියෙන්නෙ. අනිත් අය කටපාඩමින් තමයි කළකිරිල තියෙන්නෙ.

උදයත්ථ ගාමිණී කියන්නේ ඇතිවීම, නැතිවීම, හටගැනීම, වෙනස් වීම මේ අනිත්‍ය ස්වභාවය නුවණින් තේරුම් ගත්තු බව. අන්න ඒ ප්‍රඥා සම්පන්න බව නාථකරණ ධර්මයක්.

## අනාථයෙක් වගේ ඉන්න එපා...

ඊට පස්සේ බුදුරජාණන් වහන්සේ වදාළා "පින්වත් මහණෙනි, **(සනාථා විහරථ)** පිළිසරණ ඇතිව ඉන්න. **(මා අනාථා)** අනාථයෝ වගේ ඉන්න එපා. **(දුක්ඛං භික්ඛවේ අනාථෝ විහරති)** පින්වත් මහණෙනි, අනාථ වෙච්ච කෙනා දුකෙන් ඉන්නේ. **(ඉමේ ඛෝ භික්ඛවේ දස නාථකරණ ධම්මා)** පින්වත් මහණෙනි, මෙන්න මේවා තමයි පිළිසරණ ඇති කරන්නා වූ නාථකරණ ධර්ම දහය."

බලන්න මේ ධර්ම දහය ම අපි මළාට පස්සෙ ද දියුණු කරන්න තියෙන්නෙ. මේ ජීවිතයේ දී ද? මේ ජීවිතයේ දී. මේ දේශනාවේ දී එකක් එකක් පාසා පැහැදිලිව පේනවා මේ නාථකරණ නැති අනාථ වෙච්ච අයගේ බණ ඇසීමෙන් වෙච්ච අර්බුදයක් තමයි රටේ තියෙන්නෙ කියල. අනාථ වෙච්ච අයගේ බණ ඇසීම, අනාථ වෙච්ච

අයගේ පොත් පත් කියවීම මිසක් සනාථ වීමක් නො ලැබීමේ සාපය උදාවෙලා කියල. ඒ නිසා අපට වුවමනා කරන්නේ මේ නාථකරණ ධර්මයන්ගෙන් යුක්ත වීමයි. මේ නාථකරණ ධර්මයන් එකක් පාසා නුවණින් විමසා බලන්න. එයා නිවනට සුදුස්සෙක් වෙනවා.

**1. හිරි ඔතප් වලින් යුතු මනා සිල්වත් කම**

**2. බුද්ධ දේශනා පිළිබඳ නිවැරදි දැනුම - බහුශ්‍රැතභාවය**

**3. කළ්‍යාණ මිත්‍රයන් ඇති බව**

**4. අවවාදයෙහි අනුශාසනාවෙහි පැදකුණු කරල පිළිගැනීම - සුවච බව**

**5. සබ්‍රහ්මචාරීන් වහන්සේලාගේ කුදු මහත් කටයුතු කිරීම**

**6. ධර්මයට කැමති ව ධර්මය අනුන්ට දේශනා කිරීම**

**7. අරඹන ලද වීර්යයෙන් යුතු වීම**

**8. ලද දෙයින් සතුටු වීම**

**9. සිහි නුවණින් යුතු වීම.**

**10. අනිත්‍ය පිළිබඳ ඇති අවබෝධයෙන් යුතු ප්‍රඥාව**

මේ පිළිසරණ අපිට බුදු රජාණන් වහන්සේ ඇරෙන්න වෙන කාගෙන් නම් ලබන්න ද? කවුරු නම් අපට මෙහෙම ධර්මයක් කියා දෙයි ද? කවදා නම් අහන්නද බුදු රජාණන් වහන්සේ මේ ධර්මය නො වදාළා නම්. බුදුරජාණන් වහන්සේ කොයිතරම් පැහැදිලිව මේ නාථකරණ ධර්මයන් අපට පෙන්වා දුන්නාද?

ඉතින් ඒ නිසා මේ පින්වත් සියලු දෙනාට ම මේ උතුම් දස නාථකරණ ධර්මයන් තමන්ගේ ජීවිත තුළ දියුණු කරගෙන අනාථ නොවී සනාථව මේ ගෞතම බුදු සසුනේ දීම උතුම් චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගැනීමේ වාසනාව උදා වේවා!

*සාදු ! සාදු!! සාදු !!!*



# දානයේ අනුසස්

## -දක්ඛිණා විභංග සූත්‍රය-

*ශ්‍රද්ධාවන්ත පින්වතුනි,*

දැන් අපි සූදානම් වෙන්නේ බුදුරජාණන් වහන්සේ දානය ගැන වදාළ විශේෂ දේශනාවක් ඉගෙන ගැනීමට යි. මේ දේශනාව තියෙන්නේ **මජ්ඣිම නිකායේ තුන්වෙනි කොටසේ**, උපරිපණ්ණාසකයට අයිති දේශනාවක්. දානය ගැන අගනා විස්තර රාශියක් මේ දේශනාවට ඇතුළත් වෙලා තියෙනවා. මේ දේශනාවේ නම **දක්ඛිණා විභංග සූත්‍රය**. දක්ෂිණාවන් විග්‍රහ කොට වදාළ දෙසුම.

## බුදුරජාණන් වහන්සේට පිළිගැන්වූ අපූරු දානය...

දානය පිළිබඳ අනේක විග්‍රහයන් මෙම දෙසුමට ඇතුළත් වෙලා තියෙනවා. බුදුරජාණන් වහන්සේ මේ දිනවල වැඩ සිටියේ කපිලවස්තු නගරයේ නිග්‍රෝධාරාමයේ. එකල ප්‍රජාපතී ගෝතමී බිසව අලුත් වස්ත්‍ර යුගලක් අරගෙන බුදුරජාණන් වහන්සේ ළඟට පැමිණුනා. පැමිණිලා බුදුරජාණන් වහන්සේට වන්දනා කරල, ළඟින් හිටගෙන, භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට මෙහෙම ප්‍රකාශ කළා. "ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, මම මේ වස්ත්‍ර යුගල භාග්‍යවතුන් වහන්සේ උදෙසාම, විශේෂයෙන් පිළියෙල කරපු එකක්. ඒ නිසා මා කෙරෙහි අනුකම්පාව

උපදවාගෙන භාග්‍යවතුන් වහන්ස, මේ වස්ත්‍ර යුගල පිළිගන්නා සේක්වා" කියල ප්‍රජාපතී ගෝතමී බිසව බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලා හිටියා.

## සංඝයාට පූජා කළොත් බුදු රජාණන් වහන්සේටත් පූජා කළා වෙනවා..

ඒ වෙලාවෙ බුදුරජාණන් වහන්සේ මෙහෙම දේශනා කළා. "(**සංඝේ ගෝතමී දේහි, සංඝේ තේ දින්නේ අහං චේව පූජිතෝ භවිස්සාමි සංඝෝ චා'ති**) පින්වත් ගෝතමිය, සංඝයාට පූජා කරන්න. සංඝයාට පූජා කිරීමෙන් ඔබ විසින් මාවත් පුදන ලද්දෙක් වෙනව. සංඝයාත් පුදන ලද්දෙක් වෙනවා." නැවතත් ප්‍රජාපතී ගෝතමී බිසව දෙවැනි වතාවෙත් කියනවා, "ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ උදෙසා ම යි මා මේ වියෙව්වේ. පිළියෙල කළේ. ඒ නිසා අනුකම්පා උපදවා ගෙන මේ වස්ත්‍ර යුගල පිළිගන්නා සේක්වා." දෙවන වතාවෙත් බුදුරජාණන් වහන්සේ වදාළා "(**සංඝේ ගෝතමී දේහි, සංඝේ තේ දින්නේ අහං චේව පූජිතෝ භවිස්සාමි සංඝෝ චා'ති**) පින්වත් ගෝතමිය, සංඝයාට පූජා කරන්න. සංඝයාට පූජා කිරීමෙන් ඔබ විසින් මාවත් පුදන ලද්දෙක් වෙනව. සංඝයාත් පුදන ලද්දෙක් වෙනවා." නැවතත් ප්‍රජාපතී ගෝතමී බිසව තුන්වැනි වතාවෙත් කියනවා, "ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ උදෙසා ම යි මා මේක පිළියෙල කළේ. ඒ නිසා අනුකම්පා උපදවා ගෙන මේ වස්ත්‍ර පිළිගන්නා සේක්වා." කියල. තුන්වෙනි වතාවෙත් බුදුරජාණන් වහන්සේ වදාළා "පින්වත් ගෝතමිය, සංඝයාට පූජා කරන්න. සංඝයාට පූජා කිරීමෙන් ඔබ විසින් මාවත් පුදන ලද්දෙක් වෙනව. සංඝයාත් පුදන ලද්දෙක් වෙනවා." කියල.

## බුදුරජාණන් වහන්සේව පෝෂණය කළා...

එතකොට ආනන්ද හාමුදුරුවෝ කල්පනා කළා මම මේ වෙලාවෙ ප්‍රජාපතී ගෝතමී දේවිය වෙනුවෙන් කරුණු ටිකක් කිව්වොත් හොඳයි කියල. "ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, මේ වස්ත්‍ර යුගල පිළිගන්නා සේක්වා. ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, මේ අලුත් වස්ත්‍ර යුගල භාග්‍යවතුන් වහන්සේ වෙනුවෙන් ම සකස් කරපු මේ වස්ත්‍ර පිළිගන්නා සේක්වා. (**බහුපකාරෝ භන්තේ මහා පජාපතී ගෝතමී**) ස්වාමීනී, මේ මහා ප්‍රජාපතී ගෝතමිය භාග්‍යවතුන් වහන්සේට බොහෝ උපකාර වුනා. (**භගවතෝ මාතුච්චා**) භග්‍යවතුන් වහන්සේගේ පුංචි අම්මා. (**අපාදිකා**) කුඩා අවදියේ දී අත්පා වැඩුවා, හැදුවා (**පෝෂිකා**) පෝෂණය කළා. (**කීරස්ස දායිකා**) කිරි පෙව්වා. (**භගවන්තං ජනෙත්තියා කාලකතාය**)

භාග්‍යවතුන් වහන්සේ ගේ මෑණියන් වහන්සේ කලුරිය කළා ම, **(එකද්ධදං පායේසි)** මව්කිරි දුන්නා. ඒ නිසා බොහෝ උපකාරයි. ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවතුන් වහනසේත් ප්‍රජාපතී ගෝතමියට බොහෝ උපකාර කරලා තියෙනවා. **(භගවන්තං භන්තේ ආගම්ම මහා පජාපතී ගෝතමී බුද්ධං සරණං ගතා)** භාග්‍යවතුන් වහන්සේ ලඟට පැමිණුන නිසා ප්‍රජාපතී ගෝතමිය අවබෝධයෙන් ම බුදුරජාණන් වහන්සේව සරණ ගියා. අවබෝධයෙන් ම ශ්‍රී සද්ධර්මය සරණ ගියා. අවබෝධයෙන් ම ආර්ය මහා සංඝ රත්නය සරණ ගියා.

## බුදුරජාණන් වහන්සේ නිසා තිසරණයේ පිහිටියා...

ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ළඟට පැමිණුන නිසා ම සතුන් මැරීමෙන් වැලකී සිටිනවා, සොරකමින් වැලකී සිටිනවා, වැරදි කාම සේවනයෙන් වැලකී සිටිනවා, බොරු කීමෙන් වැලකී සිටිනවා, මත්පැන් - මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැලකී සිටිනවා. පංච ශීලය ආරක්ෂා කරනවා. ප්‍රජාපතී ගෝතමිය භාග්‍යවතුන් වහන්සේ ළඟට පැමිණුන නිසා ම යි. ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ළඟට පැමිණිච්ච නිසා ප්‍රජාපතී ගෝතමිය **(බුද්ධේ අවේච්චප්පසාදේන සමන්නාගතා)** ලෝකයේ කාටවත් ම වෙනස් කරන්නට බැරි විදිහට බුදුරජාණන් වහන්සේ කෙරෙහි ස්ථාවර ශ්‍රද්ධාවක් ඇති කරගෙන සිටිනවා. **(ධම්මේ අවේච්චප්පසාදේන සමන්නාගතා)** කාටවත් ම වෙනස් කරන්නට බැරි විදිහට ධර්මරත්නය කෙරෙහි නො සෙල්වෙන ශ්‍රද්ධාවක් ඇති කරගෙන තියෙනවා. **(සංඝේ අවේචප්පසාදේන සමන්නාගතා)** ආර්ය මහා සංඝරත්නය කෙරෙහි නො සෙල්වෙන පැහැදීමක් ඇතිකරගෙන තියෙනවා. **(අරියකන්තේහි සීලේහි සමන්නාගතා)** ආර්යකාන්ත ශීලයෙන්, ඒ කියන්නේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ මාර්ග අංගයන් විදිහට සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව කියන මාර්ග අංගවල පිහිටා සිටින ආකාරයට මේ ආර්යකාන්ත ශීලය දියුණු කරනවා. ඒ නිසා ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, හරි උපකාර වුනා.

## ආර්ය සත්‍යය ගැන නිසැක භාවයටත් පත් වුනා...

ඒ වගේ ම ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ළඟට පැමිණෙන්න ලැබුන නිසා මහා ප්‍රජාපතී ගෝතමිය දුක්ඛ ආර්ය සත්‍යය කෙරෙහි නිසැක භාවයට පත්වෙලා ඉන්නවා. දුක්ඛ සමුදය ආර්ය සත්‍යය කෙරෙහි නිසැක භාවයට පත්වෙලා ඉන්නවා, ඒකාන්තයෙන් ම දුක හටගන්නා හේතුව මේකයි කියලා.

දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය කෙරෙහි නිසැක භාවයට පත්වෙලා ඉන්නවා. මේ කාම තණ්හාව, භව තණ්හාව, විභව තණ්හාව නිරුද්ධ කිරීමෙන් ඒකාන්තයෙන් ම දුක් නිරුද්ධ කරන්න පුලුවන් කියල නිසැක භාවයට පත්වෙලා ඉන්නවා. (**දුක්ඛනිරෝධගාමිණියා පටිපදාය නික්කංඛා**) මේ දුක්ඛ නිරෝධ ගාමිනී පටිපදාව වන සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි කියන මේ මාර්ග අංග අට දියුණු කිරීමෙන් ඒකාන්තයෙන් ම සංසාරෙන් මිදෙන්න පුළුවන්, දුකෙන් නිදහස් වෙන්න පුළුවන් කියලා නිසැක භාවයට පත්වෙලා. මේ චතුරාර්ය සත්‍යය ධර්මය කෙරෙහි නිසැක භාවයට පත්වෙලා සිටිනවා. ඒ නිසා භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ නිසා ප්‍රජාපතී ගෝතමියට බොහෝ උපකාර වුනා.”

## කළ ගුණ සළකා අවසන් කළ නො හැකියි...

බුදුරජාණන් වහන්සේ මෙහෙම පිළිතුරු දෙනවා. “(**ඒවමේතං ආනන්ද, ඒවමේතං ආනන්ද**) ආනන්ද, ඕක ඔය විදිහම යි. ආනන්දය ඕක ඔය විදිහම යි. ආනන්ද, යම් පුද්ගලයෙක් ළඟට තව පුද්ගලයෙක් ඇවිල්ලා බුදුරජාණන් වහන්සේ ගැන කරුණු දැන කියාගෙන, බුදු රජාණන් වහන්සේව සරණ ගියොත් යම් පුද්ගලයෙක් ලඟට ඇවිල්ලා ඒ පුද්ගලයාගෙන් කරුණු දැනගෙන ධර්මය සරණ ගියොත්, යම් පුද්ගලයෙක් ළඟට තව පුද්ගලයෙක් ඇවිල්ලා ඒ පුද්ගලයාගෙන් කරුණු දැනගෙන ශ්‍රාවක සංඝ රත්නය සරණ ගියොත් (**ඉමස්සානන්ද, පුග්ගලස්ස ඉමිනා පුග්ගලේන න සුප්පතිකාරං වදාමි**) ආනන්දය, අවබෝධයෙන් ම යම් පුද්ගලයෙකුගෙන් තිසරණය ගැන ඉගෙන ගෙන පැහැදීමක් ඇති කර ගන්නවද, ඒ තිසරණ අවබෝධය ලබා දීපු පුද්ගලයාට කෙලෙහි ගුණ දක්වලා අවසන් කරන්නට බැහැ.

(**යදිදං අභිවාදනපච්චුට්ඨාන අඤ්ජලිකම්ම සාමීචිකම්ම චීවර පිණ්ඩපාත සේනාසන ගිලානපච්චය භේසජ්ජ පරික්ඛාරා නුප්පදානේන**) වැඳුම් පිදුම් කිරීමෙන්, ගරු සත්කාර සම්මාන කිරීමෙන්, නොයෙක් අයුරින් ප්‍රශංසා කිරීමෙන්, කථා කිරීමෙන්, සිවුරු - පිණ්ඩපාත - සේනාසන - ගිලන්පස - බෙහෙත් පිරිකර පූජා කිරීමෙන් ගෙවලා ඉවර කරන්න බෑ.”

## යමෙක් ව තිසරණයෙහි පිහිටුවන්න පුළුවන් නම්...

කාවද මේ? යම් පුද්ගලයෙක් ගාවට යම් පුද්ගලයෙක් ඇවිල්ලා අවබෝධයෙන් ම බුදුරජාණන් වහන්සේ ව සරණ යනවා නම්,

අවබෝධයෙන් ම ශ්‍රී සද්ධර්මය සරණ යනවා නම්, අවබෝධයෙන් ම ශ්‍රාවක සංඝරත්නය සරණ යනවා නම් ඒ තුණුරුවන් සරණ අවබෝධයෙන් ම කෙනෙකුට ලැබෙනවා නම් ඒක ලබාදෙන කෙනාට උපස්ථාන කරලා අවසන් කරන්ට බෑ කියලයි.

## යමෙක් සිල්වත් කරන්න පුළුවන් නම්...

"**(යං ආනන්ද පුග්ගලෝ පුග්ගලං ආගම්ම)** ඒ වගේ ම ආනන්දය, යම් කිසි පුද්ගලයෙක් තමත් ලඟට ඇවිල්ලා ඒ පැමිණීම හේතුවෙන් සතුන් මැරීමෙන් වළකිනවා නම්, ඒ පැමිණීම හේතුවෙන් සොරකමින් වළකිනවා නම්, ඒ පැමිණීම හේතුවෙන් වැරදිකාම සේවනයෙන් වැලකී සිටිනවා නම්, බොරු කීමෙන් වළකිනවා නම්, මත්ද්‍රව්‍ය භාවිතයෙන් වලකිනවා නම්, ආනන්දය මේ ශීලයේ පිහිටුවන්ට ඒ පුද්ගලයාට කරන උපකාරයට ප්‍රත්‍යුපකාර කරලා අවසන් කරන්න බෑ. වැඳුම් පිදුම් කිරීම, ගරු සත්කාර සම්මාන දැක්වීම, සිවුරු පිණ්ඩපත, සේනාසන, බෙහෙත් ගිලන්පස, පූජා කිරීම් වලින් සත්කාර සම්මාන කරලා අවසන් කරන්නට බෑ. ඒ කියන්නේ කෙලෙහි ගුණ දක්වලා අවසන් කරන්නට බෑ."

## සෝතාපත්ති අංග තුළ සමාදන් කරවනවා නම්...

"**(යං ආනන්ද පුග්ගලෝ පුග්ගලං ආගම්ම)** ඒ වගේ ම ආනන්දය, යම් කිසි පුද්ගලයෙක් තමත් ලඟට ඇවිල්ලා ඒ පැමිණීම හේතුවෙන් බුදුරජාණන් වහන්සේ කෙරෙහි ස්ථිරව ශ්‍රද්ධාවේ පිහිටනවා නම්, ශ්‍රී සද්ධර්මය කෙරෙහි ස්ථිරව ශ්‍රද්ධාවේ පිහිටනවා නම්, ආර්ය මහා සංඝරත්නය කෙරෙහි ස්ථිරව ශ්‍රද්ධාවේ පිහිටනවා නම්, ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ අංගයක් හැටියට ආර්ය කාන්ත ශීලයෙහි පිහිටනවා නම්, ඒ පුද්ගලයාට කරන උපකාරයට ප්‍රත්‍යුපකාර කරලා අවසන් කරන්න බෑ. වැඳුම් පිදුම් කිරීම, ගරු සත්කාර සම්මාන දැක්වීම, සිවුරු පිණ්ඩපත, සේනාසන, බෙහෙත් ගිලන්පස, පූජා කිරීම් වලින් සත්කාර සම්මාන කරලා අවසන් කරන්නට බෑ. ඒ කියන්නේ කෙලෙහි ගුණ දක්වලා අවසන් කරන්නට බෑ."

## චතුරාර්ය සත්‍යය අහන්නට සැලස්වන්න...

"ආනන්දය, යම් කිසි පුද්ගලයෙකුගෙන් තවත් පුද්ගලයෙකුට චතුරාර්ය සත්‍යය ධර්මය ගැන අහන්න ලැබෙනවා. ඒ චතුරාර්ය සත්‍යය ධර්මය ගැන ශ්‍රවණය කරන්ට ලැබෙනවා. චතුරාර්ය සත්‍යය ධර්මය

ගැන විස්තර වශයෙන් අහන්න ලැබෙනවා. මෙන්න මේකයි දුක්ඛ ආර්ය සත්‍යය, මෙන්න මේකයි දුක්ඛ සමුදය ආර්ය සත්‍යය, මෙන්න මේකයි දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය, මෙන්න මේකයි දුක්ඛ නිරෝධ ගාමිනී පටිපදා ආර්ය සත්‍යය කියල චතුරාර්ය සත්‍යය අහන්නට ලැබෙනවා.

මේ චතුරාර්ය සත්‍යය ධර්මය ශ්‍රවණය කරලා යෝනිසෝ මනසිකාරයේ යෙදෙනවා. එතකොට දුක්ඛාර්ය සත්‍යය ගැන නිසැකභාවයට පත්වෙනවා. මේක නම් ඒකාන්තයෙන් ම දුකක් ම යි. මේක නම් දුක නම් වූ ආර්ය සත්‍යය ම යි කියල. කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා යනු මේ දුක හටගන්නා හේතුව ම යි. මේ ත්‍රිවිධ තණ්හාව ම ඉතිරි නැතිව නිරුද්ධ කිරීම ම මේ දුකෙන් නිදහස් වීමට තිබෙනා එක ම විසඳුම ම යි. මේ සඳහා තියෙන්නේ මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ගමන් කිරීම ම යි කියල ස්ථාවර වෙනවා නම් කෙනෙක් මේ නිසැක භාවයට පත්වෙනවා නම් චතුරාර්ය සත්‍යය ගැන ඒ නිසැක භාවයට උදව් කරන්නා වූ යම් පුද්ගලයෙක් ඇද්ද, ඒ පුද්ගලයාට උපකාර කරලා, සම්මාන දක්වලා, ගෞරව දක්වලා, ප්‍රත්‍යුපකාර කරලා අවසන් කරන්නට බෑ.

## ඔබ යමෙකුට හිතවත් නම්....

මේකෙන් අපට එකක් පැහැදිලියි. මේ ලෝකයේ දුර්ලභ කරුණු හතරක් බුදුරජාණන් වහන්සේ මේ දේශනාවේ දී පෙන්වා දෙනවා. ඒ දුර්ලභ කරුණු 4 යම් පුද්ගලයෙකුගෙන් ලැබෙනවා නම් ඒ පුද්ගලයාට කෙලෙහි ගුණ දක්වලා අවසන් කරන්න බෑ කියල. ඒ දුර්ලභ කරුණු වලින් පළවෙනි එක තමයි තිසරණයේ පිහිටීම. බුදුරජාණන් වහන්සේ මෙන්න මේ ගුණ වලින් යුක්තයි කියල කියාදීම. බුදුරජාණන් වහන්සේව සරණ යන්න උගන්වනවා. ධර්මය වනාහී මෙයයි කියලා ධර්මය කියලා දීලා සරණ යන්න උගන්වනවා. ශ්‍රාවක සංඝරත්නය මෙයයි කියලා සඟ ගුණ කියා දීලා සරණ යන්න උගන්වනවා. අන්න ඒක මේ ලෝකයේ තිබෙන දුර්ලභ කරුණක්. අවබෝධයෙන් ම තිසරණයේ පිහිටුවනවා නම් කෙනෙක්, තිසරණයේ පිහිටුවන්නට කෙනෙක් උදව් කරනවා නම්, ඒ උදව් කරන එක්කෙනාට කෙලෙහි ගුණ දක්වලා අවසන් කරන්නට බෑ. වැඳුම් පිදුම් කරලා, ඇප උපස්ථාන කරලා, චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස, බෙහෙත්, පිරිකර පූජා කරලා අවසන් කරන්නට බෑ.

දැන් බලන්න මේක කොයි තරම් දුර්ලභ ද කියල. මොකක්ද?

අවබෝධයෙන් ම තෙරුවන් සරණ යාම. අවබෝධයෙන් සිල් රකින්න උගන්වන එක. සීලබ්බත පරාමාසයකට වැටෙන්න නොදී අවබෝධයෙන් ම එයාට ඉන්ද්‍රිය සංවරයෙන් යුතුව සීලය ආරක්ෂා කරන හැටි උගන්වනවා නම්, ඒකත් දුර්ලභ කරුණක්. ඒකට කෙලෙහි ගුණ සලකලා අවසන් කරන්න බෑ. ඊළඟට බුදුරජාණන් වහන්සේ වදාළා බුදුරජාණන් වහන්සේ කෙරෙහි නො සෙල්වෙන ප්‍රසාදයක් ලබා දෙනවා නම් (**අවේච්චප්පසාදේන**) නො සෙල්වෙන පැහැදීමක් ඇති කරලා දෙනවා නම් බුදුරජාණන් වහන්සේ ගේ ගුණ එකක් එකක් පාසා නුවණින් මෙනෙහි කරන්න ඕනෙ. **අරහං** කියන ගුණ මෙනෙහි කරන්න ඕනෙ. නුවණින් **සම්මා සම්බුද්ධ, විජ්ජා චරණ සම්පන්න, සුගත, ලෝක විදූ, අනුත්තරෝ පුරිස දම්ම සාරථී, සත්ථා දේවමනුස්සානං, බුද්ධ, භගවා** කියන මේ ගුණ එකක් එකක් ගානේ අර්ථ වශයෙන් සිහි කරනවා. නුවණින් විමසනවා.

## කිසිදා නො වෙනස් පැහැදීමක්...

මේ සියලු ගුණ බුදුරජාණන් වහන්සේට තිබුණා. මේ ගුණ වලින් යුක්තව බුදුරජාණන් වහන්සේ වැඩ සිටියේ ඒ හා සමාන ගුණයක් ලෝකයේ වෙන කිසිම දෙවියෙකුට, මාරයෙකුට, බ්‍රහ්මයෙකුට, ශ්‍රමණ බ්‍රාහ්මණයෙකුට නැහැ. මේ ගුණ තිබෙන්නෙ මේ ලෝකයේ පහළ වී වදාළ සම්බුද්ධත්වයට පත්වී වදාළ බුදුරජාණන් වහ්නසේලාට පමණයි කියල චිත්ත ප්‍රසාදය ඇතිවුනා නම් අන්න අවේච්චප්ප්‍රසාදය. කාටවත් වෙනස් කරන්න බෑ ඒක. ඊළඟට බුදුරජාණන් වහන්සේ වදාළා ධර්මය. ඒ ධර්මයෙන් කෙලෙස් පිපාසය සංසිඳවනවා.

## ශ්‍රී සද්ධර්මයට පැහැදෙන්න...

සතර අපායේ උපත දුරු කරලා දානවා. ලෝක සත්වයාගේ භව ගමන නවත්වනවා. සියලු කර්ම ක්ෂය කරනවා. කර්ම විපාක අවසන් කරනවා. මේ ධර්මයෙන් චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධය ලබා දෙනවා. ඒ නිසා බුදුරජාණන් වහන්සේ වදාළ මේ ධර්මය මනා කොට දේශනා කරපු එකක්. ඒ ධර්මයේ විස්තර කරනවා අවබෝධ කළ යුතු දේ ගැන. ඒ ධර්මයේ විස්තර කරනවා ප්‍රහාණය කළ යුතු දේ ගැන. ඒ ධර්මයේ විස්තර කරනවා සාක්ෂාත් කළ යුතු දේ ගැන. ඒ ධර්මයේ වැඩිය යුතු දේ ගැන විස්තර කරනවා. එහෙනම් බුදුරජාණන් වහන්සේ මනා කොට දේශනා කරලා තියෙනවා. ඒ ධර්මය කෙරෙහි හැම පියවරක් පාසා එයාගේ චිත්ත ප්‍රසාදය ඇතිවෙනවා. ධර්මය කෙරෙහි ඇතිවෙනවා ගෞරවයක්, ශ්‍රද්ධාවක්. වචනයකින්,

ඇලපිල්ලකින්, ඉස්පිල්ලකින් ධර්මයට අගෞරව වෙන්නේ නෑ. ඒ ධර්මය මනාකොට දේශනා කරන ලද්දක් ය කියලා හිතේ පැහැදීමක් ඇති වෙනවා.

මේ ධර්මය **ස්වාක්ඛාත** යි. ඒ වගේ ම මේ ධර්මය **සන්දිට්ඨික** යි. මේ ජීවිතයේ දී ම අවබෝධ කරගන්න පුළුවන් එකක් කියලා හිතේ ප්‍රසාදයක් ඇති වෙනවා. **අකාලික** යි ඕනෑම කාලයක මේ ධර්මය අවබෝධ කරන්න පුළුවන්. මේ ධර්මයේ හැසිරීමෙන් වහ වහා මේ ධර්මයෙන් අවබෝධය ඇති කරගන්න පුළුවන් කියල, පිළිසරණක් ඇති කරන්න පුළුවන් කියලා ප්‍රසාදයක් ඇතිවෙනව. **ඒහිපස්සික** යි. මේ ධර්මයේ රහස් බණ නෑ. රහසේ කථා කිරීමක් නෑ. මේ ධර්මය හිරු සඳු වගේ විවෘතයි. අන්න පැහැදීමක් ඇතිවෙනවා විවෘතභාවය ගැන. (**තථාගතප්පවේදිතෝ ධම්ම විනයෝ විවටෝ විරෝචති නෝ පටිච්ඡන්නෝ**) බුදුරජාණන් වහන්සේගේ ධර්මය විනය විවෘත වුනා ම යි බබලන්නේ. සැඟවුනාම බබලන්නේ නෑ. මේ අර්ථ දන්න නිසා බුදුරජාණන් වහන්සේ ධර්මය සඟවලා නෑ.

## ගුරු මුෂ්ටි මොකුත් නැහැ...

"(**නත්ථානන්ද තථාගතස්ස ධම්මේ ආචරිය මුට්ඨි**) ආනන්දය, තථාගතයන් වහ්නසේගේ ධර්මයේ ගුරුවරයාගෙන් ගෝලයාට රහසේ දෙන්නා වූ ක්‍රම නෑ." ආචරිය මුට්ඨි කියන්නේ ඒකයි. ආචරිය මුට්ඨි කියන්නේ ගුරුවරයා විශේෂයෙන් දන්නවා කියන එකයි. ආචාර්යවරයා විසින් පුද්ගලයෙකුට ගෝලයෙකුට තෝරලා උගන්වනවා මේක මෙහෙමයි කියලා. එතකොට ඒක ආචාර්යවරයාගෙන් ගෝලයාට යන්නේ ඒක ආචාර්ය මතය. ඒක බුදුදහමේ නැහැ. බුදුරජාණන් වහන්සේ ගේ ධර්මය ඒහිපස්සික යි. බුදුරජාණන් වහන්සේ ධර්මය විග්‍රහ කරන ආකාරය, අවබෝධ කරන ආකාරය පෙන්වල දෙනවා.

## විමසා බලන්න...

ආනන්ද චෛත්‍යස්ථානයේ දී උන්වහන්සේ වදාළා මේක බලන්න ඕනෙ ආකාරය. ඒකට කියනවා සතර මහෝපදේස. ධර්මය කථා කළාට පස්සේ සූත්‍රයේලා බලන්න ඕනෙ. විනයේ සසඳලා බලන්න ඕනෙ. ඒ මොකද? ඒහිපස්සික ධර්මය තෝරගන්නේ එහෙමයි. බුදුරජාණන් වහන්සේ වදාලා මේ ධර්මය ඒහිපස්සිකයි. ඕනෑම කෙනෙකුට ඇවිත් බලන්න පුළුවන්.

ඊළඟට බුදුරජාණන් වහන්සේ ගේ ධර්මය **ඕපනයික** යි. ඕපනයිකයි කියලා කියන්නේ ඒ ධර්මය තමා තුලට පමුණුවාගෙන තමා තුල දියුණු කර ගන්නා එකක්. ඒ ධර්මය **පච්චත්තං වේදිතබ්බ විඤ්ඤූහී**. විඤ්ඤූහී කියන්නේ බුද්ධිමත් අය. පච්චත්තං කියන්නේ වෙන් වෙන් වශයෙන්. වේදිතබ්බෝ කියන්නේ අවබෝධ කරගත යුත්තක්. මෙන්න මේ ලක්ෂණ වලින් යුක්ත බුදුරජාණන් වහන්සේගේ ධර්මය මේ ලෝකයේ කිසි ම විද්‍යාවක්, කිසි ශාස්ත්‍රයක්, කිසි ශිල්පයක්, කිසි කර්මාන්තයක්, කිසි දෙයක් මේ ලක්ෂණ වලින් යුක්ත නෑ. බුදුරජාණන් වහන්සේගේ ධර්මයේ පමණයි මේ ලක්ෂණ තියෙන්නේ. අන්න ඒ ලක්ෂණ හඳුනාගන්නවා එයා.

## ශ්‍රාවක සඟ රුවන ගැනත් පැහැදෙන්නට ඕනෙ...

ඒ ධර්මය අඳුනාගෙන කිසි කෙනෙකුට, වෙන කිසිම බාහිර දෙයකට වෙනස් කරන්නට බැරි විදිහට එයා චිත්ත ප්‍රසාදය ඇති කරගන්නවා. ඒ වගේ ම අපි බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝ රත්නය කෙරෙහිත් කාටවත් සොලවන්න බැරි පැහැදීමක් ඇති කරගන්න ඕනෙ. බුදුරජාණන් වහන්සේ උගන්නලා තියෙනවා, පැහැදිලිව පෙන්වලා තියෙනවා බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝරත්නය ප්‍රාතිමෝක්ෂ සංවර ශීලයෙහි හික්මෙමින්, ආජීව පාරිශුද්ධියෙහි හික්මෙමින්, පංච නීවරණ බැහැර කරමින්, සතර සතිපට්ඨානය වඩමින්, රාග - ද්වේෂ - මෝහ ප්‍රහාණය කරන ප්‍රතිපදාවක යෙදී වාසය කරනවා. ඒ කියන්නේ ඒ ශ්‍රාවක පිරිස **සුපටිපන්න** යි.

ඍජු මාර්ගය වන ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ගමන් කරනවා. **උජුපටිපන්න** යි. චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කරන ආර්ය න්‍යාය අවබෝධ කරවන ධර්මයේ ගමන් කරනවා. **ඤායපටිපන්න** යි. ඒ බුදුරජාණන් වහ්නසේගේ ශ්‍රාවක සංඝරත්නය දෙතිස් කථාවෙන් වෙන් වෙලා දස කථාවෙන් ලෝකයට අනුග්‍රහ කරනවා. ඒ දස කථා තමයි,

**01. අප්පිච්ච කථා : අල්පේච්ඡ ජීවිතය ගැන කථා.**

**02. සන්තුට්ඨි කථා : ලද දෙයින් සතුටු වීම ගැන කථා.**

**03. පවිවේක කථා : හුදෙකලා කාය විවේක, චිත්ත විවේක ඇති කර ගැනීම ගැන කථා.**

**04. අසංසග්ග කථා : මේ ලෝකයට නො ඇලී සිටීම ගැන කථා.**

**05. විරියාරම්භ කථා : කෙලෙස් දුරු කිරීමට වීරිය උපදවා ගැනීම ගැන කථා**

**06. සීල කථා : සීලය දියුණු කර ගැනීම ගැන කථා**

**07. සමාධි කථා : සමාධිය දියුණු කර ගැනීම ගැන කථා**

**08. පඤ්ඤා කථා : ප්‍රඥාව දියුණු කර ගැනීම ගැන කථා**

**09. විමුක්ති කතා : ආර්ය විමුක්තිය සාක්ෂාත් කර ගැනීම ගැන කථා**

**10. විමුක්ති ඤාණදර්ශන කථා : ඒ විමුක්තිය නිසා ඇතිවන්නා වූ අවබෝධය ගැන කථා**

මේ දස කථාවෙන් ලෝකයට සංග්‍රහ කරනවා. ඒ නිසා ශ්‍රාවක සංඝරත්නය **සාමීචිපටිපන්න** යි. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝරත්නය සෝවාන්, සකදාගාමී, අනාගාමී, අරහත් යන මාර්ග - ඵල වශයෙන් පුද්ගලයන් 8 යි. යුගල වශයෙන් 4 යි. මෙන්න මේ සංඝරත්නයේ ගුණ සිහිකරනවා. එතකොට මෙයාට සිතේ පැහැදීමක් ඇති වෙනවා මේ ලෝකයේ වෙන කිසිම බ්‍රාහ්මණ කණ්ඩායමක, වෙන කිසිම පිරිසක මෙවැනි ලක්ෂණ වලින් යුක්ත ශ්‍රාවක පිරිස් දක්නට ලැබෙන්නේ නැහැ. මේ ශ්‍රාවක පිරිස දක්නට ලැබෙන්නේ බුදුරජාණන් වහන්සේ ගේ ශ්‍රාවක පිරිස තුළ පමණයි කියල පැහැදීමක් ඇතිවෙනවා. කාටවත් වෙනස් කරන්න බැරි විදිහට. ඒකට කියනවා අවේච්චප්පසාදය කියල. අවේචප්පසාදය කියන්නේ තමන්ගේ පැත්තට වාසියට බැලිල්ලක් නෙවෙයි. බොහොම මධ්‍යස්ථව බලද්දී කරුණු අවබෝධ කරගන්නවා.

## ඇස් දෙකෙන් නො දැක්කට....

තමන්ට ස්වාමීන් වහන්සේලා උදව් කරනවා. තමන්ට ස්වාමීන් වහන්සේලා දහම් දෙසනවා. ඒ නිසා පැහැදෙනවා. ඒක අවේච්චප්පසාදය නෙවෙයි. අවේච්චප්පසාදය කියල කියන්නේ උන්වහන්සේලාගේ ගුණ අඳුනාගන්නව. උන්වහන්සේලාව ඇස් දෙකෙන් දැක්කේ නැති වුනාට කමක් නෑ. ගුණ අඳුනගන්නවා. බුදුරජාණන් වහන්සේව අපි ඇස් දෙකෙන් දැක්කේ නෑනෙ මේ ජීවිතයේ දී. නමුත් අපි උන්වහන්සේව ගුණ වශයෙන් හඳුනාගෙන හිත පහදවා ගන්නවා. සාරිපුත්ත, මොග්ගල්ලාන, මහා කාශ්‍යප, අනුරුද්ධ, ආනන්ද, නන්ද, රාහුල, මහා කච්චාන ආදී මහ රහතන් වහන්සේලා පිරිනිවන් පෑවා.

නමුත් අපේ පැහැදීම එහෙම ම තියෙන්නේ. ඒක තමයි පැහැදීම. ඒ පැහැදීමෙන් යුක්ත කෙනා ආර්යකාන්ත ශීලයෙහි හික්මෙනවා.

මාර්ග අංග හැටියට එතකොට මේ සෝතාපත්ති අංග හතරෙහි යම් කිසි කෙනෙක්ව සමාදන් කරවනවා නම් අන්න එතකොට ප්‍රත්‍යුපකාර කරලා අවසන් කරන්න බෑ. දුර්ලභ එකක්. එතකොට බලන්න බුදුරජාණන්වහන්සේ දුර්ලභ කරුණු හතරක් පෙන්නලා දෙනව.

**01. තෙරුවන් සරණේ මනාකොට පිහිටන්ට උපකාර කරනවා නම් ඒක දුර්ලභ උපකාරයක්.**

**02. පංච ශීලයෙහි මනා කොට රකින්ට උපකාර කරනවා නම් ඒක දුර්ලභ උපකාරයක්.**

**03. සෝතාපත්ති අංග හතරෙහි පිහිටා සිටින්නට උපකාර කරනවා නම් ඒක දුර්ලභ උපකාරයක්.**

**04. චතුරාර්ය සත්‍යය අවබෝධයෙහි නිසැක භාවයට පත්වෙන්න උපකාර කරනවා නම් ඒක දුර්ලභ උපකාරයක්.**

මෙන්න මේ උපකාර යමෙකුගෙන් ලැබෙනවා නම් ඒ කෙනාට කෙලෙහි ගුණ දක්වලා අවසන් කරන්න බෑ. වැඳුම් පිදුම් කරලා අවසන් කරන්න බෑ. ගෞරව සම්මාන දක්වලා අවසන් කරන්න බෑ. චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස, බෙහෙත් පිරිකර පූජා කරලා අවසන් කරන්නට බෑ.

ඊළඟට බුදුරජාණන් වහන්සේ පුද්ගලිකව දෙන දාන 14 ක් පෙන්නලා දෙනවා.

**01. තථාගතේ අරහන්තේ සම්මා සම්බුද්ධේ දානං දේති**

තථාගත අරහං සම්මා සම්බුදුරජාණන් වහන්සේට දානයක් දෙනවා. මේක පළවෙනි පෞද්ගලික දානය.

**02. පච්චේක බුද්ධේ දානං දේති**

පසේ බුදුවරුන්ට දානයක් දෙනවා. මේක දෙවෙනි පෞද්ගලික දානය.

**03. තථාගතේසාවකේ අරහන්තේ දානං දේති**

තථාගත ශ්‍රාවක වූ රහතන් වහන්සේලාට දානයක් දෙනවා.

මේක තුන්වෙනි පෞද්ගලික දානය.

**04. අරහත්තේ ඵල සච්ඡිකිරියාය පටිපන්නේ දානං දේති**

අරහත් ඵලය සාක්ෂාත් කරන්නට ප්‍රතිපත්තියේ යෙදෙන උතුමන්ට දානයක් දෙනවා. මේක හතරවෙනි පෞද්ගලික දානය.

**05. අනාගාමිස්ස දානං දේති**

අනාගාමී උතුමන්ට දානයක් දෙනවා. මේක පස්වෙනි පෞද්ගලික දානය.

**06. අනාගාමීඵල සච්ඡිකිරියාය දානං දේති**

අනාගාමී ඵලය සාක්ෂාත් කරන්න ප්‍රතිපත්තියේ යෙදෙන කෙනාට දානයක් දෙනවා. මේක හයවෙනි පෞද්ගලික දානය.

**07. සකදාගාමිස්ස දානං දේති**

සකදාගාමී උත්තමයාට දානයක් දෙනවා. මේක හත්වෙනි පෞද්ගලික දානය.

**08. සකදාගාමීඵල සච්ඡිකිරියාය පටිපන්නේ දානං දේති**

සකදාගාමීඵලය සාක්ෂාත් කිරීමට පිළිපන් කෙනාට දානයක් දෙනවා. මේක අටවෙනි පෞද්ගලික දානය.

**09. සෝතාපන්නේ දානං දේති**

සෝතාපන්න වෙච්ච කෙනෙකුට දානයක් දෙනවා. මේක නවවෙනි පෞද්ගලික දානය.

**10. සෝතාපත්තිඵල සච්ඡිකිරියාය පටිපන්නේ දානං දේති**

සෝතාපන්න ඵලය සාක්ෂාත් කරන්න පිළිපන්, ඒ කිව්වේ ශ්‍රද්ධානුසාරී, ධම්මානුසාරී අයට දානයක් දෙනවා. මේක දසවෙනි පෞද්ගලික දානය.

**11. බාහිරකේ කාමේසු වීතරාගේ දානං දේති**

කාමයන් කෙරෙහි නො ඇලී සිටින බුදු සසුනෙන් බාහිර, ඔය ශ්‍රමණ බ්‍රාහ්මණවරුන්, තාපස පරිබ්‍රාජකවරුන් ඉන්නවා. ඒ අයට දානයක් දෙනවා. මේක එකළොස්වෙනි පෞද්ගලික දානය.

**12. පුථුජ්ජන සීලවන්තේ දානං දේති**

චතුරාර්ය සත්‍යය ධර්මය ගැන දන්නේ නැති තිසරණය නැති

සිල්වත් අය ඉන්නවා. පුහුදුන් අය. අන්න ඒගොල්ලන්ට දානයක් දෙනවා. මේක දොළොස්වෙනි පෞද්ගලික දානය.

**13. පුථුජ්ජන දුස්සීලේ දානං දේති**

පෘථග්ජන දුස්සීල අයට දානෙ දෙනවා. තිසරණයේ පිහිටා නැති, සිල්වත් නැති පෘථග්ජන අය. ඒගොල්ලන්ට දානයක් දෙනවා. මේක දහතුන්වෙනි පෞද්ගලික දානය.

**14. තිරච්ඡානගතේ දානං දේති**

තිරිසන්ගත සතුන්ට දානයක් දෙනවා. මේක දහහතරවෙනි පෞද්ගලික දානය.

## දානයේ අනුසස් දැනගන්න....

බුදුරජාණන් වහන්සේ මේ පෞද්ගලික දාන පෙන්නලා දෙනවා. ඊළඟට බුදුරජාණන් වහන්සේ වදාළා ආනන්දය, මේ තිරිසන් ගත සතුන්ට දානයක් පූජා කරගත්තම ඒ අයට ආනිශංස සීයක් තියෙනවා. ඊළඟට සමාන්‍ය මනුස්සයෙක් ඉන්නවා. පෘතග්ජනයි. දුස්සීලයි. එබඳු කෙනෙකුට දානයක් දුන්නම ආනිශංස දාහක් තියෙනවා. ඊළඟට පෘතග්ජනයෙක් ඉන්නවා සීලවන්තයි. තිසරණය නෑ. නමුත් සීලවන්තයි. අවබෝධයෙන් ම තිසරණයේ පිහිටලා ආර්ය මාර්ගයට පැමිණිලා නෑ. සද්ධානුසාරි, ධම්මානුසාරී මට්ටම් වලට ඇවිල්ලා නැති එබඳු පෘතග්ජන සිල්වන්තයෙකුට දානයක් පූජා කරගත්ත කෙනාට ආනිශංස ලක්ෂයක් තියෙනවා.

ඊළඟට බුදු සසුනෙන් බාහිර වූ කාමයන් දුරු කරලා කාමයන් කෙරෙහි වීතරාගී වූ ශ්‍රමණ බ්‍රාහ්මණවරු ඉන්නවා. බණ භාවනා කරගෙන ඉන්නවා. හැබැයි ආර්ය මාර්ගය දන්නේ නැති. ඒ ගොල්ලන්ට දානේ දුන්නම කෝටි ලක්ෂවාරයක් ආනිශංස තියෙනවා. **(සෝතාපත්ති ඵල සච්ඡිකිරියාය පටිපන්නෝ දානං දේති)** සෝවන් ඵලය සාක්ෂාත් කිරීමට පිළිවෙත් පුරන ඒ කිච්චේ සද්ධානුසාරී, ධම්මානුසාරී උතුමන්ට දානේ දුන්නම **(අසංඛෙය්‍යා අප්පමෙය්‍ය දක්ඛිණා පටිකංඛිතබ්බා)** අසංඛෙයිය අප්‍රමාණ ගණනින් නිමකර, ගණන් කරලා අවසන් කළ නො හැකි ප්‍රමාණ අතින් ක්‍රාන්ත වූ පුණ්‍ය විපාක ලැබෙනවා.

**(කෝ පන වාදෝ සොතාපන්නෝ)** සෝතාපන්න වෙච්ච කෙනෙකුට දානයක් දුන්නම අනිශංස ගැන කවර කතා ද? **(කෝ පන වාදෝ සකදාගාමීඵල සච්ඡිකිරියාය පටිපන්නෝ)** සකදාගාමී ඵලය සාක්ෂාත්

කිරීම පිළිපන් කෙනෙකුට දානයක් දුන්නම අනිශංස ගැන කවර කතා ද? **(කෝ පන වාදෝ සකදාගාමිස්ස)** සකදාගාමී වෙච්ච කෙනෙකුට දානයක් දුන්නම අනිශංස ගැන කවර කතා ද? **(කෝ පන වාදෝ අනාගාමීඵල සච්ඡිකිරියාය පටිපන්නෝ)** අනාගාමී ඵලය සාක්ෂාත් කිරීම පිළිපන් කෙනෙකුට දානයක් දුන්නම අනිශංස ගැන කවර කතා ද? **(කෝ පන වාදෝ අනාගාමිස්ස)** අනාගාමී වෙච්ච කෙනෙකුට දානයක් දුන්නම අනිශංස ගැන කවර කතා ද? **(කෝ පන වාදෝ අරහත්තඵල සච්ඡිකිරියාය පටිපන්නෝ)** අරහත් ඵලය සාක්ෂාත් කිරීම පිළිපන් කෙනෙකුට දානයක් දුන්නම අනිශංස ගැන කවර කතා ද? **(කෝ පන වාදෝ තථාගතස්ස සාවකේ අරහන්තේ)** තථාගත ශ්‍රාවක වූ රහතන් වහන්සේලාට දන් දීමෙන් ලැබෙන ප්‍රතිඵල ගැන කවර කතා ද? **(කෝ පන වාදෝ පච්චේකබුද්ධේ)** පසේ බුදුරජාණන් වහන්සේලාට දානයක් දුන්නම අනිශංස ගැන කවර කතා ද? **(කෝ පන වාදෝ තථාගතේ අරහන්තේ සම්මා සම්බුද්ධේති)** තථගත අරහත් වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ නමකට දානයක් දුන්නම අනිශංස ගැන කවර කතා ද?

## සැබෑම සංඝගත දක්ෂිණාව මේකයි...

මේ කියන්නේ පුද්ගලික දාන ගැන. දැන් ඔන්න සංඝගත දක්ෂිණාව විස්තර කරනවා. ඔන්න දැන් අපි අහමු සංඝගත දක්ෂිණාව ගැන බුදුරජාණන් වහන්සේ වදාළ විදිහ. **(සත්ත බෝ පනිමානන්ද සංඝගත දක්ඛිණා)** ආනන්දය සංඝගත දක්ෂිණාවල් (සඟ සතු දාන) හතක් තියෙනවා. මොනවද ඒ හත?

### 01. බුද්ධ පමුඛේ උභතෝ සංඝේ දානං දේති

බුදුරජාණන් වහන්සේවත් සහභාගී කරවාගෙන මූලික වශයෙන් භික්ෂු, භික්ෂුණී කියන සංඝයාට දන් පූජා කරනවා. මේක තමයි සාංඝික දාන වලින් පළවෙනි එක.

### 02. තථාගතේ පරිනිබ්බුතේ උභතෝ සංඝේ දානං දේති

බුදුරජාණන් වහන්සේව පිරිනිවන් පෑ කල්හි බුදුන් ප්‍රමුඛ සංඝයාට කියල දානෙ දෙන්න බෑ. එතකොට භික්ෂු භික්ෂුණීන්ට දානෙ දෙන්න පුළුවන්. මේක තමයි සාංඝික දාන වලින් දෙවෙනි එක.

### 03. භික්ඛු සංඝේ දානං දේති

භික්ෂු සංඝයාට දන් පූජා කරනවා. මේක තමයි සාංඝික දාන වලින් තුන් වෙනි එක.

**04. භික්ඛුනී සංඝේ දානං දේති**

භික්ෂුණී සංඝයාට දන් පූජා කරනවා. මේක තමයි සාංඝික දාන වලින් හතර වෙනි එක.

**05. එත්තකා මේ භික්ඛු ච භික්ඛුනියෝ ච සංඝතෝ උද්දිස්සථා'ති දානං දේති**

මට සංඝයාගෙන් මෙපමණ භික්ෂූන් ලබා දෙන්න, මෙපමණ භික්ෂුණීන් ලබා දෙන්න කියල ගණන් ඇතිව, භික්ෂූන්, භික්ෂුණියන් කැඳවා ගෙන දානයක් පූජා කරනවා. මේක තමයි සාංඝික දාන වලින් පස් වෙනි එක.

**06. එත්තකා මේ භික්ඛු සංඝතෝ උද්දිස්සථා'ති දානං දේති**

මට භික්ෂු සංඝයාගෙන් මෙපමණ භික්ෂූන් ලබා දෙන්න. දෙනමක් හරි, තුන් නමක් හරි, හතර නමක් හරි, පස් නමක් හරි ආරාධනා කරන්නේ කොහොමද භික්ෂු සංඝයාගෙන් මට මෙච්චර ලබා දෙන්න කියලා දානයක් පූජා කරනවා. මේක තමයි සාංඝික දාන වලින් හය වෙනි එක.

**07. එත්තිකා මේ භික්ඛුනියෝ සංඝතෝ උද්දිස්සථා'ති දානං දේති**

මට භික්ෂුණී සංඝයාගෙන් මෙපමණ භික්ෂූන් ලබා දෙන්න. දෙනමක් හරි, තුන් නමක් හරි, හතර නමක් හරි, පස් නමක් හරි ආරාධනා කරන්නේ කොහොමද භික්ෂුණී සංඝයාගෙන් මට මෙච්චර ලබා දෙන්න කියලා දානයක් පූජා කරනවා. මේක තමයි සාංඝික දාන වලින් හත් වෙනි එක.

## සංඝයා නාමයෙන්...

එතකොට සංඝගත දක්ෂිණා හතයි තියෙන්නේ. මේවාට සංඝගත කිව්වේ පොදුවේ පිරිසක් නියෝජනය වන ආකාරයට දානය පූජා කිරීම. **(භවිස්සති බෝ පනානන්ද, අනාගතමද්ධානං)** අනාගත කාලයේ ඇති වෙනවා මේ ශාසනයේ **(ගොත්‍රභූතෝ)** ඒ කියන්නේ ශාසනයේ නමින් විතරක් පෙනී ඉන්නවා. භික්ෂූන් භික්ෂුණීන් නමින් විතරක් පෙනී ඉන්නවා. **(කාසාව කණ්ඨා)** කසාවත් පොරවගෙන ඉන්නව. සංඝයාගේ නියම පැහැදිලි සංඝයා සංඝයා නෙවෙයි. කසාවත් පෙරෙව්වාට ආර්ය සංඝයා නෙවෙයි. ආර්ය මාර්ගයේ ගමන් කරන්නේ නෑ. **(දුස්සීලා)** දුස්සීලයි. **(පාපධම්මා)** පවිටු අදහස්වලින් යුක්තයි. අනාගතයේ ශාසනයේ පහළ වෙනවා මේ වගේ අය. අන්න ඒ දුස්සීල

පිරිසට කෙනෙක් දානය දෙනවා (**සංඝං උද්දිස්ස**) ආර්ය සංඝයාගේ නාමයෙන් දුස්සීල භික්ෂූන්ට දානේ දෙනවා.

(**තදාපහං ආනන්ද සංඝගතං දක්ඛිණං අසංඛෙය්‍යං අප්පමෙය්‍යං වදාමි**) ආනන්දය, මේකත් සංඝගත දක්ෂිණාවක්. මේකේ මහත්ඵල මහානිසංසය අසංඛෙයිය ප්‍රමාණය යි කියනවා. (**නත්වේවාහං ආනන්ද, කේනචි පරියායේන සංඝගතාය දක්ඛිණාය පාටිපුග්ගලිකං දානං මහප්ඵලතරං වදාමි**) ආනන්දය සංඝගත දක්ෂිණාවකින් ලබන මහත්ඵල මහානිශංසය තරම් එකක් මොන ක්‍රමයකින් වත් පෞද්ගලික දානයකින් ලැබෙන්නේ නෑ.

## මෙන්න දානය පිරිසිදු වෙන හැටි...

දැන් පේනවා අපිට ප්‍රජාපතී ගෝතමියට බුදුරජාණන් වහන්සේ මේ චීවරය සංඝයාට දෙන්න. සංඝයාට පූජා කළොත් ඔබ විසින් මාවත් පූජා කරන ලද්දේ ය. සංඝයා ද පුදන ලද්දේය කියල බුදුරජාණන් වහන්සේ වදාළේ ඒකයි. ඊළඟට බුදුරජාණන් වහන්සේ වදාළා දානයක් පිරිසිදු වන ආකාරය. දානය පිරිසිදු වන ආකාර හතරක් තියෙනවා.

1. දායක පක්ෂයෙන් දානය පිරිසිදු වෙනවා. ප්‍රතිග්‍රාහක පක්ෂයෙන් දානය පිරිසිදු නෑ. ඒ තමයි (**ඉධානන්ද දායකෝ හෝති සීලවා කළ්‍යාණ ධම්මෝ**) සිල්වත්, කළ්‍යාණ ධර්ම ඇති යහපත් දායක පිරිසක් ඉන්නවා. මෙහි සීලවා කළ්‍යාණ ධම්මෝ කියන්නේ තිසරණය හොඳට තියෙන, පංච ශීලය ආරක්ෂා කරන පිරිස. (**පටිග්ගාහකා හොන්ති දුස්සීලා පාපධම්මා**) නමුත් මේ දානය පිළිගන්නා පිරිස සිල්වත් නෑ. පව්ටු අදහස් තියෙනවා. ආනන්දය, මේ දානයේ පින ලැබෙන්නේ දායකයා සිල්වත් නිසා, පිළිගන්නා කෙනා සිල්වත් නිසා නෙවෙයි. ඒ පින ලැබෙන්නේ දානය පූජා කරන අයගේ සිල්වත්කමයි යහපත් කමයි නිසා. ඒ නිසා ඒ දානය පිරිසිදු වෙනවා.

2. තව දානයක් තියෙනවා. දානය පිළිගන්නා අය නිසා පිරිසිදු වෙනවා. දානය පූජා කරන අය නිසා නෙවෙයි. (**දායකෝ හෝති දුස්සීලා පාපධම්මෝ**) දානේ දෙන අය සිල්වත් නෑ. දානය ගැන අවබෝධයක් නෑ. පින් පව් වල විශ්වාසයක් නෑ. සිල්වත් කමක් නෑ. නමුත් දානය පිළිගන්න අය (**සීලවන්තෝ කළ්‍යාණ ධම්මා**) ප්‍රතිපත්තිගරුක පිරිසක්. ප්‍රාතිමෝක්ෂ සංවර සීලයේ යෙදෙන, ඉන්ද්‍රිය සංවරයේ යෙදෙන, මාර්ග ඵල ප්‍රතිපදාවේ ගමන් කරන්නා වූ පිරිසක්. එක්කෝ ගමන් කරපු පිරිසක්. මේ වගේ උතුම් ආර්ය පිරිසක් දානේ පිළිගන්නවා. එතකොට

ඒ දානයේ ප්‍රතිඵල තියෙන්නේ දානය පිළිගන්න අයගේ පිරිසිදු බව නිසා. දානය පූජා කරන අයගේ පිරිසිදු කම නිසා නොවෙයි. පූජාව ලබන අයගේ තියෙන පිරිසිදුකම නිසා. ඒ දානය මහත්ඵල මහානිසංශ වෙනවා.

3. තව දානයක් තියෙනවා. ඒ දානය දායකයන්ගෙන් පිරිසිදු වෙන්නෙත් නෑ. දායක පිරිස දුස්සීලයි. ඒ කියන්නේ දායක පිරිස සීලය ආරක්ෂා කරන්නේ නෑ. මත්පැන් ආදිය පානය කරන පිරිස්. පින් පව් වල විශ්වාසයක් නෑ. ඒ ගොල්ලෝ දානෙ දෙන්නේ යුතුකම් ඉටුකිරීමක් විදිහට. එහෙම නැත්නම් නම්බුවට. එහෙම නැත්නම් අසවල් අය කරපු නිසා අපිත් කරනවා කියල දානෙ දෙනවා. නමුත් දෙන අයට ශීලයක් නෑ. එතකොට ඒ පැත්තෙන් පිරිසිදු වෙන්න විදිහක් නෑ. මේ දානයට සහභාගී වෙන දානය පිළිගන්න පිරිසත් දුස්සීලයි. පිළිගන්නා පිරිස තුලත් සීලාදී ගුණයක්, එවැනි යහපත් ගුණ පූර්ණයක් යෙදෙන්නේ නැති පිරිසක් දානය පිළිගන්නවා. එතකොට දුස්සීල පිරිසක් දානේ දෙනවා. දුස්සීල පිරිසක් දානේ වළඳනවා. බුදුරජාණන් වහන්සේ වදාළා මේ දානය දායක පක්ෂයෙන් පිරිසිදු වෙන්නෙත් නෑ. ප්‍රතිග්‍රාහක පක්ෂයෙන් පිරිසිදු වෙන්නෙත් නෑ. මේ දානය මහත්ඵල මහානිසංශ වෙන්නේ නෑ.

4. තව දානයක් තියෙනවා දායක පක්ෂයෙනුත් පිරිසිදු වෙනවා. ප්‍රතිග්‍රාහක පක්ෂයෙනුත් පිරිසිදු වෙනවා. ඒක බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා දායක පක්ෂයෙනුයි, ප්‍රතිග්‍රාහක පක්ෂයෙනුයි පිරිසිදු වෙන ආකාරය ගැන. දායකයා සීලවන්තයි. දායකයා හොඳට තිසරණයේ පිහිටලා ඉන්නෙ. අවබෝධයෙන් ම පංච ශීලය ආරක්ෂා කරනවා. ධර්මයේ හැසිරෙනවා. භාවනා කරනවා. එතකොට දායකයා පිරිසිදුයි. **(සීලවා කළ්‍යාණ ධම්මෝ)** දානය පිළිගන්න, දානය වළඳන පිරිසකුත් ඉන්නවා. වළඳන පිරිස සීලවන්තයි. කළ්‍යාණ ධර්ම ඇති පිරිසක්. මේ වළඳන පිරිස සුදුසුකම් ඇතිව ම දානය වළඳනවා. වළඳන පිරිසත් පිරිසිදුයි. දායක පිරිසත් පිරිසිදුයි. අන්න ඒ දානය මහත්ඵල මහානිශංසය වූ දානයක්.

ඊට පස්සේ බුදුරජාණන් වහන්සේ මේක ගාථාවලින් වදාළා.

**යෝ සීලවා දුස්සීලේසු දදාති දානං**
**ධම්මේන ලද්ධා සුපසන්නචිත්තෝ**
**අභිසද්දහං කම්ම ඵලං උළාරං**
**සා දක්ඛිණා දායකතෝ විසුජ්ඣති**

සිල්වත් කෙනෙක් දුස්සීල අයට දානේ දෙනවා. පහන් සිතින් උදාර වූ කර්ම ඵල විශ්වාස කරගෙන අන්න ඒ දානය දායක පක්ෂයෙන්ත් පිරිසිදු වෙනවා.

**යෝ දුස්සීලෝ සීලවන්තේසු දදාති දානං**
**අධම්මේන ලද්ධා අප්පසන්තචිත්තෝ**
**අනභසද්දහං කම්මඵලං උළාරං**
**සා දක්ඛිණා පටිග්ගාහකතෝ විසුජ්ඣති**

යම්කිසි දුස්සීල කෙනෙක් ඉන්නවා. ධාර්මිකව හරිහම්බ කරපුවත් නෙමෙයි. චිත්ත ප්‍රසාදයකුත් නෑ. කර්ම ඵල විශ්වාසයකුත් නෑ. දානයක් පූජා කරනවා. හැබැයි පිළිගන්නේ සීලවන්ත කෙනෙක්. එතකොට ඒ දානය ප්‍රතිග්‍රහක පක්ෂයෙන් පිරිසිදු බව තියෙනවා.

**යෝ දුස්සීලෝ දුස්සීලේසු දදාති දානං**
**අධම්මේන ලද්ධා අප්පසන්තා චිත්තෝ**
**අනභිසද්දහං කම්මඵලං උළාරං**
**න තං දානං විපුලඵලන්ති බ්‍රෑමි**

යම්කිසි දුස්සීල කෙනෙක් ඉන්නවා. මේ දුස්සීල කෙනා දුස්සීල පිරිසකට දානයක් දෙනවා. මෙයා හම්බ කරපු දේ අධාර්මිකයි. මෙයාගේ හිතේ පැහැදීමකුත් නෑ. ඒ පිරිස කෙරෙහි කර්ම කර්ම ඵල ගැන විශ්වාසයකුත් නෑ. නමුත් දානෙ දෙනවා. දානේ වළඳන්නෙත් දුස්සීල පිරිසක් ම යි. ඒ දානය මහත්ඵල මහානිසංස වෙන්නෙ නෑ.

**යෝ සීලවා සීලවන්තේසු දදාති දානං**
**ධම්මේන ලද්ධා සුපසන්නචිත්තෝ**
**අභිසද්දහං කම්මඵලං උළාරං**
**තං වේ දානං විපුලඵලන්ති බ්‍රෑමි**

දානයක් දීමේ දී මහත්ඵල මහානිශංසය ලැබෙන්නේ මේ දානයෙන්. ඒ තමයි දානය පූජා කරන පිරිස සීලවන්තයි, ගුණවන්තයි. ධර්මයේ හැසිරෙනවා. ඊළඟට දානය පිළිගන්නා වූ පිරිස සීලවන්තයි, ගුණවන්තයි ධර්මයේ හැසිරෙනවා. එතකොට දානය පූජා කරන්නෙත් සිල්වත් පිරිසක්. අන්න ඒ දානය මහත්ඵලයි මහානිසංසයි.

**යෝ වීතරාගෝ වීතරාගේසු දදාති දානං**
**ධම්මේන ලද්ධා සුපසන්නචිත්තෝ**
**අභිසද්දහං කම්මඵලං උළාරං**
**තං වේ දානං ආමිසදානාන මග්ගන්ති**

ආමිස දානවලින් අග්‍ර දානයක් ගැන ඔන්න විස්තර කරනවා. ඒ තමයි කෙනෙක් ඉන්නවා වීතරාගී. කාමයන් කෙරෙහි නො ඇලෙන. බ්‍රහ්මචාරී ශීලය පුරන යම් වීතරාගී ගිහි කෙනෙක් ඉන්නවා. මෙයා වීතරාගී පිරිසකට බඹසර සිල් සුරකින පිරිසකට මේ දානය පූජා කරනවා. ධාර්මිකව හරි හම්බ කරගෙන පහන් සිතින් පූජා කරනවා. අන්න ඒ දානය මේ ආමිස දාන අතුරින් අග්‍ර වූ දානය යි කියලා පෙන්වා දුන්න.

එතකොට පින්වතුනි තේරුම් ගන්න මේ දානය මහත් ඵල මහානිසංස වෙන්නේ කොහොමද කියල.

## මහත්ඵල මහානිසංස වෙන විදිහට ම දන් දෙන්න...

අපි මේකෙන් පැහැදිලි කරගන්න ඕනෙ කරුණු කීපයක් තියෙනවා. අපි දානයක් පූජා කරල මහත්ඵල මහානිශංස ලබාගන්න ඕනෙ නම් ඉස්සෙල්ලාම කළ යුතු දේ නම් පූජා කරන පිරිස සිල්වත් වෙන එක. අපි දන්නවා සමහර දාන දෙන තැන් වලදී අපට පොදුවේ අහන්නට ලැබෙන එකක් තමයි දානය දීලා ඉවර වුනා ම ඒ ගෙදර තියෙන්නේ පාටියක්. ඒ කියන්නේ බෝතල් ගෙනැල්ලා ලැහැස්ති පිට ඉන්නවා. දුස්සීල පිරිසක් දානෙ දෙනවා. මහත්ඵල මහානිශංස නෑ.

සමහරු දුස්සීලව ඉඳගෙන සිල්වතුන් හොයනවා. කෝ සිල්වත් පිරිස් කිය කියා. තමන් දුස්සීලයි. ඒ ගොල්ලො හිතනවා අපි දුස්සීල වුනාට කමක් නෑ අපට මහත්ඵල මහානිශංස ලැබෙන්න නම් අපේ දානෙ පිළිගන්න පිරිස විතරක් සිල්වත් වුනා ම ඇති කියල. ඒක වැරදි බව මේ දේශනාවෙන් පේනවා. එතකොට එක පැත්තයි පිරිසිදු වෙන්නේ. ප්‍රතිග්‍රාහක පක්ෂය විතරයි. එහෙනම් දානය පූජා කරන පක්ෂයත් පිරිසිදු විය යුතුයි.

අපි කියමු ප්‍රතිග්‍රාහක පක්ෂය අපට සිල්වතුන් ගුණවතුන් වෙලා දානය පූජා කරනවා. එතකොට දානය දෙන පැත්තෙන් පිරිසිදුයි. එතකොට ප්‍රතිග්‍රාහක පැත්තෙන් සිල්වත් ගුණවත් පිරිස හිටියොත් පිරිසිදු වෙනවා. එතකොට අපිට එකක් පේනවා. අපි දානයකින් මහත්ඵල මහානිශංස ලබා ගන්න ඕනෙ නම් ඒ අය කරන්න ඕනෙ සිල්වත් වෙන එක තමයි.

## සිල්වත් ව හිතේ පැහැදීම ඇති කරගන්න ඕනෙ...

ධාර්මිකව හොයාගෙන පහන් සිතින් යුතුව කර්ම කර්ම ඵල

විශ්වාස කරගෙන දානේ දෙන එක ම යි. අදත් මේක හොඳට පේනවා දානයක් මහත්ඵල මහානිශංසා වෙන්නේ කොහොමද කියල. දානයක් මහත්ඵල මහානිශංසා වෙන්නේ ම දානය පූජා කරන අයගේ දානය පූජා කරද්දි ඒ පිරිසේ සිල්වත්කම, දානය ගැන, පින් - පව් ගැන අවබෝධය ධාර්මික බව සියයට සීයක් ම බලපානවා.

ඉතින් මේ අනුව අපට මහත්ඵල මහානිසංශ ඇති කරගන්නා වූ දානයක් අපට ලබාගන්න වුවමනා නම් එහෙනම් ගිහි පැවිදි අපි කවුරුත් කරන්නට තියෙන්නේ සීලාදී ගුණධර්ම පුරුදු කරන එක. ප්‍රතිපත්ති ගරුකව ජීවත්වෙන එක. ඒ තුළින් තමයි සියලු දෙනාට යහපත සලස්සවන්න පුළුවන් වෙන්නේ.

ඉතින් මේ පින්වත් පිරිසටත් මේ උතුම් ධර්මය ඉගෙන ගෙන තමන්ගේ ජීවිතයට දාන, ශීල, භාවනා ආදී වශයෙන් පින්කම් රැස් කරගෙන උතුම් චතුරාර්ය සත්‍යය ධර්මය මේ ගෞතම බුද්ධ ශාසනයේ දී ම අවබෝධ කරගන්නට භාග්‍යය උදාවේවා!

*සාදු ! සාදු!! සාදු !!!*

# දුර්ලභ මොහොතින් ඵල ලබමු

## -අක්ඛණ සූත්‍රය-

*ශ්‍රද්ධාවන්ත පින්වතුනි,*

දැන් අපි සූදානම් වෙන්නේ මේ මහා භද්‍ර කල්පයේ හතරවෙනි බුදුරජාණන් වහන්සේ වහන්සේ හැටියට පහළ වී වදාළ අපගේ ශාස්තෘ වූ ගෞතම සම්මා සම්බුදු රජාණන් වහන්සේ වදාළ උතුම් දේශනාවක් ශ්‍රවණය කිරීමට යි. මේ දේශනාව සඳහන් වෙන්නේ **අංගුත්තර නිකායේ අට්ඨක නිපාතයට**. මේ දේශනාවේ නම **අක්ඛණ සූත්‍රය**

## එකම එක අවස්ථාවක් විතරයි....

අක්ඛණ කියලා කියන්නේ අවකාශ, ඉඩකඩ, අවස්ථාව නැති වීම ගැන වදාළ දෙසුම. බුදුරජාණන් වහන්සේ නමක් පහළ වෙලා උතුම් චතුරාර්ය සත්‍යය ධර්මය දේශනා කරන කොට ඒ ධර්මය අවබෝධ කර ගන්න ලැබෙන්නේ එකම එක අවස්ථාවක විතරයි. ඒ අවස්ථාව අහිමි වෙලා ඒ අවස්ථාව බැහැර වෙලා දුකට පත්වෙන්න තියෙන ඉඩකඩ වැඩියි. අන්න ඒ ගැන බුදුරජාණන් වහන්සේගේ දේශනාව. සැවැත් නුවර දී බුදුරජාණන් වහන්සේ භික්ෂු සංඝයා අමතල මේ දේශනාව වදාළේ. බුදු රජාණන් වහන්සේ වදළා මෙහෙම.

**(ඛණා කිච්චෝ ලෝකෝ ඛණා කිච්චෝ ලෝකෝති භික්ඛවේ අශ්‍රුතවා පෘතජ්ජනෝ භාසති)** අශ්‍රැතවත් පෘතග්ජන කෙනා මේ ලෝකේ ඛණ කිච්ච කියලා කිව්වේ මේ ලෝකයේ කාලය අපතේ අරින්නේ නැතිව ඉඩ ලැබෙන වෙලාවෙදි කළ යුතු දේ කිරීමයි කරන්න තියෙන්නේ කියල අශ්‍රැතවත් පෘතග්ජනයා නිතර කියනවා. අශ්‍රැතවත් පෘතග්ජනයා මේ කාරණය කියන්නේ අවබෝධයෙන් නොවෙයි. ඒ කෙනා අවස්ථාව දන්නෙත් නෑ. මේ සැබෑ ම මිනිස් ජීවිතේ තියෙන අවස්ථාව මොකක් ද කියල දන්නෙත් නෑ. ඒ අවස්ථාවෙ අහිමි වීම ගැන දන්නෙත් නෑ. ඒ ක්ෂණය දන්නෙත් නෑ. අක්ෂණය දන්නෙත් නෑ.

## මෙන්න ඒ අශ්‍රැතවත් පෘථග්ජනයා...

එතකොට බුදුරජාණන් වහන්සේ වදාළා මේක දන්නෙ නැත්තේ අශ්‍රැතවත් පෘතග්ජනයා. අශ්‍රැතවත් කියල කියන්නේ චතුරාර්ය සත්‍යය ධර්මය ශ්‍රවණය කරපු නැති, චතුරාර්ය සත්‍යය ධර්මය කෙරෙහි ශ්‍රද්ධාව ඇති වෙච්ච නැති. බුදුරජාණන් වහන්සේ පැහැදිලි කරනවා අශ්‍රැතවත් පෘථග්ජනයා **(අරියානං අදස්සාවි)** ආර්ය දර්ශනය අහිමි වෙච්ච කෙනෙක්. **(අරියධම්මස්ස අකෝවිදෝ)** ආර්ය ධර්මය තේරුම් ගන්න අදක්ෂ කෙනෙක්. **(අරියධම්මේ අවිනීතෝ)** චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කරගන්න ඕනෙ කියල හික්මුණ නැති කෙනෙක්. **(සප්පුරිසානං අදස්සාවි)** සත්පුරුෂයන් ව දන්නේ නැති කෙනෙක්. **(සප්පුරිසධම්මස්ස අකෝවිදෝ)** සත්පුරුෂ ධර්මය තේරුම් ගන්න බැරි කෙනෙක්. **(සප්පුරිසධම්මේ අවිනීතෝ)** සත්පුරුෂ ධර්මයෙහි නො හික්මෙන කෙනෙක්.

## නිවන් දකින්නට බැරි අවස්ථා අටක්...

ඉතින් මේ අශ්‍රැතවත් පෘතග්ජනයාට කාලය ගැනත්, මේ අවස්ථාව ගැනත් මොකවත් දන්නේ නැතිව තමයි කියන්නේ මේ අවස්ථාව දුර්ලභ අවස්ථාවක් ය කියල. ප්‍රයෝජන ගන්න ඕනෙ කියල. බුදුරජාණන් වහන්සේ වදාළා මේ අක්ඛණ සූත්‍රයේ දී, "**(අට්ඨි මේ භික්ඛවේ අක්ඛණං අසමයා බ්‍රහ්මචරිය වාසාය)** පින්වත් මහණෙනි, නිවන් අවබෝධ කරගන්ට බැරිවෙන අවස්ථාවල්, නිවන් අවබෝධ කරගන්ට බැරිවෙන කාල අටක් තියෙනවා."

බ්‍රහ්මචරිය වාසාය කියන්නේ චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කර ගැනීම පිණිස යෝනිසෝ මනසිකාරයේ යෙදෙමින් ධර්මානුධර්ම ප්‍රතිපදාවේ යෙදීම. ඒක බැරි වෙන අවස්ථා අටක් තියෙන බව බුදු

රජාණන් වහන්සේ වහන්සේ මේ අක්ඛණ සූත්‍රයේ දී පෙන්වා වදාළා. පින්වතුනි, අපි එහෙම නම් බලමු මේ බැරි වෙන අවස්ථා අට අවාසනාවන්ත අවස්ථා අට කුමක්ද කියල.

## තථාගතයන් වහන්සේ නමක් ලෝකයට පහළ වෙනවා...

"(**ඉධ භික්ඛවේ, තථාගතෝ ච ලෝකෝ උප්පන්නෝ හෝති, අරහං සම්මා සම්බුද්ධෝ, විජ්ජාචරණ සම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්ම සාරථී සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවා**) පින්වත් මහණෙනි, අරහත් වූ, සම්මා සම්බුද්ධ වූ, විජ්ජාචරණ සම්පන්න වූ, සුගත වූ, ලෝක විදූ, අනුත්තරෝ පුරිස දම්ම සාරථී, සත්ථා දේවමනුස්සානං, බුද්ධ, භගවා යන ගුණයෙන් යුතු තථාගත බුදුරජාණන් වහන්සේ නමක් මේ ලෝකයට පහළ වෙනවා. (**ධම්මෝ ච දේසියති**) ශ්‍රී සද්ධර්මය දේශනා කරන්න පටන් ගන්නවා. එතකොට ලෝකයේ ඇහෙනවා (**ඕපසමිකෝ**) කෙලෙස් සංසිඳුවන, (**පරිනිබ්බායිකෝ**) පිරිනිවන් පෑමට උපකාර කරන්නා වූ, (**සම්බෝධගාමී**) චතුරාර්ය සත්‍යය අවබෝධය ඇති කරවන්නා වූ, (**සුගතප්පවේදිතෝ**) ඒ තථාගතයන් වහන්සේ විසින් වදාරන ලද ධර්මය අහන්න ලැබෙනවා. එතකොට බලන්න බුදුරජාණන් වහන්සේ මේ දේශනාවෙදි මොන තරම් ලස්සනට පැහැදිලි කරනවද කියල.

තථාගත අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ නමක් පහළ වෙනවා. ඒ බුදුරජාණන් වහන්සේ කවුද? ඒ අර කියන ලද්දා වූ ගුණයන්ගෙන් යුක්ත වූ ශාස්තෲන් වහන්සේ. එතකොට ඒ ශාස්තෲන් වහන්සේ විසින් අවබෝධ කරන්නා වූ අවබෝධ කොට වදාළ ධර්මයත් මේ ලෝකය තුළ කථා බස් කරනවා. කෙලෙස් සංසිඳුවන, නිවන අවබෝධ කරවන, චතුරාර්ය සත්‍යය අවබෝධ කරවන්නා වූ ධර්මය. එතකොට මේ කරුණු දෙක ලෝකයේ තියෙන වෙලාවේ;

## නිරයේ හිටියොත් අවස්ථාව අහිමියි...

"(**අයංච පුග්ගලෝ නිරයෝ උප්පන්නෝ හෝති**) අනේ, ඒ සත්වයා ඉපදිලා ඉන්නවා නිරයේ. (**අයං භික්ඛවේ පඨමෝ අක්ඛණෝ අසමයෝ බ්‍රහ්මචරිය වාසාය**) පින්වත් මහණෙනි, මේක තමයි පළවෙනි අවකාශ රහිත වූ, ඉඩකඩ නැති බව, නො කාලය. ඒ කියන්නේ ධර්මය අවබෝධ කරගන්න බැරි කාල පරිච්ඡේදය."

ධර්මයේ හැසිරෙන්න බැරි කාල පරිච්ඡේදය නිරයේ ඉපදී සිටීම. එතකොට නිරයේ ඉපදිලා සිටින කෙනාට බුදුරජාණන් වහන්සේ නමක්

මේ ලෝකයට පහළ වුනා කියල ප්‍රයෝජන ගන්න අවස්ථාවක් නෑ. බුදුරජාණන් වහන්සේ වදාළා ධර්මය ලෝකයේ පැතිරෙනවා කියල ප්‍රයෝජන ගන්න අවස්ථාවක් නැහැ.

## තිරිසන් ලෝකයේ හිටියත් අවස්ථාව අහිමියි...

දෙවැනි කරුණ "පින්වත් මහණෙනි, තථාගත අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ (ඒ කිව්වේ අර නව අරහාදී බුදු ගුණයන්ගෙන් යුතු භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ) මේ ලෝකයට පහළ වෙනවා." මේ ලෝකයට තථාගතයන් වහන්සේ නමක් පහළ වුනා ම පමණ යි ඒ ධර්මය අහන්න ලැබෙන්න, සුගතපවේදිත ධර්මය තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන්නා වූ ධර්මය සුගතයන් වහන්සේ විසින් අවබෝධ කළ ධර්මය මොකක් ද? චතුරාර්ය සත්‍යය. ඒ ධර්මය අහන්න ලැබෙනවා. ඒකේ තියෙන්නෙ මොනවද? **(ඕපසමිකෝ)** ඒ ධර්මය කෙලෙස් සංසිඳෙනවා. **(පරිනිබ්බායිකෝ)** පිරිනිවන් පාන්න උදව් වෙනවා **(සම්බෝධගාමිං)** චතුරාර්ය සත්‍යය අවබෝධ කරන වැඩපිළිවෙල. ඒ ධර්මය මේ ලෝකයේ කථා බස් කරනවා. අහන්න ලැබෙනවා. අහන්න ලැබෙන කොට ධර්මය අවබෝධ කළ යුතු පුද්ගලයා **(තිරච්චාන යෝනිං උප්පන්නෝ හෝති)** තිරිසන් අපායේ ඉපදිලා ඉන්නවා, බල්ලෙක් වෙලා ඉන්නවා. බළලෙක් වෙලා ඉන්නවා. වෙනත් සතෙක් වෙලා ඉන්නවා. ඌරෙක්, හරකෙක්, එළුවෙක් වෙලා ඉපදිලා ඉන්නවා. ඊළඟට වෙනත් පක්ෂියෙක් වෙලා ඉන්නවා. එහෙම නැත්නම් ජලයේ ඉපදිලා ඉන්නවා මාළුවෙක් වෙලා. අවස්ථාවක් නැහැ. දන්නේ නැහැ බුදුරජාණන් වහන්සේ නමක් පහළ වෙලා මේ නිකෙලෙස් බවට පත්වන්නා වූ චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කරන්නා වූ ධර්මය දේශනා කරලා තියෙනවා කියන කරුණ දන්නේ නැහැ.

බුදුරජාණන් වහන්සේ වදාළා "**(අයං භික්ඛවේ දුතියෝ අක්ඛණෝ අසමයෝ බ්‍රහ්මචරිය වාසායා)** පින්වත් මහණෙනි, මේක තමයි මේ චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කිරීම පිණිස නිවන් අවබෝධ කිරීම පිණිස බාධක වූ අන්තරායකර වූ අනතුරු දායක වූ අවකාශ රහිත වූ ඉඩකඩ නැති බව.

එතකොට නිරයේ උපන්නා නම් එයාට ධර්මය අවබෝධ කරන්න ඉඩකඩ නැහැ. අවකාශ නෑ. තිරිසන් අපායේ උපන්නා නම් ධර්මය අවබෝධ කරන්න ඉඩකඩ නෑ. අවකාශ නෑ. "පින්වත් මහණෙනි, මෙන්න මේ අවස්ථාවන්ට පත් වෙච්ච කෙනාටත්, ඒ කියන්නේ මිනිස් ලෝකෙ ඉඳලා තිරිසන් අපයේ ඉපදිලා ඉන්න කෙනාටත් ධර්මය අවබෝධ කරගන්න අවස්ථාව ලැබෙන්නෙ නැහැ."

## භයානක උපත් දෙක...

එක තැනකදි බුදුරජාණන් වහන්සේ වදාළා "පින්වත් මහණෙනි, මම බුදු ඇසින් දකින්නේ නැහැ මේ තරම් අනතුරුදායක, මේ තරම් භයානක උපතක්. මේ නිරයේ ඉපදීමයි, තිරිසන් අපායේ ඉපදීමයි." දැන් නිරයේ ඉපදුනාට පස්සේ නිරි සතාට ඒ කිව්වේ අපායේ ඉපදිච්ච, නිරයේ ඉපදිච්ච සත්වයා නිරන්තරයෙන් ම වද වේදනා වලට භාජනය වෙවී අප්‍රමාණ දුකකින් දොම්නසකින් ඉන්නව. ඒ පැත්තට බුදුවරු වඩින්නේ නැහැ. ඒ ධර්මය අහන්න ලැබෙන්නේ නෑ. අප්‍රමාණ දුකකින් දොම්නසකින් වේදනාවකින් ඉන්නවා. තිරිසන් අපායේ ඉපදුනාට පස්සේ තිරිසන් සතුන්ට තියෙන්නේ නිරන්තරයෙන් ම බඩගින්න. නිරන්තරයෙන් ම තියෙන්නේ කෑමක් හොයාගෙන යන එක. එහෙම නැත්නම් නිදාගෙන ඉන්න එක. මේ තිරිසන් අපාගත සත්තුන්ට කිසිසේත් ම ජීවිතය ගැන තේරුම් ගන්න අවස්ථාවක් නැහැ.

## පෙරේතයෙක් වෙලා හිටියටත් අවබෝධ කරන්න බෑ..

ඊළඟට බුදුරජාණන් වහන්සේ වදාළා තථාගත අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ ලොවට පහළ වෙනවා. පහළ වෙලා මේ ධර්මය ලෝකයට ඇහෙන්න පටන් ගන්නවා. කෙලෙස් සංසිඳුවන්නා වූ, සියළු ම දුක් කෙළවර කරන්නා වූ, පිරිනිවන් පෑමට හේතු වන්නා වූ, චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධය කරා රැගෙන යන්නා වූ තථාගතයන් වහන්සේ දේශනා කළ ධර්මය ලෝකයේ ඇහෙනවා.

අනේ මේ කෙනා ගිහිල්ලා ඉපදිලා ඉන්නවා ප්‍රේත ලෝකයේ. ප්‍රේත ලෝකෙ උපන්නට පස්සේ එයාට අවස්ථාවක් නැහැ. ප්‍රේත ලෝකෙ උපන්නට පස්සේ හැම තිස්සෙම ඉන්නේ බඩගින්නේ. අධික ලෙස ඇල්ම ඇති කරගෙන නොයෙක් දේවල් වලට බඩගින්නෙන් පිපාසයෙන් තැවි තැවී ඉන්නවා.

ඒ අයට මේ ධර්මය කෙරෙහි හිත යොමු කරගන්න ප්‍රේතයින්ට අවස්ථාවක් නැහැ. ඒ නිසා බුදුරජාණන් වහන්සේ වදාළා "**(අයං භික්ඛවේ තතියෝ අක්ඛණෝ අසමයෝ බ්‍රහ්මචරිය වාසාය)** පින්වත් මහණෙනි, මේක තමයි චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කරගන්න බැරි වෙන්නා වූ, අවකාශ රහිත වන්නා වූ, ඉඩකඩ නැති වන්නා වූ තුන්වෙනි අක්ෂණ ය. ක්ෂණ සම්පත්තිය නැති වෙලාව එතකොට එහෙමත් අහිමි වෙනවා. එතකොට පින්වතුනි, අපි මේ සංසාරේ බුදුරජාණන් වහන්සේලා පහළ වෙද්දී අපි නිරයේ ඉන්න ඇති. අපිට

ඒ අවස්ථාව අහිමි වෙලා ගියා. බුදුරජාණන් වහන්සේලා පහළ වෙලා ධර්මය දේශනා කරද්දී තිරිසන් අපායේ අපි ඉන්න ඇති. ඒ අවස්ථාව අපිට අහිමි වෙලා ගියා. බුදුරජාණන් වහන්සේලා පහළ වෙලා ධර්මය දේශනා කරද්දි ප්‍රේත ලෝකයේ ඉන්න ඇති. ඒ අවස්ථාවත් අපට අහිමි වෙලා ගියා. ධර්මාවබෝධ කරන්න බෑ ඒ කිසිම දවසක.

## අසඤ්ඤතල වල ඉපදුනත් බැහැ..

ඊළඟට බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා තථාගත අරහත් සම්මා සම්බුද්ධ, විජ්ජාචරණ සම්පන්න, සුගත, ලෝක විදූ, අනුත්තරෝ පුරිසදම්ම සාරථී, සත්ථා දේව මනුස්සානං, බුද්ධ, භගවා යන තථාගත බුදුරජාණන් වහන්සේ ලෝකයට පහළ වෙනවා. පහළ වෙලා කෙලෙස් සංසිඳුවන්නා වූ, නිවන අවබෝධ කරවන්නා වූ, චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ වීම පිණිස මාර්ගය පෙන්වන්නා වූ, ඒ මාර්ගය දක්වන්නා වූ තථාගත ශ්‍රී සද්ධර්මය ඔන්න ලෝකයේ අහන්න ලැබෙනවා. එතකොට ඒ පුද්ගලයා ඉපදිලා ඉන්නවා අති දීර්ඝ ආයුෂ තියෙන අරූප දිව්‍ය ලෝක වල. අසංඥ දිව්‍ය ලෝක වල ඉපදිලා කල්ප ගණන් ඔහේ ඉන්නවා. බාහිර දේකට හිත යොමු කරගන්නේ නැතිව කල්ප ගණන් ඉන්න දිව්‍ය ලෝක තියෙනවා. ඒ දිව්‍ය ලෝක වල ගිහිල්ලා මේ සත්වයා ඉපදෙනවා.

ඒ ඉපදිච්ච ලෝකයට බුදුරජාණන් වහන්සේලා පහළ වුනා කියල ඒ දෙවිවරු දන්නේ නහැ. මේ කියන්නේ දීර්ඝ ආයුෂ තියෙන අරූප අසංඥතල දිව්‍ය ලෝකවල. එතකොට සාමාන්‍යයෙන් ගත්තොත් කාමාවචර දිව්‍ය ලෝක හැටියට සැලකෙන තාවතිංස, චාතුම්මහාරාජික, යාම, තුසිත, නිම්මාණරතී, පරනිම්මිත වසවත්ති කියන දිව්‍ය ලෝකත්, අකණිටා බඹලොව දක්වා තියෙන දිව්‍ය ලෝක වලත් ධර්මය අවබෝධ කරන්න පුළුවන්. ඒක පැහැදිලිව ම දම්සක් පැවතුම් සූත්‍රයේ සඳහන් වෙනවා. ඒ දෙවිවරු දහම් ඝෝෂා පැවැත්තුවා කියල.

## අනෙක් දිව්‍ය ලෝක වල ඉපදුනොත්....

**(ඒතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං)** භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ බරණැස ඉසිපතන මිගදායේ දී අනුත්තර වූ ධම්මචක්කය පවත්වා වදාළා. **(අප්පතිවත්තියං සමණේන වා, මාරේන වා, දේවේන වා, බ්‍රහ්මුනා වා, කේනචි වා)** ලෝකයේ දෙව් මිනිස් සහිත කිසිම කෙනෙකුට මේ ආකාරයට දේශනා කරන්නට බැරිය කියල.

ඒක පැතිරෙන්න නම් ඉතින් ඒක තේරෙන්න එපැයි. ඉතින් ඒකෙන් පේනවා අකනිට්ට බඹලොව දක්වා අවබෝධ කරන්න පුළුවන්. මෙතන කියන්නේ ඒක නෙවෙයි. කල්ප ගණන් ඉන්න දිව්‍ය ලෝක තියෙනවා. ඒවායේ දෙවිවරු ඉපදිලා ඉන්නවා. බාහිර ලෝකෙට හිත විසුරුවන්නේ නැහැ. ඒ නිසා දන්නේ නැහැ කිසිම දෙයක්. අන්න ඒ දිව්‍ය ලෝකෙ උපන්නොත් **(අයං භික්ඛවේ චතුත්ථෝ අක්ඛණෝ අසමයෝ බ්‍රහ්මචරිය වාසාය)** පින්වත් මහණෙනි, ඒක තමයි මේ චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කරගන්න යෝනිසෝ මනසිකාරයේ යෙදීමට, ධම්මානුධම්ම ප්‍රතිපදාවේ යෙදීමට තියෙන අවස්ථාව මඟහැරෙන, අවකාශ ඉඩකඩ සියල්ල ම අහිමි වෙන හතරවෙනි අවස්ථාව.

ඒ අවස්ථාවෙදීත් එයාට කිසි පිහිටක් නැහැ. සමහර විට අපි දන්නවා ඔය හිමාලේ වගේ පළාත් වල සාධු වරු, ඍෂිවරු මුකුත් දන්නේ නැහැ. ඔහේ භාවනා කරනවා. සමහර විට හිත වැටෙනවා අසංඥෙට. ඊට පස්සේ ඒකට හිත ඇලුම් කරනවා. ඉතින් ගිහින් උපදිනවා අරූප භවයේ.

## පතිරූප දේස වාසෝ ච – ඒතං මංගල මුත්තමං

බුදුරජාණන් වහන්සේ ඊළඟට වදාළා, මේ ලෝකයේ අරහං, සම්මා සම්බුද්ධ, විජ්ජාචරණ සම්පන්න ආදී ගුණයන්ගෙන් සමන්විත වූ තථාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේ නමක් ලෝකෙට පහළ වෙනවා. පහළ වෙලා මේ කෙලෙස් සංසිඳුවන්නා වූ පිරිනිවන් පෑමට උපකාර වන්නා වූ ආර්ය සත්‍යය අවබෝධය ඇති කරවන්නා වූ සුගතපවේදිත ශ්‍රී සද්ධර්මය ඔන්න ලෝකයේ ශ්‍රවණය වෙනවා. අහන්න ලැබෙනවා. අහන්න ලැබෙන කොට මේ පුද්ගලයා ගිහිල්ලා ඉපදිලා ඉන්නවා. කොහෙද ඉපදිලා ඉන්නේ? ඈත දුෂ්කර පළාත් වල ඉපදිලා ඉන්නවා. නුවණ දියුණු කරන්නේ නැති සමාජ වල ඉපදිලා ඉන්නවා. නොයෙක් ආගමික මතවාද එහෙම නැත්නම් නොයෙක් අදහස් වලට බැඳිලා එක්කෝ ඔය නොයෙක් ආකාරයෙන් ඔය නො දියුණු ජීවිත ගෙවන සමාජ වල ඉපදිලා ඉන්නවා.

**(යත්ථ නත්ථි ගති භික්ඛූනං, භික්ඛුණීනං, උපාසකානං, උපාසිකානං)** ඒ පළාතට භික්ෂූන් වහන්සේලා වඩින්නේ නැහැ. භික්ෂුණීන් වඩින්නෙත් නැහැ. තෙරුවන් සරණ ගිය උපාසකවරු යන්නේ නැහැ. තෙරුවන් සරණ ගිය උපාසිකාවන් යන්නේ නැහැ. ඒ පළාතට කවුරුත් යන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ ගේ ධර්මය හොඳට ඉගෙන ගත්තු සිව්වණක් පිරිසෙන් කවුරුත් ඒ පළාතට යන්නෙ

නැහැ. නො දියුණු පළාත් වලට යන්නෙ නැහැ. එතකොට මොකද වෙන්නේ.

**(අයං භික්ඛවෝ පංචමෝ අක්ඛණෝ අසමයෝ බ්‍රහ්මචරිය වාසාය)** මේක තමයි මහණෙනි, මේ මාර්ගය අහිමි වෙන්නා වූ චතුරාර්ය සත්‍යය අවබෝධයට තියෙන ඉඩකඩ නැතිවන්නා වූ අකාලය බවට පත්වන්නා වූ පස්වෙනි අවස්ථාව.

## මේ ලෝකයේ වැඩියෙන් ම තියෙන්නේ ඒ වගේ ප්‍රදේශ...

දැන් අපි ගත්තොත් ලංකාවේ පවා චතුරාර්ය සත්‍යය ධර්මය අහන්නට ලැබෙන්නේ නැති ඈත දුෂ්කර පළාත් තියෙනවා. දැන් ඒ වගේ ම ලෝකෙ පුරාම තියෙන්නෙත් ක්ෂණ සම්පත්තිය නොවේ. අක්ෂණය ම යි තියෙන්නේ. ඒ කියන්නේ ධර්මය අවබෝධ කරගන්න ඉඩකඩ නැති බව ම යි. හැම තැන ම වගේ තියෙන්නේ ඉඩකඩ ඇති බව නෙවෙයි.

## අවාසනාවන්ත මිත්‍යා දෘෂ්ටිකයා...

ඊළඟට බුදුරජාණන් වහන්සේ වදාළා තථාගත අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ ලෝකයේ පහළ වෙනවා. නව අරහාදි බුදුගුණ යන්ගෙන් යුතු ශාස්තෘන් වහන්සේ ලෝකයේ පහළ වෙනවා. පහළ වෙලා හිට මේ ධර්මය දේශනා කරනවා. එතකොට ශ්‍රාවක පිරිස් ඒක ඉගෙන ගෙන බුදුරජාණන් වහන්සේ යම් ධර්මයක් දේශනා කරනවා ද, ශ්‍රාවක ජනතාවත් ඒ ධර්මය ඉගෙන ගන්නවා. ඒකනෙ ශ්‍රාවකයා කියන්නේ.

බුදුරජාණන් වහන්සේගෙන් ඒ ශ්‍රාවක පිරිස ඒ ධර්මය ඉගෙන ගෙන කියාගෙන යනවා. එහෙම කියාගෙන යනකොට ඒකෙ තියෙන්නේ කෙලෙස් නසන්නා වූ, නිවන කරා යාමට උපකාර වන්නා වූ චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කරවන්නා වූ ධර්මයත් දේශනා කරනවා. පුද්ගලයෙක් ඉපදිලා ඉන්නවා. මේක ඇහෙන පළාතක නමුත් එයා ඉන්නේ. **(මිච්ඡාදිට්ඨිකෝ විපරිත දස්සනෝ)** මිත්‍යා දෘෂ්ඨිකයි. විපරීත දස්සනෝ කියල කියන්නේ දැක්ම විකෘතියි. විපරීත දැක්ම කියන්නේ මොකක් ද?

- **නත්ථි දින්නං** - දන් දීමේ කිසි ඵලක් නැහැ.
- **නත්ථි ඉට්ඨං** - පුද පූජා පැවැත්වීමේ සේවා කිරීමේ කිසි ඵලක් නෑ.

- **නත්ථි හුතං** - වෙනත් යහපත් දේවල් කිරීමෙන් සේවා කටයුතු කිරීමෙන් කිසි ඵලක් නැහැ.
- **නත්ථි සුඛට දුක්ඛටානං කම්මානං ඵලං විපාකෝ** - මේ සැප දුක් දෙක ඇති කරවන්නා වූ කර්ම ඵල කියල එකක් නැහැ.
- **නත්ථි අයං ලෝකෝ** - මේ ලෝකය කියලා අමුතුවෙන් විශේෂ තැනක් නැහැ.
- **නත්ථි පරෝලෝකෝ** - ආයේ මේ මැරුණාට පස්සේ යන්න කියලා වෙන ලෝකයක් නෑ.
- **නත්ථි මාතා** - අම්මා කියල විශේෂ කෙනෙකුට සලකන්න ඕනෙ නෑ.
- **නත්ථි පිතා** - පියා කියල ආයෙ අමුතුවෙන් පුද්ගලයෙක් තෝරන්න ඕනෙ නෑ.
- **නත්ථි සත්තා ඕපපාතිකා** - ඕපපාතික සත්වයෝ කියලා කොටසක් ලෝකෙ නැහැ.
- **නත්ථි ලෝකේ සමණ බ්‍රාහ්මණා සම්මග්ගතා සම්මා පටිපන්නෝ ඉමඤ්ච ලෝකං පරංච ලෝකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවේදෙන්තී'ති** - මේ ලෝකයේ මෙලොව පරලොව දෙකම මනා කොට අවබෝධ කරගත්තු ශ්‍රමණ බ්‍රාහ්මණයන් වහන්සේලා බුදුවරු පහළ වෙන බව, බුදුරජාණන් වහන්සේලා ගේ ධර්මය තියෙන බව, එහෙම එකක් ලෝකයේ නැහැ.

අන්න ඔය මානසිකත්වය තියෙන අය ඉන්නවා ඒගොල්ල මිත්‍යා දෘෂ්ඨික **(විපරීත දස්සනෝ)** විකෘති දැකුම් ඇති විපරීත වෙලා කණපිට හැරිලා එයාගේ කල්පනාව. අන්න එහෙම පිරිසට බුදුරජාණන් වහන්සේ නමක් පහළ වුනත් චතුරාර්ය සත්‍යය ධර්මය දේශනා කරගෙන ගියත් එයාට අවස්ථාවක් ලැබෙන්නේ නෑ මේ ධර්මය අවබෝධ කරගන්න. එයාට ඒ අවස්ථාව අහිමි වෙලා යනවා බුදුරජාණන් වහන්සේ වදාළා.

## මිත්‍යා දෘෂ්ඨික වුනොත් අවස්ථාව අහිමි වෙනවා...

**(අයං භික්ඛවේ ඡට්ඨෝ අක්ඛණෝ අසමයෝ බ්‍රහ්මචරිය වාසාය)** පින්වත් මහණෙනි, මේක තමයි චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කිරීමේ අවස්ථාව අහිමි වන්නා වූ, හයවෙනි මොහොත හැටියට බුදුරජාණන් වහන්සේ වදාළේ.

බුදුරජාණන් වහන්සේ පහළ වෙලා චතුරාර්ය සත්‍යය ධර්මය කථා වෙනවා. නිවන් අවබෝධ කරගන්නා වූ මාර්ගය කථා වෙනවා. එයා අවධානය යොමු කරන්නේ නැහැ. එයා පිළිගන්නේ නැහැ. අන්න ඒකට කියනවා මිත්‍යා දෘෂ්ටිකයි කියල. එයා පිළිගන්නේ නැහැ මේ ධර්මය අවබෝධ කරගන්න පුළුවන් කියල.

## මේ කාලෙ නිවන් දකින්න පුළුවන් ද?

එතකොට අපිට පැහැදිලිව පේනවා වැඩිපුර ඉන්නේ මෙන්න මේ පිරිස. මේ මිත්‍යා දෘෂ්ඨික පිරිස. අවාසනාව කියන්නේ පැවිද්දන් අතරත් ඉන්නවා, ගිහි අය අතරත් ඉන්නවා. බෞද්ධ වේෂයෙනුත් ඉන්නවා. අන්න ඒ පිරිස කියනවා ඔය චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කරගන්න පුළුවන් එකක් නෙවෙයි. ඔහොම කියල නිවන් අවබෝධ කරගන්න බෑ. ඔය කියන ආකාරයට මාර්ග ඵල ලබන්න බැහැ. සංසාරෙන් එතෙර වෙන්න බැහැ. මේ කාලේ නිවන් අවබෝධ කරන්න බෑ. ඒ ඔක්කොම අයිති වෙන්නේ මේ සම්මා දිට්ඨිය නැති පිරිසට යි.

එතකොට **(මිත්‍යා දෘෂ්ඨික විපරිත දස්සනෝ)** විපරිත දර්ශන විකෘති දැක්මක් ඇති මිත්‍යා දෘෂ්ඨික පිරිසට තමයි ඒ අය අයිති වෙන්නේ. ඇයි ඒ අය පිළිගන්නේ නැහැනේ මේ ලෝකයේ මෙලොව පරලොව මනා කොට අවබෝධ කළ ශ්‍රමණ බ්‍රාහ්මණවරු ඉන්නවා කියල. එතකොට ඒ අය මේක පිළිගන්නෙ නැති නිසා කියනවා මෙලොව පරලොව දෙකම මෙහෙයි තියෙන්නේ. අපාය දිව්‍ය ලෝකය ඔක්කොම මේකෙ තියෙන්නෙ කියනවා. ඒ නිසා ඔය කියන ආකාරයට ධර්මය අවබෝධ කරගන්න බෑ. චතුරාර්ය සත්‍යය අවබෝධ කිරීම අලුත් ස්ටයිල් එකක් කියනවා.

## ධම්මදෙස්සී පරාභවෝ...

මෙහෙම කියලා මේ ධර්මයට ගරහන්න පටන් ගන්නවා. ඒ ගරහන සියලු දෙනා ම මිත්‍යා දෘෂ්ඨිකයි. ඒ කාටවත් ධර්මය අවබෝධ කරන්න හම්බ වෙන්නෙ නැහැ. මොකද හේතුව, ඒ ධර්මයට ගරහන කොට, අපහාස කරන කොට චතුරාර්ය සත්‍යය අවබෝධ කරන්න බෑ කියල ගිහි හෝ වේවා පැවිදි හෝ වේවා යමෙක් කියයි නම් එයා බුදුරජාණන් වහන්සේගේ විශාරද ඥාණ වලින් එකකට පහර ගහනවා. බුදුරජාණන් වහන්සේට විශාරද ඥාණ හතරක් තියෙනවා. මේ විශාරද ඥාණ හතරෙන් එකක් තමයි බුදුරජාණන් වහන්සේ වදාළා මේ

ලෝකයේ බුදුරජාණන් වහනසේ නමක් විසින් යම් කරුණක් අරඹයා ධර්මය දේශනා කරනවාද, ඒ දේශනා කරන්නා වූ ධර්මයට අනුකූලව ජීවත් වෙලා ඒකෙන් ප්‍රතිඵල ලබන්නට බෑ කියල දෙවියන් මිනිසුන් අතර දෙවියන්, මරුන්, බඹුන් අතර කිසිවෙකුට කරුණු සහිතව කියන්න බෑ. ඒ කාරණයෙන් තථාගතයන් වහන්සේ විශාරද යි.

## විශාරද ඤාණ වලට අභියෝග නැහැ...

යම් කිසි කෙනෙක් ගිහි හෝ වේවා පැවිදි හෝ වේවා මේ චතුරාර්ය සත්‍යය ධර්මය කෙලෙස් සංසිඳුවන්නා වූ, නිවන කරා තමාව පමුණුවන්නා වූ, ආර්ය සත්‍යය අවබෝධ කරවන්නා වූ සුගතපවේදිත ධර්මය සුගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලද්දා වූ ධර්මය කියන කොට කියනවා නම් ඊට විරුද්ධව මේක අවබෝධ කරන්න බැහැ. මේක බොරුවක්. චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කිරීම කරන්න බැරි වැඩක් කියල. එයා කෙලින් ම පහර ගහන්නේ බුදුරජාණන් වහන්සේ ගේ විශාරද ඤාණයට යි. එයා විශාරද ඤාණයට පහර ගහනවාත් සමඟ ම එයාට බොහෝ අකුසල් රැස් වෙනවා.

## හඳුනාගන්න මිත්‍යා දෘෂ්ඨිකයා...

බුදුරජාණන් වහන්සේ මේ මිත්‍යා දෘෂ්ඨික විපරීත දර්ශන ඇති එක්කෙනා ගැන කියා දෙනවා **(ඒක පුග්ගලෝ භික්ඛවේ ලෝකේ උප්පජ්ජමානෝ උප්පජ්ජති)** පින්වත් මහණෙනි, ලෝකයේ එක පුද්ගලයෙක් බිහි වෙනවා අන්න ඒ පුද්ගලයා **(බහුජාන අහිතාය, බහුජන අසුඛාය, බහුනෝ ජනස්ස අහිතාය, දුක්ඛාය, දේව මනුස්සානං)** බොහෝ දෙනාට අහිත පිණිස, දුක් පිණිස, දෙව් මිනිස් ලෝකයාට දුක් පිණිස හේතු වන පුද්ගලයෙක් **(කතමෝ ඒක පුග්ගලෝ)** කවුද ඒ පුද්ගලයා **(මිච්ඡා දිට්ඨිකෝ හෝති විපරීත දස්සනෝ)** මිත්‍යා දෘෂ්ඨික වූ විපරීත දර්ශන, විකෘති දැක්මක් ඇති පුග්ලයා **(තං බහුජනං සද්ධ ධම්මං උට්ඨපෙත්වා)** ඒ පුද්ගලයා මොකද කරන්නේ? බොහෝ ජනයාව චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කරන අවස්ථාවෙන් අයින් කරලා දානවා. **(අසද්ධම්මේ පටිචාපේති)** ධර්මය අවබෝධ කරගන්න බැරි දේවල් වලට යොදනවා. අසද්ධර්මයේ යොදවනවා. බුදුරජාණන් වහන්සේ වදාළා, **(අයං බෝ භික්ඛවේ ඒක පුග්ගලෝ ලෝකේ උප්පජ්ජමානා උප්පජ්ජති බහුජන අහිතාය, බහුජන අසුඛාය, බහුනෝ ජනස්ස අහිතාය, දුක්ඛාය, දේවමනුස්සාය)** බොහෝ දෙව් මිනිසුන්ට ලෝකයාට අහිත පිණිස දුක් පිණිස පහළ වෙච්ච පුද්ගලයා තමයි මිත්‍යා දෘෂ්ඨිකයා.

## චතුරාර්ය සත්‍යය අවබෝධය අහිමි කරගන්නවා...

ඒ මිත්‍යා දෘෂ්ඨිකයා පිළිගන්නේ නෑ චතුරාර්ය සත්‍යය. ඒ මිත්‍යා දෘෂ්ඨිකයා පිළිගන්නේ නෑ මේ ධර්මය අවබෝධ කරන්න පුළුවන් බව. ධර්මයේ හැසිරෙන එක්කෙනාටත් විරුද්ධව කථා කරනවා. "පිස්සු ද උඹලට? ඕවා කරල කොහේ යන්නද? මේ යුගයේ කවුද ධර්මය අවබෝධ කළේ? පෙන්නපන් පුළුවන් නම් නිවන් අවබෝධ කරපු කෙනෙක්" මෙන්න මෙහෙම කිය කියා නින්දා කරනවා. අපහාස කරනවා. අපි දන්නවා ගිහියොත් කරනවා, පැවිද්දොත් කරනවා. ඒ සියලු දෙනා මරණින් මත්තේ අපායේ යනවා.

චතුරාර්ය සත්‍යය අවබෝධ කරන අවස්ථාව ඒ සියලු දෙනා ම අහිමි කර ගන්නවා. අනිත් අයටත් අහිමි කරවනවා. පව් රාශියක් රැස් කරගෙන අපාගත වෙනවා. ඉතින් මෙහෙත් අපට පේනවා මේ චතුරාර්ය සත්‍යයට වෛර කරන බෞද්ධ වේශධාරීන් ඉන්නවා කියන්නේ මහා අවාසනාවන්ත තත්වයක්. බුද්ධ ශාසනයට මහත් ම අනතුරක්. බුද්ධ ශාසනය අතුරුදහන් කරන්නෙ අන්න ඒ පිරිස එකතු වෙලා.

ඒ නිසා අපට පැහැදිලිව ම පේනවා මේ ධර්මය අවබෝධ කරගන්න තියෙන අවස්ථාව අහිමි වෙන එක තමයි ඒකෙන් සිද්ධ වෙන්නේ. බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා ඒක හයවෙනි අවස්ථාව.

## දුෂ්ප්‍රඥා අයටත් බැහැ...

හත්වෙනි එක තමයි තථාගත අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ ලෝකයට පහළ වෙනවා. අරහං, සම්මා සම්බුද්ධෝ, විජ්ජා චරණ සම්පන්න, සුගත, ලෝකවිදූ, අනුත්තරෝ පුරිසදම්ම සාරථී, සත්ථා දේවමනුස්සානං, බුද්ධ, භගවා කියන ගුණ වලින් සමන්විත තථාගත අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ නිසා ධර්මය ලැබෙනවා. කෙලෙස් සංසිඳුවන්නා වූ පිරිනිවන් පෑමට උපකාර වන්නා වූ චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කරවන්නා වූ උතුම් ශ්‍රී සද්ධර්මය මේ ධර්මය ඇහෙන කොට මේ පුද්ගලයා ඉපදිලා ඉන්නවා. මේ ධර්මය ඇහෙන මායිමේ නමුත් අවබෝධ කරගන්න අවස්ථාවක් නෑ.

මොකද අවබෝධ කරගන්න අවස්ථාවක් නැත්තේ, ඒ කෙනා **(සෝ ච හෝති දුප්පඤ්ඤෝ ජලෝ ඒලමූගෝ)** මෙයා ප්‍රඥාව නැති එක්කෙනෙක්. අවබෝධ කරගන්න අවස්ථාවක් නෑ එයාට. ප්‍රඥාව නෑ. ප්‍රඥාව නෑ කියන්නේ එයාට මේක කොච්චර කිව්වත් තේරෙන්නේ

නෑ. චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කරගන්න ඕනෙ. මේ සංසාරෙන් අත්මිදෙන්න ඕනෙ. සතර අපායෙන් එතෙර වෙන්න ඕනෙ. මේ මාර්ගයේ ගමන් කරන්න ඕනෙ. මෙයා අහනවා තේරෙන්නෙ නෑ. අවබෝධ කරගන්න බෑ. යෝනිසෝ මනසිකාරයට එන්න බෑ. මොනව හරි වෙන බාහිර දේවල් අල්ලගෙන ඉන්නවා. නැත්නම් කියන දේවල් තේරෙන්නෙ නෑ. එහෙමත් නැත්නම් එයා ධර්මය අහන්න ඇවිල්ලා මොනවා හරි ඇදක් හොයාගෙන ඒ ඇදේ කල්පනා කර කර ඉන්නවා. ඔය වගේ දේවල් කරගන්නවා. මේ දුෂ්ප්‍රාඥ බව බරපතල ප්‍රශ්නයක් බවට පත්වෙනවා.

## සුභාෂිත - දුර්භාෂිත වෙනස හඳුනාගන්න...

මේකේ තියෙනවා (**න පටිලභෝ සුභාසිත, දුබ්භාසිත තස්ස අත්ථ මඤ්ඤාතුං**) සුභාෂිත, දුර්භාෂිත දෙකේ තේරුම දන්නෙ නෑ. එයාට ඒ කියන්නේ බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය මොකක් ද, අනිත් අධර්මය මොකක් ද කියල දන්නෙ නැහැ. පටලව ගන්නවා. එක්කෝ පටලව ගන්නවා විද්‍යාවත් එක්ක. විද්‍යාව බුදුදහමයි එකයි කියල. ප්‍රඥාව නැහැ. ප්‍රඥාව තිබ්බ නම් එහෙම පටලව ගන්නෙ නැහැ. ඇයි මොළේ තියෙන කෙනෙකුට තේරෙනවනෙ මේ විද්‍යාඥයෝ හොයා ගන්නේ සීල, සමාධි, ප්‍රඥා තුළ ප්‍රතිපත්තියේ යෙදිලා සතර සතිපට්ඨානයේ යෙදිලා නොවෙයි කියල. නමුත් අපට එහෙම නෙවෙයි. මේ ධර්ම මාර්ගයේ ගමන් කිරීමේ දී සීලයක් රකින්න ඕනෙ. සමාධිය දියුණු කරන්න ඕනෙ. නීවරණ ප්‍රහාණය කරන්න ඕනෙ. ඒ වගේ ම ප්‍රඥාව උපදවා ගන්න ඕනෙ. සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපේක්ඛා කියන බොජ්ඣංග ධර්මයන් ඇති කරගන්න ඕනෙ.

## මෙන්න ඒ සොඳුරු මාවත...

ඊළඟට සතර සතිපට්ඨාන, සතර ඍද්ධිපාද, සතර සම්‍යක් ප්‍රධාන වීර්යය, පංච ඉන්ද්‍රිය, පංච බල, සප්ත බොජ්ඣංග, ආර්ය අෂ්ඨාංගික මාර්ගය යන සත්තිස් බෝධි පාක්ෂික ධර්ම දියුණු කරගන්න ඕනෙ. ආර්ය අෂ්ඨාංගික මාර්ගය අනුගමනය කරන්න ඕනෙ. බුදුරජාණන් වහන්සේ මේ ධර්මය අවබෝධ කරගත්තෙ කාමසුඛල්ලිකානුයෝගී අන්තය බැහැර කරලා. අත්තකිලමතානුයෝගය බැහැර කරලා. මේ ඒකාන්තයෙන් ම ජීවිතය අවබෝධය පිණිස හේතු වන්නා වූ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි කියන මධ්‍ය ප්‍රතිපදාව නම් වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙන්. මධ්‍යම ප්‍රතිපදාව

කියන්නේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයට ම යි. එහෙම නැතිව වෙන කිසිම අර්ථයක් ඒකෙ නැහැ. වෙන බාහිර අර්ථයකුත් නෑ.

එතකොට මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගය අනුගමනය කරලා අවබෝධ කරන ධර්මයත්, මිත්‍යා දෘෂ්ඨික වූ විපරීත දර්ශන ඇති මෙලොව පරලොව නො පිළිගන්නා වූ මේ ලෝකයේ විශේෂ ඤාණයක් ඇති ශ්‍රමණ බ්‍රාහ්මණවරු සිටින බව නො පිළිගන්නා වූ, දුස්සීල වූ, ඕනෑම විනෝදයකට දඩයමේ යන, ඕනෑම හොරකමක යෙදෙන, වැරදි කාම සේවනය කරන, බොරු කියන, සුරා පානය කරන. මේ මිත්‍යා දෘෂ්ඨික විද්‍යාඥයෝ කයින්, වචනයෙන්, සිතෙන් අකුසල් කරන්නා වූ පිරිසගේ පර්යේෂණ ඒගොල්ල හොයගන්න දේවල් බුදුරජාණන් වහන්සේ ගේ ධර්මයත් එක්ක සමාන වෙන්නෙ කොහොමද? ඒක කොයිතරම් මෝඩ කතාවක් ද? දුෂ්ප්‍රාඥ කථාවක් ද? ඉතින් මේ ප්‍රඥා රහිත පිරිසට මේ ධර්මයෙන් ප්‍රයෝජනයක් නෑ.

**(න පටිබලෝ සුභාසිත දුබ්බාසිත අත්ථ මංඤාතුං)** සුභාෂිත කියන්නේ බුද්ධ වචනය. දුබ්භාෂිත කියන්නේ බුද්ධ වචනය නො වන දේ. එතකොට බුද්ධ වචනයත්, බුද්ධ වචනය නො වන දේත් අර්ථය අල්ලන දන්නෙ නැහැ. අන්න එයාට කියනවා ප්‍රඥා රහිතයි කියල. ඉතින් මේ ලෝකේ බොහෝ දෙනෙක් දුෂ්ප්‍රාඥයි. අවබෝධ කරගන්න අවස්ථාවක් නැහැ. අන්න ඒ දුෂ්ප්‍රාඥ පිරිසට ධර්මය අවබෝධ කරගන්න අවස්ථාවක් නැහැ.

## උතුම් වූ සමාධිය....

අපි ගනිමු තවත් විශේෂ කරුණක්. **(යං බුද්ධ සෙට්ඨෝ පරිවණ්ණායී සුචිං)** බුදුරජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨ වූ, බුදුරජාණන් වහන්සේ ඉතා හොඳ යැයි, ඉතා පිරිසිදු යැයි වර්ණනා කළ සේක් ද, **(සමාධි මානංතරිකඤ්ඤමාහු)** ඒක තමයි ආනන්තරික සමාධිය කියල කියන්නෙ. අරහත් ඵල සමාධිය. ධර්මයේ සඳහන් වෙනවා විරාග සඤ්ඤා, නිරෝධ සඤ්ඤා හැටියට.

නිරෝධ සඤ්ඤාවේ තියෙනවා **(ඒතං සන්තං, ඒතං පණීතං යදිදං සබ්බ සංඛාර සමථෝ සබ්බූපධිපටිනිස්සග්ගෝ තණ්හක්ඛයෝ නිරෝධෝ නිබ්බාණං)** කියන සංඥාව ඒකට කියන්නේ නිරෝධ සඤ්ඤාව කියල. මේක ම යි ශාන්ත. මේක ම යි ප්‍රණීත. ඒ තමයි පුඤ්ඤාභි සංඛාර, අපුඤ්ඤාභි සංඛාර, ආනෙඤ්ජාභි සංඛාර සියලු විපාක දෙන්නා වූ සියලු දේවල් සංසිඳී ගිය තැන. සියලුම කෙලෙස්

සහිත කර්ම බැහැරට ගිහිල්ලා, කාම තණ්හා - භව තණ්හා - විභව තණ්හා ක්ෂය වෙලා. තණ්හාව නිරුද්ධ වෙලා. නිවීමට පත්වෙලා තියෙනවා. අන්න ඒක අත්දකිනවා රහතන් වහන්සේ. අන්න ඒකට කියනවා අරහත් ඵල සමාධිය කියල. අන්න ඒ අරහත් ඵල සමාධිය බුදුරජාණන් වහන්සේ **සමාධි නං තේන සමෝන විජ්ජති** කියල. ඒ හා සමාන දෙයක් මේ ලෝකෙ නෑ.

## මෙන්න ඒ වෙනස...

විද්‍යාඥයෙකුට පුළුවන් වුනා ද මේ අරහත් ඵල සමාධියක් ගැන කථා කරන්න. ඒ නිසා මේකෙන් අපිට පැහැදිලි වෙනවා ප්‍රඥා රහිත වුනා ම ලොකු ප්‍රශ්නයක් ඒක. ඒ මොකද, තමන්ට ප්‍රඥාව රහිත වෙලා සුභාෂිත අඳුනාගන්නත් බෑ. එයාට බුදුරජාණන් වහන්සේ නමකගේ ධර්මය අඳුන ගන්නත් බෑ. දුර්භාෂිතය අඳුනාගන්නත් බෑ. මොකද නූතන විද්‍යාවෙන් ගන්නෙත් එහෙම. ඒකෙ තියන්නෙත් නිරන්තරයෙන් ම වෙනස් වන්නා වූ ධර්මයක්. මේ කියන දේ මේ වෙනස් වෙනවා. මේ පර්යේෂණය කරන දේ මේ අයින් කරනවා.

## බෞද්ධ වේෂයෙනුත් ඉන්නට පුළුවනි....

බුදුරජාණන් වහන්සේ ගේ ධර්මය එහෙම නෙමෙයි. ඒකෙ දේශනා කරලා තියෙන්නේ **(උප්පාදෝ වා තථාගතා අනුප්පාදෝ වා තථාගතා)** තථාගතයන් වහන්සේ උපන්නා වූ නූපන්නා වූ මේ ලෝකයේ තියෙන ධර්මතා අවබෝධ කරලා හිට පෙන්වා දෙනවා. ඒ නිසා බුදුරජාණන් වහන්සේගේ ධර්මය හොඳට අවබෝධ කරගන්න පුළුවන් එක්කෙනා ප්‍රඥාවන්තයා. අනෙක් කෙනා දුෂ්ප්‍රාඥයා. එතකොට මේ දුෂ්ප්‍රාඥ කෙනෙක් ඉන්නවා. සමහර විට ඒ අය බෞද්ධ වේශයෙනුත් ඉන්න පුළුවන්. දුෂ්ප්‍රාඥ අයට බුද්ධ වචනය අඳුන ගන්න බෑ. වෙන් වශයෙන් තෝරගන්න බෑ. අන්න එතකොට මොකද වෙන්නේ? චතුරාර්ය සත්‍යය අවබෝධ කිරීම පිණිස යෝනිසෝ මනසිකාරයේ යෙදෙන්නේ නැහැ. චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කර ගැනීම පිණිස ධම්මානුධම්ම පටිපදාවේ යෙදෙන්නේ නෑ.

එතකොට බුදුරජාණන් වහන්සේ වදාළා **(අයං භික්ඛවේ සත්තමෝ අක්ඛණෝ)** පින්වත් මහණෙනි, මේක තමයි හත්වෙනි අක්ෂණය. **(අසමයෝ බ්‍රහ්මචරිය වාසාය)** අනේ නිවන් අවබෝධ කරගැනීමට එයාට හම්බ වෙන්නේ නෑ. ඒ අවස්ථාව එයාගෙන් ගිලිහිලා යනවා. ඒක තමයි හත්වෙනි අවස්ථාව.

## බුදු කෙනෙක් පහළ වෙලා නැහැ...

ඊළඟට බුදුරජාණන් වහන්සේ වදාළා අට වෙනි අවස්ථාව. **(තථාගතෝ ච ලෝකේ අනුප්පන්නෝ හෝති)** අරහං, සම්මා සම්බුද්ධ, විජ්ජාචරණ සම්පන්න, සුගත, ලෝකවිදූ, අනුත්තරෝ පුරිසදම්ම සාරථී, සත්ථා දේවමනුස්සානං, බුද්ධ, භගවා කියන මේ නව අරහාදී ගුණයෙන් සමන්විත තථාගත බුදුරජාණන් වහන්සේ ලෝකයේ පහළ වෙලා නෑ. **(ධම්මෝ ච න දේසියති ඕපසමිකෝ, පරිනිබ්බායිකෝ, සම්බෝධගාමී, සුගතපවේදිතෝ)** තථාගත බුදුරජාණන් වහන්සේ නමක් විසින් අවබෝධ කොට වදාළා වූ ධර්මයක් ලෝකයේ ඇහෙන්නේ නෑ. කියන්න කිසිම කෙනෙක් නෑ. ඒ චතුරාර්ය සත්‍යය ධර්මය කියන්න කෙනෙක් නෑ. ඇයි බුදු කෙනෙක් පහළ වෙලා නේ මේක දේශනා කරන්න තියෙන්නේ. බුදු කෙනෙක් පහළ වෙලා නැහැ. එතකොට මේක කියලා දෙන්න කෙනෙක් නැහැ. ධර්මය ඇහෙන්නේ නැහැ. නිවන් අවබෝධ කරන්න පුළුවන් කියන කථාව ඇහෙන්නේ නැහැ. චතුරාර්ය සත්‍යය අවබෝධ කරන්න පුළුවන් කියන කථාව ඇහෙන්නේ නෑ. කෙලෙස් සංසිඳුවන්න පුළුවන් කියන කථාව ඇහෙන්නේ නෑ.

## හැබැයි ප්‍රඥාවන්ත පුද්ගලයෙක්...

නමුත් පුද්ගලයෙක් ඉපදිලා ඉන්නවා **(පඤ්ඤවා ච)** ප්‍රඥාවන්ත පුද්ගලයෙක්. **(අජලෝ අනේලමූගෝ)** එයා අඥාන පුද්ගලයෙක් නෙවෙයි. කෙලතොලු පුද්ගලයෙක් නෙවෙයි. **(පටිබලෝ සුභාසිතං දුබ්භාසිතං අත්ථ මඤ්ඤාතුං)** මෙයාට බුද්ධ වචනය ඇහුනොත් අවබෝධ කරන්න පුළුවන්කම තියෙන කෙනෙක්. මේක බුද්ධ වචනයයි, මේක බුද්ධ වචනය නෙවෙයි කියල හොඳට තෝරගන්න පුළුවන් කෙනෙක්. ප්‍රඥාවන්ත පුද්ගලයා ඉන්නවා. බුදු කෙනෙක් පහළ වෙලා නෑ. බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නා වූ ධර්මය නැහැ. බුදු රජාණන් වහන්සේ වදාළා ප්‍රඥාවන්ත පුද්ගලයාට කිසිම ඵලක් නැහැ කියල.

**(අයං භික්ඛවේ අට්ඨමෝ අසමයෝ බ්‍රහ්මචරිය වාසාය)** මේක තමයි බ්‍රහ්මචරිය වාසයට අන්තරායකර වූ අටවෙනි අවස්ථාව. අක්ෂණය. ක්ෂණ සම්පත්තිය නැති වීම.

දැන් මේ අනුව අපට ඉතාම පැහැදිලියි ලෝකයේ තියෙන්නේ ක්ෂණ සම්පත්තිය නොවේ ම යි. ක්ෂණ සම්පත්තියක් නොවේ අක්ෂණයක් ම යි ලෝකයේ තියෙන්නෙ. අසමයක් ම යි තියෙන්නේ. බ්‍රහ්මචරිය වාසයට නො හැකි මට්ටමේ තත්වයක් ම යි මේ ලෝකය පුරා ම තියෙන්නේ.

## මෙන්න ඒ එක ම එක මොහොත...

බුදුරජාණන් වහන්සේ වදාළා මේ අෂ්ට අක්ෂණයෙන් ම බැහැර වෙච්ච එක ම එක මොහොතයි තියෙන්නේ. **(ඒකෝ භික්ඛවේ ඛණෝච සමයෝ ච)** මහණෙනි, එක ම එක ක්ෂණය යි තියෙන්නේ. එකම එක අවස්ථාවයි තියෙන්නේ. **(බ්‍රහ්මචරිය වාසාය)** මේ චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කරගන්න එක ම එක අවස්ථාවයි තියෙන්නේ. **(කතමෝ ඒකෝ)** මොකක් ද ඒ එක ම එක අවස්ථාව **(ඉදං භික්ඛවේ තථාගතෝ ච ලෝකේ උප්පන්නෝ හෝති)** අරහං, සම්මා සම්බුද්ධ, විජ්ජාචරණ සම්පන්න, සුගත, ලෝකවිදූ, අනුත්තරෝ පුරිසදම්ම සාරථී, සත්ථා දේවමනුස්සානං, බුද්ධ, භගවා කියන මේ නව අරහාදී ගුණයෙන් සමන්විත තථාගත බුදුරජාණන් වහන්සේ ලෝකයේ පහළ වෙලා ඉන්නවා.

**(ධම්මෝ ච දේසියති)** ඔන්න ධර්මය දේශනා කරනවා. **(ඕපසමිකෝ)** ඒ ධර්මය කෙලෙස් සංසිඳෙනවා. **(පරිනිබ්බායිකෝ)** පිරිනිවන් පාන්න උදව් වෙනවා **(සම්බෝධගාමිං)** චතුරාර්ය සත්‍යය අවබෝධ කරන වැඩපිළිවෙල. ඒ ධර්මය මේ ලෝකයේ කථා බස් කරනවා. අහන්න ලැබෙනවා. ඒ එක ම එක අවස්ථාවයි.

## අවබෝධ කරන්නට සුදුසු පුද්ගලයෙක්...

**(අයං ච පුග්ගලෝ මජ්ඣෙඩිසු ජනපදේසු පච්චාජාතෝ හෝති)** මේ පුද්ගලයාත් තථාගත බුදුරජාණන් වහන්සේ නමක් ඉපදිලා ඉන්න ඒ ධර්මය තියෙන තැනක ඉන්නවා. **(සෝ ච හෝති පඤ්ඤවා)** එයා ප්‍රඥාවන්ත කෙකේ. එයා නුවණ නැති කෙනෙක් නොවෙයි. අවබෝධ කරගන්න බැරි කෙනෙක් නෙවෙයි. **(පටිබලෝ සුභාසිත, දුබ්භාසිත අත්ථමඤ්ඤාතුං)** මෙන්න මේකයි තථාගත බුදුරජාණන් වහන්සේ වදාළේ. මේක තථාගත බුදුරජාණන් වහන්සේ වදාළ දෙයක් නෙවෙයි කියලා බුද්ධ වචනය මනා කොට තේරුම් ගන්න. බුදුරජාණන් වහන්සේ ගේ ධර්මය මනාකොට තේරුම් ගන්න ප්‍රතිබල කෙනෙක්. ශක්ති සම්පන්න කෙනෙක්.

බුදුරජාණන් වහන්සේ වදාළා **(අයං බෝ භික්ඛවේ ඒකෝ අක්ඛණෝ)** මහණෙනි, මෙන්න මේක තමයි එකම ක්ෂණ සම්පත්තිය. **(සමයෝ ච)** එකම වෙලාව. **(බ්‍රහ්මචරිය වාසාය)** චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කර ගැනීම පිණිස තියෙන්නා වූ එකම වෙලාව. එකම අවස්ථාව. එකම මොහොත. මේ බුදුරජාණන් වහන්සේගේ ධර්මය තියෙන මොහොත.

## අපට ධර්මය විනය තවම තියෙනවා...

පින්වතුනි අපි දන්නවා බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පාලා. බොහෝ දෙනෙක් කියාගෙන ගියා මේ ධර්මය අවබෝධ කරන්න බෑ. මෛත්‍රී බුද්ධ ශාසනයේ චතුරාර්ය සත්‍යය අවබෝධ කරගන්න කියල. ඒක සිද්ධ වෙච්ච විශාල වැරද්දක්.

බුදුරජාණන් වහන්සේ පෙන්වා දීලා තියෙනවා "**(යෝ බෝ ආනන්ද මයා ධම්මෝ ච, විනයෝ ච දේසිතෝ පඤ්ඤායන්තෝ සෝචෝ මමච්චේව සත්ථා)** ආනන්ද, මා විසින් යම් ධර්මයක් දේශනා කරන ලද්දේ ද, යම් විනයක් පණවන ලද්දේ ද, මාගේ ඇවෑමෙන් පසු එය ඔබට ශාස්තෘ වන්නේ ය" කියල. එහෙනම් අපිට පැහැදිලිව පේනවා බුදුරජාණන් වහන්සේ වදාළා ධර්ම, විනය තියෙද්දී අපි ඒ ධර්ම විනය පැත්තකට දැම්මා. පැත්තකට දාලා මෛත්‍රී බුද්ධ ශාසනය පතන්න කෙනෙක් කල්පනා කළා. කෙනෙක් තමන් බුදු වෙන්න කල්පනා කළා. කෙනෙක් පාරමී පුරාගෙන යන්න කල්පනා කළා. නමුත් බුදුරජාණන් වහන්සේගේ ධර්මය විනය බැහැර කළා. ඒ නිසා තමයි ඒ ක්ෂණ සම්පත්තියත් අහිමි වෙලා ගියේ. නමුත් මේ වන විට නැවත ඒ ක්ෂණ සම්පත්තිය ලැබිල තියෙනවා.

## ලැබුනු අවස්ථාව මඟ හැරගන්න එපා...

ඒ බුදුරජාණන් වහන්සේගේ ධර්මය අපි දේශනා කරනවා. දැන් කෙලෙස් සංසිඳුවන්නා වූ සෝවාන්, සකදාගාමී, අනාගාමී, අරහත් වශයෙන් මාර්ග ඵල අවබෝධය ඇතිකරවන්නා වූ චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කරවන්නා වූ, ඒ ශ්‍රී සද්ධර්මය දැන් අහන්න ලැබෙනවා. දැන් එතකොට බුද්ධිමත් ශ්‍රාවකයා, ප්‍රඥාවන්ත ශ්‍රාවකයා මේ ධර්මය අල්ලගන්න ඕනෙ. මේ ධර්මය අවබෝධ කරගන්න ඕනෙ. මේ ධර්මය තේරුම් ගන්න ඕනෙ. අන්න ඒ දුර්ලභ අවස්ථාව ලැබිලා තියෙනව කියන කරුණ අපි තේරුම් ගන්න ඕනෙ.

ඊට පස්සේ බුදුරජාණන් වහන්සේ ගාථා ටිකක් වදාළා.

**මනුස්ස ලාභං ලද්ධාන - සද්ධම්මේ සුප්පවේදිතේ**
**යේ ඛණං නාධිගච්ඡන්ති - අතිනාමෙන්ති තේ ඛණං**

මිනිස් ජීවිතය ලබලා සද්ධර්මය දේශනා කරන කාලෙක මේ ලැබිච්ච ක්ෂණ සම්පත්තියෙන් ප්‍රයෝජනය ගන්නෙ නැත්නම් ක්ෂණ සම්පත්තිය අත්හල කෙනෙක් බවට එයා පත්වෙනවා.

**බහූ හි අක්ඛණා වුත්තා - මග්ගස්ස අන්තරායිකා**
**කදාචි කරහචි ලෝකේ - උප්පජ්ජන්ති තථාගතා**

බුදුරජාණන් වහන්සේ විසින් මේ නිවන් මඟට අනතුරු දායක වූ අන්තරායකර වූ මේ අක්ෂණය බොහෝ අක්ෂණයන්, ක්ෂණ සම්පත්තිය නැති අවස්ථා බෙහෝ තියෙනව. ඉතාමත් කලාතුරකින් තමයි ලෝකයට තථාගත බුදුරජාණන් වහන්සේලා පහළ වෙන්නෙ.

**තස්සිදං සම්මුඛීභූතං - ය ලෝකස්මිං සුදුල්ලභං**
**මනුස්ස පටිලාභෝ ච - සද්ධම්මස්සච දේසනා**
**අලං වායමිතුං තත්ථ - අත්ථකාමේන ජන්තුනා**

මේ ලෝකයේ අතිශයින් ම දුර්ලභ වූ මනුෂ්‍ය ප්‍රතිලාභයක් සද්ධර්ම දේශනා කරන අවස්ථාවක් ඔබට මුණගැහිලා තියෙනවා. තමන්ගේ යහපත කැමති මනුෂ්‍යයා විසින් ඒ ධර්මය අවබෝධ කිරීම පිණිස උත්සාහ කරන එක ම යි සුදුසු.

**කතං විජඤ්ඤා සද්ධම්මං - ඛණෝ වේ මා උපච්චගා**
**ඛණාතීතා හි සෝචන්ති - නිරයම්හි සමප්පිතා**

සද්ධර්මය දේශනා කරන වෙලාවේ සද්ධර්මය අවබෝධ කරන්නට ඕනෙ. මේ ක්ෂණ සම්පත්තිය නම් ඉක්මවා යන්නට දෙන්න එපා. මේ අවස්ථාව අහිමි කරගන්නවා සමහර ගිහි පිරිසත්, පැවිදි පිරිසත්. මොන චතුරාර්ය සත්‍යය ද මොනවට මේක අවබෝධ කරනවද කිය කිය ඒකට ගරහා ගරහා මේක අහිමි කර ගන්නවා. ඒක අහිමි කරගන්න අය ක්ෂණ සම්පත්තිය අත අරින අය නිරයේ ගිහිල්ලා දුක් විඳිනවා.

**ඉධ චේව නං විරාධේති - සද්ධම්මස්ස නියාමතං**
**වාණිජෝව අතීතත්ථෝ- චිරත්තං අනුතපෙස්සති**

යම්කිසි කෙනෙක් චතුරාර්ය සත්‍යය ධර්මය ශ්‍රවණය කරන වෙලාවෙ මේ ධර්මය අතඅරිනවා නම් ඒක හරියට ලොකු ලාභයක් ලබන්නට හිටිය වෙළෙන්දෙක් ඒ ලාභය අතහැරලා බොහෝ කල් ශෝක කර කර ඉන්නවා වගේ දෙයක්.

**අවිජ්ජානිවුතෝ පෝසෝ - සද්ධම්මං අපරාධිකෝ**
**ජාතිමරණසංසාරං - චිරං පච්චනුභොස්සති**

අවිද්‍යාවෙන් වැහිලා ඉන්න, චතුරාර්ය සත්‍යය අවබෝධය

නැතිකම නැමැති කලුවරේ ඉන්න මේ පුද්ගලයා සද්ධර්මයට විරුද්ධ වෙලා ගිහිල්ලා මේ ජරා මරණ ඉපදෙන ජරා මරණ සංසාරෙන් ඉක්මවා යන්න බැරුව බොහෝ කල් මේ සංසාරේ සැරිසරනවා.

**යේ ච ලද්ධා මනුස්සත්තං - සද්ධම්මේ සුප්පවේදිතේ**
**අකංසු තත්ථ වචනං - කරිස්සන්ති කරොන්ති වා**

නමුත් මේ මනුෂ්‍යය ජීවිතය ලැබිච්ච වෙලාවේ උතුම් ශ්‍රී සද්ධර්මය දේශනා කරන වෙලාවෙ ඒ තථාගත බුදුරජාණන් වහන්සේ ගේ බුද්ධ වචනයට කීකරු වෙලා ඒ ධර්මයේ හැසිරෙනව. නුවණ තියෙන අය අනාගතයෙත් හැසිරෙනවා.

**ඛණං පච්චවිදුං ලෝකේ - බ්‍රහ්මචරියං අනුත්තරං**
**යේ මග්ගං පටිපජ්ජිංසු - තථාගතප්පවේදිතං**

මේ ක්ෂණ සම්පත්තිය අවබෝධ කර ගත්තු අය අනුත්තරීය වූ බ්‍රහ්මචරිය දියුණු කරලා තථාගත බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය අවබෝධ කරගන්න ඕනෙ කියල ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ම ගමන් කරනවා.

**යේ සංවරා චක්ඛුමතා - දේසිතාදිච්චබන්ධුනා**
**තේසු ගුත්තෝ සදා සතෝ - විහරේ අනවස්සුතෝ**

ඒ අය සංවර වෙනවා. නුවණ පාදා ගන්නවා. සූර්ය වංශයේ උපන් ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ දේශනා කරපු ධර්මය හොඳට සිහිය පිහිටුවා ගෙන සිත,කය,වචනය හැමතිස්සෙම පවට ඇතුලු වෙන්න නොදී පවෙන් වලක්වනවා. හැම තිස්සෙම සිහියෙන් ඉන්නවා. කෙලෙස් වැගිරෙන්න දෙන්නේ නැති ආකාරයට ජීවත් වෙනවා.

**සබ්බේ අනුසයේ ඡෙත්වා - මාරධෙය්‍ය සරානුගේ**
**තේ වේ පරාගතා ලෝකේ - යේ පත්තා අසවක්ඛයන්ති**

මාරයාගේ ග්‍රහණයෙන් අත්මිදිලා සියලුම කෙලෙස් ප්‍රහාණය කරලා සංසාරෙන් එතෙර වෙන අය ආසවක්ඛය ඥාණය ලබාගෙන මේ ගෞතම බුද්ධ ශාසනයේ අමා නිවන සාක්ෂාත් කරනවා.

මේ පින්වත් සියලු දෙනාටත් මේ ගෞතම බුද්ධ ශාසනයේ දීම මේ ජීවිතයේ දී මේ ක්ෂණ සම්පත්තිය අහිමි වෙන්නට කලින් උතුම් චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ වේවා!

*සාදු ! සාදු!! සාදු !!!*

# අසිරිමත් දමනය කිරීම

## -කේසී සූත්‍රය-

*ශ්‍රද්ධාවන්ත පින්වතුනි,*

දැන් අපි ඉගෙන ගන්නට සූදානම් වෙන්නේ **අංගුත්තර නිකායේ හතර වෙනි නිපාතයට** අයිති දේශනාවක්. මේ දේශනාවේ නම **කේසී සූත්‍රය**. කේසී කියන අශ්වයන් දමනය කරන කෙනෙකුට බුදු රජාණන් වහන්සේ දේශනා කරපු දේශනයක්. මේ සූත්‍ර දේශනාවෙන් බුදු රජාණන් වහන්සේගේ පුරිසදම්ම සාරථී ගුණය දැකගන්නට පුළුවන් වෙනවා. **සැවත් නුවර** දී තමයි භාග්‍යවතුන් වහන්සේ කේසී අරඹයා මේ දේශනාව වදාළේ.

## අශ්වදම්ම සාරථී....

ඉතින් මේ අශ්වයන් දමනය කරන කෙනාට කියනවා අශ්වදම්ම සාරථී කියල. පුරුෂයන් දමනය කරන එක්කෙනාට කියනවා පුරිස දම්ම සාරථී කියල. කේසී අශ්වදම්ම සාරථී.

ඉතින් මේ කේසී බුදුරජාණන් වහන්සේ දකින්නට ගිහිල්ලා බුදුරජාණන් වහන්සේට වන්දනා කරල පැත්තකින් වාඩිවුනා. ඊට පසසේ භාග්‍යවතුන් වහන්සේ අහනවා කේසී ගෙන් "හා... කේසී ඔබ අශ්වයන් දමනය කරන්නට බොහොම ප්‍රසිද්ධ එක්කෙනෙක් නෙව.

බොහොම දක්ෂ කෙනෙක් නෙව. ඔබ කොයි ආකාරයට ද මේ අශ්වයින්ව දමනය කරන්නේ?" කියල. ඊට පස්සේ කේසී කියනවා "ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, මම අශ්වයන්ව මෘදු මොළොක් විදිහට පුහුණු කරනවා, ඊට ගැලපෙන අශ්වයින් තෝරා ගෙන. ඇතැම් අශ්වයන් ටිකක් සැර පරුෂ විදිහට දමනය කරන්න ඕනෙ. තවත් අශ්වයින් කොටසක් ඉන්නව ඒ දෙකෙන් ම මිශ්‍ර විදිහට සළකල යි දමනය කරන්න ඕනෙ" කියල.

## දමනය වෙන්නෙ නැත්නම් මොකද කරන්නේ?

ඊට පස්සේ භාග්‍යවතුන් වහන්සේ කේසී ගෙන් අහනවා "ඉතින් කේසී, ඔබ අශ්වයින් දමනය කරන කොට මෘදු මොළොක් විදිහට දමනය වෙන්නේ නැත්නම්, සැර පරුෂ විදිහට දමනය වෙන්නෙත් නැත්නම්, මෘදු විදිහට සැර පරුෂ විදිහට මිශ්‍රව දමනය වෙන්නෙත් නැත්නම් ඔබ මොකද කරන්නේ?" කියල ඇහුව. ඊට පස්සේ කේසී කියනවා "ස්වාමීනී, දමනය කළ යුතු අශ්වයින් මෘදු විදිහට දමනය වෙන්නෙත් නැත්නම්, සැර පරුෂ විදිහට දමනය වෙන්නෙත් නැත්නම්, මෘදු විදිහට සැර පරුෂ විදිහට මිශ්‍රව දමනය වන්නෙත් නැත්නම් ස්වාමීනී මම ඒ අශ්වයින්ව මරණවා. ඒකට හේතුව තමයි ආචාර්ය කුලයට ඒ කියන්නේ අශ්වයන් පුරුදු කරන කුලයට අවනම්බුවක් වෙන්න එපා" කියල.

## බුදු සසුනෙත් දමනය කිරීම්...

ඒ විදිහට කේසී උත්තර දීල බුදුරජාණන් වහන්සේගෙන් අහනවා "ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ ගැන ගොඩක් මිනිස්සු දැනගෙන තියෙනව අනුත්තරෝ පුරිසදම්ම සාරථී කියල. මිනිස්සුන්ව දමනය කිරීමේ ලා අනුත්තර වූ උතුම් වූ ශ්‍රේෂ්ඨ ආචාර්ය වරයා කියල ඔබවහන්සේ ගැන ප්‍රසිද්ධයි. ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, ඔබවහන්සේ මේ මිනිසුන්ව දමනය කරන්නේ කොහොමද?" කියල භාග්‍යවතුන් වහන්සේගෙන් ඇහුවා.

භාග්‍යවතුන් වහන්සේ පිළිතුරු දුන්නා. "කේසී, මමත් ඔය ආකාරයට ම තමයි කරන්නේ. කොහොමද? **(සංහේනපි විනේමි)** මෘදු විදිහටත් මම මිනිසුන්ව දමනය කරනවා. **(පරුසේනපි විනේමි)** සැර පරුෂ විදිහටත් මම මේ මිනිසුන්ව දමනය කරනවා. **(සන්හ පරුසේනපි විනේමි)** මෘදු විදිහට වගේ ම සැර පරුෂ විදිහටත් මම මේ මිනිසුන්ව දමනය කරනවා" කියල භාග්‍යවතුන් වහන්සේ විස්තර කරනවා

කොහොම ද මේ මෘදු විදිහට දමනය කරන්නේ, කොහොමද මේ සැර පරුෂ විදිහට දමනය කරන්නේ, කොහොමද මෘදු විදිහටත් සැර පරුෂ විදිහටත් දමනය කරන්නේ කියල.

## මෘදු විදිහට දමනය කරන්නේ මෙහෙමයි...

මම මෙහෙමයි මෘදු විදිහට දමනය කරන්නේ කියල කියනවා. කාය සුචරිතය කියන්නේ මේකයි කියල භාග්‍යවතුන් වහන්සේ පෙන්වා දෙනව. කයින් කරන්නා වූ යහපත් දේ මේවා කියල හොඳ පෙන්වල දෙනව. ඒක තමා මෘදු විදිහට දමනය කිරීම.

**(නිහිත දණ්ඩෝ)** දඩු මුගුරු අත්හරිනවා. **(නිහිත සත්තෝ)** අවි ආයුධ අත්හරිනවා. **(ලජ්ජී)** සත්ව හිංසාවට ලැජ්ජා වෙනවා. **(දයාපන්නෝ)** දයාවන්ත වෙනවා. **(සබ්බපාණ භූතේසු හිතානුකම්පී විහරති)** සියලු සතුන් කෙරෙහි හිතානුකම්පීව වාසය කරනවා. මෙන්න මේ විදිහට මෘදු විදිහට හික්මවනවා.

ඊළඟට කියනවා ආරණ්‍යයක වේවා ගමක වේවා නුදුන් දෙයක් ගන්න එපා කියල. සොර සිතින් තොරව වාසය කරන්න කියල කියලා දෙනව. කාමයෙහි වරදවා හැසිරෙන්නේ නැතිව වාසය කරන්න කියල කියල දෙනව. මේ තමා කාය සුචරිතය.

## වචී සුචරිතය ඇති කරගන්න...

ඊළඟට පෙන්වලා දෙනව සත්‍ය වචන කියන්න, බොරුවෙන් වළකින්න, කේලාම් කීමෙන්, ඵරුෂ වචන කීමෙන් වළකින්න, වාග් සුචරිතය ඇති කරගන්න කියල පෙන්වල දෙනව. කොහොමද එයා ඒක කරන්නේ.

සත්‍ය වචන කථා කරනවා. ඊළඟට සමඟිය ඇතිවෙන වචන කථා කරනවා. සමඟියෙහි සතුටු වෙනවා. සමඟියෙහිම රැදී සිටිනවා. එයා පිසුණාවාචා කියන්නේ නෑ. ඊළඟට එයා සත්‍යවාදී වෙනවා. සත්‍ය වචන කථා කරනවා. ලෝකයේ ගැටුම් ඇතිවෙන දේ කථා නො කර ඉන්නවා

## සුන්දර වචන ම කථා කරන්න...

මේ පුද්ගලයා **(කණ්ණසුඛා)** මිහිරි වචන කථා කරනවා, **(පේමනීයා)** ප්‍රේමනීය වචන කථා කරනවා, **(හදයංගමා)** හෘදයාංගම

වචන කථා කරනවා, **(පෝරි)** ශිෂ්ඨ සම්පන්න වචන කථා කරනවා, **(බහුජන කන්තා)** බොහෝ ජනයා කැමති වචන කථා කරනවා, **(බහුජන මනාපා)** බොහෝ ජනයාට මනාප වචන කථා කරනවා, මේ තමයි මෘදු ලෙස දමනය කිරීම.

## හදවතේ දරාගන්න සුදුසු වචන ම ....

ඊළඟට එයා වචන හසුරුවන්නේ කරුණු සහිතව **(නිධානවතිං වාචං භාසිතා)** බාගෙට නැතිව හිතේ මතක තබාගෙන යළි යළි සිහිකළ යුතු යහපත් වචන කථා කරනවා. මේවා කියාදුන්නට පස්සේ මේකයි වචී සුචරිතය කියල, මොකද පුරිසදම්මයාට වෙන්නේ (පුරිස දම්මයා කියල කියන්නේ දමනය වන පුද්ගලයා) එයා ඒවා පුරුදු කරනවා. අශ්වයාට ආදරෙන් කිව්වා ම අශ්වයා දමනය වෙනවා වගේ මනුස්සයාටත් යහපත් දේ කිව්වා ම දමනය වෙනවා. මේ තමයි මෘදු දමනය.

අපි දකිනවා බොහෝ තැන්වල මේ වචී සුචරිතය අඩුයි. කාය සුචරිතයත් අඩුයි. අද කාලේ පවුල් වල මේ තරම් ම ගැටලු ඇතිවෙන්න හේතු වෙලා තියෙන්නේ එක්කෝ වචනයෙන් දූෂිත වෙලා. එක්කෝ කයින් දූෂිත වෙලා. මේ පවුල් වලට මේක විශාල පාඩුවක්. එතකොට මේගොල්ල මෘදු විදිහට හික්මිලා නෑ. මෘදු විදිහට හික්මෙනවා නම් හරි ලේසියි. එතකොට තියෙන්නේ කරුණාවෙන් මෛත්‍රියෙන් මෙන්න යහපත් දේ කියල කියල දෙන්න විතරයි.

## මනසිනුත් සුචරිතය ඇතිවෙන්න ඕනෙ...

ඊළඟට මනෝ සුචරිතය. මනෝ සුචරිතය කියන්නේ මේ ලෝකයේ බාහිර දේ වලට ආශා නො කර ඉන්නවා. අනුන්ගේ දේ ට ආශා නො කරන ඉන්නවා. අනුන්ගේ දේට ආශා නො කරන පුද්ගලයා මෘදු විදිහට දමනය වෙනවා. ඊළඟට අනිත් අයට මෙත් සිත පතුරුවන්න කියපුවාම එයා අනිත් අයට මෙත් සිත පතුරුවනවා. නපුරු සිත් ඇති කරගන්නෙ නෑ. මෙන්න මෘදු විදිහට දමනය වෙනවා.

## කයින් කරන හොඳ දේවල්....

ඊළඟට භාග්‍යවතුන් වහන්සේ කයින් කරන හොඳ දේවල් ටික කියල දෙනවා. මෙන්න මේක තමයි කයින් කරන යහපත් දේ කියල කියල දෙනවා. වත් පිළිවෙත් කරන හැටි, ඇප උපස්ථාන කරන

විදිහ, ගිලානෝපස්ථානය කරන විදිහ කියා දෙනවා. එක තැනක තියෙන්නේ **(යෝ ගිලානං උපට්ඨෙය්‍ය සෝ මං උපට්ඨෙය්‍ය)** යමෙක් ගිලනුන්ට උපස්ථාන කරනවා නම් ඔහු මට උපස්ථාන කරනවා කියල. මෙන්න කාය සුචරිතය. මේ විදිහට කයින් කරන හොඳ දේවල් කියා දීල මෘදු විදිහට දමනය කරනවා.

## මෙන්න කාය සුචරිතයේ විපාක....

ඊළඟට **(කාය සුචරිතස්ස විපාකෝ)** කයින් හොඳ දේවල් කළා ම එයින් ලැබෙන යහපත් විපාක පෙන්වා දෙනවා. දන් දුන්නම දන්දීමෙන් ලැබෙන විපාක පෙන්වා දෙනවා. සිල් රැක්කම ලැබෙන විපාක පෙන්වා දෙනවා. සීලවන්තයාගේ සීලය නිසා ලැබෙන හොඳ විපාක මොනවද?

1. **මහන්තං භෝගක්කන්දං ආදිගච්ඡති** - මහත් වූ බෝග සම්පත් ලැබෙනවා.

2. **කළ්‍යාණෝ කිත්තිසද්දෝ ආදිගච්ඡති** - කළ්‍යාණ කීර්ති රාවයක් පැතිර යනවා.

3. **විසාරදෝ උපසංකමති** - ඕනෑම තැනකට විශාරදව බිය රහිතව යන්න පුළුවන්.

4. **අසංමූල්හං හෝ කාලං කරෝති** - සිහි මුලා නො වී කළුරිය කරනවා.

5. **කායස්ස භේදා පරංමරණා සුගතිං සග්ගං ලෝකේ උප්පජ්ජති** - කය බිඳී මරණින් මතු සුගතියේ උපදිනවා.

## මෙන්න වචී සුචරිතයේ විපාක....

එතකොට මෘදු මොළොක් විදිහට හික්මෙන පුද්ගලයා සුචරිතය මේකයි සුචරිතයේ විපාක මේකයි කියල විස්තර කරපුවා ම ආයෙ අමුතුවෙන් එයාට දුසිරිතය විස්තර කරන්න ඕනෙ නෑ. සුචරිතයේ විපාක ඇහුවා ම ඒ අය හික්මෙනවා. මේ තමයි මෘදු විදිහට දමනය වීම.

ඊළඟට වාග් සුචරිතයේ විපාක පෙන්වා දෙන්වා.

1. තමාගේ වචනයට අනිත් අය ඇහුම්කම් දෙනවා.

2. පැහැදිලි නො පැටලවෙන මිහිරි වචන කථා කරන්න පුළුවන් වෙනවා.

3. කථා කරන වචන ඕනෙ කෙනෙකුට අහන්න පුළුවන් වෙනවා.

4. කථා කරන කථාව තුළ තියෙන ධර්ම කථාව වැටහෙනවා.

5. මරණින් මතු සුගතියේ උපදිනවා.

මේවා තමා වාග් සුචරිතයේ විපාක.

## මෙත් සිත පැතිර වීමේ ආනිසංස...

ඊළඟට මනෝ සුචරිතයේ විපාක පැහැදිලි කරනවා. මනෝ සුචරිතය තමා මෛත්‍රිය. මෛත්‍රිය නිතර නිතර පුරුදු කළොත්, නිතර නිතර භාවිතා කළොත්, යානාවක් වගේ පුරුදු කළොත් මෙන්න මේවා ආනිසංශ.

1. සැප සේ නින්ද යනවා.

2. සැප සේ අවදි වෙනවා.

3. නින්දේදී නපුරු හීන පේන්නෙ නෑ.

4. මනුස්සයන්ට ප්‍රිය වෙනවා.

5. අමනුස්සයන්ට ප්‍රිය වෙනවා.

6. දෙවියෝ විසින් රකිනවා

7. ගින්නෙන්, අවි ආයුධවලින්, වසෙන් විසෙන් අනතුරු වෙන්නෙ නෑ.

8. ඉක්මනින් ම චිත්ත සමාධිය ඇතිවෙනවා.

9. මුහුණේ පැහැය ලස්සන වෙනවා.

10. සිහි මුලා නො වී මරණයට පත්වෙනවා.

11. ඉදිරියේ දී මාර්ග ඵල නො ලැබුවොත් බඹලොව උපදිනවා.

මේ එකක් එකක් ගානෙ කියන කොට මිහිරියි නේද? මේ තමා සුචරිතයේ ප්‍රතිවිපාක. මේ තමා භාග්‍යවතුන් වහන්සේගේ මෘදු විදිහට පුරුෂයන් දමනය කිරීම.

## බය හිතෙන්නෙ නෑ...

දැන් ඔන්න මෙහෙම කිව්වා ම බය හිතෙන්නෙ නෑ. බය හිතෙන්නෙ **දේවදූත සූත්‍රය** ඇහුවාම. භාග්‍යවතුන් වහන්සේගේ බොහෝ දේශනා තියෙනවා මේ මෘදු මොළොක් විදිහට දමනය කිරීම ගැන. ඒවායේ අපාය ගැන සිහිකරන්නෙ නෑ. නපුරු කටුක වද පීඩා විස්තර කරන්නෙ නෑ. මෘදු විදිහට තමා දමනය කරන්නේ. මේ මිහිරි දේ අහන විට මිහිරි දේට අවනත වෙන එක්කෙනා ඉන්නවා. දැන් මෙයාට හිතෙන්නේ ඉපදෙන්නෙ නැත්නම් මට හොඳයි. ඒ නිසා එයා සුචරිතය වඩනවා. එහෙම නම් එයා සම්පූර්ණයෙන් ම සුචරිතය අහල සුචරිතය වඩල දමනය වෙනවා. අන්න ඒ කාරණයෙන් බුදුරජාණන් වහන්සේ **අනුත්තරෝ පුරිසදම්ම සාරථී** වෙනවා.

## කායදුෂ්චරිතය හඳුනාගන්න...

ඊළඟට භාග්‍යවතුන් වහන්සේ විස්තර කරනවා කේසී, දරුණු විදිහටත් මම දමනය කරනවා. මෙනවද මේවා. **(ඉති කායදුච්චරිතං)** මෙය යි කාය දුෂ්චරිතය කියල විස්තර කරනවා. ප්‍රාණඝාතය, ලේ වැකුණු අත් ඇතිව ඉන්නවා, දයා රහිතව ඉන්නවා, සතුන් කෙරෙහි හිංසවාදී ව ඉන්නවා මෙයයි ප්‍රාණඝාතය.

ඊට පස්සේ ප්‍රාණඝාතය සිදුවෙන ආකාරය විස්තර කරනවා. පණ ඇති සතෙක් වෙන්න ඕනෙ, සතුන් මැරීමේ චේතනාව තියෙන්න ඕනෙ. උපක්‍රමයක් කරන්න ඕනෙ, උපක්‍රමයෙන් සතා මැරෙන්න ඕනෙ. කියල විස්තර කරනවා. මෙය තමයි බුදුරජාණන් වහන්සේ ගේ සැර පරුෂ විදිහට හික්මවීම.

## හොරකම කියන්නේ මේකයි...

ඊළඟට බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා මෙන්න මේ විදිහට කයින් හොරකම් කරනවා. වංචනික විදිහට ජීවත් වෙන අය ඉන්නවා. තරාදියෙන් හොරකම් කරනවා. මනින මිම්මෙන් හොරකම් කරනවා. ගණන් හිලව් වලින් හොරකම් කරනවා. මේ විදිහට හොරකම් කරනවා. නුදුන් දෙය ගන්නවා. ආරණ්‍යයක හෝ වේවා, ගමක හෝ වේවා නුදුන් දෙය ගන්නවා. අනුන්ගේ දෙයක් බව දැනගැනීම, සොර සිත පහළ වීම, ඒ සඳහා උපක්‍රමයක් යෙදීම, ඒ උපක්‍රමය මගින් ඒ තිබුන දෙය තිබුන තැනින් ඉවත් කිරීම. හොරකම කියන්නේ මෙන්න මේකයි කියල හික්මවනවා.

ඒක තමයි භාග්‍යවතුන් වහන්සේ දරුණු විදිහට හික්මවනවා කියන්නේ. එතකොට මිහිරි දෙයක් ද මේ පෙන්වා දෙන්නේ? නෑ. හොරකමයි පෙන්වා දෙන්නේ.

ඊළඟට භාග්‍යවතුන් වහන්සේ පෙන්වා දෙනවා වැරදි කාම සේවනය. මව් රකින අය ඉන්නවා, ස්වාමියා රකින අය ඉන්නවා, පියා රකින අය ඉන්නවා. සහොදර සහෝදරියන් රකින අය ඉන්නවා, මාමා විසින් රකින අය ඉන්නවා මේ විදිහට යම් කෙනෙක් ආරක්ෂා කරන පිරිස සමඟ වරදේ බැඳීම කාම මිත්‍යාචාරය යි. එතකොට මේ විස්තරය තමයි දරුණු විදිහට විස්තර කිරීම. තවත් දරුණු විදිහට භික්ෂූන් වහන්සේලාට විස්තර කරලා දීලා තියෙනවා පංච දුෂ්චරිතයේ භයානක කම.

## ගිනිකඳ ද? කාන්තාව ද?

එක්තරා අවස්ථාවක විශාල ගිනිකන්දක් ඇවිලෙනවා. ඇවිලෙන කොට භාග්‍යවතුන් වහන්සේ අහනවා “මේකද හොඳ නැත්නම් කාන්තාවක් වැළඳ ගැනීම ද හොඳ?” කියල. භික්ෂූන් වහන්සේලා කියනවා “අනේ ස්වාමීනී, මේ ගිනි කඳ වැළඳගෙන ඉන්න එකට වඩා කාන්තාවක් වැළඳගෙන ඉන්න එක හොඳයි” කියල. “නැහැ... නැහැ... ඊට වඩා හොඳයි මේ ගිනි කඳ වැළඳ ගැනීම” කියල විස්තර කරනවා. මේ ගිනි කඳ වැළඳගත්තොත් මැරෙයි. එක්කෝ මාරාන්තික තුවාල වෙයි. අපායෙ යන්නෙ නෑ කියල විස්තර කරනවා. දැන් මෙතන මිහිරි සිද්ධි ද තියෙන්නේ? අන්න දමනය කරන ආකාරය. මෙන්න පුරිසදම්ම සාරථී ගුණය.

## ගිනිකඳ ද? පට සිවුරු ද?

ඊළඟට බුදුරජාණන් වහන්සේ නැවතත් ඒවාගේ අවස්ථාවක දී අහනවා “මහණෙනි, මේ ගිනි කඳ පොරවන එකට ද කැමති. හොඳ සිනිඳු පට සිවුරු පොරවන එකට ද කැමති?” කියල. “ස්වාමීනී, සිනිඳු පට සිවුරු හොඳයි” කියල භික්ෂූන් වහන්සේලා කියනවා. “නෑ... නෑ... දුස්සීලව ඉඳගෙන සිනිඳු පට සිවුරු පොරවනවාට වැඩිය හොඳයි මේ ගිනි කඳ පොරවා ගැනීම. මේ ගිනි කඳ පොරවා ගත්තොත් එක්කෝ මැරෙයි. එක්කෝ මාරාන්තික තුවාල ලබයි. අපායේ යන්නෙ නෑ” කියල පෙන්වල දෙනවා.

## ගිනි දළු ද? ඇල් හාලේ බත ද?

ඊළඟට භාග්‍යවතුන් වහන්සේ අහනවා, "පින්වත් මහණෙනි, ඇල්හාලේ බත් සූප ව්‍යංජනයන් එක්ක වළඳන එක ද හොඳ, මේ ගිනි දළු වළඳන එක ද හොඳ?" කියල. "ස්වාමීනී, ඇල් හාලේ බත් නම් හොඳයි" කිව්වා. "නෑ... නෑ... දුස්සීලව ඉඳගෙන ඇල් හාලේ බත වළඳනවට වැඩිය හොඳයි මේ ගිනිදළු වළඳන එක. මේ ගිනිදළු වලින් එක්කෝ මැරෙයි. එක්කො මාරාන්තික තුවාල ලබයි. අපායේ යන්නෙ නෑ." මේ විදිහට බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා කාය දුෂ්චරිතය.

මේවා බුදුරජාණන් වහන්සේ සැර පරුෂ විදිහට දමනය කිරීම. දැන් අපි සැර පරුෂයි කියන්නේ මොනවට ද? තෝ, තා, වර, පල ඒවටනේ. නමුත් භාග්‍යවතුන් වහන්සේ ඒ වචන පාවිච්චි කළේ නෑ. උන්වහන්සේ දමනය කිරීම පිණිස දුෂ්චරිතයේ විපාක පෙන්වා දීමයි සැර පරුෂ දමනය.

## මුල් යුගයේ බුදු සසුන...

අවුරුදු විස්සක් තුළ භික්ෂූන් වහ්සේලා බුද්ධ ශාසනය තුළ බඹසර කිලුටු කරගත්තේ නෑ. මුල්ම අවුරුදු විස්ස තුළ දී බුද්ධ ශාසනයට ඇතුළු වුන සියලු දෙනා මිහිරි විදිහට හික්මෙන්නේ. මෘදු විදිහටයි හික්මෙන්නේ.

විශාලා මහනුවර සුදින්න කියල තරුණයෙක් හිටියා. මේ ගෞතම බුදුන් වහන්සේගේ ශාසනයේ නිවන් දකින්න ඕනෙ කියල කැමති වුනා. එතකොට එයා විවාහ වෙලා හිටියේ. විවාහ වෙච්ච අලුත. ගෙදරින් උපවාස කරල මට කෑම බීමත් එපා. මට මහණ වෙන්න අවසර දුන්නොත් විතරයි මම කෑම ගන්නේ කියල කොහොම හරි මහණ වුනා. මහණ වෙලා හොඳට සිල් රැකල මෙයා වාසය කරනවා.

## පිළිණු පිට්ටුව....

දැන් සුදින්න හාමුදුරු කෙනෙක්. ඉතින් ඊට පස්සේ චාරිකාවේ වඩිද්දී ඔන්න දවසක් මේ ගෙදරටත් වැඩියා. ගෙදර හිටපු දාසිය පිළුණු වෙච්ච පිට්ටු ටිකක් විසි කරන්න එළියට ආවා. සුදින්න හාමුදුරුවෝ ඒ පිට්ටු ටික ඉල්ල ගත්තා. සුදින්න ස්වාමීන් වහන්සේ ගේ ඉරියව් වලින් අඳුනගත්තා මේ අපේ ගෙදර හිටපු ස්වාමි පුරුෂයා

කියල. ඉතින් ගිහිල්ලා ගිහි කාලේ බිරිඳට කිව්වා "අන්න ස්වාමි පුත්‍රයාණන් වහන්සේ ඇවිල්ලා දැන් මේ පිළුණු පිට්ටුවක් පිළිඅරන් ගියා" කියල.

හොයන කොට මේ පැත්තක පිළිකන්නෙ දානේ වළඳනවා. ඊට පස්සේ ස්වාමි දුව කිව්වා "අනේ ස්වාමීනී, වඩින්න මම හොඳ දානේ දෙන්නම්" කියල. "නෑ... නෑ... මම දැන් දානෙ වළඳල ඉවරයි" කියල සුදින්න හාමුදුරුවෝ කිව්වා. "කොහෙද ඉන්නේ?" කියල ඇහුවා. "මම ඉන්නේ අර වනාන්තරේ" කියල කිව්වා. "එහෙනම් හෙට දානෙට වඩින්න" කිව්වා.

## දානෙ දෙනව නම් දානෙ දෙන්න....

ඉතින් මේ ස්වාමීන් වහන්සේ බරක් පතලක් හිතුවේ නෑ වඩින්න ලෑස්ති වුනා. දානේ ලෑස්ති කරලා නැන්දනිය කිව්වා ලේලියේ මගේ පුතාගේ සිත් ඇදගන්න ඇඳුම ඇඳපන් කියල. දැන් ඉතින් ඇන්දා. සුදින්න හාමුදුරුවෝ දානෙට වැඩියා. දැන් ඉතින් දානෙ දෙන්නේ නෑ. අරයා එහාට මෙහාට පැටැලෙනවා. ඉතින් අර ස්වාමීන් වහන්සේ කිව්වා, "මොකද මොකද මේ... දානෙ දෙනවා නම් දෙන්න. මම යන්න ඕනෙ" කියල. ඊට පස්සේ "අනේ ස්වාමීනී, ඔබවහන්සේ මොන වගේ බිරින්දෑවරුන් බලාගෙන ද මේ බ්‍රහ්මචාරී සීලය රකින්නේ?" කියල ඇහුවා. "නැගණියනි, මට එහෙම අදහසක් නෑ" කිව්වා. නැගණියනි කිව්වා විතරයි ඔන්න කලන්තෙ දාල වැටුනා.

## බීජයක් කළ විපතක්...

ඊට පස්සේ දෙමාපියන් අඬන්න ගත්තා අපේ පරම්පරාව ඉවරයි කියල. දරු පරම්පරාව ඉවරයි කියල. "අනේ ස්වාමීනී, එහෙම කරන්න එපා. දැන් මේ දේපල වස්තු වලට මොනවද වෙන්නේ. දරු බීජයක් වත් දෙන්න." ඒ වෙන කොට ශික්ෂා පද පණවල තිබ්බේ නෑ. ඉතින් දන්නේ නෑ.

ඊට පස්සේ මොකද වුනේ, හොඳයි කිව්වා. දන්නේ නෑනෙ. ශික්ෂා පදයක් තිබ්බෙත් නෑ එතකොට. මේ දේ එපා කියල තහනම් කරල. ඉතින් කිව්වා මම අර වනන්තරේ ඉන්නෙ කියල. මේ වෙන කොට බුද්ධ ශාසනයට අවුරුදු විස්සයි. ඉතින් මේ ස්වාමීන් වහන්සේ තමාගේ ගිහි කාලෙ බිරිඳත් එක්ක මෙවුන්දම් සේවනයේ යෙදුනා චීවරයත් දරාගෙන.

## බුදු සසුන කිලුටු වුනා...

වනගත දෙවි දේවතාවුන් දෑත් බැඳගෙන අඬන්න ගත්තා. "බුදු සසුන කිලුටු වුනා... බුදු සසුන කිලුටු වුනා...." කියල. ඊට පස්සේ ඒක අහල චාතුම්මහාරාජික දෙවිවරු අඬන්න ගත්තා "බුදු සසුන කිලුටු වුනා... බුදු සසුන කිලුටු වුනා..." කියල. ඒක අහල තව්තිසා වැසි දෙවිවරු අඬන්න ගත්තා "බුදු සසුන කිලුටු වුනා... බුදු සසුන කිලුටු වුනා..." කියල. අකනිටා බඹලොව දක්වා දෙවිවරු අඬන්න ගත්තා "බුදු සසුන කිලුටු වුනා... බුදු සසුන කිලුටු වුනා..." කියල.

ඊට පස්සේ මේ සිද්ධිය ඉවර වුනාට පස්සේ මේ ස්වාමීන් වහ්සේට හිතුනා "මට වැරදුනා..." කියල. ශ්‍රමණ උත්තමයෙක් විසින් නො කළයුත්තක් මගේ අතින් වුනේ කියල. දැන් මෙයාට කියා ගන්න බෑ වෙච්ච වැරැද්ද. ලස්සට හිටපු කෙනා සුමානෙන් දෙකෙන් කටු ගැහුණා. වළඳන්නත් බෑ කල්පනා කරනවා.

## මෙන්න කාමයන්ගේ ආදීනව....

අනිත් ස්වාමීන් වහන්සේලා ඇහුවා "ස්වාමීන් වහන්ස, මොකද වුනේ" "අනේ මට මෙහෙම දෙයක් වුනා" "අහෝ බුදුරජාණන් වහන්සේ වදාළා නේද මේ කාමයන් අනිත්‍යය යි. කාමයන් ගිනි සිළුවක් වගේ. කාමයන් මස් වැදැල්ලක් වගේ. මේ කාමයන් සම්පූර්ණයෙන් ම මනුෂ්‍යයා විනාශ කරනවා. විමුක්තිය නැතිකරල දානවා කියල පෙන්වා දීල තියෙනවා නේද? ඇයි ඔබවහන්සේ සිහිකළේ නැද්ද?" "අනේ මෙහෙමයි මෙහෙමයි වුනේ" කිව්වා.

බුදුරජාණන් වහන්සේ ළඟට එක්කන් ගියා. "බුදුරජාණන් වහන්සේ හැබෑද භික්ෂුව මෙවැනි අකරතැබ්බයක් වුනා ද?" කියල ඇහුවා. අන්න එතනදි බුදුරජාණන් වහන්සේ දුෂ්චරිතය විස්තර කරනවා.

## බඹසර නො රැක්කොත් නිරයේ...

"හිස් පුරුෂය, මීට වඩා හොඳයි භයානක සර්පයෙක් ඉන්න ගුලක් ඇතුලට දම්ම නම්. මීට වඩා හොඳයි ගිනි අඟුරු වලක ඔබා ගත්ත නම්. මීට වඩා හොඳයි දිවි නසා ගත්ත නම්" කියල විස්තර කරනවා. පිරිසිදු බඹසර ආරක්ෂා කරන්න බුදු සසුනට ආපු කෙනා මේක කළොත් නිරයේ හරි තිරිසන් අපායේ හරි ඉපදෙනවා කියල වදාළා. මෙන්න අකුසලයත් අකුසල විපාකයත්.

ඊට පස්සේ තමාගේ පැරණි ස්වාමියාට මෙවැනි විපතක් සිදුවුනේ කියල ආරංචි වෙනවා. ඉතින් ඒ බිරිඳට දරුවෙක් ලැබුනා. දරු බීජයක් නෙ ඉල්ලුවේ. ඒ නිසා එයාට නම වැටුණා "බීජක" කියල. අම්මට නම වැටුනා "බීජක මාතා" කියල. මේ දෙන්නම මහණ වෙලා රහත් වුනා. මේ ස්වාමීන් වහන්සේ ගැන විස්තර සඳහන් වෙන්නෙ නෑ.

බුද්ධ දේශනාවේ තියෙනවා ආදිකම්මිකයාට අනාපත්ති කියල. ඒ කිව්වේ ඒ වරද නො දැන ඉස්සෙල්ලා ම කරන එක්කෙනා ඒ වරදෙන් නිදහස් වෙනවා කියල විස්තර කරනවා. එතනින් පස්සේ සුදින්න හාමුදුරුවෝ ගැන විස්තරයක් නෑ. එච්චරට එයාට ඒක මානසිකව බලපෑවා. ඉතින් මේ අකුසලය යි අකුසලයේ විපාකය යි බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනකොට අන්න ඒකට මිනිස්සු හික්මෙනවා. මෙන්න පුරිසදම්ම සාරථී ගුණය.

## කළා ද? නැද්ද?

ඊළඟට පෙන්වා දෙනවා වචී දුෂ්චරිතය. බොරු කීම, පිරිස මැද්දේ අඬගහල කියනවා මේක කළාද, නැද්ද? දැක්කද, නැද්ද? දැකපු දේ නැහැ කියනවා. එහෙම නැත්නම් පිරිස මැද්දේ කියනවා අපි මොකුත් කළේ නැත්නම් නිශ්ශබ්දයි කියනවා. ඒ කරල නිශ්ශබ්දව ඉන්නවා. ඒකත් බොරුවට අහුවෙනවා.

එතකොට කේලාම් කීම. අතනින් අහගෙන ඇවිල්ලා මෙතන කියනවා. මෙතන බිඳවන්න. මෙතනින් අහගෙන ගිහිල්ලා එතන කියනවා එතන බිඳවන්න. ඊළඟට සමඟි වෙච්ච අය බිඳවනවා. අසමඟි කරනවා. මේවා තමයි කේලම. අන්න පරුෂ විදිහට හික්මවනවා. විස්තර කරල දෙනව කේලම. එතකොට කේලම කියපු අය රත්වෙලා යනවා. අනේ මට මෙහෙම වුනානේ, මෙහෙම වුනානේ කියල.

ඊළඟට පරුෂ වචන විස්තර කරල දෙනවා. මේ විදිහට ශාන්තිය නැතිවෙලා, නපුරු වචන, පරුෂ වචන කියාගෙන යනවා. එතකොට එහෙම වෙච්ච අය තැති ගන්නවා. ආ... මේ අකුසලය මගේ අතින් සිද්ධ වෙලා කියල තැති ගන්නව.

## හිස් වචන කතා කළොත් ප්‍රතිපලත් හිස් තමයි...

ඒ වගේ ම හිස් වචන පෙන්වල දෙනවා. රාජ කතා... චෝර කතා... ආදී දෙතිස් කථා විස්තර කරනවා. මේවා හිස්වචන කියල. එතකොට අර හිස් වචන කිය කිය හිටපු අය තැති ගන්නවා. අන්න

හික්මෙනවා. අකුසලය පෙන්වා දුන්නාම අකුසලය හඳුනාගෙන හික්මෙනවා.

## වචනය වරද්දා ගැනීමේ ආදීනවය...

ඊළඟට පෙන්වල දෙනවා වචී දුෂ්චරිතයේ විපාක. බුදුරජාණන් වහන්සේ ගේ කාලෙ හිටියා කෝකාලික කියල භික්ෂුවක්. සැරියුත් මුගලන් දෙනමට චෝදනා කළා පව්ටු භික්ෂූන් කියල. එතකොට භාග්‍යවතුන් වහන්සේ ළඟට ම ඇවිල්ලා කිව්වනේ "කෝකාලික ඕක කියන්න එපා" කියල. කියද්දි කියද්දි ඒක ම කිව්වා.

කෝකාලික හාමුදුරුවෝ ගියා. ගිහිල්ලා වැඩිවෙලාවක් ඉන්න හම්බවුනේ නෑ. ඇඟම කැහුවා. පොඩි බිබිලි හටගෙන ඒවා වෙරළු ගෙඩි, බෙලිගෙඩි ප්‍රමාණයට පත්වුනා. ඊට පස්සේ සැරව වැදිලා පිපුරුණා. ඒත් හරිගියේ නෑ.

අනාගාමී බ්‍රහ්ම රාජයෙක් හිටිය තුදු කියල. ඒ දෙවියාත් ඇවිල්ල මෙයා බේරගන්න කියල හිතල හිත පහදවාගන්න කිව්ව. ඊට පස්සේ කවුද උඹ කියල ඇහුවා. මම අනාගාමී බ්‍රහ්ම රාජයෙක් කියල හඳුන්වල දුන්නා. ඊටපස්සේ කෝකාලික හාමුදුරුවො කිව්වා බලපං උඹ කරපු වැරැද්ද. උඹ මොකටද මෙහෙ ආවෙ කියල ඇහුවා. බලන්න උපදෙස් දෙන්න ගියාම වෙන දේ. බුදුරජාණන් වහන්සේ කිව්වා කටේ කෙටේරිය තියාගෙන ඉපදුන අය ඔහොම තමයි කියල.

ඊට පස්සේ එයා මැරිලා ඉපදුනා පදුම කියන නිරයේ. ඊට පස්සේ ඒ නිරයේ ආයුෂ ගැන විස්තර කරනවා මේ නිරයේ මෙච්චර ආයුෂ තියෙනවා කියල. දැක්කනේ දුෂ්චරිතයත් දුෂ්චරිතයේ විපාකත් විස්තර කරනවා.

## මනසේ දුෂ්චරිතයෙනුත් නිරයේ යනවා...

ඊළඟට මනෝ දුෂ්චරිතය විස්තර කරනවා. මේ අභිජ්ඣා, දෝමනස්ස, ව්‍යාපාද, මිච්ඡා දිට්ඨි. බුදුරජාණන් වහන්සේ විස්තර කරනවා සමහර අවස්ථා වලදී පුද්ගලයින් දූෂිත සිතුවිලිවලින් ඉන්නවා. එහෙම ඉන්න කෙනා මැරිලා ගිහින් නිරයේ ඉපදෙනවා කියල. දුෂ්චරිතයත් දුෂ්චරිතයේ විපාකත් පෙන්වලා දෙනවා.

ඊළඟට බුදුරජාණන් වහන්සේ වදාළා "කේසී, දැන් ඔයා කිව්වා මෘදු විදිහටත් පරුෂ විදිහටත් දෙකට ම දමනය කරනවා කියල. මමත් මේ විදිහම තමයි" කියල වදාළා.

## සුචරියතයත් - දුෂ්චරිතයත්....

බුදුරජාණන් වහන්සේ වදාළා කයින් කරන හොඳ මේකයි හොඳ දේ විපාක මේකයි කයේ දුෂ්චරිතය මේකයි, දුෂ්චරිතයේ විපාක මේකයි කියල විස්තර කරනවා. වචී දුෂ්චරිතය මේකයි, වචී දුෂ්චරිතයේ විපාක මේකයි කියල විස්තර කරනවා. මේ විදිහට කරන කොට ශ්‍රද්ධාවේ පිහිටි කෙනා මොකද කරන්නේ. මේ පොඩි බණ පදයත් අරගෙන පුහුණු වෙනවා. මම දැන් සංවර වෙනවා. මම දැන් වචනය සංවර කරගන්නවා. මම දැන් කය සංවර කරගන්නවා කියල. ඊළඟට අකුසල විපාකයට බය වෙනවා. හිරි ඔතප් ඇති වෙනවා. ඇතිවුනාට පස්සේ ඔන්න දැන් එයා සංවර වෙන්න පුරුදු වෙනවා.

## බුදු සසුනෙත් මරා දානවා....

ඊළඟට කේසී අහනවා බුදුරජාණන් වහන්සේගෙන් "මෘදු විදිහට හික්මෙන්නේ නැත්නම්, පරුෂ විදිහට හික්මෙන්නේ නැත්නම් භාග්‍යවතුන් වහන්ස මොකද කරන්නේ?" කියල. "කේසී, දමනය විය යුතු පුද්ගලයා මෘදු විදිහට දමනය වෙන්නෙත් නැත්නම්, පරුෂ විදිහට දමනය වෙන්නෙත් නැත්නම්, කේසී මම ඒ පුද්ගලයා මරණවා." .

එතකොට කේසී කියනවා "භාග්‍යවතුන් වහන්ස, සතුන් මැරීම කැප නැහැ නෙව." "ඒක ඇත්ත කේසී. භාග්‍යවතුන් වහන්සේට සතුන් මැරීම කැප නැහැ තමයි. නමුත් ඒ විදිහට පුරුෂයා මෘදු විදිහට හික්මෙන්නෙත් නැත්නම්, දුෂ්චරිතය මේකයි දුෂ්චරිතයේ විපාකය මේකයි කියල පෙන්නුවාට ම ඒකට හික්මෙන්නෙත් නැත්නම්, සුචරිතය මේකයි සුචරිතයේ මේකයි කියල පෙන්නද්දි මේකට හික්මෙන්නෙත් නැත්නම් මම මෙහෙමයි පුද්ගලයාව මරන්නේ"

**(න තථාගතෝ අත්තබ්බං අනුසාසිතබ්බං මඤ්ඤති)** තථාගතයන් වහන්සේ ඔහුට අනුශාසනා කරන්නේ නෑ. **(නපි විඤ්ඤූ සබ්‍රහ්මචාරී අත්තබ්බං, අනුසාසිතබ්බං මඤ්ඤන්ති)** කේසී මේ ආර්ය විනයෙහි තථාගතයන් වහන්සේගේ අනුශාසනා යමෙකුට ලැබෙන්නේ නැත්නම්, සබ්‍රහ්මචාරීන් වහන්සේලාගේ අවවාද අනුශාසනා යමෙකුට ලැබෙන්නේ නැත්නම් **(වධෝ)** ඒක මරණයක් වගේ කියනවා.

## ඒකාන්තයෙන් මරලා දැම්ම වගේ තමයි...

ඊට පස්සේ කේසී බුදුරජාණන් වහන්සේට කියනවා, "ස්වාමීනී, ඒක නම් ඒකාන්තයෙන් ම මරණයක් වගේ තමයි" කියල. තථාගතයන්

වහන්සේලා අනුශාසනා කරන්නෙත් නෑ. සබ්‍රහ්මචාරීන් වහන්සේලා අනුශාසනා කරන්නෙත් නෑ. මේක අහලා කේසී අවබෝධයෙන් යුතුව ම තෙරුවන් කෙරෙහි පැහැදිලා අවබෝධයෙන් යුතුව ම තෙරුවන් සරණ ගියා.

කාය දුෂ්චරිතයත්, කාය දුෂ්චරිතයේ විපාකත් හඳුනන එක්කෙනා දුෂ්චරිතයෙන් අත්මිදෙනවා. ඇයි ඒ? භය වෙනවා දුෂ්චරිතයේ විපාකයට. කාය සුචරිතය යි සුචරිතයේ විපාකය යි අහනකොට ලොකු රැකවරණයක් හිතට එනවා. මට මේ කාය සුචරිතයත් සුචරිතයේ විපාකත් අහන කොට ඇති වුනේ ම ආරක්ෂාවක්. මේක කරගත්තොත් හරි මේක කරගත්තොත් භය වෙන්න දෙයක් නෑ කියල. ඔබට එහෙම හිතෙනවද?

## සුචරිතය දැන හික්මෙන්න...

අන්න බලන්න එතකොට ඒකේ හිත පැහැදිලා තමයි සුචරිතයේ යෙදෙන්නේ. කාය දුෂ්චරිතයේ දී ඇතිවන්නේ භයක්. අනේ මේවා මේවා වෙලා තියෙනවා මේවා මේවා හිතලා තියෙනවා. මේවා නම් අතහරින්න ඕනෙ මේක නම් පුරුදු කරල හරියන්නෙ නෑ කියල සුචරිතයට කැමති වෙනවා. බලන්න මේවා අපට බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන්නේ නැත්නම් අපට කොහෙන්වත් මේවා අහන්න ලැබෙන්නෙ නෑ. නමුත් බුදුරජාණන් වහන්සේ ඉතාම පැහැදිලිව කාය සුචරිතය පෙන්වල දීල තියෙනවා.

## මෙන්න ඒ හික්මවන හැටි...

බුදුරජාණන් වහන්සේ එක තැනක පෙන්වල දෙනවා බුදු සසුනට ඇතුළු වුන මුල් කාලයේ මේ දෙය පුරුදු කරන්න මේ දෙය අතහරින්න මෙහෙම හිතන්න මේ විදිහට කල්පනා කරන්න කියල විතරයි කියන්නේ. ඒ අය හික්මෙනවා. දමනය වෙනවා.

බුදුරජාණන් වහන්සේ හරියට උපමා කළා අශ්වයින්ට. සමහර අශ්වයින් ඉන්නවා, අල්ලගෙන එනවා. ටික කලක් බැඳල තියනවා. ඊට පස්සේ කටකලියාව දානවා. ඉස්සෙල්ලා ම මෙයාට අමුතුයි. ඊට පස්සේ ටික ටික පුරුදු වෙනවා. ඊට පස්සේ අශ්වයාට හොඳින් කියනවා 'මේක කරපන් පුතා' කියල. අයෙ කසේ ගන්න දෙයක් නෑ. ඒ මොන අශ්වයින් ද? ආජානේය අශ්වයින්. සුපිරි අශ්වයින්. යන්තම් පොඩ්ඩක් කියන කොට බොහොම ලස්සනට හික්මිලා යනවා. දඩබ්බර අශ්වයෝ ඉන්නවා ඒගොල්ලන්ට මොකද කරන්නේ. හැම තිස්සේම

දැගලනව. කසෙන් ගහන්න ඕනෙ. ඒ වගේ තමයි දුෂ්චරිතයත්. මේක තමයි බුදුරජාණන් වහන්සේගේ පුරිසදම්ම සාරථී ගුණය.

## මේ දෙකෙන් ම නිදහස් වෙලාව...

බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා මේ අනුත්තර වූ නිවන අවබෝධයට සතර අපායේ වැටීම තරම් අනතුරක් මම තවත් බුදු ඇසින් දකින්නේ නෑ කියල. එතකොට බලන්න කොයිතරම් මේක බරපතලයි ද? ඊළඟට බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා මහණෙනි, මම දැකලා තියෙනවා ඡඵස්සායතනික කියල නිරයක්. ඒ නිරයේ පෙනෙන රූප බියක්, තැතිගැනීමක්, දුකක් ම යි ඇතිවෙන්නේ කියනවා. විඳින ගඳ සුවඳ, දැනෙන රස, විඳින පහස, සිතට එන සිතුවිලි බියක්, තැතිගැනීමක්, දුකක් ම යි ඇතිවෙන්නේ කියනව. මහණෙනි, ඡඵස්සායතනික නිරය මම දැක්ක කියල කියනවා.

ඊළඟට කියනවා මහණෙනි මම දැක්කා ඡඵස්සායතනික සුගතිය. ඒකේ ඇහැට පේන රූපයක් දැක්කම සතුටක්, සොම්නසක් විතර ම යි ඇතිවෙන්නේ කියල දේශනා කරනවා. කණට ශබ්දයක් ඇහුනා ම සතුටක් සොම්නසක් විතර ම යි ඇතිවෙන්නේ. නාසයට ගඳ සුවඳක් දැනුනා ම, දිවට රසයක් දැනුනා ම, ශරීරයට පහසක් දැනුනා ම, සිතට සිතුවිල්ලක් ආවා ම සතුටක් සොම්නසක් විතර ම යි කියනව ඇතිවෙන්නේ.

ඊට පස්සේ භාග්‍යවතුන් වහන්සේ දේශනා කරනවා පින්වත් මහණෙනි, අපි දැන් මේ අවස්ථා දෙකෙන් ම බේරිලා ඉන්න මොහොතයි කියල. ඉතින් බලන්න මේ අවස්ථාව ජීවිතය අවබෝධ කරගන්න හොඳම මොහොතයි. දුෂ්චරිතය බැහැර කරන්න හොඳම අවස්ථාව. සුචරිතය ඇති කරගන්න හොඳම අවස්ථාව. මේක තම තමන් ම හිත හිතා තම තමන් ම හැදෙන්න ඕනෙ. අපි ගොඩක් පුරුදු වෙන්න ඕනෙ මේ සුචරිතයට හැදෙන්නයි. සුචරිතයේ විපාක වලට යි.

## වෙන ආගම් වල මේවා නෑ..

ඉතින් බලන්න බුද්ධ දේශනා වල විතරයි මේ විදිහට දුෂ්චරිතය මේකයි, දුෂ්චරිතයේ විපාක මේකයි, සුචරිතය මේකයි, සුචරිතයේ විපාක මේකයි කියල විස්තර කරන්නේ. වෙන කිසිම ආගමක මේ විදිහට දේශනා කරල නෑ. ඒ ආගම් වල උගන්වන්නේ ඒ ආගම වෙනුවෙන් තව කෙනෙක් මැරුවා ම ඒක තමයි එයාට සුගතියේ

යන්න තියෙන්නේ. සුගතියේ යන්න සුචරිතය කියල පෙන්වල තියෙන්නේ දුෂ්චරිතය.

## ගෙට ගෙවදින්නේ හරක් මරලා...

සමහර ආගම් වල ගෙට ගෙවදින කොට හරකෙක් මරණවා. මරල ඔක්කොම එකතු වෙලා පුච්චල කනවා. ප්‍රාණඝාතය සුචරිතය ද? දුෂ්චරිතය ද? දුෂ්චරිතයේ යෙදිල ඒ දුෂ්චරිතය අනුමෝදන් වෙනව. දුෂ්චරිතය දන්නෙත් නෑ. දුෂ්චරිතයේ විපාක දන්නෙත් නෑ. කරන්න දෙයක් නෑ.

## දැන් අපිට ඒ දුර්ලභ මොහොත උදාවෙලා තියෙන්නේ...

අපි දැන් සුචරිතය හඳුනාගත්ත වෙලාවෙ, දුෂ්චරිතයේ විපාක හඳුනාගත්ත වෙලාවෙ මොකද කරන්න ඕනෙ. දුෂ්චරිතය බැහැර කරන්න ඕනෙ. එතකොට දුෂ්චරිතයේ විපාක බැහැර වෙනවා. සුචරිතය ම දියුණු කරන්න ඕනෙ. එතකොට අපිට සුචරිතයේ විපාක ලැබෙනවා. එතකොට අපිට ඒ දුර්ලභ අවස්ථාව දැන් මේ උදාවෙලා තියෙන්නේ.

ඉතින් අපිට මේ කේසී සූත්‍රයෙන් හොඳට දැනගන්න පුළුවනි, ගෞතම බුදුරජාණන් වහන්සේ පුරිසදම්ම සාරථී වුනේ කොහොම ද? ඒ පුරිසදම්ම සාරථී බුදුරජාණන් වහන්සේ හොඳිනුත් දමනය කළා, සැර පරුෂ විදිහටත් දමනය කළා. ඒ දෙකෙන්මත් දමනය කළා. සමහර අය අත්හැරල දැම්මා.

## කථා නො කර දමනය කිරීම...

දැක්කනේ ඡන්න හිමියන් දමනය වෙච්ච ආකාරය. හොඳින් දමනය වුනෙත් නෑ. සැර පරුෂ විදිහට දමනය වුනෙත් නෑ. ආනන්ද හාමුදුරුවො ඇහුවා බුදුරජාණන් වහන්සේගෙන් මොකද කරන්නේ කියල. බුදුරජාණන් වහන්සේ වදාළා බ්‍රහ්මදණ්ඩය පණවන්න කියල. ඊට පස්සේ ආනන්ද හාමුදුරුවෝ ඇහුවා මොකක්ද මේ බ්‍රහ්මදණ්ඩය කියන්නේ කියල. අවවාද අනුශාසනා මොකුත් කරන්න එපා කිව්ව. ඒ අය ඕන දෙයක් කියපුවාවේ ඕගොල්ලෝ සද්ද නැතිව ඉන්න කිව්වා.

දැන් මේක කොහොමද කියන්නේ කියල ඇහුවා. එයා හරිම සැර පරුෂයි කිව්වා. තනියම යන්න එපා කිව්වා. පිරිසත් එක්ක යන්න කිව්වා. ගිහිල්ලා සංඝයා මෙන්න මෙහෙම සම්මත කළා කියල

කියන්න කිව්වා. දැන් බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පාලා. අනිත් ස්වාමීන් වහන්සේලා වැඩලා කිව්වා ආයුෂ්මත් ඡන්න, සංඝයා වහන්සේලා විසින් බ්‍රහ්මදණ්ඩය ඔබට නියම කරනවා කියල. මොකක්ද බ්‍රහ්මදණ්ඩය කියල ඇහුවා. ඔබවහන්සේට පුළුවනි අනිත් ඕනෙ කෙනෙක් එක්ක කථා කරන්න. හැබැයි අනෙත් ස්වාමීන් වහන්සේලාගෙන් අවවාද අනුශාසනා නැහැ කිව්වා. අනේ එහෙම නම් මම ඉවරයි කියල සිහිය නැතිව වැටුනා.

## මානය තරම් නිවනට බාධකයක් තවත් තියේ ද?

ඊට පස්සේ ස්වාමීන් වහන්සේලා ළඟට යනවා "අනේ ස්වාමීනී, මට අවවාද කරන්න, අවවාද කරන්න" කියල කියනවා. කවුරුත් කථා කරන්නෙ නෑ. අනිත් අය ළඟට යවනවා. අන්තිමේ දී ආනන්ද ස්වාමීන් වහන්සේ ළඟට ගියා. "හරි ඔබ ජයගත්තා" කිව්වා. මාන හුල බින්දා කිව්වා. දැන් ඔබ ධර්මාවබෝධයට සුදුස්සෙක්.

එතකොට අපට පේනවා ධර්මය අවබෝධ කරන්න තියෙන විශාල බාධාවක් තමයි මානය. ඇත්ත පෙනි පෙනී ඇත්තට ගරහනවා මාන්නය තියෙන කෙනා. ඒ නිසා මේ ධර්ම මාර්ගය නිහතමානීව දියුණු කරගෙන දුසිරිතත් දුසිරිතේ විපාකයටත් බය වෙලා, සුචරිතයටත් සුචරිතයේ විපාකයටත් කැමති වෙලා, සුචරිතයේ විපාක ලැබෙන විදිහට ජීවිතය දියුණු කරගෙන මේ ගෞතම බුද්ධ ශාසනයේ දී ම උතුම් චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කරගැනීමේ භාග්‍ය උදාවේවා!

*සාදු ! සාදු!! සාදු !!!*



# ආශ්චර්ය අද්භූත කරුණු අටක්

## -වේසාලික උග්ග සූත්‍රය-

*ශ්‍රද්ධාවන්ත පින්වතුනි,*

දැන් ඔබ ඉගෙන ගන්න මේ දේශනාව ඇතුළත් වෙලා තියෙන්නේ **අංගුත්තර නිකායේ 8 වැනි නිපාතය** ට යි. මේ දේශනාවෙ නම **වේසාලික උග්ග සූත්‍රය**. විශාලා මහනුවර වාසී උග්ග ගෘහපතියාට වදාළ දෙසුම. එතකොට මේ පින්වතාගෙ නම මොකක් ද උග්ග. ඒ දවස්වල බුදුරජාණන් වහන්සේ වැඩ සිටියේ **විශාලා මහනුවර** මහවනාන්තරේ ඇතුලෙ ගොඩනගල තිබ්බ්ච්ච කූටාගාර ශාලාවේ. බුදුරජාණන් වහන්සේ භික්ෂු සංඝයා අමතා මෙහෙම වදාළා.

### ආශ්චර්ය අද්භූත කරුණු අටක්...

"පින්වත් මහණෙනි, ඔබ මතක කියාගන්න ඔය විශාලා මහනුවර සිටින උග්ග ගෘහපතියාට **ආශ්චර්ය අද්භූත කරුණු අටක්** තියෙනවා" කියල. එහෙම කියල බුදුරජාණන් වහන්සේ විහාරයට වැඩියා. දැන් සාමාන්‍යයෙන් රහතන් වහන්සේ නමකගේ ආශ්චර්යවත් අද්භූත කරුණු කියවෙනව නම්, අපිට ඒක එච්චර පුදුම සහගත දෙයක් නෙවෙයි. දැන් මේ කියන්නෙ ගිහි ශ්‍රාවකයෙකු ගැන. ගෘහපති කෙනෙක්. ගෘහ මූලිකයෙක්. මේ කෙනාටත් ආශ්චර්ය අද්භූත කරුණු අටක් තියෙනවා.

## කෙටියෙන් දෙසූ ධර්මය දැනගන්නට...

ඉතින් ස්වාමීන් වහන්සේලාටත් මේ කාරණය විස්තර වශයෙන් දැනගන්න ඕනෙ වුනා. දැන් බුදුරජාණන් වහන්සේ මේ විදිහට වදාළා විතරයි. විස්තර වශයෙන් දේශනා කළේ නැහැ. ඉතින් බුදුරජාණන් වහන්සේ එහෙම ප්‍රකාශ කරලා විහාරයට වැඩියා ම ස්වාමීන් වහන්සේලා කල්පනා කළා අපි මේ උග්ග සිටුතුමා හමුවෙන්න ඕනෙ ගිහිල්ලා.

ඉතින් පහුවදා උදේ වරුවේ පාත්තර සිවුරුත් අරගෙන විශාලා මහනුවරට වැඩම කරලා කෙලින් ම වැඩියෙ උග්ග සිටුතුමාගේ නිවසට. වැඩියට පස්සේ උග්ග සිටුතුමා ඉක්මනින් ම ආසන පිළියෙල කරල දුන්න ස්වාමීන් වහන්සේලාට වැඩ සිටින්න. ඊට පස්සේ ඒ උග්ග සිටුතුමා ස්වාමීන් වහන්සේලාට බොහෝම ගරුසරු ඇතිව වන්දනා කරලා එකත්පස්ව වාඩිවුනා.

## මොනවද ඒ ආශ්චර්ය අද්භූත කරුණු?

එකත්පස්ව වාඩිවුනා කියන්නේ කෙලින් ම ඉදිරියෙනුත් නෙවෙයි, පිටුපස්සෙනුත් නොවෙයි, පැත්තෙන් වාඩිවුනා, එකත්පස්ව වාඩි වෙච්ච මේ උග්ග ගෘහපතියාගෙන් ස්වාමීන් වහන්සේ නමක් මෙහෙම අහනවා. “පින්වත් ගෘහපතිය, භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වදාළා, ඔබ ආශ්චර්යවත් අද්භූත වූ කරුණු අටකින් සමන්විත වූ එක්කෙනෙක් ය කියල. ඉතින් පින්වත් ගෘහපතිය, භාග්‍යවතුන් වහන්සේ අදහස් කරපු, ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරපු ආශ්චර්යවත් වූ අද්භූත වූ කරුණු අට මොනව ද?”

මෙයා කියනවා, “මම දන්නෙ නෑ භාග්‍යවතුන් වහන්සේ මා ගැන ආශ්චර්යවත් අද්භූත කරුණු අටක් තියෙනවා කියලා වදාළා කියල. හැබැයි ස්වාමීනී, මට හිතෙන හැටියට කල්පනා කරල බලන කොට නම් මට ආශ්චර්යවත් අද්භූත කරුණු අටක් තියෙනව තමයි. හැබැයි බුදුරජාණන් වහන්සේ අදහස් කළේ මොකක් ද කියන්න මං දන්නේ නෑ. ඉතින් ස්වාමීනී, මං එහෙනම් ඒක කියන්නම්” කියල.

### 1 වැනි ආශ්චර්ය අද්භූත කාරණය

“පින්වත් ස්වාමීන් වහන්ස, මෙන්න මේකයි මගේ පළවෙනි ආශ්චර්ය අද්භූත කාරණාව. මම භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ව ඉස්සෙල්ල ම දැකපු වෙලාවෙ දුර ඉඳල ම මම බුදුරජාණන් වහන්සේව

දැක්කා. ඒ දැකපු වෙලාවෙ දැකීමත් සමඟ ම මගේ සිත පහන් වෙලා ගියා. ඒ චිත්ත ප්‍රසාදය එහෙම්ම ම යි. වෙනස් වෙන්නෙ නෑ. මේක මා දකිනවා මා තුළ තියෙන ආශ්චර්ය අද්භූත කාරණයක් හැටියට."

එහෙම නම් අපිට පේනවා බුදුරජාණන් වහන්සේ දිහා බලලා පැහැදිලා වෙනස් වෙච්ච අයත් ඉන්න පුළුවන්. ධර්මයට ආපු නැති අය ඉන්නවනෙ. සමහරු කාලෙකට පැහැදිලා තවත් කාලෙකට අපහදිනවා. දැන් මේ කෙනා එහෙම නෙවෙයි. බුදුරජාණන් වහන්සේව දුටු පමණින් හඳුනාගත්තා මේ උත්තමයා ඒකාන්තයෙන් ම අරහත් සම්මා සම්බුදු උත්තමයෙක් ය, විජ්ජාචරණ සම්පන්න ආදී ගුණ ටික ඔක්කොම හඳුනාගත්තා. හිත පැහැදුනා. ඒ පැහැදීම එහෙම්ම ම යි. ඔන්න පළවෙනි කරුණ.

## 2 වැනි ආශ්චර්ය අද්භූත කාරණය

ඊට පස්සේ එයා කියනවා "ස්වාමීනී, මට මේ දෙවැනි ආශ්චර්යවත් අද්භූත කාරණය හැටියට මෙන්න මේක සලකනවා. බුදුරජාණන් වහන්සේව දැකල පැහැදුන සිතින් ම යි බුදුරජාණන් වහන්සේව ඇසුරු කළේ." මෙතන ඇසුරු කරනවා කියන්නේ ධර්මය අහනවාට. මෙතන ඇසුර කියන්නේ බුදුරජාණන් වහන්සේ ළඟට වෙලා වාඩිවෙලා බොහෝම ශ්‍රද්ධාවෙන් සූදානමෙන් ඉන්නවා, උන්වහන්සේ වදාළ කරුණ තේරුම් ගන්න. ඒකයි මේ ඇසුර කියන්නේ. එතකොට බුදුරජාණන් වහන්සේව පහන් සිතින් ඇසුරු කරනවා.

## කාමයන්ගේ ආදීනව ගැන කථා

"එතකොට බුදුරජාණන් වහන්සේ මට අනුපිළිවෙල කථාව වදාළා." දැන් බුදුරජාණන් වහන්සේලාට පමණක් සුවිශේෂ දේශනාවක් මෙතන කියනවා. අනුපිළිවෙල කථාවක් එක්ක යෙදෙන සාමුක්කංසික දේශනා කියලා. මේකෙ කියනවා, "ස්වාමීනී, මට මේ දානය ගැන බුදුරජාණන් වහන්සේ වදාළා. සීලය ගැන වදාළා. සීලා දී ගුණදහම් ආරක්ෂා කිරීමෙන් පින් ලැබෙනවනේ. ඊට පස්සේ සග්ග කථා. ස්වර්ගයේ ඉපදීම ගැන දේශනා කළා. ඊට පස්සේ උන්වහන්සේ රූප, ශබ්ද, ගන්ධ, රස, පහස ට ඇලී වාසය කිරීම ගැන, ඒ පංච කාමයේ ආදීනව ගැන කියල දුන්න. මේ පංච කාමයට යටවෙච්ච සත්වයා ඒ වෙනුවෙන් දුක්විඳින ආකාරය, ඒ වෙනුවෙන් නඩු හබ වලට පැටලෙන ආකාරය, ඒ වෙනුවෙන් සතුන් මරනවා, සොරකම් කරනවා, පංචකාම සැප විඳින්න ගිහිල්ලා වැරදි කාම සේවනයේ යෙදෙනවා, බොරු කියනවා, කේලාම් කියනවා, පරුෂ වචන කියනවා, හිස් වචන කියනවා,

මේ නානාප්‍රකාර පව් රැස්කරගන්නවා. මේ පස්කම් සැප විඳින්න ගිහිල්ලා.

## කෙලෙස් වල සැබෑ තත්වය...

ඒ නිසා මේ පංච කාමයන් තුළ මේ කෙලෙසුන් සිත කෙලෙසන දේවල් වල වර්ධනයක් තියෙන්නේ. මේ නිසා මේ පංච කාමය කියල කියන්නේ මඩගොඩක් වගේ එකක්. භය සහිත දෙයක්. පීඩා සහිත දෙයක්. අනතුරු සහිත දෙයක් කියල, ස්වාමීනී, මට පංච කාමයන්ගේ ආදීනව කියල දුන්නා.

මේ කෙලෙස් වල පීඩාව, මේ කෙලෙසුන්ගෙන් ඇතිවන්නා වූ සිත ජීවිතය කෙලෙසී යන කෙලෙස් වලින් කිලුටු වන ආකාරය, මේ හොඳට හිටපු මිනිස්සු මේ පංච කාමය සොයන්න ගිහිල්ලා මේ නරක් වෙලා පව් රැස් කරගෙන කිලුටු බවට පත්වන ආකාරය මට කියල දුන්නා. කියල දීලා බුදුරජාණන් වහන්සේ මේවායින් නිදහස් වීම, නෙක්ඛම්මයේ ආනිසංශ, මේවා නැති තැන කොයිතරම් සැපසේ ඉන්න පුළුවන් ද කියල මට කියා දුන්නා.

## නීවරණ වලින් සංසිඳුනු සිත...

ස්වාමීනී, මං මේක අහගෙන ඉන්නකොට මගේ හිත හොඳට තැන්පත් වුනා. මෘදු වුනා. ඊළඟට මේ පංච නීවරණයන්ගෙන් හිත බැහැර වුනා. පංච නීවරණ යටපත් වෙලා ගියා. මගේ හිත හොඳට සතුටින් ප්‍රීතියෙන් උද්දාමයට පත් වුනා. මගේ හිත වඩාත් පහන් වුනා.

ස්වාමීනී, මගේ හිතේ ඇතිවුන මේ වෙනස භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ දැක්කා. ඒ වෙලාවෙදි මේ සාමුක්කංසික ධර්ම දේශනාව මට වදාළා. **(දුක්ඛං සමුදයං නිරෝධං මග්ගං)** ඒ කියන්නෙ මෙන්න මේකයි දුක. මෙන්න මේකයි දුක්ඛ සමුදය, මෙන්න මේකයි දුක්ඛ නිරෝධය. මේක තමයි දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදාව. මේ චතුරාර්ය සත්‍යය විස්තර කරන කොට ස්වාමීනී, මට මේක අවබෝධ වුනා. ඒකාන්තයෙන් ම මේක ආර්ය සත්‍යයක් ම යි. සත්‍ය ඤාණය ලැබුවා.

ස්වාමීනී, මේ ධර්මය මගේ හිතට වැටහුනේ, මට මේක අවබෝධ වුනේ, හොඳට පිරිසිදු රෙදි කෑල්ලක් ඩයි කරනවා වගේ. පිරිසිදු වස්ත්‍රයක් ඩයි කළොත් ඒ ඩයි කරන්නා වූ වර්ණය වස්ත්‍රයට හොඳට අල්ලනවා. අන්න ඒ වගේ මගේ හිතේ ධර්මය පිහිටියේ.

## යමක් හට ගත්තා ද මෙලොවේ....

ස්වාමීනී, මට අවබෝධ වුනා. මම හිටපු ආසනේ මම වාඩිවෙලා බණ අහමින් හිටියෙ බුදුරජාණන් වහන්සේ ළඟ. මට අවබෝධ වුනා රජස් නැති, කෙලෙස් නැති, අවිද්‍යා මළකඩ නැති, ධම්ම චක්ඛුව මට ඇතිවුණා. මොකක්ද ධම්ම චක්ඛුව (**යං කිංචි සමුදය ධම්මං - සබ්බං තං නිරෝධ ධම්මං**) හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගන්නා වූ යම් දෙයක් ඇද්ද ඒ සියල්ල ම හේතු නැතිවීමෙන් නැති වී යන ධර්මතාවයට අයිතියි. ඒ එකක් වත් මම ය කියල, මගේ කියල, මගේ ආත්මය කියල ගන්න දෙයක් නෑ. මට මේක අවබෝධ වුනා.

## සැකයෙන් එතෙර වීම...

ස්වාමීනී, මම ධර්මය දැක්කා. මම ධර්මයට පැමිණුනා. මම ධර්මය සාක්ෂාත් කළා. මං ධර්මය වැළඳගත්තා. මම මේ විචිකිච්ඡාවෙන් එතෙර වුනා. 'මොකද මොකද - කොහොම ද කොහොම ද' කිය කියා යන ගමනින් මං එතෙර වුනා. මම මේ ධර්මය තුළ විශාරද වුනා. මං මේ ශාස්තෘ ශාසනයේ බාහිර පුද්ගලයෙකුගේ වෙන උදව් නැතිව වුණත් මට දැන් ධර්මය දියුණු කරගන්න පුළුවන් තත්වයට පත්වුනා. මම එදා එතන ම වැඳ වැටිලා බුදුරජාණන් වහන්සේව, ශ්‍රී සද්ධර්මය, ශ්‍රාවක සංඝරත්නය සරණ ගියා. ස්වාමීනී, මම බ්‍රහ්මචාරී වෙන්න තීරණය කළා. බ්‍රහ්මචාරී ශික්ෂා පදය ප්‍රමුඛ කොට මං පංච ශීලය සමාදන් වුනා. මෙන්න මේක මම දකිනව දෙවැනි ආශ්චර්ය අද්භූත කාරණය හැටියට."

ඔන්න බලන්න ඒ කාලේ හිටිය ගිහි අය එහෙම නම් පැවිදි අය කොහොම වෙන්න ඇද්ද? එතකොට ඒක තමයි දෙවැනි ආශ්චර්ය කාරණය. පළමුවෙනි ආශ්චර්ය අද්භූත කාරණාව තමයි බුදුරජාණන් වහන්සේ ව දුටු පමණින් ම බලවත් පැහැදීමට පත්වුනා. දෙවැනි ආශ්චර්ය අද්භූත කාරණාව තමයි, ඒ චිත්ත ප්‍රසාදයෙන් යුක්තව බුදුරජාණන් වහන්සේව ඇසුරු කිරීමේ දී බුදුරජාණන් වහන්සේ අනුපිළිවෙල කථාව දේශනා කළා. ඊට පස්සේ චතුරාර්ය සත්‍යය දේශනා කළා. ඒක අවබෝධ කරගෙන ඊට පස්සේ බ්‍රහ්මචාරීව පංච ශීලයේ සමාදන් වුනා. ඒක තමයි දෙවැනි කරුණ.

## 3 වැනි ආශ්චර්ය අද්භූත කාරණය

තුන්වෙනි කරුණ තමයි, "ස්වාමීනී, මම බොහොම තරුණ කෙනෙක්. එතකොට මට හිටිය තරුණ බිරින්දෑවරුන් හතර දෙනෙක්."

එතකොට බුදුරජාණන් වහන්සේගේ කාලයේ තිබිල තියෙන්නෙ මේ තනි බිරිඳක් විවාහ කර ගැනීමක් නෙවෙයි. තමන්ට නඩත්තු කරන්න පුළුවන් නම් බිරින්දෑවරුන් හතර පස්දෙනෙක් වුනත් විවාහ කරගන්න පුළුවන්. ඉතින් මෙතුමාට ඉඳලා තියෙනවා බිරින්දෑවරුන් හතර දෙනෙක්. මෙයා ගෙදර ගියා. මෙයා බුදුරජාණන් වහන්සේ ඉදිරියේ බ්‍රහ්මචාරී ශීලය සමාදන් වෙච්ච කෙනෙක්.

## තරුණ වයසේ නෝනලා හතර දෙනා...

තරුණ වයසේ කල්ගෙවන නෝනලා හතර දෙනාට කථා කළා. කථා කරලා කියනවා, "නැගණිවරුනි, මම බ්‍රහ්මචරියාව මුල්වෙච්ච ශික්ෂා පද පහ සමාදන් වුනා. අද ඉඳල කැමති කෙනෙක් මගේ සහෝදරියන් හැටියට වාසය කරන්න ඕනෙ නම් මේ ගෙදර ම ඉන්න පුළුවනි. පින් කරන්නත් පුළුවනි. කැමති කෙනෙක් තමන්ගේ ගෙවල් වලට ඇරලවන්න කියනව නම් ඇරලවන්නත් පුළුවනි. තව කවුරු හරි ඉන්නව නම්, මට අසවලා සරණපාවල දෙන්න කියල, මම ඒක වුනත් කරන්නම්" කියල කිව්ව ම වැඩිමහල් බිරින්දෑ ඉදිරියට ආවා. ඇවිල්ලා කියනවා, "ආර්ය පුත්‍රය, මට අන්න අරයව සරණ පාවල දෙන්න එහෙනම්."

"හොඳයි" කියල, මං එයත් එක්ක කථා බස් කරල, මම එන්න කිව්වා ගෙදරට. එන්න කියලා පැන් කෙණ්ඩිය අතට අරගෙන පැන් වත් කරල ම දුන්නා එක්කන් යන්න කියලා.

ස්වාමීනී, පුදුම වැඩේ කියන්නෙ මම මේ බොහොම සෙනෙහෙවන්තව හිටපු මේ බිරිඳ අතපැන් වත් කරලා දීලා ඒ දෙන්නා පිටත් වෙලා යද්දිත් මගේ හිතට අමුත්තක් නෑ. මගේ හිතට කිසිම වෙනසක් නෑ. මගේ හිත අර පැරණි සතුටෙන් ම එහෙම් ම තියෙනවා. ස්වාමීනී, මට තේරෙන විදිහට මේකත් ආශ්චර්ය අද්භූත කාරණාවක්."

## සිල් නැති හන්දයි සැක කරමින් යන්නේ...

එතකොට බලන්න මේ හිතක නේද මේ ඔක්කොම තියෙන්නෙ. දැන් මේ වගේ මට්ටමකට හිත දියුණුකරන්න පුළුවන් නම්, එයා සංසාරෙන් අත්මිදෙනවා, එහෙම නැතිව නිකම් මේ ඔන්න විවාහ වෙනවා. ඊට පස්සෙ සැක කර කර යනවා. අපට පේනවනේ, පුදුම විදිහට සැකේමනෙ තියෙන්නෙ. දැන් අපිට වර්තමානයේ පේනවා, එක්කෙනාට එක්කෙනා සැක යි. මොකද හේතුව? එක්කෙනාට එක්කෙනා සිල්වත් නෑ. ඒ අය දන්නව. ඒ නිසා බැරිවෙලාවත් කෙනෙක් දිහා වැඩිපුර බැලුවොත් ඉවරයි. ඇයි ඒ? සැකේනෙ.

සමහර විට පිරිසිදු හිතින් බලනව, පිරිසිදු හිතින් කථා කරනවා. ඊට පස්සේ හිතෙනව ඔන්න ඔන්න පටන් ගත්තා කියල. ඊට පස්සේ සම්පූර්ණයෙන් ම රණ්ඩු අල්ලගෙන යනවා. ඒ නිසා සැකයට හේතුව තමයි සීලය පිළිබඳ පැහැදිලි ස්ථාවරයක් නැතිකම.

## සීලයෙන් පිරිසිදු වී නිසැක බවට පත්වෙන්න.

සීලය පිළිබඳ පැහැදිලි ස්ථාවරයක ඉන්නව නම් මේ සැක ගොඩක් අඩුවෙන් ඉන්න පුළුවනි. ඒ කියන්නේ සැක රහිතව වාසය කරන්න පුළුවනි. දැන් ස්වාමියා දන්නවා නම් තමන් සිල්වත් කියලා, ඒ තමන්ගේ සිල්වත් කම ගැන බිරිඳ පැහැදීමකින් ඉන්නව නම්, තමන් සිල්වත් කියලා බිරිඳ දන්නව නම්, බිරිඳගේ සිල්වත්කම ගැන සැමියා දන්නව නම්, සැකයක් ඇති වෙයි ද? අන්න ඒක වුවමනයි සැක නැතිවෙන්න. ඒ සැක රහිත බවත් එක්ක තමයි සැනසිල්ලේ ඉන්න පුළුවන් වෙන්නේ.

එතකොට උග්ග සිටුතුමා ගිහි ජීවිතය ගත කරද්දී එයාට පුළුවන් වුනා ධර්මය ඇහුවට පස්සේ එයාගේ බිරින්දෑ වරුන්ට මෙන්න මෙන්න මේ විදිහට සලකන්න. එතකොට මම හිතන්නේ තුන් දෙනෙක් නැවතිලා තියෙනවා පින් දහම් කරන්න. එක්කෙනෙක් විවාහ කරලා දුන්නා. එතකොට මොකක් ද ඒකෙ තියෙන ආශ්චර්ය අද්භූත කාරණාව? සිතේ කිසිම වෙනස්කමක් ඇති වුනේ නෑ, ඒ හේතුවෙන්.

## 4 වැනි ආශ්චර්ය අද්භූත කාරණය

"ස්වාමීනී මට මගේ හරිහම්බ කරපු සම්පත් තියෙනව දේපල වස්තුව තියෙනව. ස්වාමීනී, මම මේවා කළ්‍යාණ ධර්ම ඇති සිල්වතුන් වහන්සේලා සමඟ බෙදා ගැනීමේ දී මම ඒක ප්‍රමාණ කරන්නෙ නෑ. මෙච්චරක් මම දෙනව. ඉතුරු ටික දෙන්නෙ නෑ කියල. එහෙම ප්‍රමාණ කරන්නෙ නැතිවයි කළ්‍යාණ ධර්ම ඇති සිල්වතුන් වහන්සේලාට දෙන්නේ."

## දෙන්දෝ නො දෙන්දෝ කියලා සිතුනි මට...

මොකද ඒකත් ලේසි වැඩක් නෙවෙයි නේ. කෙනෙකුට තමන් ළඟ තියෙන දේවල් දෙනවා කියන එක ලේසි කරුණක් නෙවෙයි. **'දානංච යුද්ධංච සමානමාහු'** කියලා දෙවි කෙනෙක් කිව්වේ. මේ දාන දීම සමාන කරන්න පුළුවන් යුද්ධෙකට. ඇයි ඒ? මෙයා හැම තිස්සෙම මේක පටැලැවී පටැලැවී දෙන්දෝ නො දෙන්දෝ කිය කිය ලොකු

අර්බුධයක ඉඳලයි, මේකෙන් ඉස්සරහට පනින්නේ. නමුත් සමහර කෙනෙකුට එහෙම නෙවෙයි. දෙන්න හිතුනද අතෑරියා.

එතකොට උග්ග සිටුතුමා කියනවා මේක තමයි හතරවෙනි ආශ්චර්ය අද්භූත කාරණය කියලා. දැන් මේ විදිහට දානාදී පිංකම් කරන්න නම් එයාට තියෙන්නෙ ඕනෙ ධර්මය ගැන පැහැදිලි අවබෝධයක්.

## 5 වැනි ආශ්චර්ය අද්භූත කාරණය

පස්වෙනි කරුණ හරි ලස්සන එකක්. ඒක තමයි, "ස්වාමීනී, මම භික්ෂූන් වහන්සේලා මනා කොට ඇසුරු කළා, නො මනා කොට නෙවෙයි." අන්න ඒකෙ තේරුම හොයාගන්න ඕනෙ.

ඒ තමයි භික්ෂූන් වහන්සේ නමක් ඇසුරු කරන්න ඕනෙ සද්ධර්ම ශ්‍රවණයට, දහම් ගැටළු විසඳා ගැනීමට, චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගැනීමට විතරයි. ඔය කරුණු වලින් තොරව කරන ආශ්‍රය අධාර්මික එකක්. ඔන්න ඔය කරුණට යි ආශ්‍රය කරන්න ඕනෙ. අන්න ඒක තමයි සැබෑම ඇසුර වෙන්නේ.

ඉතින් 'ස්වාමීනී මම සකස් කරල ම යි ඇසුරු කළේ' කියනව. 'මම මනාකොට ඇසුරු කළා ස්වාමීන් වහන්සේලාව - නො මනා කොට නොවේ' කියනව. එතකොට සීලාදී ගුණධර්ම දියුණු කර ගැනීම පිණිස, බණ භාවනා පිණිස, ආර්ය සත්‍ය ධර්මය ඉගෙන ගැනීම පිණිස, බුදුරජාණන් වහන්සේගේ ධර්මය ඉගෙන ගැනීම පිණිස මේකට යි ඇසුර තියෙන්නේ. අන්න ඒ කරා පමණයි ඇසුරු කරන්නේ.

උග්ග සිටුතුමා කියනවා, "ස්වාමීනී, මේක මගේ ආශ්චර්ය අද්භූත කාරණාවක්." අන්න බලන්න, උග්ග සිටුතුමාගේ ජීවිතයේ කොච්චර ආදර්ශ ගොඩක් ද? මේක ගිහි කෙනෙකුට අනර්ඝ දේශනාවක්.

## 6 වැනි ආශ්චර්ය අද්භූත කාරණය

ඊළඟට තව වටිනා කථාවක් කියනවා. මේ තමයි හයවැනි ආශ්චර්ය අද්භූත කාරණාව. "ස්වාමීනී, මම ඒ ස්වාමීන් වහන්සේලාව ඇසුරු කරන කොට ඒ ස්වාමීන් වහන්සේලා ධර්මය දේශනා කරනවා. චතුරාර්ය සත්‍යය දේශනා කරනවා. දේශනා කරන කොට මම මනා කොට ග්‍රහණය කරගන්නවා. නො මනා කොට නො වෙයි."

ඒ කියන්නේ මේ ධර්මය අහන්නේ ඇද හොයන්න නො වෙයි; සිදුරු හොයන්න නො වෙයි; වරදින කෑලි අල්ලගන්න නො වෙයි; වාද කරන්න නො වෙයි; ප්‍රශ්න නගන්න නො වෙයි; අවබෝධ කර ගැනීම පිණිස ම යි. මනාකොට ග්‍රහණය කරගන්නවා කියන්නේ ඒක යි.

එතකොට අපිට පේනවා මෙයා ධර්මය අවබෝධ කර ගැනීමේ අදහසින් ම යි භික්ෂූන් වහන්සේලාව ඇසුරු කරලා තියෙන්නේ.

මෙන්න මේ ආශ්චර්ය අද්භූත කාරණාවෙ විශේෂත්වයක් තියෙනවා. මේක ඔබටත් හොඳ එකක්. "**(නෝ චේ මේ සෝ ආයස්මා ධම්මං දේසේති)** ස්වාමීනී, ඒ ස්වාමීන් වහන්සේ මට ධර්මය දේශනා කරන්නේ නැත්නම්, **(අහමස්ස ධම්මං දේසේමි)** මම උන්වහන්සේට ධර්මය දේශනා කරනවා.

අන්න බලන්න බුදුරජාණන් වහන්සේගේ කාලෙ ගිහි පැවිදි සම්බන්ධය තිබිල තියෙන ආකාරය. එතකොට ස්වාමීන් වහන්සේ නමක් මුණ ගැහෙන්න ගිහිල්ලා, ඒ ස්වාමීන් වහන්සේ නිශ්ශබ්දව ඉන්න වෙලාවක නම්, මෙයා කියනවා, "ස්වාමීනී, භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගෙන් මම අසවල් දේශනාව ඉගෙන ගත්තා. ඒ දේශනාවේ මෙන්න මේ මේ කරුණු යි තියෙන්නේ කියලා අර ස්වාමීන් වහන්සේට තෝරලා දෙනවා. මෙන්න මේක තමයි ස්වාමීනී, මගේ තියෙන හය වැනි ආශ්චර්ය අද්භූත කාරණාව." මෙන්න මේ වගේ අවබෝධයක අපි ඉන්න ඕනෙ.

## 7 වැනි ආශ්චර්ය අද්භූත කාරණය

උග්ග සිටුතුමාගේ තියෙන හත්වෙනි ආශ්චර්ය අද්භූත කරුණ තමයි, "ස්වාමීන් වහන්ස, මගේ ළඟට දෙවිවරු එනවා, දෙවිවරු ඇවිදින් කියනවා, **(ස්වාඛාතෝ ගහපති, භගවතා ධම්මෝ)** 'ගෘහපතිය, භාග්‍යවතුන් වහන්සේ මනාකොට දේශනා කරන ලද ධර්මයක් මේ' කියලා කියනවා. කිව්වට පස්සේ මෙයා කියනවා දෙවියාට, 'ඔව් ඉතින් ඔයා කිව්වත් නැතත් මේක මනා කොට දේශනා කරන ලද ධර්මයක් තමයි' කියල. අන්න බලන්න අභිමානය.

දෙවි කෙනෙක් ඇවිල්ලා කිව්වොත් එහෙම වර්තමාන කෙනෙකුට 'පින්වත, බුදුරජාණන් වහන්සේ මනාකොට දේශනා කරලා තියෙන්නේ' 'එසේය දෙවියනි, එසේය' කියල හතරට පහට නැවිලා කොන්ද කුදු කරගෙන කියයි. මේ එහෙම නෙවෙයි.

"ස්වාමීන් වහන්ස, මම දැන් දෙවියන් සමඟ පවා අල්ලාප සල්ලාපයේ යෙදුනත්, මට මේ කාරණයේ දී මගේ හිතට කිසි ආඩම්බරකමක්, ඇතිවෙන්නේ නෑ. මං දැන් දෙවියන් එක්කත් කථා කරන කෙනෙක් නේද කියල. ඒක තමයි ස්වාමීනී, මගේ තියෙන හත්වෙනි ආශ්චර්ය අද්භූත කාරණය."

බලන්න මේ බුදුරජාණන් වහන්සේගේ කාලයේ හිටපු ගිහි අය කොච්චර දියුණු ද කියලා.

## 8 වැනි ආශ්චර්ය අද්භූත කාරණය

"ස්වාමීන් වහන්ස, අපට භාග්‍යවතුන් වහන්සේ දේශනා කරලා තියෙනවා ඕරම්භාගිය සංයෝජන පහක් ගැන."

**ඕරම්භාගිය සංයෝජන** කියන්නේ කාම ලෝකයෙන් යටට බැඳ තබන සංයෝජන පහ. මොනවද ඒ? **සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස, කාම රාග, පටිඝ**. මෙන්න මේ ඕරම්භාගිය සංයෝජන පහ අපට බුදුරජාණන් වහන්සේ දේශනා කළා.

"ස්වාමීනී, මා තුළ ප්‍රහීන වෙලා නැති ඒ එක ම සංයෝජනයක් වත් මා දකින්නේ නෑ. ඒ පහ ම ප්‍රහීන වෙලා තියෙන්නේ."

එහෙනම් මෙයා කවුද? අනාගාමී කෙනෙක්.

"ස්වාමීනී, අන්න ඒකත් ආශ්චර්ය අද්භූත කාරණාවක්. මෙන්න මේ ආශ්චර්ය අද්භූත කාරණා අට ගැන මම දන්නවා මා තුළ තියෙනවා කියලා. මා වෙන කරුණු නම් දන්නෙ නෑ. මම දන්නෙ නෑ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ මොන වගේ දෙයක් අරමුණු කරගෙන ද මා තුළ ආශ්චර්ය අද්භූත කරුණු අටක් තියෙනවා කියලා වදාළේ "

ඉතින් මේ ස්වාමීන් වහන්සේලාට උග්ග සිටුතුමා දානය පිළිගැන්නුවා. දානෙ වළඳලා ඒ ස්වාමීන් වහන්සේලා නැවත බුදුරජාණන් වහන්සේ බැහැදකින්නට වැඩියා. ගිහිල්ලා බුදුරජාණන් වහන්සේට කියා හිටියා, "ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, මම අද උදේ පාන්දර උග්ග සිටුතුමාගේ නිවසට ගියා. ගිහිල්ලා මම ඒ පණවන ලද ආසනයේ වැඩ ඉඳලා, උග්ග සිටුතුමා මට වන්දනා කළාට පස්සේ ඇහුවා, 'පින්වත් උග්ග සිටුතුමනි, භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ඔබතුමා ආශ්චර්යවත් අද්භූත කරුණු අටකින් සමන්විතයි කියලා පෙන්වා දුන්නා. පෙන්නා දීලා කුටියට වැඩියා. මේක විස්තර වශයෙන් කියා දුන්නේ නෑ. බුදුරජාණන් වහන්සේ වදාළ ආශ්චර්ය අද්භූත

කාරණා අට ඔබතුමා දන්නවා. ඔබතුමා තුළ තියෙනවා ඒවා.' එතකොට එතුමා ප්‍රකාශ කළා, 'ආශ්චර්ය අද්භූත කාරණා අටක් මා තුළ තියෙනවා කියලා බුදුරජාණන් වහන්සේ වදාළ බවක් මා දන්නෙ නෑ. නමුත් මා තුළ ආශ්චර්ය අද්භූත කරුණු අටක් තියෙනවා.'

## මනා කොට ශාස්තෘන් වහන්සේව ඇසුරු කළ හැටි...

මොනව ද ඒ අට? පළවෙනි එක තමයි බුදුරජාණන් වහන්සේ දුර දීම දැකීමත් සමඟ ම සිත පහන් වෙලා ගියා ගියා ම යි ඒක වෙනස් වුනේ නෑ. ඒක තමයි පළවෙනි ආශ්චර්ය අද්භූත කාරණාව. දෙවෙනි ආශ්චර්ය අද්භූත කාරණාව තමයි පහන් සිතින් බුදුරජාණන් වහන්සේව ආශ්‍රය කළා. ආශ්‍රය කරන කොට, බුදුරජාණන් වහන්සේ අනුපිළිවෙල කථාව වදාළා. (**දාන කථා, සීල කථා, සග්ග කථා, කාමානං ආදීනවං, ඕකාරං සංකිලේසා, නෙක්ඛම්මේ ආනිසංසා**) දන්දීමේ කථාව, සිල් රැකීම, ස්වර්ග කථාව, කාමයන්ගේ ආදීනව, කෙලෙසුන්ගෙන් කිලුටු වීම ගැන, නෛෂ්කම්‍යයෙහි ආනිසංස ගැන. මේ විස්තර කරගෙන යද්දී මේ සිත පහන් වුනා. එතකොට බුදුරජාණන් වහන්සේගේ සාමුක්කංසික ධර්ම දේශනාව වන **දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග** ප්‍රකාශිත චතුරාර්ය සත්‍යය ධර්මය මට වදාළා. ඒ ධර්මය දේශනා කරන කොට මේක ආර්ය සත්‍යයක් ම යි කියලා සත්‍ය ඥාණය වැටහුණා. හරියට පිරිසිදු වස්ත්‍රයක් පඬු ගසද්දී ඒ පඬු සියල්ල ම ඒ වස්ත්‍රය උරා ගන්නවා වගේ මට ධර්මය අවබෝධ වුනා. (**යං කිංචි සමුදය ධම්මං සබ්බං තං නිරෝධ ධම්මං**) හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගන්නා වූ යම් කිසිවක් ඇද්ද ඒ සියල්ල ම නිරුද්ධ වී යන ස්වභාවයෙන් යුක්තයි කියලා දහම් ඇස පහළ වුනා.

ස්වාමීනී, මං මේ ධර්මයට පැමිණිලා ධර්මය තුලට ඇවිල්ලා ධර්මය වැළඳගෙන ඊට පස්සේ බුදුරජාණන් වහන්සේව, ශ්‍රී සද්ධර්මය, ශ්‍රාවක සංඝ රත්නය සරණ ගිහින් බ්‍රහ්මචාරී පංච ශීලය සමාදන් වුනා. ඒක දෙවෙනි ආශ්චර්ය අද්භූත කාරණාව.

## බ්‍රහ්මචාරී පංච ශීලයක හික්මුන හැටි...

ඊට පස්සේ ස්වාමීනී, මම කෙලින් ම නිවසට ගියා. නිවසේ සිටියා මා විවාහ වෙච්ච තරුණ කාන්තාවන් හතර දෙනෙක්. මා අඬගහලා කිව්වා, 'නැගණිවරුනි, මා අද ඉඳලා බ්‍රහ්මචාරී පංච ශීලයෙහි පිහිටලා ඉන්නෙ. නැගණිවරුන් කැමති නම් මෙහෙ ඉන්න. පින් දහම් කරගෙන කැමති කෙනෙකුට ඕනෙ නම් ගෙදර ඉන්න පුළුවනි. කැමති කෙනෙක්ව විවාහ කරල දෙන්නත් පුළුවනි.' එතකොට

වැඩිමහලු බිරින්දෑ කිව්වා අසවල් එක්කෙනා මට කසාද බන්ඳලා දෙන්න කියලා. එතකොට මං කරුණු කථා කරල ඒ ඇත්තා අඬගහලා අතපැන් වත්කරලා බන්දලා දුන්නා. ඒ වගේ අවස්ථාවක පවා මගේ හිතේ කිසිම වෙනසක් ඇතිවුනේ නෑ. මේකත් ආශ්චර්ය අද්භූත කාරණාවක්.

ඊළඟට කිව්වා, ස්වාමීනී, ඒ වගේ ම මට සම්පත් තියෙනව, දේපල තියෙනවා, මම දානාදී පින්කම් වල යොදවනවා. සිල්වතුන්, ගුණවතුන් වහන්සේලාට මං මේවා පූජා කරන්නේ සීමා කරගෙන නෙවෙයි. ඒකත් මේ ආශ්චර්ය අද්භූත කාරණාවක්.

## මනාකොට භික්ෂූන් වහන්සේලාව ඇසුරු කළා..

ඊළඟට ස්වාමීනී, මම භික්ෂූන් වහන්සේලා ඇසුරු කරනවා. මනාකොට ඇසුරු කරනවා, නො මනා කොට නෙවෙයි. ඊළඟට ඒ ස්වාමීන් වහන්සේලා ධර්මය දේශනා කරනවා. මම මනාකොට අහනවා. නො මනා කොට නො වෙයි. හැබැයි ඒ ස්වාමීන් වහ්නසේලා ධර්මය දේශනා කරන්නේ නැත්නම් මං උන්වහන්සේලාට ධර්මය දේශනා කරනවා. මේක ආශ්චර්ය අද්භූත කාරණාවක් කියනවා.

ඊළඟට ස්වාමීනී, දෙවිවරු ඇවිල්ලා මට කියනවා භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ මනාකොට දේශනා කරපු ධර්මයක් නේද මේ. එතකොට මම කියනවා පින්වත් දෙවිය, ඔහේ ඕක කිව්වත්, නැතත් බුදුරජාණන් වහන්සේ මනාකොට දේශනා කරපු එකක් ම යි මේක. ඉතින් මම මෙහෙම දෙවියන් සමඟ අල්ලාප සල්ලාපයේ යෙදෙද්දිත් මට කිසිම ආඩම්බරකමක් ඇතිවෙන්නෙ නෑ. 'හා... මාත් දැන් දෙවියන් එක්ක කථා කරන කෙනෙක් නො වේද' කියලා. මට එහෙම මොකුත් ඇතිවෙන්නේ නෑ.

ඊළඟට අන්තිම කරුණ කියනවා ස්වාමීනී, බුදුරජාණන් වහන්සේ ඕරම්භාගිය සංයෝජන ධර්ම පහක් ගැන දේශනා කළා. ඒ පහෙන් එකක් වත් මා තුළ තියෙන බවක් මට පේන්නෙ නෑ කියනවා."

## මෙන්න ඒ අසිරිමත් කරුණු අට...

මෙන්න මේ ආශ්චර්යමත් අද්භූත කරුණ ටික ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේ කියලා දුන්න කියනවා උග්ග සිටුතුමා. බුදුරජාණන් වහන්සේ වදාළා "පින්වත් භික්ෂුව ඉතා හොඳයි, ඉතා හොඳයි" ඒ වේසාලික උග්ග සිටුතුමා තමන් ගැන මනාකොට කියාපු කාරණයක් කියනවා පින්වත් භික්ෂුව, ඔය කරුණු අට. ඔය ආශ්චර්ය අද්භූත කරුණු අට තමයි උග්ග සිටුතුමාට තියෙන්නේ.

දැන් බලන්න බුදුරජාණන් වහන්සේ එහෙම කියන බව වත් එයා දන්නෙ නෑ. බලන්න බුද්ධිය. ගානට ගලපලා කිව්වනේ. බුදුරජාණන් වහන්සේ වදාළා ඒ නිසා "පින්වත් භික්ෂුව, එහෙම නම් මතක තියාගන්න, මේ විශාලා මහනුවර සිටින උග්ග ගෘහපතිතුමා ඔය කියන ලද ආශ්චර්ය අද්භූත කරුණු අටකින් සමන්විතයි කියල දැනගන්න"

## පැහැදිලි ලෙස ම ශ්‍රද්ධාවට පැමිණෙන්න...

එතකොට අපට පේනවා මේ වගේ කරුණු, මේ වගේ දේවල් මේ යුගය තුළ අපට දරාගන්න බැරි ද? අපට පුළුවන් වෙන්න ඕනෙ. බුදුරජාණන් වහ්නසේගේ බුද්ධ දේශනා ශ්‍රවණය කරද්දී අපිත් වෙහෙස වෙන්න ඕනෙ, පහන් සිතක් ඇති කරගන්න ඕනෙ.

ඒකාන්තයෙන් ම අපි සරණ ගිය බුදුරජාණන් වහන්සේ **අරහං** වන සේක. **සම්මා සම්බුද්ධ** වන සේක. **විජ්ජා චරණ සම්පන්න** වන සේක. **සුගත** වන සේක. **ලෝකවිදූ** වන සේක. **අනුත්තරෝ පුරිස දම්ම සාරථී** වන සේක. **සත්ථා දේවමනුස්සානං** වන සේක. **බුද්ධ** වන සේක. **භගවා** වන සේක කියල අපිටත් තියෙන්න ඕනෙ හිතේ පැහැදීමක්.

හොඳට විමසලා තේරුම් ගන්න ඕනෙ, අපේ චිත්ත ප්‍රසාදය තියෙන්න ඕනෙ බුදුරජාණන් වහන්සේ ගැන යි. අනික බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙන්නේ හේතු ඵල ධර්මයක්. උන්වහන්සේගේ ධර්මයේ කොහේවත් තියෙනවා ද ප්‍රාර්ථනාවකින් යමක් ඉෂ්ඨවෙනවා කියලා. ක්‍රියාවකින් තමයි යමක් වෙනස් කරන්නේ. පැතුමකින් නෙවෙයි. ඉතින් ඒ නිසා අපි මේ උග්ග සිටුතුමා වගේ හොඳ පැහැදීමක් ඇති කරගන්න ඕනෙ. අපට බැරිද ඒ වගේ ආශ්චර්යවත් අද්භූත කාරණාවලින් එකක්වත් ඇතිකර ගන්න. එකක් හරි ඇතිකර ගන්න පුළුවන් වෙන්න ඕනෙ.

## දහම් ඇස පහළ කර ගනිමු.

ඊළඟට දෙවෙනි ආශ්චර්ය අද්භූත කාරණාව තමයි මේ දහම් ඇස ඇති කර ගැනීම. මේකත් අපට පුළුවන් වෙන්න ඕනේ. දැන් දානයේ ආනිසංස දන්නව අපි. සීලයේ ආනිසංසත් දන්නවා. ස්වර්ගයේ උපත ගැන අපි දැන් තොරතුරු දන්නවා. දැන් මේකත් ස්වර්ගයක් නෙ. මිනිස් ලෝකෙ කියන්නෙත් සුගතියක්. දිව්‍ය ලෝක කියන්නේ සුගතියක්. කාමයන්ගේ ආදීනව අපි දන්නෙ නැද්ද? කාමයන්ගේ ආදීනව අපි දන්නෙ නැත්නම් ආයෙ දැනගන්න ක්‍රමයකුත් නෑ. ඒ

තරම් ම දේවල්. බඩු මිල එහෙන් ඉහළ යනවා, ස්වාභාවික විපත් වලට මුහුණ දෙනවා, කාලෙකට යුද්ධ වලට මුහුණ දෙනවා. ඔය වගේ නොයෙකුත් ප්‍රශ්න. ඔය අතරේ මේ සැපසේ වාසය කරන්න කොච්චර මහන්සියක් ගන්නවද නේද? කාමයන්ගේ ආදීනව අපට පේන්නෙ නැද්ද?

හිතන්න පුළුවන් අපට ඊළඟට මේ කෙලෙසුන් නිසා, මේ චිත්තසන්තාන අපිරිසිදු වෙලා ඊට පස්සේ, හිත අපිරිසිදු වෙලා, වචනය අපිරිසිදු වෙලා, ක්‍රියාව අපිරිසිදු වෙලා යන ආකාරය. අපට පේන්නෙ නැද්ද? පේනවා. මෙයින් මිදුනට පස්සේ ලොකු සැනසිල්ලක් ගන්න පුළුවන් කියල පේන්නෙ නැද්ද? පේනවා. මෙයින් මිදිලා ජීවිතය ගෙවන්න පුළුවන් බව අපට පේනවා. අපිට මේ දුක හටගන්නේ ත්‍රිවිධ තණ්හාවෙන්. මේක ආර්ය සත්‍යයක් හැටියට අවබෝධ කරගන්න බැරි ද? පුළුවන්. තණ්හාව නිරුද්ධ කළහම දුකින් නිදහස් වෙනවා. අවබෝධ කරන්න බැරිද ඕක. අවබෝධ කරන්න පුළුවන්. තණ්හාව නිරුද්ධ කරන්නා වූ මාර්ගය ආර්ය අෂ්ඨාංගික මාර්ගය යි කියලා අවබෝධ කරන්න පුළුවන්. අපට බැරිද අවබෝධ කරන්න හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගන්නා වූ යමක් ඇද්ද, ඒ හේතු ප්‍රත්‍යය නැති වීමෙන් ඒ සියල්ල නිරුද්ධ වන ස්වභාවයෙන් යුක්තයි. මේක අනාත්මයි කියල අවබෝධ කරන්න බැරිද අපිට. අන්න එහෙනම් අපට ඒ ආශ්චර්ය අද්භූත කාරණාවත් ඇතිකරගන්න පුළුවන්.

## දුර්ලභ යුගයක ලැබුණු දුර්ලභ අවස්ථාවක්...

දැන් අපි ගත්තොත් බුදුරජාණන් වහන්සේ වැඩ සිටිද්දී අර උග්ග සිටුතුමා තුළ මේ ආශ්චර්ය අද්භූත කාරණා ඇතිවුනේ. නමුත් මේ වන විට අපගේ ශාස්තෘන් වහන්සේ පිරිනිවන් පාලා. අපගේ ශාස්තෘන් වහන්සේ විතරක් ද පිරිනිවන් පෑවේ? නෑ. සාරිපුත්ත, මොග්ගල්ලාන ඇතුළු අසූ මහ ශ්‍රාවක රහතන් වහන්සේලාත් අනෙකුත් මහරහතන් වහන්සේලා ත් පිරිනිවන් පාලා. අපට දැන් රහතන් වහන්සේලා දුර්ලභ ම කාලයක්. මාර්ග ඵල ලාභීන් දුර්ලභ ම කාලයක්.

මේ කාලෙ කියන්නේ මොකක් ද? චතුරාර්ය සත්‍යය අවබෝධ කරන්න මහන්සි ගන්න එපා. ඔහේ ගත කරන විදිහට ගත කරන්න. පංච සීලය රැක්කහම ඇති. එහෙම කියාගෙන යන යුගයකනෙ අපි මේ ධර්මය කියන්නේ. එහෙනම් මේ කාලේ වඩාත් ම ආශ්චර්ය අද්භූත නැද්ද මේ ගුණ ඇති කර ගැනීම. වඩාත් ආශ්චර්ය යි. අද්භූත යි.

## සිල් ගුණදම් රැක යන මග නිවනේ...

මේ වගේ ගුණ අපි ඇති කරගන්න ඕනෙ. ඊළඟට නිත්‍ය සීලය හැටියට පංච ශීලය රකින එක පවා ආශ්චර්ය යි, අද්භූත යි. ඊළඟට පොහොය දින වල අෂ්ඨාංග උපෝසථ සීලය ආදී ගුණ ධර්ම රැකගෙන මනාකොට සීල සම්පන්නව වාසය කරන කොට, ඒවත් අසිරිමත් මේ යුගයේ. ඊළඟට දානාදී පින්කම් කිරීමේ දී, ස්වාමීන් වහන්සේලා ඇසුරු කිරීමේ දී, ධර්මය උදෙසා පමණක් ඇසුරු කිරීමේ දී ආශ්චර්ය යි, අද්භූත යි.

ඊළඟට ධර්මය ශ්‍රවණය කරල, තමන් ධර්ම කථාව මනාකොට අහනවා. ඒ ස්වාමීන් වහන්සේලා ධර්මය කියන්නේ නැත්නම්, තමා හරි ඒ ධර්මය කියන්න ඕනෙ. "ස්වාමීනී, මම අසවල් දේශනාවෙ අසවල් කරුණ ඉගෙන ගත්තා. බුදුරජාණන් වහන්සේ මේ මේ ආකාරයෙන් මේ කරුණ පෙන්නා වදාළා" ආශ්චර්ය යි. අද්භූත යි. අන්න ඒ කාරණා ඇති කරගන්න ඕනෙ.

## පැටලෙන්න නම් එපා!

දෙවියන් එක්ක කථාව නම් ඉතින් අපි අත්හරිමු. ඒක කරන්න ගියොත් අපි පැටලෙයි. ඊට පස්සේ දෙවිවරු ඇවිල්ලා මට දැන් කමටහන් දෙනවා, මම දැන් උඩින් කියයි උපදෙස් ගන්නෙ. එහෙම මාත් එක්ක ඇවිල්ලා කියපු අය ඉන්නවා. ඉතින් එහෙම ඒක අතාරිනවා. ඒක උග්ග සිටුතුමාට පුළුවන් වුනාට ඒක අපි පටලවාගන්න ඕනෙ නෑ. ඒක එතුමාගේ වාසනාව. ඒක එතුමාගේ පින.

ඊළඟට අපි ධර්ම මාර්ගයේ ගමන් කරල සංයෝජන දැකල ඒ සංයෝජන ප්‍රහාණය කරන්න කල්පනා කරන්න ඕනෙ. මොකද පැහැදිලිව අපි දන්නවා මාර්ග-ඵල ලාභීන්, උග්ග සිටුතුමා පිරිනිවන් පාලා නැත්නම් සමහර විට මේක අරගෙන ඇති. බඹලොව නෙ එතුමා ඉන්නෙ. **අවිහ, අතප්පා, සුදස්ස, සුදස්සී, අකනිට්ඨ** කියන සුද්ධාවාස බ්‍රහ්ම ලෝක වලින් එකක ඇත්තේ. ඒ නිසා මේ එතුමා අද වුනත් අහගෙන ඉන්න පුළුවන් මේක. ඒ නිසා දෙවිවරු මේ ලෝකෙ ඉන්නවා. මේ මිනිස් ලෝකය තුළ මාර්ගය දියුණු කරල මාර්ගඵල අවබෝධ කරගත්ත උතුම් මිනිසුන් දෙවියන් අතර ගිහිල්ලා ඉන්නවා.

## මේ දිව්‍ය ලෝකවල ඉඩ නැති වෙන කාලය යි.

සමහර දෙවිවරු ඇවිල්ලා බුදුරජාණන් වහන්සේට කියනවා,

“භාග්‍යවතුන් වහන්ස, දෙවිවරු අතර ලොකු දිව්‍ය ඝෝෂාවක් පැතිරෙනවා බුදුරජාණන් වහන්සේ නමක් වැඩ සිටින කාලෙ බුදුරජාණන් වහන්සේගේ ධර්මය පැතිරෙන කාලෙ දෙව් පිරිස වැඩිවෙනවා.”

ඇයි දෙව් පිරිස වැඩිවෙන්න හේතුව? මෙහෙදි ධර්මයේ හැසිරෙන පිරිස වැඩිවීමෙන් ඒ අය මරණින් මත්තේ දෙවියන් අතර උපදිනවා. බුද්ධ ශාසනය පරිහානි කාලයට සම්පූර්ණයෙන් ම දිව්‍ය ලෝක හිස්වෙලා යනවා. දෙව් පිරිස නැති වෙනවා. පරිහානි කාලයට මොක ද වෙන්නේ? පිරෙනවා වෙන තැනක්. ඒ තමයි අපාය.

අපාය පිරෙනකොට යම රජ්ජුරුවො කල්පනා කරනවා, “ආ... පිරිහිලා මේ එන්නේ” එතකොට අපිට පේනවා එහෙනම් මිනිසුන් පිරිහීමෙන් නිරය ආදියේ උපත ලබනවා. දියුණු වීමෙන් දිව්‍ය ලෝකයේ උපත ලබනවා. අනික මේකෙ වටිනාකම තියෙන්නේ ධර්මයෙ. ධර්මයත් එක්ක යන්න ඕනෙ. ධර්මය නැතිව වුනත් කෙනෙකුට දිව්‍ය ලෝකෙ ඉන්න ඉඩ තියෙනවා. පින් පව් විශ්වාස කරගෙන කෙනෙක් සාමාන්‍යයෙන් දානාදී පින්කම් කරගෙන ඔක්කොම අතහැරලා යනවා. හැබැයි දිව්‍ය ලෝකයේ ගිහිල්ලා එහෙන් ධර්මය අවබෝධ කරන්නේ නැත්නම්, එයා ඒකෙන් චුත වෙනවා.

## තාවකාලික සැපය හමුවේ මං මුලා නො වන්න

දැන් අපි මිනිස් ලෝකෙට ආවා. මෙහෙ මනුස්ස කාමය, මිනිස් සැප තියෙනවා. මේකට වසඟ වෙලා ගිහිල්ලා ධර්මාවබෝධය අතහැරපු පිරිස ගණනින් කියන්න පුළුවන් ද? කෝටි ගණනින් වත් කියන්න බැරිතරම් විශාල පිරිසක් මිනිස් ලෝකෙට ඇවිල්ලා චතුරාර්ය සත්‍යය අතෑරපු අය. එතකොට චතුරාර්ය සත්‍යය අවබෝධ කරගන්න අය මිනිසුන් අතරට ආපු අයගෙන් කීයෙන් කී දෙනා ද කරගන්නෙ. ඒක දෙවියන් අතරත් එහෙම ඇත්තේ.

දෙවියන් අතරට ගිහිල්ලා ඒ සැපයට වසඟ වෙච්ච අය ඇති. නමුත් අර ධර්මය මෙහෙදි පුරුදු කරලා ගිය අය එහෙම්ම ම යනවා. ඉතින් ඒ නිසා අපි පැහැදිලිව තේරුම් ගන්න ඕනෙ මේක. අපි මේ ජීවිතය ගෙවන්න ඕනෙ ධර්මාවබෝධ කරගෙන මේ ධර්ම මාර්ගය දියුණු කරගෙන යන්නයි. එතකොට දැන් විශේෂයෙන් ම මේ ධර්මය දියුණු කරන්නේ මේක දෙවිවරු දන්නවා. මේක ඇත්තක් ද බොරුවක් ද කියල.

ඉතින් ඒ නිසා වේසාලික උග්ග සිටුතුමාගේ සූත්‍ර දේශනාවෙන් අපට පැහැදිලිව පේනවා බුදුරජාණන් වහන්සේගේ කාලයේ ශ්‍රද්ධාවන්ත, ඉතා ම අවබෝධයෙන් ජීවත් වෙච්ච ගිහි පිරිස. බුදුරජාණන් වහන්සේ වදාලා ගිහි පිරිසට ගිහි පිරිමි අයට, උපාසක බවට පත් වෙනව නම්, එක්කෝ හත්ථාලවකපුත්ත උග්ග සිටුතුමා වගේ වෙන්න කියලා, එක්කෝ චිත්ත ගෘහපති වගේ වෙන්න කියලා.

## කලකිනි බුදු කෙනෙකුන් උපදින්නේ...

බුදුරජාණන් වහන්සේගේ ධර්මය කලාතුරකින් ලැබෙන්නේ. මේ කාලෙ විතරයි. කලාතුරකින් ලැබිච්ච ඒ ධර්මය ලැබිච්ච කාලෙ විතරයි ආධ්‍යාත්මික දියුණුවක් අපි ඇතිකරගන්න තියෙන්නේ. අපි ඒ ආධ්‍යාත්මික දියුණුව ඇති කරගන්න ඕනෙ. විශේෂයෙන් ම දැන් මේ අනාගාමී කෙනෙක් ගැන නෙ කථා කළේ. අඩු ගන්නෙ අපට පුළුවන් වෙන්න ඕනෙ සෝතාපන්නවත් වෙන්න. ඒ කියන්නේ ගිහි ජීවිත ගතකරමින්, අඹු දරුවන් පෝෂණය කරමින් බැරිද සෝතාපන්න වෙන්න. හොඳට ම පුළුවන්කම තියෙනවා. අඩු ගණනෙ ඒ තත්වයටවත් පත්වෙන්න ඕනෙ. ඒත් ලොකු පිළිසරණක් නෙ.

ඉතින් ඒ නිසා අපි කවුරුත් අදිටන් කරගනිමු භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ දුර්ලභ බුදු සසුන ලැබූ මේ කාලයේ ඒ ධර්මය මතුවෙන මේ කාලයේ අපිත් නො සෙල්වෙන ශ්‍රද්ධාවකට පැමිණිලා සීලාදී ගුණධර්ම දියුණු කරගෙන චතුරාර්ය සත්‍යය අවබෝධ වන ආකාරයට යෝනිසෝ මනසිකාරයේ යෙදෙමින් අපිත් මේ ගෞතම බුදු සසුන තුළ චතුරාර්ය සත්‍යය අවබෝධ කරගන්නවා කියල.

*සාදු! සාදු!! සාදු!!!*

# ඉපදුනේ ඇයි ?

## -පටිච්ච සමුප්පාදය-

**ශ්‍රද්ධාවන්ත පින්වතුනි,**

අව්වෙන් වැස්සෙන් පීඩා විඳගෙන අද අපි මහමෙව්නාවට රැස් වූයේ උදාර අදහසක් ඇතුවයි. ඒ තමයි මේ ගෞතම බුද්ධ ශාසනයේ දී මේ උතුම් ශ්‍රී සද්ධර්මය අවබෝධ කරගන්නවා කියන අදහසයි. මේ ගෞතම බුද්ධ ශාසනයේ දී ම අපට මේ සංසාරයෙන් අත්මිදෙන්නට ඇත්නම් කොයිතරම් හොඳ ද කියන අදහසයි. පින්වතුනි, තිරිසන් ආත්මභාව වල අපි ඉපදිච්ච කාල වල අනන්තවත් අපි අව්වෙන් වැස්සෙන් පීඩා වින්ඳා. දැන් බලන්න මේ සත්තු අව්වෙන් වැස්සෙන් පීඩා විඳින හැටි. අපි සංසාරේ අනන්තවත් ගං වතුරට අහුවෙලා තියෙනවා. එහෙම තමයි මේ ගෙවපු සංසාරේ. ලැව් ගිනි වලට අහුවෙලා පිච්චුන වාර අනන්තයි. අපි භූමිකම්පා වලට අහුවෙලා මැරිච්ච වාර අනන්තයි. හදිසි අනතුරුවලට අහුවෙලා මැරිච්ච වාර අනන්තයි.

## මේ සසරේ හැටි මෙහෙමයි...

බුදුරජාණන් වහන්සේ පෙන්නා දීලා තියෙනවා, මේ සංසාරයේ ගමන් කරද්දී, එක සත්වයෙක් බොන ලද කිරි ප්‍රමාණය සතර මහා සාගරයේ ජලයට වඩා වැඩියි කියලා. එහෙම නම් බලන්න දැන් අපි

මේ සංසාරේ ඉපිද ඉපිද මැරී මැරී එන්නේ කොයි තරම් දීර්ඝ කාලයක් මුළුල්ලේ ද? නමුත් අපට පේන තෙක් මානෙක විසඳුමක් නෑ. අසවල් කාලයේ මේ සංසාර ගමන අවසන් වෙනවා කියලා. අපි කවුරුත් කැමතියි සැප විඳින්න. අපි කවුරුත් කැමතියි කරදර කම්කටොලු නැතිව සිටින්න. නමුත් ඒ කැමති දේ නෙවෙයි සිද්ධ වෙන්නේ, අපි අකමැති දේ. අපි සිතන දේ නෙවෙයි සිද්ධ වෙන්නේ, අපි නො සිතන දේ.

මේ නිසා කල්පනා කරල බලමු පොදුවේ සංසාරේ අපි කොච්චර බඩගින්නේ ඉන්න ඇත් ද? පෙරේත ආත්ම වල ඉපදුනාට පස්සේ ඒ පෙරේතයන්ට සෙම් සොටුවත් නෑ. අපි එබඳු සංසාර ගත ජීවිත ගෙවලයි මේ ඇවිල්ල තියෙන්නේ. දැන් මේ මිනිස් ලෝකයේ ඉපදුනාට පස්සේ අපිට කොයිතරම් අපි සතුටින් ජීවිතය ගොඩනගා ගන්න හැදුවත් අපි හිතන දේ සිද්ධ වෙන්නේ නෑ. මේ නිසා අපි බලාපොරොත්තු වෙන ලෝකය නොවේ අපි මුහුණ දෙන ලෝකය. අපි හිතින් ගොඩ නගා ගන්න ජීවිතය නෙවෙයි ඇත්ත ජීවිතය. ඇත්ත ජීවිතය තුළ තියෙනවා, හැම තිස්සෙ ම අපි හිතන දේ සිද්ධ වෙන්නෙ නැති එක.

## මේකෙන් නිදහස් වෙන්න පුළුවන් අපි හැමෝට ම...

අපි මේක අවබෝධ කරගන්න තියෙන්නේ බුදු රජාණන් වහන්සේ වදාළ **පටිච්ච සමුප්පාදය** තුළ යි. පටිච්ච සමුප්පාදය අවබෝධ කරගත්තොත් අපිට **පංච උපාදානස්කන්ධය** අවබෝධ කරගන්න පුළුවන්. පංච උපාදානස්කන්ධය අවබෝධ කළොත් අපි **සක්කාය දිට්ඨියෙන්** නිදහස් වෙනවා. සක්කාය දිට්ඨියෙන් නිදහස් වුනොත් අපි **සීලබ්බත පරාමාස** වලින් නිදහස් වෙනවා, **විචිකිච්ඡාවෙන්** නිදහස් වෙනවා. අපිට පුළුවන් වෙනවා සෝවාන් වෙන්න.

කෙනෙකුට මේ මාර්ගඵල ලබනවා කිව්වා ම බයක් ඇතිවෙන්න පුළුවනි, තමන්ගේ ජීවිතයට මොකක් හරි වේවි කියල. මාර්ග ඵල ලබනවා කියන්නෙ ජීවිතය තුළ ඇතිවෙන අවබෝධයක්. අපිට හොඳට ජීවිතේ හිතලා මතලා තේරුම් ගන්න පුළුවන්කම තමයි මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙන් ලබා දෙන්නේ. ඉතින් අපිට මේ ධර්මය අවබෝධ කරගන්න අමාරු වෙලා තියෙන්නේ අපි තුළ ගොඩ නගා ගෙන තියෙන අවබෝධයක් නැතිකම නිසා. අවබෝධයක් ඇති වෙලා තිබුනා නම් බොහොම සුළු කාලයකින් මේ සංසාරෙන් අපි නිදහස් වෙනවා.

## පෙරේත ලෝකයේ විස්තර....

බලන්න මේ සංසාරේ හැටි. දවසක් මුගලන් මහ රහතන් වහන්සේට මුණ ගැහුනා, එක ප්‍රේතියක්. මේ ප්‍රේතිය කටින් ලේ හලාගෙන හමයි, කටුයි විතරයි ඒ ශරීරයේ තිබුනේ, විලාප දෙනවා බඩගිනියි කියලා. අදත් මේ ලෝකයේ ඕනතරම් එහෙම ප්‍රේතියෝ ඉන්නවා. අපට පේන්නෙ නැති එක විතරයි ප්‍රශ්නය.

ඉතින් මුගලන් හාමුදුරුවෝ දැකලා ඒ පෙරේති කථා කළා. කථා කරලා අහැව්වා "මක්වෙලාද ඔය" කියලා. "මේ පෙරේත ලෝකෙ ඉපදෙන්න කලින් ඉපදුනේ කොහේද?" කියල ඇහුවා. "අනේ ස්වාමීනී, මම හොඳට සැප විඳපු මනුස්ස ලෝකේ හිටියේ." "මොකද වුනේ" කියලා ඇහුවා.

## කළ කළ දේ - එල එල දේ...

"ස්වාමීනි, මම මනුස්ස ලෝකෙ හිටියේ. මට ලොකු පුතාල දෙන්නෙක් හිටියා. මං මේ පුතාලගේ හයිය හිතට අරගෙන මගේ ස්වාමියාව ගෙදරින් එලෙව්වා. ස්වාමියා වෙන කසාදයක් කරගත්තා. ඒ දෙවෙනි කසාදේ. ඒ දෙවෙනි බිරිඳට දරුවෙක් ලැබෙන්න ඉන්න කොට මම ඉරිසියා කළා. දැන් ඉතින් දේපල වස්තුව බෙදේවි කියලා. ඊට පස්සේ මම ඒ දරු ගැබ විනාශ කරන්න හොරෙන් බෙහෙත් දුන්නා. අන්න එතකොට දරු ගැබ විනාශ වුනා. ගෙදර කට්ටිය සැක කරලා මාව අල්ලගෙන ඇහැව්වා, තිගේ වැඩක් නේ ද මේ කියලා. මං එවේලේ දිවුරුවා අනේ මම නම් කළේ නෑ. මම එබඳු දෙයක් කළොත් උපනූපන් ආත්ම වල දරුවන් වදා කන එකියක් වෙන්න ඕනෙ කියල." ඉතින් මෙයා කෑ ගහලා කියලා තියෙනවා "අනේ ස්වාමීනී, මට පුදුමාකාර බඩගින්නක් තියෙන්නේ, මට උදේට දරුවො පහක් ලැබෙනවා, මං ඒ දරුවෝ පහ ම කනවා. හවසට ත් පහක් ලැබෙනවා. පහ ම ත් කනවා."

මේ කතාව කියන කොට මතක් වුනා, මම දැකලා තියෙනවා මේ බැළලියෝ පැටව් දාලා ඒ පැටවුන්ව කනවා. මේ ළඟදි ඔබ දැකගන්ට ඇති, පුවත් පත් වලින් ඇතින්නක්. ඒ ඇතින්න පැටියා බිහි කරපු ගමන් උස්සලා පොළොවේ ගහලා පෑගුවා කකුලෙන්. බලන්න අපි සංසාරෙදි මුහුණ දෙන දේවල්. අපි සංසාරෙදි කොච්චර නම් දරුවන් කන්න ඇත් ද? එහෙම තමයි මේ ඇවිල්ලා තියෙන්නේ.

## පුංචි සැපයට රැවටෙන්න එපා...

ඉතින් බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා මේ ඉපදුනාට පස්සේ අපි නොයෙක් ආකාරයේ කායික රෝග වලට ගොදුරු වෙමින්, නොයෙක් ආකාරයේ මානසික රෝග වලට ගොදුරු වෙමින් කායික පීඩා විඳ විඳ මානසික පීඩා විඳ විඳ මේ ජීවිතේ ගෙවන්න තියෙන්නේ. මේ ජීවිතේ තුළ පුංචි සැපයක් තියෙනවා තමයි. නමුත් ඒ පුංචි සැපය වගේ නෙවෙයි විශාල දුකක් තියෙනවා. නමුත් මේ පුංචි සැපයට මුලා වෙන සත්වයා ඒ පුංචි සැපය පතාගෙන අර විශාල දුකක් අනුභව කරනවා. අන්තිමට මොකද වෙන්නේ? එයා මරණින් මත්තේ නිරයේ හරි ප්‍රේත ලෝකයේ හරි අපායේ ගියොත් එයාට පිහිට වෙන්න කවුරුවත් නෑ.

## ජරා මරණ හැර වෙන කිසිවක් අපට උරුම නැද්ද?

මේ නිසා බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන්නා, මේ සිද්ධ වෙන්නේ මොකක් ද කියලා තමන්ගේ ජීවිතයෙන් හොයලා බලන්න කියලා. දැන් අපි ජරාවට පත් වෙනවා, වයසට යනවා, මැරෙනවා. දැන් බලන්න හිතලා අපිට ඇස් රෝග හැදෙන්නෙ නැද්ද? ඇස් රෝග හැදෙනවා. කණ් රෝග හැදෙන්නෙ නැද්ද? කණ් රෝග හැදෙනවා. නාසයේ රෝග හැදෙනවා, දිවේ - කටේ රෝග හැදෙන්නෙ නැද්ද? රෝග හැදෙනවා. නොයෙක් ආකාරයේ රෝග හැදෙනවා. අපිට හිතට රෝග හැදෙන්නෙ නැද්ද? හිතට රෝග හැදෙනවා. එහෙම නම් අපිට මේ ඔක්කොම සිද්ධ වුනේ එක ම හේතුවක් නිසා.

බුදුරජාණන් වහන්සේ ඉතා ම පැහැදිලිව දේශනා කළා, හැබැයි මේක අවබෝධ කරගන්න තියෙන්නේ ඔබ තුළින්. එක ම හේතුව තමයි අපි ඉපදීම. අපි ඉපදෙන්නෙ නැත්නම් කවදාවත් අපිට ඇස් දෙකක් ලැබෙන්නෙ නෑ. අපි ඉපදුනේ නැත්නම් කවදාවත් අපිට කණ් දෙකක් ලැබෙන්නෙ නෑ. අපි ඉපදුනේ නැත්නම් අපිට නාසයක් ලැබෙන්නෙ නෑ. අපි ඉපදුනේ නැත්නම් අපිට දිවක් ලැබෙන්නෙ නෑ. අපි ඉපදුනේ නැත්නම් අපිට කයක් ලැබෙන්නෙ නෑ. අපි ඉපදුනේ නැත්නම් අපිට මනසක් ලැබෙන්නෙ නෑ. අපිට මේ හය ලැබුණා. ඉපදුනා. අපි දුක් විඳිනවා.

## සිහිනය බොඳවී යා නම්...

නමුත් අපි පුරුදු වුනේ මොකක් ද? ඇහැ මුල් කරගෙන

ආශ්වාදයක් විඳින්ට හිතාගෙන අපි ඒ පස්සේ දුවනවා. කණ මුල්කරගෙන ආශ්වාදයක් විඳින්ට හිතාගෙන ඒ පස්සේ දුවනවා. නාසය මුල්කරගෙන ආශ්වාදයක් විඳින්ට හිතාගෙන ඒ පස්සේ දුවනවා. දිව මුල්කරගෙන ආශ්වාදයක් විඳින්ට හිතාගෙන ඒ පස්සේ දුවනවා. කය මුල්කරගෙන ආශ්වාදයක් විඳින්ට හිතාගෙන ඒ පස්සේ දුවනවා. මනස මුල්කරගෙන ආශ්වාදයක් විඳින්ට හිතාගෙන ඒ පස්සේ දුවනවා.

දැන් බලන්න හිතල, අපි මේ ආශ්වාදයක් විඳින්ට පුරුදු වෙච්ච එක. දැන් බලන්න අපි කොයිතරම් නම් හිතින් විඳවනවා ද? මේකෙ ඇතිවීමක් නෑනෙ. අපි ආශ්වාදයක් විඳින්න අපිට ඇත්තට ම කන්න බැරි කෑම අපි හිතින් හදාගෙන කනවා. අපිට ඇත්තට ම අඳින්න බැරි ඇඳුම් අපි හිතින් අඳිනවා. අපිට ඇත්තට හදාගන්න බැරි ගෙවල් අපි හිතින් හදනවා. අපි ඇත්තට ගන්න බැරි වාහන අපි හිතින් ගන්නවා. අපි ඇත්තට ම ගෙවා ගන්න බැරි ජීවිතයක් අපි හිතින් ගෙවනවා. එහෙම නම් අපි මේ හිත පාවිච්චි කරලා තියෙනවා, මනෝ ලෝකයක වින්දනයක් ලබන්න.

## අවබෝධ කරනවා නම් ඉපදීම...

මේ මනෝ ලෝකයක වින්දනයක් ලබන්ට පාවිච්චි කරන පාවිච්චිය නිසා තමයි දිගින් දිගට ම අපි මේ සංසාරයට බැඳිලා යන්නේ. අන්න නුවණ තියෙන එක්කෙනා මේ ගැන හිතනවා. ඉපදුනේ පින්වතුනි හයක්. ඉපදුනු හය තමයි, ඇස් දෙකක් ඉපදුනා, කණ් දෙකක් ඉපදුනා, නාසයක් ඉපදුනා, දිවක් ඉපදුනා, කයක් ඉපදුනා, මනසක් ඉපදුනා. මෙන්න මේවා තමයි අපේ අම්මල තාත්තලා ඉස්පිරිතාල වල ඉඳලා අරන් ආවේ. අරන් ආවේ වෙන මොනව ද? දැන් ඒ ටික තමයි මේ හැදිලා වැඩිලා තියෙන්නේ. දැන් මේක ම තමයි වයසට යන්නේ. දැන් මේක ම තමයි ලෙඩ වෙන්නේ. ඒක ම තමයි මැරිලා යන්නේ.

## මේ හතරෙන් එකකට උපදිනවා...

අන්න බුදුරජාණන් වහන්සේ වදාළා ඉපදීම නිසයි මේක තියෙන්නෙ. හැබැයි උන්වහන්සේ පෙන්වා දුන්නා ඉපදෙන ආකාර හතරක්. එක්කො ඉපදෙනවා බිත්තරයක් අස්සේ, බිත්තරයක් අස්සේ ඉපදෙනවා කුකුල්ලු, ඒ වගේ ම කුරුල්ලෝ, කිඹුල්ලු, නයි, සර්පයෝ මේ ඔක්කොම බිත්තර අස්සේ උපදිනවා. ඒකට කියනවා **අණ්ඩජ** උපත කියල.

ඒ වගේ ම මේ තෙත් පරිසරය තුළ, පණුවෝ, මදුරුවෝ ආදිය උපදිනවා, ඒකට කියනවා **සංසේදජ** උපත කියලා. මව් කුසවල් වල සත්තු උපදිනවා, මිනිස් මව් කුසේ, අලින්ගේ මව් කුසේ, ගවයන්ගේ මව් කුසේ, එළුවන්ගෙ මව් කුසේ, බල්ලන්ගේ මව් කුසේ, බළලුන්ගෙ මව් කුසේ සතුන් උපදිනවා. ඒකට කියනවා **ජලාබුජ** උපත කියලා. මේ තුනෙන් ම තොරවත් උපදිනවා. අන්න ඒකට කියනවා **ඕපපාතික**ව උපදිනවා කියල.

එතකොට පින්වතුනි, අපිට හිතා මතා මේක නතර කරන්න බෑ. සමහර විට අපි මෙහෙම ම නින්ද යනවා වගේ මැරෙන්න පුළුවන්. සමහර විට උපදින කොට අර හතරෙන් එකක තමයි උපදින්නේ. එක්කෝ අණ්ඩජ උපතක් කරා යනවා. එක්කෝ සංසේදජ උපතක් කරා යනවා. එක්කෝ ජලාබුජ උපතක් කරා යනවා, එක්කෝ ඕපපාතික උපතක් කරා යනවා. ප්‍රේත ලෝකයේ ප්‍රේතයන් උපදින්නේ ඕපපාතිකව. මෙහෙන් හුස්ම ටික යන කොට ම මනෝ කාය හැදෙනවා, ඕපපාතික ව පෙරේත ලෝකෙ. නිරයේ නිරි සතුන් උපදින්නේ ඕපපාතිකව. මෙතනින් හුස්ම ටික යන කොට ම එයා නිරයේ උපදිනවා ඕපපාතිකව.

## සිහින නො පෙනෙන්නෙ රහතන් වහන්සේට පමණයි

ඉපදුනාට පස්සේ තමයි නිරයේ නිරි සත්තු මෙයාව අරගෙන ගිහිල්ලා දඬුවම් කරන්නේ. ඊළඟට දෙවියන් උපදින්නේ ඕපපාතිකව. මං මේක තේරුම් ගන්න ඔබට උදාහරණයක් කියනම්. ඔබ කවුරුත් හීන දකිනවා නේ. හීනෙන් බය වෙන අවස්ථා නැද්ද? හීනෙන් බය වෙන අවස්ථා තියෙනවා. එතකොට ඔබ දන්නවා ද, ඔබට හීනෙන් තේරෙනව ද, මේක හීනයක්, බය වෙන්න දෙයක් නෑ. කලබල වෙන්න දෙයක් නෑ කියලා ඔබට හොයගන්න පුළුවන් ද? බෑ. ඇයි ඒ? ඔබ සිහිනය තුල ඉන්නවා. ඔබ සිහිනය තුළ ජීවත් වෙනවා. සිහින පේන්නෙ නැත්තේ රහතන් වහන්සේට පමණයි. ඇයි ඒ? සම්පූර්ණයෙන් ම මුලාවෙන් දුරු වෙච්ච නිසා. කෙලෙස් රහිත නිසා.

අනෙක් සියලු සතුන් මේ මනෝ ලෝකය තුළ සිහින වශයෙනුත් ජීවත් වෙනවා. දැන් එතකොට අපි හිතමු හීනෙන් සතෙක් ඔබව එලවාගෙන එනවා, ඔබට බේරෙන්න පුළුවන් ද? මේ හීනයක්. මම කලබල වෙන්න ඕනෙ නෑ කියලා ඔබට ඉන්න පුළුවන් ද? බෑ. අන්න ඒ වගේ තමයි ඕපපාතිකව ඉපදුනාම.

## මේ ඔක්කොම දුක් වලට හේතුව තමයි...

ඒ නිසා බුදුරජාණන් වහන්සේ පෙන්වා දීලා තියෙනවා, මේ ජරා මරණ වලට, මේ සෝක වැලපුම් වලට, කායික පීඩා වලට, මානසික පීඩා වලට, කායික දුක් වලට, මානසික දුක් වලට, කායික රෝග වලට, මානසික රෝග වලට මේ ඔක්කොට ම හේතුව එක්කො අණ්ඩජ උපතක්. එක්කො ජලාබුජ උපතක්. එහෙම නැත්නම් සංසේදජ උපතක්. එහෙම නැත්නම් ඕපපාතිකව ඉපදෙන එකක්. මේක වලක්වන්න පුළුවන්කම තියෙන්නෙ තමාට ම යි. බාහිර කෙනෙකුට මේක වලක්වන්න බෑ. තමන් ම යි මේකෙන් වලක්වන්න තියෙන්නෙ. ඒ වලක්වන ක්‍රමය අද අපි කථා කරනවා.

## බුදු සමිඳු ඔබ ළග නො වෙද?

ඔබට නුවණ තියෙනවා නම් ඔබට ඒක කරන්න පුළුවන්. බාහිර කෙනෙකුට කරන්න බෑ මේක. මේක ඔබට විතර ම යි කරන්න පුළුවන්. බුදුරජාණන් වහන්සේ උපමාවක් දේශනා කළා. උපමාව තමයි කෙනෙක් බුදු රජාණන් වහන්සේ ළඟ පැවිදි වෙනවා, පැවිදි වෙලා බුදු රජාණන් වහන්සේ සිවුරු පොරවන ආකාරයට ම සිවුරු පොරවනවා. බුදු රජාණන් වහන්සේ පියවර තබන ආකාරයට ම පියවර තබනවා. බුදුරජාණන් වහන්සේ ගේ සිවුර කොනකින් අල්ලාගෙන යනවා. නමුත් එයාට මේ මනසේ තියෙන ප්‍රශ්න විසඳන්ට පුළුවන් ද? ඒක කළා කියලා. බෑ. බුදුරජාණන් වහන්සේ වදාළා ධර්මයේ හැසිරෙන්නේ නැත්නම් එහෙම හිටියත් එයා බුදුරජාණන් වහන්සේගෙන් බොහොම ඈතයි.

යම් කිසි කෙනෙක් ඉන්නවා බුදුරජාණන් වහන්සේ දැකලා නෑ. නමුත් බුදු රජාණන් වහන්සේ වදාළ බුදු බණ අහලා තියෙනවා. ඒ අහපු බණ එයා අනුගමනය කරලා සිහිය පිහිටුවාගෙන සිත පිරිසිදු කරගන්නවා. බුදුරජාණන් වහන්සේ වදාළා කොයිතරම් දුර හිටියත් අන්න එයා තමයි බුදුරජාණන් වහන්සේ ළඟ ඉන්න එක්කෙනා. එහෙම නම් පින්වතුනි, අපට තේරුම් ගන්න පුළුවනි, මේක තමා විසින් ම හරිගස්ස ගන්න එකක්. මම මේකට පුංචි උදාහරණයක් කියන්නම්.

## අවබෝධයෙන් ම නිදහස් නම්...

දැන් අපි දුක් විඳිනවනේ. අපිට තරහා යනවා. අපිට ආශාව ඇතිවෙනවා. අපිට ශෝකය ඇති වෙනවා. මේවා ඔක්කොම

ඇතිවෙන්නේ කොහේ ද? අපේ සිතේ ඇති වෙන්නේ. අපේ සිතේ මේවා ඇතිවෙන්නෙ නැත්නම්, අපිට කවුරු බැන්නත් අපිට තරහක් යන්නේ නැත්නම්, අපිට මොන මොන හොල්මන් පෙනුනත් අපිට භයක් ඇතිවෙන්නේ නැත්නම්, අපිට කවුරු මොනවා දුන්නත් අපිට ආශාවක් ඇතිවෙන්නෙ නැත්නම්, අපි නිදහස් වෙලා ද, බැඳිල ද? නිදහස්. එහෙනම් ඒ නිදහස ලැබෙන්නේ ඒ හැම දෙයක් කෙරෙහි ම ඇති අවබෝධයෙන් ම යි. අවබෝධයක් නැත්නම් ඇතිවෙන්නෙ නෑ.

දැන් අපි කවුරුත් ඉපදිලා ඉන්නවා. මේ ඉපදිලා ඉන්නේ දෙවියන් වහන්සේ මවලා නෙවෙයි. අපි මේ ඉපදිලා ඉන්නේ, අපි මේ කැමැත්තෙන් ඉපදිලා නෙවෙයි. අපි කවුරුත් ගත්තොත් එහෙම දැන් ඉපදිලා තියෙන හැටි අපි කවුරුත් සෑහීමකට පත් වෙලා නෑ, දැන් ලැබිලා තියෙන ඉපදීම ගැන. අපි මොනවා හරි අඩුවක් දකිනවා අපේ ජීවිත වල. අපට ඉපදෙන්න කියල ගන්න තීරණය ගන්න තියෙන්නේ අපට නම්, අපි මොකද කරන්නේ? අපි තීරණය කරනවා, මට මේ වගේ ඇස් දෙකක් ඕනෙ, මට මේ වගේ කොණ්ඩයක් ඕනෙ, මට මේ වගේ ඇඟක් ඕනෙ. මට මේ වගේ මොළයක් ඕනෙ. මට මේ වගේ නුවණක් ඕනෙ. එහෙම කරන්න බෑ. එහෙම නම් අපිට පැහැදිලිව ම පේනවා අපිට තීරණයක් ගන්න බෑ, ඉපදීම සම්බන්ධයෙන්. දෙවිකෙනෙක් නෙවෙයි ඉපදීම සම්බන්ධයෙන් තීරණය ගන්නේ. ඉබේ සිදුවෙනවත් නෙවෙයි.

## උපතක් කරා ගෙන ආ භවය...

මේක සිදුවෙන්නෙ භවය නිසා. **භව පච්චයා ජාති**. ඔබ හොඳට මතක තියාගන්න අපි ඉපදෙන්නේ කුමක් නිසා ද? භවය නිසා. උපදින්නේ භවය නිසා නම්, අපි භවය තේරුම් ගන්න ඕනෙ. බුදුරජාණන් වහන්සේ වදාළා භව තුනක් තියෙනවා. **කාම භව, රූප භව, අරූප භව** කියලා. කාම භවය හැදුනා ම කාම ලෝකයේ උපදිනවා. රූප භවය හැදුනා ම රූප ලෝකයේ උපදිනවා. අරූප භවයක් හැදුනාම අරූප ලෝකයේ උපදිනවා. එහෙම නම් අපි මේ උපතක් කරා යන්නේ භවය නිසා.

භවය කියන වචනය අපි තේරුම් ගන්න ඕනෙ. භවය කියලා කියන්නේ කර්ම විපාක වලට. විපාකයක් විඳින්ට කර්මයක් හැදුනා ම ඒක තමයි භවය. එතකොට කාම ලෝකයේ විපාක විඳින්ට කර්මයක් හැදුනාම ඒක කාම භවය. රූප ලෝකයේ විපාක විඳින්ට කර්මයක් හැදුනා ම ඒක රූප භවය. අරූප ලෝකයේ විපාක විඳින්ට කර්මයක්

හැදුනා ම ඒක අරූප භවය. මේ භව තුන ම දාන්න පුළුවන් සංස්කාර කියන වචනයට.

## සංස්කාරත් තේරුම් ගනිමු.

දැන් අපි කර්ම රැස්කළා. අද මේ රැස්කරපු කර්ම වලට කියන්නේ **පුඤ්ඤාභි සංඛාර** කියලා. මේ රැස් කරන්නේ පුණ්‍ය කර්ම. අපි හැමදාම පුණ්‍ය කර්ම විතරක් නෙමෙයි කරන්නේ. අපි සිහිය පිහිටුව ගත්තොත් නම් පුළුවන්. සිහිය පිහිටුවා ගත්තෙ නැත්නම් පුණ්‍ය කර්ම විතරක් කරන්න බෑ. එයා පාප කර්ම ත් කරනව. ඒවාට කියනවා **අපුඤ්ඤාභි සංඛාර** කියලා. එහෙම නැත්නම් අපි මොකද කරන්නේ, අපි සමාධියක් වඩනවා. භාවනා කරල හිට අපි සමාධියක් වඩනවා, ඒවාට අපි කියනවා **අනෙඤ්ජාභි සංඛාර** කියලා. මේ ඔක්කොම සංස්කාර වලින් භවයක් හැදෙන්නේ.

එතකොට මේ කාම භවය කියලා කියන්නේ කාම ලෝකයේ උපදින ආකාරයට කර්ම හැදිලා තිබීම. රූප භවය කියලා කියන්නේ රූප ධ්‍යාන ඉපදෙව්වා ම එයාට උපදිනවා රූප භවයක්. අරූප භවය කියලා කියන්නේ අරූප ධ්‍යාන ඉපදෙව්වා ම එයාට ඉපදෙන භවය.

දැන් එහෙම නම් ඔබට තේරුම් ගන්න පුළුවන් උපදින්නේ භවයක් නිසා නම් ඉපදීමෙන් නිදහස් වෙන්නේ කුමක් නැතිවීමෙන් ද? ඉපදීම නැති වෙන්න නම් භවය නැති වෙන්න ඕනෙ. ඒ කියන්නේ පුඤ්ඤාභි සංඛාර, අපුඤ්ඤාභි සංඛාර, ආනෙඤ්ජාභි සංඛාර කියන මේවා නැති වෙන්න ඕනේ. එහෙම නැත්නම් කාම භවය, රූප භවය, අරූප භවය මේවා නැති වෙන්න ඕනෙ. විපාක පිණිස කර්ම සකස් වීම නැතිව යන්න ඕනෙ.

## කේන්ති ගියොත් නිදාගන්න බෑ.

දැන් කර්ම විපාක දෙනවා තුන් ආකාරයකින්. පළවෙනි කර්මය තමයි **දිට්ඨධම්මවේදනීය.** දැන් ඔබ සිතලා බලන්න ඔබට කේන්ති ගියපු අවස්ථාවක, කේන්ති ගිය ගමන් ම ඔබට මේ හිතේ සැනසිල්ල තියෙනවා ද? ශාන්තිය තියෙනවා ද? සැපත තියෙනවා ද? එවේලෙ ම විපාක ලැබිලා. දිට්ඨධම්මවේදනීය යි. ඊට පස්සේ රණ්ඩු නේද? ඊට පස්සේ රණ්ඩු ඇවිලි ඇවිලි යනවා. එවේලෙම විපාක ලැබෙනවා. සැනසිල්ලක් නෑ. ඊට පස්සේ නින්ද යනවා ද? නින්ද යන්නෙ නෑ. හීනෙන් භය වෙනවා. මේ ඔක්කොම සිද්ධ වෙනවා. දිට්ඨධම්මවේදනීය විපාක ඒ.

## අපි ළඟ ම ඉන්නා හතුරා...

ඒ වගේ ම තියෙනවා **උපපජ්ජවේදනීය** විපාක. උපපජ්ජවේදනීය විපාක කියන්නේ, ඊළඟ ජීවිතයේ ලැබෙන විපාක. අපිට මේ කවුද මේ ප්‍රාණඝාතය කරපන් කියලා බාහිර කෙනෙක් නෙමෙයි අපට කියන්නේ. මේ හිත කියන්නේ. හිතට ආවා නම් සිතිවිල්ල අපි කරනවා, හිතල බලන්නෙ නැතිව. එතකොට සතුරා ඉන්නේ කොහෙද? අපි ළඟ. අපිට හොරකම් කරපන් කියලා හිත කියනවා. හිත කියපු ගමන් අපි කරනවා. අන්න කර්මය හැදෙනවා. අපිට වැරදි කාම සේවනයේ යෙදියන් කියලා හිත කියනවා. කියපු ගමන් අපි ඒක කරනවා. අන්න කර්මය හැදෙනවා. අපිට සුරාව පානය කරපන් කියලා හිත කියනවා. කියන කොට ම සුරා බොනවා. අන්න හිත කියන එක කරන්නේ.

## බ්‍රේක් නැති වාහනය වගේ....

සිහිය නැතිනම් සාමාන්‍ය හිතක හැටි එයා දන්නෙ නෑ. බොරුවක් වුනත් කියලා ගොඩක් වෙලා ගියාට පස්සෙයි දන්නේ මං මේ බොරුවක් නෙ කිව්වෙ කියල. සමහර විට බොරුව කියන වෙලාවෙ දන්නවා මම මේ කියන්නේ බොරුවක් කියලා, ඒත් එයාට නවත්තගන්න බෑ. එයා දිගට ම කියනවා. පරුෂ වචන කියන වෙලාවට එයා දන්නවා මේක හොඳ නෑ කියලා. නමුත් එයාට ඒක නවත්වගන්න බෑ. එතකොට කේලම් කියන වෙලාවට එයා දන්නවා මේක කේලම කියලා. නමුත් එයාට ඒක නවත්වගන්න බෑ. මොකද හේතුව? මෙයාට වීරියත් නෑ. සිහියත් නෑ.

අන්න දැක්කනේ, එතකොට බලන්න සාමාන්‍ය ජීවිත ගෙවන කොට කර්මය හැදෙන්නේ ඒ විදිහටයි. ඕක තමයි භවය කියන්නේ. අන්න ඒ භවය හැදෙන කොට මොකද වෙන්නේ. තමන්ගේ ජීවිතේ සම්පූර්ණයෙන් ම හැදිලා යනවා. ඉතින් අපිට බේරෙන්න තියෙන්නේ නුවණ කල්පනා කළොත් විතරයි. අපට තේරෙන විදිහට නම් මේ මරණයට පත්වෙන අයගෙන් සියයට අනූපහක් විතර යන්නේ අපායේ. සියයට පහක් විතර වගේ තමයි එක්කෝ මිනිස් ලෝකේ, එහෙම නැත්නම් හොඳ ලෝකෙක යන්නේ. කවුරුවත් බාහිර කෙනෙක් නෙමෙයි මේක කරන්නේ. තමා විසින් මේක කරගන්නේ. ඒ නිසා පින්වතුනි, අපි හොඳ කල්පනාවෙන් අපේ ජීවිතේ දිහා බලන්න ඕනෙ. දැන් මේ වෙලාවෙත් භවයක් හැදෙනවා, හැම තිස්සෙම භවයක් හැදෙනවා. අපි නිදාගෙන හිටියත් ඒ නින්දෙන් භවය හැදි හැදී තමයි තියෙන්නේ උපතක් කරා යන්න.

## නිවන් දක්නා තුරා හැදෙන භවය...

ඒ නිසා අපට භවය හැදිච්ච නැති වෙලාවක් නෑ. භවය හැදෙන්නෙ නැත්තෙ අරහත්වයට පත් වුණා ම යි. යම් දවසක අපි කවුරුහරි අරහත් වුනොත් ඒ මොහොතේ ඉඳලා භවය ඉවරයි. එතකම් ම භවය හැදෙනවා. දැන්, සෝවාන් වෙච්ච එක්කෙනාටත් භවය හැදෙනවා. හැබැයි කාම ලෝකය තුළ සතර අපායේ වැටෙන්නෙ නැතිව තමයි උපදින්නෙ. සකදාගාමී වෙච්ච එක්කෙනාටත් භවයක් හැදෙනවා. ඒ කෙනා මිනිස් ලෝකේ හෝ දිව්‍ය ලෝකෙ එක වතාවක් උපදිනවා. අනාගාමී වෙච්ච එක්කෙනාටත් භවය හැදෙනවා. එක්කෝ රූප භවය, එක්කෝ අරූප භවය. ඒ ලෝකේ ගිහිල්ලා පිරිනිවන් පානවා.

රහතන් වහන්සේට භවය නිරුද්ධයි. ඒ නිසා උපතක් කරා යන්නේ නෑ පිරිනිවන් පානවා. එහෙනම් පින්වතුනි, අපි උපතක් කරා යන ස්වභාවයෙන් යුක්තයි. ඒ නිසා මේක බුදුරජාණන් වහන්සේගේ ධර්මය තුළින් තමා විසින් ම යි බේරගන්න තියෙන්නේ.

## භවය හැදුනෙ ඇයි?

බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා, විපාක පිණිස කර්ම හැදෙනවානේ අපේ. මේ භවයක් හැදෙන්නේ උපාදාන නිසා. උපාදානය, යම්කිසි දෙයකට ග්‍රහණය වීම, යම් කිසි දෙයකට බැඳී යාම. මේකට තමයි උපාදාන කියලා කියන්නේ. ඒක පින්වතුනි, අනෙක් දේවල් වලට වඩා වෙනස් එකක්. දැන් අපි ගත්තොත්, අපේ ඇඟට මූනිස්සමක් වදිනවා කියමු. කවුරු හරි වෙඩි තියලා මූනිස්සමක් අපේ ශරීරයට ඇතුළු වෙනවා. අපිට බැරිද මේක අරන් දාන්න ඔපරේෂන් කරලා. පුළුවන් අරන් දාන්න. උපාදාන කියන්නෙත් ඒ වගේ ඇතුළු වෙන එකක් තමයි. නමුත් ඒක කෘතිම ව අරන් දාන්න බෑ.

යම් කිසි දේකට හසුවුනාට පස්සේ හිතෙන් ඒක ලිහාගන්න එක ලේසි එකක් නෙවෙයි. ඇඳුමක් වගේ එකක් නම්, තෙත වුණා, ගැලෙව්වා ඉවරයි. දතක් වගේ එකක් නම් ගලවලා දැම්මා ඉවරයි. ඇඟිල්ලක් වගේ එකක් නම් කපලා දැම්මා ඉවරයි.

## මෙන්න උපාදාන...

උපාදාන කියන්නේ එහෙම එකක් නෙවෙයි. උපාදාන කියන්නේ අපි මනසින් යමකට ග්‍රහණය වීම. ඒ යමක් මනසින් ග්‍රහණය වීම මත

ම තමයි භවය හැදෙන්නේ. ඉතින් බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාළා උපාදාන හතරක්.

එකක් තමයි අපි කාමයට බැඳිලා ඉන්නවා. කාමයට අහුවෙලා ඉන්නවා. කාමය කියලා කියන්නේ මේ ලස්සන රූප. අහුවෙලා නැද්ද අපි. අහුවෙලා ඉන්නෙ. ඊළඟට මිහිරි ශබ්ද වලට අහුවෙලා ඉන්නෙ. අපි මේවා කොච්චර හිතනවා ද? අන්න ඒකට කියන්නේ '**කාම උපාදාන**' කියලා.

කාමයට විතරක් නෙමෙයි අපි අහුවෙන්නේ. අපි අහුවෙනවා දෘෂ්ටි වලට. දෘෂ්ටි වලට අහුවෙනවා. මතවාද වලට අහුවෙනවා. නොයෙක් දේවල් වලට අහුවෙනවා. අන්තවාදී විදිහට ම අහුවෙනවා. අහුවුණාට පස්සේ මොකද කරන්නේ? ඒ ගොල්ලො ඒ නාමයෙන් ඕනෑම දෙයක් කරන්න කැමතියි. ඒක තමයි මේ දෘෂ්ටි වලට, මතවාද වලට අහුවුනා ම තියෙන ස්වභාවය. ඒකට කියනවා '**දිට්ඨි උපාදාන**' කියලා.

'**සීලබ්බත උපාදාන**' කියලා සීල ව්‍රත වලට බැඳෙනවා. නොයෙක් පුරුදු ඇතිකර ගන්නවා, නොයෙක් දේවල් ඇතිකර ගන්නවා. සීල ව්‍රත. මේවාට බැඳෙනවා.

ඊළඟට '**අත්තවාද උපාදාන**' කියන්නේ එයා බැඳෙනවා මම කියන අදහසට. මගේ කියන අදහසට. මම තමයි, මගේ තමයි, මගේ ආත්මය තමයි කියලා අයිතියක් හඟවාගෙන එයා බැඳෙනවා. අන්න ඒකට කියනවා අත්තවාද උපාදාන කියලා. එතකොට කාම උපාදාන, දිට්ඨි උපාදාන, සීලබ්බත උපාදාන, අත්තවාද උපාදාන කියන මෙන්න මේ හතරට අහුවුනාට පස්සේ එයාට ගැලවෙන්න විදිහක් නෑ.

## සෝවාන් වුනොත් දෙකක් ඉවරයි...

දැන් යම්කිසි කෙනෙක් සෝවාන් වුනොත් එයාට මේ උපාදාන දෙකක් නැතිව යනවා. කාම උපාදාන තියෙනවා. දිට්ඨි උපාදාන නැතිව යනවා. සීලබ්බත උපාදාන නැතිව යනවා. අත්තවාද උපාදාන තියෙනවා.

සකදාගාමී වුනොත් කාම උපාදාන තුනී වෙනවා. අනාගාමී වුනොත් කාම උපාදාන ප්‍රහාණය වෙනවා. රහත් වුනාට පස්සේ අත්තවාද උපාදානත් ප්‍රහාණය වෙනවා. අන්න එතකොට (**උපාදාන නිරෝධා භව නිරෝධෝ**) උපාදාන නැත්නම් භවයක් නෑ. භවයක් නැත්නම් ඉපදීමක් නෑ. එහෙනම් අපට පැහැදිලිව පේනවා අපි

ග්‍රහණය වෙලා සිටීම විශාල වශයෙන් අපේ ජීවිත වල අපි දුක් විඳින්න අපිට හේතුවක් වෙලා තියෙනවා.

## අවබෝධයක් කරා යන්න දක්ෂ වෙන්න ඕනෙ

දැන් ඕන දේකදි අපි දුක් විඳින්නේ හැම දේකට ම මුහුණ දීමේ හැකියාව නැති වීමෙන්. දැන් අපි ගම්මු අද දවසේ, වෙලාවට ආහාර ගන්න බැරිවුනා ම මේ ඇඟට මහන්සියක් දැනෙන්නෙ නැත් ද? මහන්සියක් දැනෙනවා. ඇඟට පණ නෑ වගේ දැනෙන්නෙ නැද්ද? පණ නෑ වගේ දැනෙනවා. දැන් බලන්න අපි කොච්චර කෑවත් වේලක් වැරදුනොත් වෙන දේ මේ ශරීරයට. එහෙම නම් අපිට නුවණ තියෙන්න ඕනෙ අපි මේ කිසිවකට බැඳෙන්නෙ නැතිව මුහුණ දීලා අපේ ජීවිතය අවබෝධයක් කරා ගෙනියන්න. අවබෝධයක් කරා ගෙනියන්න පුළුවන් කම ඕනෑ ම නුවණ තියෙන කෙනෙකුට ඇති කරගන්න පුළුවන්. ඒ කියන්නේ අපි හිත හදාගෙන මේ ජීවිතයට මූණ දෙන්න දක්ෂ වුනොත්, ඕනෙම කෙනෙකුට මේ ජීවිතේ අවබෝධ කරන්න පුළුවන්.

දැන් අපි ගනිමු උදාහරණයක් විදිහට **සාමාවති** බිසවුන්නාන්සේ ඇතුළු බිසවුන් පන්සීයක් මරණයට පත් වුනේ පිච්චිලා. **මාගන්දියා** කියන බිසව ඒ පිරිස කෙරෙහි තරහින් ඒ කාමර ඔක්කොම වහලා ගිනිතිබ්බා. පිච්චිලා මැරුණේ. නමුත් පිච්චිලා මැරුණේ කියලා අපායේ උපන්නා ද? නෑ. කොහෙද උපන්නේ. දිව්‍ය ලෝකයේ උපන්නේ. මොකද හේතුව? මාර්ගඵල ලබලා හිටියේ. අර **ඛුජ්ජුත්තරා** කියන උපාසිකාව බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවිකාව සාමාවතී බිසවගේ මල් ගෙනෙන සේවිකාව, සාමාවතී බිසව හැමදාම කහවණු හතරක් දෙනවා මල් අරගෙන එන්න. මේ ඛුජ්ජුත්තරා මොකද කරන්නේ? කහවණු දෙකක් හොරකම් කරනවා, කහවණු දෙකක මල් අරන් එනවා.

## සිල් සුවඳ විහිදුවන කුසුම ඔබයි

දවසක් ඛුජ්ජුත්තරාට බුදුරජාණන් වහන්සේව දකින්නට ලැබුණා. ධර්මය දේශනා කරනවා අහන්නට ලැබුණා. මෙයා ගිහිල්ලා පැත්තක ඉඳලා අහගෙන හිටියා. මෙයා සෝවාන් වුනා. සෝවාන් වුනාට පස්සේ හොරකම් කරන්නේ නෑනේ, මාර්ගඵල ලාභීන්. මොකද කළේ එදා කඩේ ගිහින් කහවණු හතරේ ම මල් අරගෙන ආවා.

සාමාවතී අහනවා, ඛුජ්ජුත්තරා "අද මොකද මේ මල්කාරයා අපට මෙච්චර ප්‍රසාදයෙන් වෙනදා දෙනව වගේ මේ දෙගුණයක් මල් දීලා තියෙන්නේ."

"අනේ, දේවීන් වහන්ස, මල්කාරයා පැහැදුනා නෙවෙයි. මම හොරකම අත්හැරියා"

"උඹ කොහොම ද හොරකම අත්හැරියෙ?"

"මම බුදුරජාණන් වහන්සේගේ ධර්මය අවබෝධ කර ගත්තා. මට දැන් ජීවිතේ තේරෙනවා. මම අවබෝධ කරගත්තා. මම කරන දේ මම අරගෙන යනවා. ඒ නිසා මම කරන්නෙ නෑ" කිව්වා.

සාමාවතිය කියනවා, "අනේ ඛුජ්ජුත්තරා, මං තව කහවණු හතරක් දෙනවා. බණ අහගෙන ඇවිල්ලා මට ආපහු කියන්න" කියල.

## ශ්‍රද්ධාව ඇති වුනේ බුදු සමිඳුන් ඇසින් දැකල නෙවෙයි

එතකොට බුද්ධ කාලේ සාමාවතියට පුළුවන් වුනා ද බුදු රජාණන් වහන්සේව දකින්න යන්න. පුළුවන් වුනේ නෑ. බිසවුන් වහන්සේලාට පුළුවන් වුනා ද? පුළුවන් වුනේ නෑ. ඛුජ්ජුත්තරා බණ අහගෙන ඇවිල්ලා උස් ආසනයක වාඩිවෙලා සාමාවතියටයි අනෙක් අයට යි බණ කියනවා. මොකද? ඒ කියන්නේ බණ.

අන්න ඒකෙ තියෙන්නේ, මේ ඇස අනිත්‍යය යි කියලා හිතන එකක්. මේ කණ අනිත්‍යය යි කියලා හිතන එකක්. මේ නාසය අනිත්‍යය යි කියලා හිතන එකක්. මේ දිව අනිත්‍යය යි කියලා හිතන එකක්. මේ කය අනිත්‍යය යි කියලා හිතන එකක්. මේ මනස අනිත්‍යය යි කියලා හිතන එකක්. මේක තමන් දිහා බලාගෙන හිතන එකක්. සාමාවතිය ප්‍රධාන පිරිස මේක කළා. මේක කරගෙන කරගෙන යනකොට අවබෝධ වුනා ඇත්ත තමයි මේ හය ම අනිත්‍යය යි කියලා. මේ අවබෝධය තුළ ඉන්න කොට මේ අයට ශ්‍රද්ධාව ඇති වුනා බුදුරජාණන් වහන්සේ ගැන. බුදුරජාණන් වහන්සේ ගැන ශ්‍රද්ධාව ඇතිවුනාට ම මාගන්දියා බිසවට ලොකු තරහක් ඇති වුනා,

## මගෙ දුවට ඔබින රූපේ...

මොකද හේතුව, මාගන්දියාගේ පියා නුවණ තිබුණු කෙනෙක්. ලස්සන කුමාරයෙක් හෙව්වා තමන්ගේ දුවට සරණ පාවා දෙන්න. හොයාගෙන යනකොට බුදුරජාණන් වහන්සේ ගහක් යට වැඩ ඉන්නවා දැක්කා. දැකලා කල්පනා කළා "හා... මේ තමයි මගේ දුවට ස්වාමියා වෙන්න සුදුසු කෙනා. මේ තරම් ලස්සන කෙනෙක් ලෝකෙ නෑ" කියලා ආපහු ගෙදර ගියා. බැමිණියට කිව්වා ඉක්මනට අපේ දුව සරසවන්න.

අන්න සුදුසු කෙනා ඉන්නවා ගහක් යට වාඩි වෙලා ඉන්නවා දැක්කා කියල. අපි එක්කරගෙන යමු කියලා.

තමන්ගේ දියණියව එක්කරගෙන ගියා. ගිහිල්ලා මොකද කළේ? බුදුරජාණන් වහන්සේට කිව්වා, "ස්වාමීනී, මෙන්න ඉන්නවා මගේ දුව. මේ දුව ඔබතුමාට සරණපාවා දෙන්න කැමතියි" කියලා. එතකොට බුදුරජාණන් වහන්සේ වදාළා, "පින්වත, මේ දෙතිස් කුණපයකින් යුතු ශරීරය පයින්වත් ස්පර්ශ කරන්නට කැමති නෑ" කියලා.

## වෛරයක් - ගිය දුරක්...

අන්න එදා තමයි මාගන්දියාගේ හිතට වෛරය ඇති වුනේ. වෛරය ඇති වෙලා වෛර බැඳගත්තා. වෛර බැඳගත්තාට පස්සේ බුදුරජාණන් වහන්සේ ත් එක්ක තව කවුරු හරි හිතවත් නම් එයත් එක්කත් වෛරයි. දැන් අපේ හිතේ නැද්ද මේ ස්වභාවය. දැන් අපි කවුරුහරි කෙනෙක් එක්ක තරහ නම්, ඒ තරහා එක්කෙනා වෙන කෙනෙක් එකක් යාලු වෙනවා නම් අපි එයත් එක්කත් තරහා එනවා.

මාගන්දියා මොකද කළේ? ඒ තමන්ගේ ඒ පවුලේ කට්ටියට කියලා මේ සාමාවතිය ඉන්න ඒ මාලිගාව වටකරලා මේ කණු ඔක්කොම තෙල් පහන් කඩ වලින් ඔතලා ගිනිතිබ්බා.

## දහම දැහැමියා රකී - ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරී

සාමාවතිය බිසවුන්නාන්සේලාට කිව්වා, දැන් ජේනවනේ සංසාරෙ හැටි. දැන් අපි අනිත්‍ය වශයෙන්, දුක් වශයෙන්, මේ ඇස, කණ, නාසය, දිව, කය බලාගෙන අපි සිහියෙන් මැරෙමු කිව්වා. සිහියෙන් මැරුණා. කවුද රැක්කේ ? ධර්මය යි. ධර්මය තිබුනෙ නැත්නම් එහෙම කරන කොට වෛරය හට ගන්නේ නැද්ද? තරහ හට ගන්නේ නැද්ද? වෛරයක්, තරහක් හටගත්ත නම්, ගිහිල්ලා නිරයේ උපදින්නේ නැද්ද? තිරිසන් යෝනියේ උපදින්නේ නැද්ද? මේ හැම එකෙන් ම මිදුනේ ධර්මය තිබුණු නිසා.

මෙන්න මේ නිසා මේ ධර්මය මනාකොට තේරුම් ගැනීමේ හැකියාව අපට තියෙන්න ඕනෙ. ඉතින් බුදුරජාණන් වහන්සේගේ ධර්මයේ අපි හොඳට තේරුම් ගන්න ඕනෙ උපාදාන කියන්නේ මොකක් ද කියලා. උපාදාන කියන්නේ යම්කිසි දේකට ග්‍රහණය වීම, යම්කිසි දේකට හසුවීම.

දැන් අපි කාමයට හසුවෙලා, දෘෂ්ටිවලට හසුවෙලා, සීලව්‍රත වලට හසුවෙලා, මම දැකලා තියෙනවා ඉන්දියාවේ ඉන්නවා සමහරු මුළු ජීවිත කාලයේ ම එක අතක් ඔසවාගෙන ඉන්නවා. සමහරු මුළු ජීවිත කාලයේ ම තනි කකුලෙන් හිටගෙන ඉන්නවා. සමහරු මුළු ජීවිත කාලයේ ම එක වචනයක් වත් කථා කරන්නෙ නෑ. මේවා ඔක්කොම සීලබ්බත පරාමාස වලට අයිති වෙනවා.

## සිත විමසන්නෙ මේ ගැන ම යි

ඉතින් බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාළා, මේ උපාදාන ඉබේ හැදෙනවා නෙවෙයි. මේ උපාදාන හැදෙන්නේ හේතුවක් නිසා. උපාදාන හැදෙන්නේ යමකට හිත ඇදිලා ගියා ම තමයි ඒකට අහුවෙන්නේ. යමකට හිත ඇදිලා යනවා ද අන්න ඒකට කියනවා තණ්හාව කියලා.

එතකොට අපේ හිත ඇදිලා යනවා ද යමකට අන්න එතන තණ්හාව හටගන්නවා. අපේ හිත ඇදිලා යනවා ද යමකට අන්න ඒකෙ උපාදාන ඇතිවෙනවා. එහෙම නම්, පින්වතුනි, අපේ හිත ඇදිලා යනවා ඇසට පෙනෙන රූපයට. අපේ හිත ඇදිලා යනවා, කණට ඇහෙන ශබ්දයට. අපේ හිත ඇදිලා යනවා නාසයට දැනෙන ගඳ සුවඳට අපේ සිත ඇදිලා යනවා. දිවට දැනෙන රසයට. අපේ හිත ඇදිලා යනවා කයට දැනෙන පහසට. අපේ හිත ඇදිලා යනවා හිතට හිතෙන දේවල් වලට. දැන් බලන්න අපි හිතට හිතෙන දේවල් වලට ඇදිලා ගියා ම අපි ඒ ලෝකෙ ඉන්නවානේ. දැන් අපි තනිවෙච්ච වෙලාවට සමහර විට කල්පනා කර කර කෙනෙක් එක්ක කථා කර කර පවා අපි හිත ඇදිලා ගිය දෙයක් ගැන හිතන අවස්ථා තියෙනවානෙ.

## අපි සිහියෙන් නො සිටියොත්...

මෙන්න මේක තමයි තණ්හාව කියන්නේ. දැන් අපි කෙනෙකුට එකපාර තණ්හාව නැතිව ඉන්න කියලා කිව්වට පුළුවන් ද එකපාරට ම ඒක කරන්න. බෑ. දැන් හිත ඇදිලා යන ස්වභාවයක් හැදිලා තියෙනවා. මේ හිත ඇදිලා යන ස්වභාවය හැදිලා තියෙන නිසා මේ තණ්හාව හටගන්නවා. අපි සිහියෙන් හිටියෙ නැත්නම් මේක දකින්න බෑ. දැන් බුදුරජාණන් වහන්සේගේ ධර්මයේ දේශනා කරන්නේ මේ හිත ඇදිලා යන ස්වභාවය නැති කරන්න කියලා. හිත ඇදිලා යන ස්වභාවය නැති කළොත් අන්න ඒ ඇදිලා යන දේට අහුවෙන්නෙ නෑ. අහුවෙන්නෙ නැත්නම් ඒකේ හිත පිහිටන්නෙ නෑ. පිහිටන්නෙ නැත්නම් කයෙන් ක්‍රියා කළාට විපාක හැදෙන්නෙ නෑ. වචනයෙන් කථා කළාට

විපාක හැදෙන්නෙ නෑ. හිතෙන් හිතුවට විපාක හැදෙන්නෙ නෑ. එහෙම නම් මේ ඔක්කොම හැදෙන්නේ මේ අපි තුළ හැදිලා තියෙන පිළිවෙලක් නිසයි.

## කවදා නම් අපි නිදහස් වෙමු ද?

ඉතින් බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාළා මේ සත්වයාට එතෙර වෙන්න බැරි මහා සාගරයක් වගේ කියලා මේ තණ්හාව. මේ හිත අපි ගත්තොත් එහෙම අපිට එතෙර වෙන්න බැරි මහා ලොකු දේකුත් නෙමෙයි. කරුණු හයකින් එතෙර වෙන්න බැරිවයි ඉන්නෙ. ඇහෙන් රූප පේනවා, මේකට හිත ඇදිලා යනවා, නවත්වගන්න බෑ. කණට ශබ්ද ඇහෙනවා, මේකට හිත ඇදිලා යනවා මේක නවත්වගන්න බෑ. නාසයට ගඳ සුවඳ දැනෙනවා, මේකට හිත ඇදිලා යනවා මේක නවත්වාගන්න බෑ. දිවට රස දැනෙනවා, මේකට හිත ඇදිලා යනවා නවත්වාගන්න බෑ. දිවට රස දැනෙනවා මේකට හිත ඇදිලා යනවා, නවත්වාගන්න බෑ. කයට පහස දැනෙනවා මේකට හිත ඇදිලා යනවා නවත්වාගන්න බෑ. මෙන්න මෙතනින් තමයි සියලු දුෂ්චරිත හටගන්නේ.

එතන ඉඳලා ඒ සිත ඇදිලා යන නිසා අන්න සතුන් මරන්න පටන් ගන්නවා. දැන් හිත ඇදිලා යනකොට හිත බැඳෙනවනෙ ඒකට. බැඳුනට පස්සේ මොකද වෙන්නේ? සතුන් මරන්න පටන් ගන්නවා, හොරකම් කරන්න පටන් ගන්නවා, වැරදි කාම සේවනයේ යෙදෙන්න පටන් ගන්නවා, ඊළඟට පරුෂ වචන කියනවා, හිස් වචන කියනවා. අනුන්ගේ දේවල් දැක්කම අනේ මේවා මට ඇත්නම් කොච්චර හොඳ ද කියලා හිතෙනවා.

## අකුසල් ගොඩ කරගහගන්න වෙනවා.

දැන් මේක කොච්චර භයානකයි ද කියන්නේ මේ හිතේ ස්වභාවය අනුන්ගේ සම්පත් කෙරෙහි අපේ සිත ඇලුනා ම අපි කැමති වෙනවා ඒ කෙනාගේ මරණය පවා. "ආ... මෙයා මැරුණොත් මේක මට අයිති කරගන්න පුළුවන්. මෙයාට කරදරයක් වුනොත්, මට මේක අයිති කරගන්න පුළුවන්. මෙයා මේක දාලා යනවා නම් කොච්චර හොඳ ද? මෙයාට මේක එපා වෙනවා නම් කොච්චර හොඳ ද?" මේ ඔක්කොම ඇතිවෙන්නේ මනස කිලුටු වීමෙන්. ඒ වගේ ම හිතේ ඇතිවෙනවා වෛරය, ක්‍රෝධය, පළිගැනීම, මාන්නය, ඉරිසියාව, එකට එක කිරීම. මේ ඔක්කොම හිතේ ඇතිවෙන අකුසල්. මෙන්න මේ අකුසල් අර ඔක්කෝට ම මුල අර තණ්හාව හිත ඇදිලා යාම.

## මිසදිටු බවින් මත් වෙලා - නො දැමුණු සිතින් යුතු

ඊළඟ එක මේ ජීවිතයේ සිදුවන්නේ මොකක් ද කියලා එයාට අවබෝධයක් නෑ. අවබෝධයක් නැති නිසා එයා මෙලොවක් පිළිගන්නෙ නෑ. පරලොව පිළිගන්නෙ නෑ. අම්මා තාත්තා පිළිගන්නෙ නෑ. ඕපපාතික සත්වයෝ ඉන්නවා කියලා පිළිගන්නෙ නෑ. ජීවිතේ අවබෝධ කරපු මුනිවරු ඉන්නවා කියලා පිළිගන්නෙ නෑ. මේ නිසා එයා මිත්‍යා දෘෂ්ටික වෙනවා. කර්ම විපාක අදහන්නෙ නෑ.

දැන් අපි ගත්තොත් ධර්මය තේරෙන කෙනා කයෙන් අකුසල් කරන්න බය යි. මේ අකුසල් කරා ම නරක විපාක ලැබෙනවා කියලා අවබෝධය නිසා. වචනයෙන් අකුසල් කරන්න බය යි. ඇයි ඒ, අවබෝධයක් තියෙනවා එයාට. විපාක විඳින්න ඇති බය. අන්න ඒ නිසා ඒකෙන් අත්මිදෙනවා, හිතට අකුසල් එනකොට මොකද කරන්නේ, ධර්මය තේරෙන කෙනා, ඒ අකුසල් හිතේ පවත්වන්නෙ නෑ. එයා ඒ අකුසල් දුරු කරන්න කල්පනා කරනවා. මෙන්න මේ විදිහට ධර්මය තේරෙන එක්කෙනා අකුසල් දුරු කරනවා. ධර්මය තේරෙන්නෙ නැති එක්කෙනා අකුසල් පිළිගන්නවා. අකුසල් පිළිගත්තාට පස්සෙ අර හිත ඇදිලා ගියාට පස්සේ ඇදිලා යන දිහාවට ම යනවා.

## මිනිස්සු හත් දෙනෙක් ගෙන් ම ගුටිකන යව කරල් මිටිය වගේ...

බුදුරජාණන් වහන්සේ වදාලා ඒක හරියට, හතර මං හන්දියක මිනිස්සු හය දෙනෙක් ඉන්නවා. මේ මිනිස්සු හය දෙනා යව මිටියක් හතර මං හන්දියේ තියලා මේ යව මිටියට පොලු හයකින් ගහනවා. පොලු හයකින් ගහන්න, ගහන්න මොකද වෙන්නේ මේ යව මිටියට. හොඳට තැලෙනවා. එතකොට මොකද වෙන්නේ? මේ පොලු හයෙන් ගහලා ඉවර වෙච්ච ගමන් තව ලොකු පොල්ල අරන් හත්වෙනි මිනිහා එනවා. ඇවිල්ලා ඒ හත්වෙනි මිනිහා ඒ පොල්ලෙන් ගහනවා. බුදුරජාණන් වහන්සේ වදාලා මේ ජීවිතයත් ඒ වගේ කියලා.

## ආයෙමත් උපදින්න කැමතියි

ඇහෙන් රූප දැකලා, කෙනෙක් නොයෙක් ආකාරයේ දුක් දොම්නස් විඳිනවා, කණෙන් ශබ්ද අහලා නොයෙක් ආකාරයේ දුක් දොම්නස් විඳිනවා, නාසයෙන් ගඳ සුවඳ ආඝ්‍රාණය කරලා නොයෙක්

ආකාරයේ දුක් දොම්නස් විඳිනවා, දිවෙන් රස විඳලා නොයෙක් ආකාරයේ දුක් දොම්නස් විඳිනවා, කයට ලැබෙන පහස නිසා නොයෙක් ආකාරයේ දුක් දොම්නස් විඳිනවා, සිතට සිතෙන දේවල් නිසා නොයෙක් ආකාරයේ මානසික පීඩාවල් විඳිනවා.

බුදුරජාණන් වහන්සේ වදාළේ මේක හරියට යව මිටියකට මිනිස්සු හය දෙයෙක් පොලු හයකින් ගහනව වගේ තැලි තැලී ඉන්නේ කියලා. එහෙම ජීවිතේ තැලි තැලී ඉඳලා, පීඩා විඳ විඳ ඉඳලා අර හත්වෙනි පොල්ලෙන් ගහනව වගේ එයා මරණාසන්න වෙනකොට ආයෙත් උපදින්න කැමතියි.

## ආයෙමත් අප අතර ම ඉපදේවා !

එයා කල්පනා කරනවා, "අනේ මගේ මේ දරුවෝ ටික ආපහු මට ලැබෙන්න ඕනෙ. මගේ මේ මුණුබුරෝ, මිණිබිරියෝ ආපහු මට ලැබෙන්න ඕනෙ. මට උපනූපන් ආත්ම වල මගේ ස්වාමියා හම්බ වෙන්න ඕනෙ. මට උපනූපන් ආත්ම වල මගේ බිරිඳ මුණ ගැහෙන්න ඕනෙ. අපි ඔක්කොම ආයෙ එක ම පවුලක හම්බවෙන්න ඕනෙ" යව මිටිය තලනවා. යව මිටිය තල තලා ඉන්නවා වගේ ආයෙමත් අර හත්වෙනි පොල්ලකින් ගහනව වගේ ආයෙමත් උපතක් කරා යන්න කැමතියි.

## බුදු සමිඳු දැක දැකත් - නිවන් නොදුටු අය...

ආයෙමත් උපතක් කරා යන්න කැමති එක්කෙනා කවදාවත් නිවන අවබෝධ කරාවි ද? කවදාවත් නිවන අවබෝධ කරන්නෙ නෑ එයා. මෛත්‍රී බුදුරජාණන් වහන්සේ දුටුවත් නිවන අවබෝධ කරන්නේ නෑ එයා. බුදුරජාණන් වහ්නසේ පෙනි පෙනී නිවන අවබෝධ කරන්නෙ නෑ එයා. බුදු රජාණන් වහන්සේ පෙනි පෙනී නිවන අවබෝධ නො කරපු පිරස මහත් රාශියක් හිටියා. බුදුරජාණන් වහ්නසේ ධර්මය දේශනා කරද්දී ඒ ධර්මය අහලා ඒ ධර්මයට බැණ බැණ ගිය මහත් රාශියක් හිටියා. ඒ නිසා නුවණ තියෙන කෙනා විතර ම යි මේ ධර්මය අල්ලා ගන්නේ. නුවණ තියෙන කෙනා විතර ම යි මේ ධර්මය අවබෝධ කරගන්නේ. බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාළා ඒ නිසා අපිට මේ හිත ඇදිලා යනකම් ම තණ්හාව තියෙනකම් ම අපි මෙච්චට අහුවෙනවා. අහුවෙනකම් ම භවය හැදෙනවා. භවය හැදෙන කම් ම උපදිනවා. උපදින කම් අපිට මේ දුක් තියෙනවා.

බුදුරජාණන් වහන්සේ වදාළා තණ්හාව ඇතිවෙන්නේ එක කරුණක් නිසා. ඒකට කියන්නේ මොකක් ද? තණ්හාව ඇති වෙන්නේ විඳීම නිසා. දැන් ඇහෙන් රූපයක් දැක්කා ම විඳිනවා. මම ඒක කියන්නම් ඔබට තේරුම් ගන්න පහසු විදිහට.

## ආයෙමත් දකින්නට ආසයි...

දැන් ඔන්න ඔබ බඩු අරගෙන මලු දෙකක් අරගෙන කඩේ ගිහින් එනවා. එතකොට ඉස්සරහට වයසක ආච්චි කෙනෙක් කොණ්ඩෙත් අවුල් කරගෙන, මල්ලත් අරගෙන ඉස්සරහට එනවා. දැන් ඔබට මේ ආච්චිව මතක හිටීවි ද? ගනන් ගන්නෙ නෑ ඒ රූපය. ඔබත් ඉස්සරහට යනකොට ඔබේ ඉස්සරහට එනවා, දිග නීල කේෂ කලාපයක් තියෙන, ඒ කොණ්ඩෙ මල් ගවසලා රන්වන් පාට ශරීරයක් ඇති ඉතා පියකරු නෙත් යුගලක් ඇති, රන්වන් සෙරෙප්පු දෙකක් දාගෙන හැඩ දදා එක්කෙනෙක් එනවා ඉස්සරහට. දැන් අර ආච්චි දිහා බලන්නෙ නැති ඔබට අර රූපෙ පේනවා. පෙනිච්ච ගමන් මොකක් ද වෙන්නේ. අන්න ඇහැයි රූපය යි, විඤ්ඤාණය යි එකතු වෙනවා. එකතු වෙච්ච ගමන් ම වින්දනයක් හට ගන්නවා. “ෂා... ලස්සන එක්කෙනෙක්” කියලා ඔබේ සිත ඇදිලා යනවා. එතකොට ම ඔබෙන් පහුවෙනවා එයා. ඔබ මොකද කරන්නේ? අර බඩු මලුත් තියලා ආපස්සට හැරිලා බලනවා, “කවුද එයා? කොහෙද යන්නේ එයා, කොහේ එක්කෙනෙක් ද?” අන්න එහෙම තමයි මේ හිත යන්නේ.

දැන් ඊළඟට ඔබ කඩේකට යනවා. රස කැවිලි ගන්න. රස කැවිලි ගන්න ගියා ම ඒ කඩේ එක්කෙනා චූටි කෑල්ලක් දීලා කියනවා. මෙන්න මේක කාලා බලන්න කියලා. ඔබ මොකද කරන්නේ, ඒ රස කැවිලි කෑල්ල අරගෙන කටට දාලා හපනවා. එතකොට මොකද වෙන්නේ? රස වැටෙනවා. ඊට පස්සේ ඔබ අහනවා මේක කීය ද කියල. ඊට පස්සේ එයා කියනවා මේක මෙච්චර ගාණයි කියලා. ඊට පස්සේ එයා වෙන ජාතියක් දීලා කියනවා මේකෙනුත් කාලා බලන්න කියලා. ඊට පස්සේ ඔබ මොකද කරන්නේ ඒකෙනුත් කාලා බලනවා.

මොකද වුනේ? දිව යි, රසය යි, විඤ්ඤාණය යි එකතු වුනා. දිව යි, රසය යි, විඤ්ඤාණය යි එකතු වුන ගමන් ම මොකද වුනේ? අන්න විඳීමක් හටගත්තා. ඒ විඳීමට ඔබේ හිත ඇදිලා යනවා. ඔබේ හිත ඇදිලා ගිය එක කීය ද කියලා අහනවා, ඔබ ඒක ගන්නවා.

## දෙසවන් පිනවීම...

ශබ්දයත් ඒ වගේ. ඔබ යනවා කඩේකට. ගියා ම ඔබ ආස කරන ගීතයක් රෙකෝඩ් කරලා දාලා දෙනවා. මේක හොඳ ද කියලා අහනවා. එතකොට කණ යි, ශබ්දය යි, විඤ්ඤාණය යි එකතුවෙනවා. විඳිනවා. ඔබේ හිත ඇදිලා යනවා, අන්න ඒක ඔබ ඉල්ල ගන්නවා. එහෙම නම් පින්වතුනි, අපි මේ හිත ඇදිලා යන්නේ වින්දනයක් ලැබූ දේකට යි.

හැබැයි මේක තේරුම් ගන්න තියෙන්නේ තමා තුලින්. බාහිර කෙනෙක් තුලින් නෙවෙයි. අපේ හිත ඇදිලා යන්නේ මොකේට ද? වින්දනයක් ලැබෙන දේකට ම යි හිත ඇදිලා යන්නේ. වින්දනයක් ලැබෙන්නේ නැත්නම් ඒකට හිත ඇදිලා යන්නෙ නෑ. නමුත් පින්වතුනි, දැන් බලන්න හිතලා, අපේ හිත ධර්මයට ඇදිලා යනවා. ධර්මයට ඇදිලා යන්නේ ඇයි? අන්න ඒක තමයි ධර්මයේ තියෙන ආශ්චර්ය ය.

දැන් අපි ගත්තොත් සංගීත සංදර්ශනයක දී ඒ සිංදු අහලා නටලා ඉවර වුනා ම එයාට විශාල වෙහෙසක්, විශාල මහන්සියක්, විශාල හතියක් ඉතුරු වෙනවා. මොකක් ද මේ කියලා හිතෙනවා. ධර්මය ඊට වෙනස් එකක්. ධර්මය අහලා ඉවර වුනා ම එයාට අවදිවුනා වගේ අලුතින් එයාට ප්‍රාණයක්, ලොකු සැනසිල්ලක්, ලොකු ශක්තියක් ලැබෙනවා. අන්න ඒකයි මේ ධර්මයේ තිබෙන වෙනස.

## ධර්මයට හිත ඇදිලා යන්නේ ඇයි?

ඉතින් පින්වතුනි, බුදුරජාණන් වහන්සේ වදාළා, විඳින දේට තමයි හිත ඇදිලා යන්නේ. ඉතින් ඔබට ඇතිවෙනවා, සැප විඳීම්. දුක් විඳීම් ඇතිවෙනවා. උපේක්ෂා විඳීම් ඇතිවෙනවා. ඔබට හිතෙන්න පුළුවන් සැප විඳීමට විතරයි හිත ඇදිලා යන්නේ කියලා. දුක් විඳීමටත් හිත ඇදිලා යනවා. අපි කියමු ඔබට යම්කිසි කාරණයකට හිතින් දුක් විඳිනවා කියල. ඔබ දුක් වෙවී ඉන්නවා. දැන් ඔබේ යාලුවෙක් ඔබට කියනවා, "නෑ.... නෑ.... ඔයා දුක් වෙවී ඉන්න ඕනෙ නෑ. ඔයා ඕක අතාරන්න" කියල. එයා කැමතිද අතාරින්න. එයා කැමතියි ඒ දුක විඳ විඳ ඉන්න. දුකට ත් මිනිස්සු කැමතියි. මධ්‍යස්ථභාවයක් පිළිබඳ සාමාන්‍යයෙන් වටහා ගැනීමක් නෑ. මුලාවක් ම යි තියෙන්නේ. මේ නිසා මේකට හිත ඇදිලා යනවා.

## ස්පර්ශය තේරුම් ගනිමු

බුදුරජාණන් වහන්සේ වදාළා මේ විඳීමට හිත ඇදිලා යන්නේ ස්පර්ශය නිසා. මම කිව්වෙ දැන් අර ඇහෙන් රූපයක් දැක්ක ම ඇහැ යි, රූපය යි, විඤ්ඤාණය යි එකතු වෙනවා කියලා. අන්න ඒක තමයි ස්පර්ශය. කණෙන් ශබ්දයක් අහනකොට කණ යි, ශබ්දය යි, විඤ්ඤාණය යි එකතු වෙනවා ඒක තමයි ස්පර්ශය. නාසයට ගඳ සුවඳ දැනෙන කොට නාසය යි, ගඳ සුවඳ යි, විඤ්ඤාණය යි එකතු වෙනවා. ඒක ස්පර්ශය. දිවට රස දැනෙන කොට දිව යි, රසය යි, විඤ්ඤාණය යි එකතු වෙනවා. ඒක ස්පර්ශය. කයට පහසක් දැනෙන කොට, කය යි, පහස යි, විඤ්ඤාණය යි එකතු වෙනවා. ඒක ස්පර්ශය. මනසට අරමුණු දැනුනා ම මනස යි, අරමුණු යි, විඤ්ඤාණය යි එකතු වෙනවා. ඒක ස්පර්ශය.

බුදුරජාණන් වහන්සේ වදාළා මේක අපේ ජීවිත තුළ ක්‍රියාත්මක වෙන්නේ හම ගැසූ ගව දෙනක් වගේ. පණ පිටින් ඉන්න ගව දෙනක් හම ගහලා ලිහලා අරිනවා. එයාව ලෙහල දානවා. එතකොට මේ ගව දෙන වතුරට බැස්සොත් වතුරෙ ඉන්න සත්තු මොකද කරන්නේ? මේ ගවදෙනව කනවා. මේ ගව දෙන ගහකට හේත්තු වෙනවා. මොකද වෙන්නේ? ගහ ඇසුරු කරගෙන ඉන්න සත්තු මේ ගව දෙන කනවා. මේ ගව දෙන හිටියොත් එළිමහනෙ, එළිමහනෙ ඉන්න සත්තු ටික මේ ගවදෙන කනවා.

මෙන්න මේ වගේ තමයි අපට මේ ස්පර්ශයෙන් ගැලවෙන්න බෑ. ඇහෙන් රූප දකින කොට ඇහැ යි, රූපය යි, විඤ්ඤාණය යි එකතු වෙනවා, කණින් ශබ්ද අහන කොට.... නාසයට ගඳ සුවඳ දැනෙන කොට... දිවට රස දැනෙන කොට.... කයට පහස ලැබෙන කොට.... මනසට අරමුණු ඇති වෙනකොට මනස යි, අරමුණු යි, විඤ්ඤාණය යි එකතු වෙනවා. මේ නිසා ස්පර්ශයෙන් ගැලවෙනවා කියන එක ලේසි එකක් නෙවෙයි. නමුත් අපට ගැලවෙන්න පුළුවන්. අපි ගැලවෙන්නේ ස්පර්ශය නැති කරලා නොවෙයි. අපි මොකක් ද කරන්නේ? සිහිය උපද්දවලා අවබෝධ කරනවා.

## සිහියෙන් සිටියොත් ....

සිහිය කියන්නේ මොකක් ද? සිහිය කියන්නේ සතිය. සතිය කියන්නේ අවධානයෙන් සිටීම. අවධානයෙන් සිටීම කියන්නේ මෙහෙම එකක්. දැන් අපි ගත්තොත්, අපි කිරි හොද්දක් හදනවා. හැඳි ගාන

කොට අපි අවධානයෙන් ඉන්නවා කිරිහොද්ද උතුරයි ද කියලා. ඒ වගේ අවධානයක් නෙවෙයි මේ කියන්නේ. අපි මෙතන අවධානය කියන්නේ සිහියෙන් ඉන්නවා කයේ ඇත්ත ගැන. අපි සිහියෙන් ඉන්නවා විඳීම් ලැබෙන කොට විඳීම් ගැන. අපි සිහියෙන් ඉන්නවා මේ අපේ සිත ගැන. අපි සිහියෙන් ඉන්නවා මේ වෙනස් වන දේ හඳුනාගෙන. මෙන්න මේ සිහිය තමයි සතිපට්ඨානය. අන්න ඒ සතිපට්ඨානයේ පිහිටුවාගන්න පුළුවන් එක්කෙනා මේ සිතේ මේ ස්වභාවයට ඉඩ දෙන්නෙ නෑ.

අන්න එයා වීරිය ඇතිකරගන්නවා. වීරිය ඇති කරගත්තා ම පුදුම විදිහට අපිට මේ ජීවිතේ ජය ගන්න පුළුවන්. ඕනෑම දුෂ්කර අවස්ථාවකට අපිට මූණ දෙන්න පුළුවන්. ඉතින් ඔබේ මේ හැකියාව පාවිච්චි කරන්න මේ ධර්ම මාර්ගය දියුණු කරගන්න. දැන් අපිට බඩගින්න එනවා, පිපාසය එනවා ඉවසන්න පුරුදු වෙන්න ඕනෙ. වැස්ස එනවා, අව්ව එනවා, ඉවසන්න පුරුදු වෙන්න ඕනෙ. මේ ඔක්කොම ඉවසුව හැකියි. නින්දා අපහාස එනවා, ඒව ඉවසන්න පුරුදු වෙන්න ඕනෙ. නොයෙක් ආකාරයේ අභූත චෝදනා එනවා. ඒවා ඉවසන්න පුරුදු වෙන්න ඕනෙ. මේ ඉවසන්න පුරුදු වෙමින් අපි ඒ මත්තෙ නහින්න හොඳ නෑ. මොකද අපි කරන්න ඕනෙ මේ ජීවිතය අවබෝධ කරගන්නයි.

## මෙන්න මෙහෙම හිතන්න පුරුදුවෙන්න

ප්‍රශ්නයක් එනකොට හිතන්න මෙහෙම. මම ඉපදුණු නිසා තමයි මෙහෙම වුනේ. ඉපදුනේ නැත්නම් මෙහෙම වෙන්නේ නැහැනේ. ඊළඟට හිතන්න මම ඉපදුනේ භවයක් තිබුණු නිසා නේ. භවයක් තිබුනෙ නැත්නම් ඉපදෙන්නේ නෑනේ. ඊළඟට හිතන්න භවයක් හැදුනේ උපාදාන නිසා නේ. උපාදාන නැත්නම් භවයක් නෑනේ. ඊළඟට හිතන්න උපාදාන තිබුනේ තණ්හාව නිසා නේ. තණ්හාවක් නැත්නම් උපාදාන නෑනේ. මගේ මේ හිත ඇදිලා ගියේ වින්දනයක් නිසා නේ. විඳීමක් නැත්නම් තණ්හාවක් නෑනේ. මගේ හිතට මේ වින්දනය ආවේ ස්පර්ශය නිසා නේ. ස්පර්ශය නැත්නම් විඳීමක් නෑනේ. ස්පර්ශයක් හැදුනේ බුදුරජාණන් වහන්සේ වදාළා ආයතන හයක් නිසා. මොකක් ද මේ ස්පර්ශය ඇතිවෙන්න හේතු වෙච්ච ආයතන හය?

## මොනව ද මේ අරුම පුදුම ආයතන හය?

ඇස, කණ, නාසය, දිව, ශරීරය, හිත. මේ ගැන අපි හිතේ සිහිය පිහිටුවාගෙන හිටියෙ නැත්නම්, අපි අවබෝධ කර ගන්න

කල්පනා කළේ නැත්නම්, අපි සියලු දෙනාට එක ඉරණමකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඒ තමයි වයසට යන්න යන්න මේ ඉන්ද්‍රියන් දුර්වල වෙනවා. මේ ඉන්ද්‍රියන් දුර්වල වෙච්ච ගමන් වයසට යන්න යන්න අපේ කල්පනාව නැතුව යනවා. කල්පනාව නැතිව ගියා ම තනිකර ම බලපවත්වන්නේ කර්මය විතරයි. අන්න ඒ කර්මය සමහර විට අපිට කොයි ලෝකෙකට අරගෙන යයි ද කියලා අපි දන්නෙ නෑ.

අපේ වාසනාවට අපි මේ මිනිස් ලෝකෙ ඇවිල්ලා ඉපදුනා. අපේ වාසනාවට අපිට මේ ගෞතම බුදුරජාණන් වහන්සේගේ ධර්මය මේ සූත්‍ර පොත් වල ලියවිලා තිබුණා. නැත්නම් අපි දන්නෙ නෑනේ මේ ධර්මය මෙහෙම එකක් කියලා. අපේ වාසනාවට ඒවා ලියැවිලා තිබුණා. අපේ වාසනාවට ඒවා අපට තේරෙනවා. අපට ඒවා අවබෝධ කරන්ට පුළුවන්. ඉතින් මේ නිසා පින්වතුනි, අපට ඉතා ම පැහැදිලියි මේ ඇස, කණ, නාසය, දිව, කය, මනස කියන ආයතන හය තියෙනකම් ම දිගින් දිගට ම සත්වයා දුක කරා යනවා.

## අඳුරු සෙවණැල්ලෙන් වසාගත් සත්වයා

දැන් ඔබ හිතලා බලන්න, යමක් හිතට හිතුනා ම අපි දෙපාරක් හිතන්නෙ නැතිව අපි කරනවා තමයි. නමුත් අන්තිමට ඔබ තනි වෙච්ච වෙලාවට, බුදුරජාණන් වහන්සේ වදාළා පව් කරපු එක්කෙනෙක් තනිවෙච්ච වෙලාවට එයාගේ ජීවිතේ මේ වගේ කියලා, ඔන්න ගෙයක් තියෙනවා. ඉර බැහැගෙන යනකොට ඒ ගෙදර හෙවනැල්ල පොලොවට වැටෙනවා. එයා ගේ පිළිකන්නෙ වාඩි වෙලා ඉන්නකොට අර හෙවනැල්ලෙන් එයාගේ ශරීරය සම්පූර්ණයෙන් ම වැහිලා යනවා. ඒ වගේ තමයි අකුසල් කෙරුවට පස්සේ අකුසල් වලින් එයාගේ ජීවිතේ වහගන්නවා. ඊට පස්සේ එයාට ඒවගෙන් නැගී සිටින්න බෑ. එහෙම නම් අපි දැනගන්න ඕනෙ මේ පටිච්ච සමුප්පාදය හැදෙන්නේ මේ විදිහටයි කියලා.

## ආයතන වල නිෂ්පාදකයා - නාම රූප

ඊළඟට බුදුරජාණන් වහන්සේ වදාළා, මේ ඇස, කණ, නාසය, දිව, කය, මනස කියන ආයතන හය හැදෙන්නේ නාම රූප නිසා. නාම රූප ගැන බුදුරජාණන් වහන්සේ වදාළේ මෙහෙමයි.

රූප කියලා කියන්නේ සතර මහා ධාතූන්ගෙන් හට ගත්ත දේවල්. නාම කියලා වදාළේ කරුණු පහකට. ස්පර්ශය නාමයක්. විඳීම,

වේදනාව නාමයක්. සංඥාව, හඳුනාගැනීම නාමයක්. සංස්කාර, ඒ කියන්නේ චේතනාව. චේතනාව කියන්නේ කර්මය යි. දැන් ඔබ හොඳට හිතලා බලන්න ඇස් පිල්ලමක්වත් ගහන්න බෑ චේතනාවක් පහළ කරන්නෙ නැතිව. චේතනාවක් පහළ කරන්නෙ නැතුව ඇස් පිල්ලමක් ගහන්න පුළුවන් ද බලන්න. චේතනාවක් පහළ කරල යි ඇස් පිල්ලමක් ගහන්නේ. එච්චර වේගයෙන් මේ චේතනාව ක්‍රියාත්මක වෙනවා. මේ චේතනාව තමයි කර්මය. මේ චේතනාව මුල්කරගෙන තමයි අපි කයින් ක්‍රියා කරන්නේ, වචන කථා කරන්නේ, මනසින් හිතන්නේ. මේ නිසා ඒ ඔක්කොම නාම. එතකොට නාම කියලා කියන්නේ වේදනා, සංඥා, චේතනා, ඵස්ස, මනසිකාර.

මනසිකාර කියලා කියන්නේ මේ මනස ක්‍රියාත්මක වීම. දැන් මම ඒකට කියන්නම් තේරෙන එකක්. දැන් ඔබ ගමනක් යනවා. ඔබ ගමනක් යන්නේ අසවල් කඩෙන් මේ බඩුවක් ගන්න යනවා කියලා පයින් යනවා. යනකොට ඔබ වෙන කල්පනාවක වැටෙනවා. දැන් කඩේ ඉස්සරහින් යනවා. නමුත් ඔබට බඩුව ගන්න පුළුවන් වුනා ද? නෑ. ඒකට හේතුව මොකක් ද? අන්න... ඒක ඔබේ මනසට එන්නෙ නෑ. දැන් ඔබට කඩේ පේනවා. පෙනුනට ඔබට ඕනෙ කාරණය හිතා ගන්න බෑ. ඇයි ඔබේ මනසිකාරය වෙන පැත්තකට යොමු වෙලා. මේ වගේ කියනවා මේ අභ්‍යන්තරයේ නාම රූපයන්ගේ ක්‍රියාකාරීත්වය. ඇස, කණ, නාසය, දිව, කය, මනස කියන ආයතන හය ම පවතින්නෙ හේතුවක් නිසා.

## නාම රූප පවතින්නේ විඤ්ඤාණය නිස යි.

ඊළඟට බුදුරජාණන් වහන්සේ වදාළා, මේ නාම රූපයන් පවතින්නේ විඤ්ඤාණයේ ක්‍රියාකාරීත්වය මත. බුදුරජාණන් වහන්සේ විඤ්ඤාණය පෙන්වා දෙන්නේ පැලවෙන දෙයක් වගේ කියල යි.

දැන් අපි ගනිමු, මේ ගස් කොළන් ඔක්කොම පැලවෙන දේවල්. මේ ගස් කොළන් පැළ වෙන්න නම්, පොළොව ඕනෙ, වතුර ඕනෙ, කොච්චර පොළව තිබුණත්, වතුර නැත්නම් පැළ වෙන්නෙ නෑ. බුදුරජාණන් වහන්සේ වදාළා මේ රූප කියන්නේ සතර මහා ධාතූන්ගෙන් හටගත්තු දේවල්. විඳීම, සංඥාව කියන්නේ හඳුනා ගැනීම, චේතනාව කියන්නේ කර්මය, මෙන්න මේ හතර පොළොව වගේ මේ විඤ්ඤාණය පවතින්නෙ. එතකොට මොකද වෙන්නේ? මේ තණ්හාව නැමැති වතුර වැටෙන කොට ම මේ විඤ්ඤාණය පැලවෙනවා.

# පැල සිටුවීමේ මහා තරඟය...

අන්න ඒ වගේ තමයි අපි ඇහෙන් රූපයක් දකිනවා. අපි ඇහෙන් රූපයක් දකින කොට ම විඤ්ඤාණය පැලවෙනවා. කණෙන් ශබ්දයක් අහන කොට ම විඤ්ඤාණය පැලවෙනවා. නාසයෙන් ගඳ සුවඳ ආඝ්‍රාණය කරන කොට ම විඤ්ඤාණය පැලවෙනවා. දිවෙන් රස දැනෙන කොට ම විඤ්ඤාණය පැලවෙනවා. කයෙන් පහස දැනගන්න කොට ම විඤ්ඤාණය පැලවෙනවා. මනසට සිතුවිල්ලක් සිතෙන විට ම විඤ්ඤාණය පැලවෙනවා. මේ පැලවෙන විඤ්ඤාණය මැරිලා යන්න නම්, තණ්හාව නැතුව යන්න ඕනෙ.

හිත ඇදිලා යන්නේ නැත්නම් විඤ්ඤාණය මැරිලා. රූප තණ්හා නෑ. ශබ්ද තණ්හා නෑ. ගන්ධ තණ්හා නෑ. රස තණ්හා නෑ. ස්පර්ශ තණ්හා නෑ. ධම්ම තණ්හා නෑ. ඒ කියන්නේ විඤ්ඤාණය මැරිලා. එහෙම නම් විඤ්ඤාණය දිගින් දිගට ම පවතින්නේ පටිච්ච සමුප්පාදය තුළින්.

## මෙන්න පැල වලට උදව් දෙන අය...

බුදුරජාණන් වහන්සේ වදාළා මෙන්න මේකට තවත් උපකාරයක් තියෙනවා. ඒවාට කියන්නේ සංස්කාර. ඒ සංස්කාර තමයි කය හා බැඳී ගිය සංස්කාර තියෙනවා. ඒ තමයි ආශ්වාස, ප්‍රශ්වාස දෙක. මේ විඤ්ඤාණය පවතින්ට අපට පණ තියෙන්න ඕනෙ. දැන් මේ ආශ්වාස ප්‍රශ්වාස දෙක මේ විඤ්ඤාණය පවතින්න උපකාර වන දෙයක්. ඒ නිසා ආශ්වාස ප්‍රාශ්වාස දෙක හේතු වෙනවා විඤ්ඤාණයේ පැවැත්මට. ඊළඟට බුදුරජාණන් වහන්සේ වදාළා මේ වචන කථා කිරීම. මේ වචන කථා කිරීමත්, විඤ්ඤාණයේ ක්‍රියාකාරීත්වයට රුකුල් දෙන එකක්. ඊළඟට බුදුරජාණන් වහන්සේ වදාළා සංඥාව, ඒ කිවුවෙ හඳුනාගැනීම, වේදනාව ඒ කිව්වෙ විඳීම. මේවා ඇති වෙන්නේ ස්පර්ශයෙන්. ස්පර්ශය තියෙන කොට එතන විඤ්ඤාණය තියෙනවා. එතකොට මේ ක්‍රියාකාරීත්වය මත තමයි විඤ්ඤාණය පවතින්නේ.

# මේ ඔක්කොට ම මුල නො දන්න කම.

බුදු රජාණන් වහන්සේ වදාළා මේ සියල්ල ට හේතුව තමයි අවබෝධයක් නැතිකම. මොකක් ද අවබෝධයක් නැතිකම කියන්නේ? චතුරාර්ය සත්‍යය ගැන අවබෝධයක් නැතිකම. චතුරාර්ය සත්‍යය ගැන අවබෝධයක් නෑ කියන්නේ එතන තියෙන්නේ අවිද්‍යාව.

ඒ අවිද්‍යාව මුල් කරගෙන සංස්කාර හැදෙනවා. සංස්කාර නිසා විඤ්ඤාණය හැදෙනවා. විඤ්ඤාණය නිසා නාම-රූප හැදෙනවා. නාම-රූප නිසා ඇස, කණ, නාසය, දිව, කය, මනස හැදෙනවා. ඇස, කණ, නාසය, දිව, කය, මනස නිසා ස්පර්ශය හැදෙනවා. ස්පර්ශය නිසා විඳිනවා. විඳින දේට හිත ඇදිලා යනවා. හිත ඇදිලා ගිය දේට අපි අහුවෙනවා. අහුවෙලා අපි කයෙන් ක්‍රියා කරනවා, වචනයෙන් ක්‍රියා කරනවා. මනසින් ක්‍රියා කරනවා. එතකොට විපාක දෙන්න කර්ම හැදෙනවා. විපාක දෙන්න කර්ම හැදෙන නිසා උපදිනවා. උපදින නිසා අපි මේ ඔක්කොට ම මූණ දෙන්න ඕනෙ.

## ඉස්සෙල්ලා ම කරන්න ඕනෙ මොකක් ද?

එතකොට අපි ඉස්සෙල්ලා ම කරන්නේ තණ්හාව නැති කිරීම නෙවෙයි. අපි ඉස්සෙල්ලා ම කරන්නේ මෙතන සිදුවෙන්නේ මෙන්න මේ දෙය යි, මෙන්න මේ ක්‍රියාකාරීත්වය තමයි මෙතන තියෙන්නේ කියලා තමන්ගේ ජීවිතේ ක්‍රියාකාරීත්වය විමසලා බලනවා. පටිච්ච සමුප්පාදය විමසලා බලනවා.

විමසලා බලනකොට මෙයාට අවබෝධ කරගන්න පුළුවන් වෙනවා මේ ජරා මරණ ඔක්කොම ඉපදීම හේතු කරගෙනයි තියෙන්නේ. ඉපදීමක් නැත්නම් ජරා මරණ නෑ කියල. ඉපදෙන්නේ එක්කෝ බිත්තරයක් අස්සේ, එක්කෝ තෙත් පරිසරයක, එහෙම නැත්නම් මව් කුසක, එහෙම නැත්නම් ඕපපාතිකව. මේ කිසිම ආකාරයකින් උපදින්නෙ නැත්නම් ජරා මරණ නෑ.

උපදින්නේ කුමක් නිසා ද? භවයක් නිසා. කාම භවය, රූප භවය, අරූප භවය තියෙන නිසයි උපදින්නේ. කාම භවය, රූප භවය, අරූප භවය නැත්නම් ඉපදීමක් නෑ. කාම භවය, රූප භවය, අරූප භවය නැත්නම්, ඉපදීමක් නැත්නම්, එහෙම නම් අපට තේරෙනවා අපි නිදහස් වෙන්න ඕනෙ කවදා හරි මේ කාම භවයෙන්, රූප භවයෙන්, අරූප භවයෙන්. කාම භවය, රූප භවය, අරූප භවය හැදෙන්නෙ නෑ උපාදාන නැත්නම්. උපදාන නිසයි මේක හැදෙන්නෙ. උපාදාන නැත්නම් භවය හැදෙන්නෙ නෑ. උපාදාන හැදෙන්නෙ නෑ, ඒ කිව්වේ මේවාට හසුවෙන්නෙ නෑ. බැඳෙන්නෙ නෑ. ග්‍රහණය වෙන්නෙ නෑ. මේවාට හිත ඇදිලා ගියේ නැත්නම්. හිත ඇදිලා යන්නේ තණ්හාවෙන්. තණ්හාවෙන් හිත ඇදිලා යන්නෙ නැත්නම් අපි නිදහස්.

## පටිච්ච සමුප්පාදය නිරුද්ධ වෙන හැටි...

හිත ඇදිලා යන්නේ විඳින නිසා. විඳීමක් නැත්නම් හිත ඇදිලා

යන්නෙ නෑ. විඳින්නෙ ස්පර්ශය නිසා. ස්පර්ශය නැත්නම් විඳීමක් නෑ. එතකොට ස්පර්ශය ඇතිවෙන්නේ ආයතන හයක් නිසා. මේ ඇසක් නැත්නම්, කණක් නැත්නම්, නාසයක් නැත්නම්, දිවක් නැත්නම්, කයක් නැත්නම්, මනසක් නැත්නම් කවුද ඉන්නේ ස්පර්ශයක් ලබන්න. කිසි දෙයක් නෑ. නාම රූප නැත්නම් ආයතන හයක් නෑ. එතකොට බුදුරජාණන් වහන්සේ පෙන්නලා දෙනවා විඤ්ඤාණයේ ක්‍රියාකාරීත්වයක් නැත්නම් නාම රූප නෑ. ඊළඟට බුදුරජාණන් වහන්සේ පෙන්වනවා, ආශ්වාස ප්‍රාශ්වාස නැත්නම්, අවිද්‍යා සහගත විතක්ක විචාර නැත්නම්, අවිද්‍යා සහගත හැඳිනීම්, විඳීම් නැත්නම් මේ පටිච්ච සමුප්පාදය නැතිවෙලා යනවා.

## විද්‍යාව පහළ වෙනවා...

එහෙමනම් අවිද්‍යාව නැතිවෙන්න විද්‍යාව පහළ වෙන්න ඕනෙ. විද්‍යාව පහළ වෙනව කියන්නේ පින්වතුනි, මොකක් ද? චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කර ගැනීම තමයි, විද්‍යාව පහළ වීම. මෙන්න මේ විද්‍යාව පහළ කර ගැනීම අපේ ජීවිත වලට කරගන්න පුළුවන් දෙයක්. අන්න ඒක කරගත්තොත් පින්වතුනි, තම තමන් විසින් තම තමන් තුළින් විද්‍යාව පහළ කරගන්න තියෙන්නේ. අන්න ඒකට තියෙන මාර්ගය මොකක් ද? ආර්ය අෂ්ඨාංගික මාර්ගය යි. අන්න ඒ ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ අපි ගමන් කරන්න ඕනෙ. ඒ ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ගමන් කිරීමෙන් තමයි මේ පටිච්ච සමුප්පාදයෙන් අපිට නිදහස් වෙන්න පුළුවන් වෙන්නේ. තව කෙනෙකුට තව කෙනෙකුගේ කර්මයෙන් උපකාර කරන්න පුළුවන්කමක් නෑ. බුදුරජාණන් වහන්සේ උපමාවක් පෙන්නලා දීලා තියෙනවා මෙන්න මෙහෙම.

## ප්‍රාර්ථනාවෙන් කරන්න පුළුවන් ද?

ඔන්න පව් කරන කෙනෙක් ඉන්නවා. මේ කෙනා මැරෙනවා. මැරිලා ගිහින් නිරයේ උපදිනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කළා, අන්න ඒ කෙනා එයාගේ යාළුවෝ ටික එකතු වෙලා ප්‍රාර්ථනා කරනවා, අනේ අපේ ඤාතියා සුගතියේ උපදීවා කියලා. සුගතියේ උපදියි ද? නෑ. මොකද හේතුව? එයා පව්කලා. ඒ නිසා එයා ගිහිල්ලා නිරයේ උපදිනවා. බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාළා ඒක හරියට මේ වගේ එකක් කියලා.

වතුර ජලාශයකට විශාල කළු ගලක් දානවා. එතකොට ඒ ගල වතුරේ යටට යනවා. පිරිසක් ඇවිල්ලා වැඳගෙන කියනවා, "අනේ පින්වත් ගල, උඩට එන්න. අනේ පින්වත් ගල, උඩට එන්න." ගල

උඩට එනව ද? නෑ. ප්‍රාර්ථනාවෙන් කරන්න බෑ. මෙන්න මේ වගේ කියනවා අකුසලය කරපු එක්කෙනා නිරයේ ඉපදුනාට පස්සේ, තිරිසන් යෝනියේ ඉපදුනාට පස්සේ බේරෙන්න බෑ.

## මරණින් පසුව කරන්න ඉතිරි කරගන්න එපා..

ඒකයි අපි බොහෝ විට කියන්නේ මේ මැරුණට පස්සේ දෙන පාංශු කූලෙන් නෙවෙයි මනුෂ්‍යයෙක් සුවපත් කරන්නේ. මැරුණට පස්සේ දෙන දානවලින් නෙවෙයි මනුෂ්‍යයෙක් සුවපත් වෙන්නේ. මැරෙන්න ඉස්සෙල්ලා එයා ජීවිතේ තමන් විසින් හදා ගන්න ඕනෙ. දැන් අපි මැරුණට පස්සේ අපි දානෙ දෙනවනේ. ප්‍රේත ලෝකයේ හිටියොත් විතරයි අනුමෝදන් වෙන්නේ. නිරයේ එහෙම හිටියොත් අනුමෝදන් වෙන්නේ නෑ. තිරිසන් අපායේ ඉපදුනොත් ඒත් අනුමෝදන් වෙන්නෙ නෑ. මිනිස් ලෝකේ ඉපදුනොත් ඒත් අනුමෝදන් වෙන්නෙ නෑ. ඒ නිසා මරණයට පත් වෙච්ච එක්කෙනෙක් සම්බන්ධයෙන් දානෙ දීලා පින්දෙන්න ඕනෙ. නමුත් මැරෙන්න ඉස්සෙල්ලා ම එයා දැන ගන්න ඕනෙ, සුගතියේ ජීවිතේ හරිගස්සගන්න.

## සුගතියේ යන්න ජීවිතය හදාගන්න

බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා මේ සුගතිය කරා යන ජීවිතේ මෙන්න මේ වගේ එකක් කියලා, දවසක් මහානාම කියලා බුදුරජාණන් වහන්සේගේ ගිහි කාලේ සහෝදරයෙක්, ශාක්‍ය කුමාරයෙක්. බුදුරජාණන් වහන්සේව බැහැදකින්න ඇවිල්ලා බුදුරජාණන් වහන්සේට කියා හිටියා, "ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, මම නගරයට ගියාට පස්සේ නගරයේ වෙළෙන්දොත් එක්ක කථා බහට හසුවෙනවා. යාන වාහනත් එක්ක මම මිශ්‍ර වෙනවා. එතකොට මට ධර්මය සිහිකරන්න බැරුව යනවා. එතකොට මට සැකයක් ඇතිවුනා භාග්‍යවතුන් වහන්ස, ඒ වගේ අවස්ථාවක මම මැරුණොත් මම කොහේ යයි ද?" කියලා.

බුදුරජාණන් වහන්සේ වදාළා, "හා... හා... මහානාම, භය වෙන්න එපා. ඔබ බොහෝ කාලයක් බුදුරජාණන් වහන්සේව සරණ ගියපු කෙනෙක්. ඔබ බොහෝ කාලයක් ඒ ධර්මය සරණ ගිය කෙනෙක්. ඔබ බොහෝ කාලයක් ඒ ශ්‍රාවකයින් සරණ ගිය කෙනෙක්. ඔබ බොහෝ කාලයක් තෙරුවන් සරණ ගිය කෙනෙක්. ඉතින් ඒ නිසා ඔබ මැරුණට පස්සේ සුගතියේ ම යි උපදින්නේ" කියලා බුදුරජාණන් වහන්සේ උපමාවක් පෙන්නුවා.

## වළං කටු යටට... ගිතෙල් ටික උඩට...

උපමාව තමයි, කෙනෙක් මැටි භාජනයක ගිතෙල් පුරවාගෙන යනවා. යනකොට මේ භාජනය, තමන් ගඟක් උඩින් පාලමකින් යනකොට වැටෙනවා. වැටුනට පස්සේ මේ මැටි භාජනය බිඳෙනවා. බිඳුනට පස්සේ මොකද වෙන්නේ? ගිතෙල් ටික කෙලින් ම උඩට එනවා. මෙන්න මේ වගේ කියනවා, අවබෝධයෙන් ම තිසරණයේ පිහිටපු එක්කෙනා හදිසි අනතුරකින්වත්, කරදරයකින්වත්, සතුරු පීඩාවක දී හරි හදිසි අවස්ථාවකදී හරි මරණයට පත්වුණොත් අර ගිතෙල් කළයක් හදිස්සියේ අතඇරෙන කොට වළං කටු ටික යටට ගියා වගේ මේ කුණු ශරීරය ඉතුරු වෙනවා. එයාගේ මනස සුගතිගාමී වෙනවා.

## බුදුසරණ යමු අපිත් - පිළිසරණ සදා දුන්...

මේකෙන් අපිට පැහැදිලිව පේනවා, බුදුරජාණන් වහන්සේගේ ධර්මයෙන් අපිට කොයිතරම් පිහිටක් පිළිසරණක් ලබාගන්න පුළුවන් ද කියලා. ඒ නිසා අපි හොඳට තේරුම්ගත යුතුයි, බුදුරජාණන් වහන්සේ කිසි ම ශ්‍රාවකයෙකුට ඔබට දැන් පින් මදි, ඔබට දැන් පාරමිතා මදි, කියන ඒවා බුදුරජාණන් වහන්සේගේ අදහස් නෙවෙයි. ඒ සියල්ල පසු කාලීන අදහස්. කිසිම බුද්ධ දේශනාවක සෝවාන්, සකදාගාමී ආදී මාර්ගඵල ලබන්න පාරමිතා අවශ්‍ය යි කියලා නෑ. බොහෝ දේශනා වල තියෙන්නේ සෝතාපත්ති අංග හතරක්.

## කළ්‍යාණ මිත්‍රයා හඳුනාගන්න...

ඒ අංග හතර තමයි කළ්‍යාණ මිත්‍ර සේවනය, සද්ධර්ම ශ්‍රවණය, යෝනිසෝ මනසිකාරය, ධම්මානුධම්ම පටිපදාව. අපිට කළ්‍යාණ මිත්‍රයෝ ඉන්නවා නම්, අපි මේ කවුරුවත් හිස් අතින් මැරෙන්නේ නෑ. කළ්‍යාණ මිත්‍රයා මේ සංසාර ගමන වර්ණනා කරන්නේ නෑ. කළ්‍යාණ මිත්‍රයා මේ ජීවත් වෙන්න තියෙන අවස්ථාව කොයිතරම් සුළු අවස්ථාවක් ද කියලා, පෙන්නා දෙනවා. කළ්‍යාණ මිත්‍රයා මේ සුළු අවස්ථාව කොහොම හරි ප්‍රයෝජනයට ගන්නවා. ඒ ගන්න ආකාරයට කියලා දෙනවා. ඒ නිසා අපි කියමු අපිට වෙලාව මදි, අපිට කාලය නෑ, අපිට වැඩ තියෙනවා කියලා අපි ඉන්නවා. හදිසි අනතුරකින් අපි මැරෙනවා. මොකද වෙන්නේ? ඊට පස්සේ අපි මේ ආපු සංසාර ගමනේ කොහේට හරි විසිවෙලා යයි. ඊට පස්සේ සමහර විට අපිට කල්ප ගානකින් ගෙදර කට්ටිය මුණ ගැහෙන්නේ නෑ. ඉතින් මෙහෙමයි අපි මේ සංසාරෙ යන්නේ.

ඒ නිසා අපි හොඳට තේරුම් ගන්න ඕනෙ, කල්‍යාණ මිත්‍රයා පිරිසිදු බුද්ධ දේශනාව ම යි කියාගෙන යන්නේ. කල්‍යාණ මිත්‍රයාගෙන් තමයි චතුරාර්ය සත්‍යය ධර්මය අසන්න ලැබෙන්නේ. ප්‍රමාද කරවන්නෙ නෑ. බුදුරජාණන් වහන්සේ දේශනා කළා, බුදුරජාණන් වහන්සේ දේශනා කරපු සමස්ථ ධර්මය, ඒ කියන්නේ සතර සතිපට්ඨානය, සතර ඍද්ධිපාද, සතර සම්‍යක් ප්‍රධාන වීර්යය, පංච ඉන්ද්‍රිය, පංච බල, සප්ත බොජ්ඣංග, ආර්ය අෂ්ඨාංගික මාර්ගය, චතුරාර්ය සත්‍යය මේ සියල්ල ම එක වචනයක් ඇතුළට දාන්න පුළුවන් කියලා. ඒක මේ වගේ එකක් කියනවා.

## ඇත් පා සළකුණේ උපමාව....

දැන් මේ අපිට තියෙන්නේ මිනිස්සුන්ගේ පාද සටහන් නේ. මේ සතුන්ගේ පා සටහන් අතර ලොකු ම පා සටහන කාගෙ ද? හස්ති රාජයාගේ පා සටහන. මේ හස්ති රාජයාගේ පා සටහන ඇතුළට මේ සියලු සත්වයන්ගේ පා සටහන් දාන්න පුළුවන්. බුදුරජාණන් වහන්සේ වදාළා අන්න ඒ වගේ කියනවා මේ සියලු කුසල් දහම් එක වචනයක් ඇතුළට දාන්න පුළුවන් කියලා. ඒ වචනය තමයි අප්‍රමාදය. ඊළඟට මේ සියලුම ධර්මය එක වචනයකින් හඳුන්වන්න පුළුවන්. ඒ තමයි චතුරාර්ය සත්‍යය.

## අපි මැරෙනා දවස කවුරු නම් දනී ද?

එහෙම නම් මේ චතුරාර්ය සත්‍යය, අප්‍රමාදය කියන වචන දෙක එකට කතා කරන දෙයක්. ප්‍රමාදය යි, චතුරාර්ය සත්‍යය අවබෝධය යි ගැන කියන්නේ නෑ. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පාන මොහොතේ වදාළේ මොකක් ද? **(අප්පමාදේන සම්පාදේථ)** අප්‍රමාදීව චතුරාර්ය සත්‍යය අවබෝධ කරගන්න මහන්සි වෙන්න කියල යි. දැන් මේ වෙන කොට අපි ප්‍රමාද ද? අප්‍රමාද ද? අපි මේ වෙන කොට ගොඩක් ප්‍රමාදයි. අපේ ජීවත් වෙන්න තියෙන කාලෙ ගොඩක් දැන් ගෙවිලා ඉවරයි. අපිට ජීවත් වෙන්න තියෙන්නේ සුළු කාලය යි. නමුත් අපි දන්නෙ නෑ කොච්චර කාලයක් ද කියලා. අපි මාරයත් එක්ක ගිවිසුමක් ගහගෙන නෑ මේ අසවල් දවස වෙනකම් මට ජීවත් වෙන්න දෙන්න. අසවල් දවස වෙනකම් මාව අසනීප වෙන්න එපා. අසවල් දවස වෙනකම් මට කරදරයක් වෙන්න එපා කියලා කා එක්කවත් ලෝකෙ ගිවිසුම් ගහගෙන නෑ.

## බුදු සමිඳු නැති ලොවක් මට එපා...

ඒ නිසා අපට හැම තිස්සේ ම තිබෙන්නේ අපහසුවත්, අනතුරත් මිසක්, පහසුවක් රැකවරණයක් නෙවෙයි. ඒ නිසා අපි කළ යුත්තේ වහ වහා ම පළමුවෙන් ම කරන්න තියෙන්නේ මොනවා නැතත් තිසරණ තුළ රැඳී සිටීම යි. බුදුරජාණන් වහන්සේ හැර වෙන කිසිම කෙනෙක්ව සරණ යන්න එපා. බුදුරජාණන් වහන්සේගේ ධර්මය හැර වෙන කිසිම ධර්මයක් සරණ යන්න එපා. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝරත්නය, මාර්ගඵල ලාභී ශ්‍රාවක සංඝරත්නය හැර වෙන කිසි ම පිරිසක් සරණ යන්න එපා.

මෙන්න මේ තිසරණයේ පිහිටලා, ඊළඟට අපි සීලයකින් සමන්විත වෙන්න ඕනෙ. මොකක් ද සීලය? හිතාමතා ම සතුන් මරන්න එපා. ඒක සීලයක්. කාගෙවත් දෙයක්, තමන්ට දීපු නැති දෙයක් ගන්න එපා. ඒක සීලයක්. වැරදි කාම සේවනයේ යෙදෙන්න එපා. ඒක සීලයක්. බොරු කියන්න එපා. ඒක සීලයක්. සුරා පානය කරන්න එපා. මත්වෙන දේවල් පානය කරන්න එපා. ඒක සීලයක්.

## සසර දුක් ගෙවන්නට - සදාතනික සැප ලබන්නට...

ඉතින් මේ වගේ සීලයක පිහිටලා තෙරුවන් සරණ පිහිටියාට පස්සේ මේක තමයි, සෝවාන් වෙච්ච ආර්ය ශ්‍රාවකයෙකුගේ මූලික ස්වභාවය. ඒක තමයි බුදු රජාණන් වහන්සේ කෙරෙහි නො සෙල්වෙන ප්‍රසාදය. මොකක් ද මේ නො සෙල්වෙන ස්වභාවය කියන්නේ. ධර්මය හරියට ලැබුනේ නැතිනම්, අපි මොකද කරන්නේ? අධර්මය ලැබුණා ම හූමිටි තියනවා. හූමිටි තියනවා කියන්නේ මොකක් ද? බුදුරජාණන් වහන්සේට කවුරු හරි දොස් කියන කොට ඒකත් ඇත්ත ම යි කියනවා. ධර්මයට දොස් කියන කොට හොඳ වැඩේ කියනවා. සංඝයාට දොස් කියන කොට හොඳ වැඩේ කියනවා. මේ මොනව ද මේ කියන්නේ? හූමිටි තියෙනවා කියන්නේ මේක තමා. එහෙම කරන්නෙ නෑ අවෙච්ච ප්‍රසාදයෙන් ඉන්න කෙනා. ඒ නිසා මේ පින්වතුන් තෙරුවන් කෙරෙහි නො සෙල්වෙන ප්‍රසාදයක් ඇතිකර ගෙන සෝතාපත්ති අංග ඇති කරගෙන මේ ගෞතම බුද්ධ ශාසනයේ, මේ ජීවිතයේ සෝවාන් වෙන්න මහන්සි ගන්න.

තමන් ගේ පරලොව ජීවිතේ ගැන පොඩ්ඩක් වත් බය වෙන්න එපා. ඊට පස්සේ තමන්ගේ ජීවිතේට චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කරගෙන මේ ගෞතම බුද්ධ ශාසනයේ ම චතුරාර්ය සත්‍යාවබෝධයෙන්

මේ ගෞතම බුද්ධ රාජ්‍යය තුළ ම මම නිවන අවබෝධ කරනවා කියල හිතාගන්න.

*සාදු! සාදු !! සාදු !!!*



# අන්ත වලට නො වැටී හරි මග හඳුනාගන්න

## -කච්චානගොත්ත සූත්‍රය-

*ශ්‍රද්ධාවන්ත පින්වතුනි,*

පටිච්ච සමුප්පාද ධර්මය අවබෝධ කිරීමේ වැදගත්කම කොතරම් ද කියන එක තේරුම් ගන්න පුළුවන් දේශනාවක් අපි දැන් ඉගෙන ගන්නේ. මේ උතුම් දේශනාවේ නම **කච්චානගොත්ත සූත්‍රය.** කච්චානගොත්ත කියන ස්වාමීන් වහන්සේට උන්වහන්සේ ඇසූ ප්‍රශ්නයකට බුදුරජාණන් වහන්සේ දීපු පිළිතුරක් ලෙසයි මේ දේශනාව සඳහන් වෙන්නේ. **සංයුත්ත නිකායේ දෙවෙනි කොටසේ අභිසමය සංයුත්තය**ටයි මේ කච්චානගොත්ත සූත්‍රය අයිති වෙන්නේ.

### සම්මා දිට්ඨිය කියන්නේ මොකක් ද?

එදා බුදුරජාණන් වහන්සේ **සැවැත් නුවර ජේතවනාරාමයේ** වැඩ සිටියා. කච්චානගොත්ත කියන ස්වාමීන් වහන්සේ බුදුරජාණන් වහන්සේව බැහැදකින්නට වැඩම කරලා බුදුරජාණන් වහන්සේට ආදරයෙන් වන්දනා කරලා වාඩිවෙලා මෙන්න මේ ප්‍රශ්නය අහනවා.

"(**සම්මා දිට්ඨි සම්මා දිට්ඨීති භන්තේ වුච්චති**) ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, සම්මා දිට්ඨිය සම්මා දිට්ඨිය කියලා කියනවා. (**කිත්තාවතානු ඛෝ භන්තේ සම්මා දිට්ඨී හෝති'ති**) ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, සම්මා දිට්ඨිය ඇතිවෙන්නේ කොහොමද?"

දැන් අපි හොඳට ම දන්නවා සම්මා දිට්ඨිය කියන වචනය ගැන අපි අහලා තියෙනවා. සම්මා දිට්ඨිය කරා ගියොත් අපට මේ ධර්ම මාර්ගය විවෘත වෙන බව අපි දන්නවා. එහෙනම් මේ සම්මා දිට්ඨිය ගැන විස්තර වශයෙන් ඉගෙන ගැනීම අපට හරි ම ප්‍රයෝජනවත්.

## අඳුර නසනා එළිය සදනා ...

බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන්නේ සම්මා දිට්ඨිය නැති ජීවිතය කළුවරක් වගේ තියෙන ලෝකයක් කියලා. අන්ධකාර ලෝකයක් වගේ කියලා. යම් කෙනෙකුගේ ජීවිතය තුළ සම්මා දිට්ඨිය ඇතිවෙන්න පටන් ගත්තොත් ඒක හරියට අර කළුවර ලෝකය එළිය කිරීම පිණිස හිරු පායා එද්දී නැගෙනහිරින් උදාවෙන අරුණෝදය වගේ. නැගෙනහිරින් අරුණෝදය උදාවෙන කොට අර කළුවර ලෝකය ටික ටික ආලෝකවත් වෙනවා. එළිය වැටෙනවා. මේ වගේ තමයි කෙනෙකුගේ ජීවිතයක ආර්ය සම්මා දිට්ඨිය ආර්ය අෂ්ඨාංගික මාර්ගයට බැස ගන්නා වූ සම්මා දිට්ඨිය ඇතිවීම.

## සම්මා දිට්ඨිය ආකාර දෙකයි...

මේ නිසා අපට හරි ම ප්‍රයෝජනවත් බුදුරජාණන් වහන්සේගේ ධර්මයෙන් ඒ ධර්මය පිළිසරණ කරගෙන සම්මා දිට්ඨිය ඇති කර ගත්තොත්. අපි සාමාන්‍යයෙන් දන්නවා සම්මා දිට්ඨිය දෙආකාරයි කියලා. ලෞකික සම්මා දිට්ඨිය, ලෝකෝත්තර සම්මා දිට්ඨිය.

ලෞකික සම්මා දිට්ඨිය කියන්නේ දසවස්තුක සම්මා දිට්ඨිය. ඒ කියන්නේ දන් දීමෙහි විපාක ඇත, සිල් රැකීමේ විපාක ඇත, සේවා කටයුතු වල විපාක ඇත. මෙලොව කියා දෙයක් ඇත. පරලොවක් ඇත. මව ඇත. පියා ඇත. හොඳ කර්මයන්ගේ හොඳ විපාක ඇත. නරක කර්මයන්ගේ නරක විපාක ඇත. ඕපපාතික සත්වයන් ඇත. මෙලොව පරලොව දෙක ගැන තමා තුළ ඇති වූ අවබෝධයෙන් ම සාක්ෂාත් කරන්නා වූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත කියන මේ මානසිකත්වය. මේකට කියන්නේ ලෞකික සම්මා දිට්ඨිය.

## හැබෑම ප්‍රඥාවන්තයෙක්...

ලෞකික සම්මා දිට්ඨිය තියෙන කෙනා ප්‍රඥාවන්තයෙක් තමයි. නමුත් ඒ ලෞකික සම්මා දිට්ඨිය ස්ථාවර වෙන්නේ ලෝකෝත්තර සම්මා දිට්ඨිය තුළ. එතකොට ලෝකෝත්තර සම්මා දිට්ඨිය කරා යන්නේ ලෞකික සම්මා දිට්ඨිය තියෙන කෙනා. ලෞකික සම්මා දිට්ඨිය තියෙන

කෙනා ඕපපාතික උපත පිළිගන්න නිසා එයාට දිව්‍ය ලෝකය, නිරය, පෙරේත ලෝකය ගැන කථා කරන කොට එයාට අමුතු දෙයක් ඒකෙ නෑ. මෙලොව පරලොව අවබෝධයෙන් ම ප්‍රකාශ කරන්නා වූ බුදුවරයන් වහන්සේලාගේ ධර්මය ගැන කථා කරද්දී එයාට ඒකේ සැකකරන්න දෙයක් නෑ. ඒකට හේතුව තමයි ඒවා පිළිගන්න වුවමනා කරන මානසිකත්වයකින් ඉන්නවා.

## කල්‍යාණ මිත්‍රයා හම්බ වුනොත් නම් හරි...

අන්න එයාට කල්‍යාණ මිත්‍රයා හම්බ වුනොත්, කල්‍යාණ මිත්‍රයාගෙන් චතුරාර්ය සත්‍යය ධර්මය අහන්න ලැබුනොත් එයාට අර සම්මා දිට්ඨිය ලෝකෝත්තර මාර්ග අංගයක් දක්වා දියුණු කරගන්න පුළුවන්. ඒකට හේතුව තමයි අර ලෞකික සම්මා දිට්ඨිය.

ලෞකික සම්මා දිට්ඨිය ඇතිවෙන්නෙත් යෝනිසෝ මනසිකාරයෙන්. ලෞකික සම්මා දිට්ඨිය ඇතිවුන පමණින් එයා ගැලවිච්ච කෙනෙක් නෙවෙයි. ලෞකික සම්මා දිට්ඨිය ඇති වූ පමණින් යෝනිසෝ මනසිකාරය තිබුණට එයා තුළ අයෝනිසෝ මනසිකාරයත් තියෙනවා. යෝනිසෝ මනසිකාරය යි, අයෝනිසෝ මනසිකාරය යි වෙන් කරලා දකින්න පුළුවන් වෙන්නේ ලෝකෝත්තර සම්මා දිට්ඨියට ආවට පස්සේ. එතකොට ලෝකෝත්තර සම්මා දිට්ඨියට එනතුරු එයාට යම්කිසි අනතුරක් තියෙනවා.

## මෙන්න ඒ අනතුර...

දැන් බලන්න දේවදත්ත හාමුදුරුවරු 500ක් රවට්ටගෙන ගයා ශීර්ෂයට එක්ක ගියා නෙ. ගිහිල්ලා කිව්වා මට සවන් දෙන්න. මම කියා දෙන්නම් මාර්ගය. එතකොට ඒගොල්ලන්ට යෝනිසෝ මනසිකාරය තිබුණු පිරිසක්. නමුත් අහුවුනේ නැද්ද? ඒගොල්ලන්ට අයෝනිසෝ මනසිකාරය තුළ තිසරණය අහිමිවෙන්නත් ඉඩකඩ තිබුණා. එතකොට බුදුරජාණන් වහන්සේ කිව්වා මේ පිරිස අමාරුවේ වැටෙන්න ඉස්සෙල්ලා බේරාගන්න කියලා.

එතකොට අපට පේනවා ලෞකික සම්මා දිට්ඨිය තියෙන, යෝනිසෝ මනසිකාරය තියෙන පුද්ගලයාට වුනත් එකදිගට අසත්පුරුෂයාව ආශ්‍රය කරන්න ලැබුනොත් ඒ අසත්පුරුෂ ආශ්‍රයෙන් අසත්පුරුෂ ධර්මයක් අහන්ට ලැබනවා නම් අසත්පුරුෂයාගේ ඇසුරු කිරීම හේතු කරගෙන අර පුද්ගලයාගේ යෝනිසෝ මනසිකාරය නැතිවෙන්න පුළුවන්. අන්න ඒ අනතුර ලෞකික සම්මා දිට්ඨියේ

තියෙන්නේ බාහිරින් එන අනතුරට නියම ප්‍රතිකර්ම යොදාගන්න තියෙන ශක්තිය නැත්නම්.

## ප්‍රශ්නය ඉවර වෙන්න නම්...

ලෝකෝත්තර සම්මා දිට්ඨිය කරා ගියාම ඒ ප්‍රශ්නය ඉවර වෙනවා. ලෝකෝත්තර සම්මා දිට්ඨිය කරා ගියාට පස්සේ එක එක්කෙනා මොනවා කීවත් තමන් ඒක හොඳට තෝරලා, බේරලා ගන්නවා. ඒකයි ලෝකෝත්තර සම්මා දිට්ඨියේ විශේෂත්වය. එයා යෝනිසෝ මනසිකාරයත් දන්නවා. අයෝනිසෝ මනසිකාරයත් දන්නවා.

එතකොට බාහිරින් යමක් ශ්‍රවණය කරද්දී අයෝනිසෝ මනසිකාරයට වැටෙනවා නම් එය ශ්‍රවණය කිරීම හේතුවෙන් එයා දන්නවා මා ඒක ශ්‍රවණය නො කළ යුතුයි. ඒක මට අහිත පිණිස දුක් පිණිස පවතිනවා. මම එය බැහැර කළ යුතුයි කියලා ආර්ය සම්මා දිට්ඨියට පැමිණුන කෙනා ඒක බැහැර කරනවා. එතකොට ඒ කුසලතාවය පිහිටියාම තමයි සම්පූර්ණයෙන් ම රැකවරණය තියෙන්නේ.

## ලෝකෝත්තර සම්මා දිට්ඨිය කියන්නේ මොකක් ද?

ලෝකෝත්තර සම්මා දිට්ඨිය බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙන්නේ **(දුක්ඛේ ඤාණං, දුක්ඛ සමුදයේ ඤාණං, දුක්ඛ නිරෝධේ ඤාණං, දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ඤාණං)** දුක ගැන තියෙන්නා වූ අවබෝධය, දුක හටගන්න හේතුවන කරුණු ගැන ඇති අවබෝධය, දුක නිරුද්ධ වීම ගැන ඇති අවබෝධය, දුක නිරුද්ධ වීම පිණිස පවතින මාර්ගය ගැන ඇති අවබෝධය. මේක තමයි ලෝකෝත්තර සම්මා දිට්ඨිය. දැන් බුදුරජාණන් වහන්සේ අන්න ඒ සම්මා දිට්ඨිය වෙනස් ආකාරයකින් විස්තර කරන විදිහක් මේ සූත්‍රයේ කියන්නේ.

මේකේ සම්මා දිට්ඨිය විස්තර කරනවා හරි අමුතු ලස්සන පිළිවෙලකට. බුදුරජාණන් වහන්සේ මේ සම්මා දිට්ඨිය විස්තර කරන්නේ පටිච්ච සමුප්පාදය අර්ථ වශයෙන් අවබෝධ කරගන්න උපකාර වෙන විදිහටයි.

## දෘෂ්ටි දෙකක් නිසා ලෝකය ම කැළඹිලා...

කච්චානගොත්ත ස්වාමීන් වහන්සේ බුදුරජාණන් වහන්සේ ළඟට ගිහින් බුදුරජාණන් වහන්සේගෙන් අහනවා, "ස්වාමීනී, භාග්‍යවතුන්

වහන්ස, සම්මා දිට්ඨි, සම්මා දිට්ඨි කියල කියනවා. කොපමණකින්ද ස්වාමීනී, සම්මා දිට්ඨිය ඇතිවෙන්නේ?" හරි ලස්සනට බුදුරජාණන් වහන්සේ මේකෙදි පැහැදිලි කරනවා, "**(ද්වයං නිස්සිතෝ කෝ යං කච්චාන ලෝකෝ යේ භූයියේන අත්ථිතං චේව නත්ථි තං ච)** කච්චාන මේ ලෝක සත්වයා බොහෝ සෙයින් දෘෂ්ඨි දෙකක් ඇසුරු කරගෙන වාසය කරනවා. **(අත්ථි තං චේ ව නත්ථි තං ච)** ඇත කියන දෘෂ්ඨියත්, නැත කියන දෘෂ්ඨියත්."

## ඇත.... නැත..... මොකක්ද හරි?

ඇත කියන දෘෂ්ඨිය තුළ බලපවත්වන්නේ ශාස්වත දෘෂ්ඨිය යි. ශාස්වත දෘෂ්ඨිය කියන්නේ මරණින් මත්තේ යම් කිසි තැනක වෙනස් නො වී සදාකාලිකව ඉන්නවා කියන දෘෂ්ඨිය. ඊළඟ එක නැත කියන දෘෂ්ඨිය. මරණින් මත්තේ කිසිවක් ම නැත කියන දෘෂ්ඨිය. මරණින් මත්තේ සියල්ලෝ ම උච්ඡේදයට පත්වන්නේය, සිඳී වැනසී යන්නේ ය කියන එක. ඒකට කියන්නේ උච්ඡේද දෘෂ්ඨිය. මේ තිබෙන්නා වූ ආත්මය මරණින් මත්තේ නැති වෙලා යනවා. මොකවත් ම නැතිවෙලා යනවා කියනවා. එතකොට මේ ශාස්වත දෘෂ්ඨියත්, උච්ඡේද දෘෂ්ඨියත් කියන දෘෂ්ඨි දෙකේ තමයි මේ ලෝක සත්වයා බොහෝ සෙයින් වාසය කරන්නේ.

දැන් අපි ගත්තොත් දේව නිර්මාණ වාදී ආගම් වල තියෙන්නේ මරණින් මතු ඒ දේව නිර්මාණවාදී දෙවියන් ළඟ සදාකාලිකව ඉන්නවා. අනිත්‍ය වෙන්නේ නෑ. හේතු ඵල රහිතව හටගන්නවා කියන එක. ශාස්වත දෘෂ්ඨිය තුළ කෙනෙකුට ඕනෙ ම පවක් කරන්න පුළුවන්. බයක් වෙන්න දෙයක් නෑ. කර්ම විපාක කථාවක් නෑ. හොඳට හොඳ ඵල දීමක්, නරකට නරක ඵල දීමක් කියල කථාවක් නෑ. ඕපපාතික උපතක් ගැන කථාවක් නෑ. මෙලොව පරලොව අවබෝධයක් ගැන කියන ශ්‍රමණ බ්‍රාහ්මණවරු ඉන්නවා කියල කථාවක් නෑ. ඒකෙ කියන්නේ මරණින් මතු සදාකාලිකව කොහේ හරි ඉන්න ලැබෙනවා. එතකොට ඒ දෘෂ්ඨිය තුළ ඕනෙ ම පවක් කරන්න පුළුවන්. ලෝක සත්වයා ඒ තුළ තමයි බොහෝ සෙයින් ඉන්නේ.

## ඉන්නකම් විතරනෙ...

ඊළඟට බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා නැත කියන උච්ඡේද දෘෂ්ඨිය. මරණින් මත්තේ කිසිවක් නැත. මේ ජීවිතයේ දී ලබා ගන්නා දේවල් විතරයි කියල. එතකොට උච්ඡේද දෘෂ්ඨිය

උගන්වන ආගම් ඉස්සර තිබුණා. ඒ ආගම් වල උගන්වන ශ්ලෝක තියෙනවා. **(යාව ජීවං සුඛං ජීවේ...)** ජීවත් වෙලා ඉන්න කම් සැපසේ ජීවත් වෙයන්. **(ඍනම් කෘත්වා ඝෘතම් පිබේත්)** ණය වෙලා හරි ගිතෙල් බීපන්. ඒ කාලෙ ඒවා තමයි බොන්න තිබුණේ. මේ කාලෙ නම් වෙනින් ඒවා ඕනෙ කියයි. **(භස්මි භූතස්ස දේහස්ස)** මේ ශරීරය බස්මී වුණාට පස්සේ, අළු වුණාට පස්සේ **(පුණරාගමනං කෘතඃ)** ආපහු එන්නේ කවුද? කවුරුත් නෑ කියනවා.

## අදත් තියෙන්නෙ ඔය අන්ත දෙක ම තමයි...

මේ මතය සමාජයේ නැද්ද? ඉන්නකම් කාලා බීල ඉන්නෙ ඕනෙ කියන කථාව කියන්නේ නැද්ද? ඉන්නකම් සැපසේ ඉන්න ඕනෙ. ආයෙ මළාට පස්සේ අපි මේවා කන්න බොන්න එනවද? බලන්න අදටත් බුදුරජාණන් වහන්සේ එදා දේශනා කරපු ලෝක ස්වභාවය ම යි තියෙන්නෙ. ශාස්වත කියන දෘෂ්ඨියෙත්, උච්ඡේද කියන දෘෂ්ඨියෙත්.

විද්‍යාව ඔහොම නෙවෙයි අහසේ පළඟක් බැඳගෙන ඉන්න තරමට දියුණු වුණාත් ලෝකයේ තියෙන්නේ ඔය දෘෂ්ඨි දෙක තමයි. ලෝක සත්වයා ඔය දෘෂ්ඨි දෙකෙන් මිදෙන්නේ පටිච්ච සමුප්පාදය අවබෝධ කිරීමෙන් විතරයි. දැන් ඔන්න බුදුරජාණන් වහන්සේ ඒ දෘෂ්ඨි දෙකෙන් නිදහස් වෙන ආකාරය කියලා දෙනවා.

## මෙන්න ලෝකයේ හටගැනීම...

"**(ලෝක සමුදයංච බෝ කච්චාන යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතෝ යා ලෝකේ නත්ථි සා න හෝති)** පින්වත් කච්චාන, ලෝකය හටගන්නා ආකාරය යම්කිසි කෙනෙක් ඒ විදිහට ම ප්‍රඥාවෙන් දකිනවා නම් මරණින් මතු කිසිවක් නැත කියන දෘෂ්ඨිය නැතිවෙනවා." එතකොට මරණින් පස්සේ කිසිවක් නැත කියන උච්ඡේද දෘෂ්ඨිය නැතිව යන්නේ කොහොමද? ලෝකය හටගන්නා ආකාරය ඒ විදිහට ම දැකීමෙන්. දැන් අපි පටිච්ච සමුප්පාදය ඉගෙන ගන්නේ ලෝකයේ හට ගන්නා ආකාරය.

- ජරා මරණ හටගන්නේ කුමක් හටගැනීමෙන් ද?
  **ඉපදීම හටගැනීමෙන්.**

- ඉපදීම හටගන්නේ කුමක් හටගැනීමෙන් ද?
  **භවය හටගැනීමෙන්.**

- භවය හටගන්නේ කුමක් හටගැනීමෙන් ද?
  උපාදාන හටගැනීමෙන්.
- උපාදාන හටගන්නේ කුමක් හටගැනීමෙන් ද?
  තණ්හාව හටගැනීමෙන්.
- තණ්හාව හටගන්නේ කුමක් හටගැනීමෙන් ද?
  විඳීම හටගැනීමෙන්.
- විඳීම හටගන්නේ කුමක් හටගැනීමෙන් ද?
  ස්පර්ශය හටගැනීමෙන්.
- ස්පර්ශය හටගන්නේ කුමක් හටගැනීමෙන් ද?
  ආයතන හය හටගැනීමෙන්.
- ආයතන හය හටගන්නේ කුමක් හටගැනීමෙන් ද?
  නාමරූප හටගැනීමෙන්.
- නාමරූප හටගන්නේ කුමක් හටගැනීමෙන් ද?
  විඤ්ඤාණය හටගැනීමෙන්.
- විඤ්ඤාණය හටගන්නේ කුමක් හටගැනීමෙන් ද?
  සංස්කාර හටගැනීමෙන්.
- සංස්කාර හටගන්නේ කුමක් හටගැනීමෙන් ද?
  අවිද්‍යාවෙන්.

මේක තමයි ලෝකයේ හට ගැනීම. දැන් බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා අතීතයෙත් මේක මේ විදිහට ම යි සිද්ධ වෙලා තියෙන්නේ. අතීතය අරභයාත් එයා පටිච්ච සමුප්පාදය ම යි මෙනෙහි කරන්නේ.

- අතීතයේ දී ජරා මරණ හටගත්තේ කුමක් හටගැනීමෙන් ද?
  ඉපදීම හටගැනීමෙන්.
- අතීතයේ දී ඉපදීම හටගත්තේ කුමක් හටගැනීමෙන් ද?
  භවය හටගැනීමෙන්.
- අතීතයේ දී භවය හටගත්තේ කුමක් හටගැනීමෙන් ද?
  උපාදාන හටගැනීමෙන්.

- **අතීතයේ දී උපාදාන හටගත්තේ කුමක් හටගැනීමෙන් ද?**
  **තණ්හාව හටගැනීමෙන්.**
- **අතීතයේ දී තණ්හාව හටගත්තේ කුමක් හටගැනීමෙන් ද?**
  **විඳීම හටගැනීමෙන්.**
- **අතීතයේ දී විඳීම හටගත්තේ කුමක් හටගැනීමෙන් ද?**
  **ස්පර්ශය හටගැනීමෙන්.**
- **අතීතයේ දී ස්පර්ශය හටගත්තේ කුමක් හටගැනීමෙන් ද?**
  **ආයතන හය හටගැනීමෙන්.**
- **අතීතයේ දී ආයතන හය හටගත්තේ කුමක් හටගැනීමෙන් ද?**
  **නාමරූප හටගැනීමෙන්.**
- **අතීතයේ දී නාමරූප හටගත්තේ කුමක් හටගැනීමෙන් ද?**
  **විඤ්ඤාණය හටගැනීමෙන්.**
- **අතීතයේ දී විඤ්ඤාණය හටගත්තේ කුමක් හටගැනීමෙන් ද?**
  **සංස්කාර හටගැනීමෙන්.**
- **අතීතයේ දී සංස්කාර හටගත්තේ කුමක් හටගැනීමෙන් ද?**
  **අවිද්‍යාවෙන්.**

එහෙනම් පින්වතුනි, අතීතයේ සිදුවෙලා තියෙන්නෙත් මේ වර්තමානයේ සිදුවන්නා වූ දේ ම යි. එහෙනම් අනාගතයේ දී සිදුවන්නෙත් මේ වර්තමානයේ සිදුවන දේ ම යි.

- **අනාගතයේ දී ජරා මරණ හටගන්නේ කුමක් හටගැනීමෙන් ද?**
  **ඉපදීම හටගැනීමෙන්.**
- **අනාගතයේ දී ඉපදීම හටගන්නේ කුමක් හටගැනීමෙන් ද?**
  **භවය හටගැනීමෙන්.**
- **අනාගතයේ දී භවය හටගන්නේ කුමක් හටගැනීමෙන් ද?**
  **උපාදාන හටගැනීමෙන්.**
- **අනාගතයේ දී උපාදාන හටගන්නේ කුමක් හටගැනීමෙන් ද?**
  **තණ්හාව හටගැනීමෙන්.**
- **අනාගතයේ දී තණ්හාව හටගන්නේ කුමක් හටගැනීමෙන් ද?**
  **විඳීම හටගැනීමෙන්.**

- **අනාගතයේ දී විඳීම හටගන්නේ කුමක් හටගැනීමෙන් ද?**
  **ස්පර්ශය හටගැනීමෙන්.**

- **අනාගතයේ දී ස්පර්ශය හටගන්නේ කුමක් හටගැනීමෙන් ද?**
  **ආයතන හය හටගැනීමෙන්.**

- **අනාගතයේ දී ආයතන හය හටගන්නේ කුමක් හටගැනීමෙන් ද?**
  **නාමරූප හටගැනීමෙන්.**

- **අනාගතයේ දී නාමරූප හටගන්නේ කුමක් හටගැනීමෙන් ද?**
  **විඤ්ඤාණය හටගැනීමෙන්.**

- **අනාගතයේ දී විඤ්ඤාණය හටගන්නේ කුමක් හටගැනීමෙන් ද?**
  **සංස්කාර හටගැනීමෙන්.**

- **අනාගතයේ දී සංස්කාර හටගන්නේ කුමක් හටගැනීමෙන් ද?**
  **අවිද්‍යාවෙන්.**

එහෙනම් පින්වතුනි, ලෝක සමුදය ඒ කිව්වේ ලෝකයේ හට ගැනීම සිද්ධ වන්නේ එක ම ආකාරයකින්. අතීතයේ සිද්ධ වුනේ යම් ආකාරයකින් ද, ඒ ආකාරයෙන් ම යි වර්තමානයේ සිදුවන්නෙත්. වර්තමානයේ සිදුවන්නේ යම් ආකාරයකින් ද මේ විදිහම තමයි අනාගතයෙත්.

## දෘෂ්ඨි නැතිවෙන තැන...

මේ විදිහට අතීතයෙත්, වර්තමානයෙත්, අනාගතයෙත් මේ ලෝකය සකස් වෙන ආකාරය දකින විට කෙනෙක් කියනවා නම් මේ සත්වයා මරණින් මතු උච්ඡේදයට යනවා, නැසිලා වැනසිලා යනවා කියල ඒ දෘෂ්ඨියට එනවද? එන්නෙ නෑ. ඒකට හේතුව තමයි එයා ලෝකය හටගන්නා ආකාරය දන්නවා. අන්න ඒකයි බුදුරජාණන් වහන්සේ වදාළේ "පින්වත් කච්චාන, ලෝකයේ හටගැනීම යම් කෙනෙක් අවබෝධයෙන් ම දන්නවා නම්, මරණින් මතු ඇත කියල දෘෂ්ඨියක් ඇද්ද, ඒ දෘෂ්ඨිය නැතිවෙලා යනවා." කියල.

## සදාකාලික නො වූ ලෝකේ...

ඊළඟට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා **(ලෝක නිරෝධං ඛෝ කච්චාන යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතෝ යා ලෝකෝ අත්ථිතා සා න හෝති)** දැන් කොටසක් කියනවා මරණින් මතු සත්වයා සදාකාලික

වෙනවා. ඒ කියන්නේ වෙනස් නො වී නිත්‍ය ස්වභාවයෙන් පවතිනවා. දැන් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයා ලෝකය හටගන්නා සත්‍ය ස්වභාවය දැක්කා. ලෝකය හටගන්නා වූ සත්‍ය ස්වභාවය මොකක්ද? අනිත්‍යය යි. අනිත්‍ය වූ හේතු සකස් වෙන කොට ඒ හේතුවට අනුව තමයි ඵල හැදෙන්නේ. එතකොට ජරා මරණ හැදෙන්නේ ඉපදීම නැමති හේතුව සකස් වුනාම. ඉපදීම නැමති හේතුව හැදෙන්නේ භවය සකස් වුනාම. භවය හැදෙන්නේ උපාදානය නැමැති හේතුව සකස් වුනාම. එහෙනම් හැම තිස්සේ ම යමක් සකස් වීමෙන් යමක් හැදෙනවා. එහෙනම් හැමතැන ම තියෙන්නේ හේතූන්ගෙන් සකස් වෙච්ච දෙයක්. හේතූන්ගෙන් සකස් වෙච්ච දෙයක් නම් තියෙන්නේ පටිච්ච සමුප්පාදයක් තියෙනවා.

## පටිච්ච සමුප්පාදය තුළ හැදෙන දේවල්...

ඒ කියන්නේ අවිද්‍යාව ප්‍රත්‍යයෙන් සංස්කාර හටගන්නවා. සංස්කාර ප්‍රත්‍යයෙන් විඤ්ඤාණය හටගන්නවා. විඤ්ඤාණය ප්‍රත්‍යයෙන් නාම රූප හටගන්නවා. නාම රූප ප්‍රත්‍යයෙන් සළායතන හටගන්නවා. සළායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශය හටගන්නවා. ස්පර්ශය ප්‍රත්‍යයෙන් විඳීම හටගන්නවා. විඳීම ප්‍රත්‍යයෙන් ඇලීම හටගන්නවා. ඇලීම ප්‍රත්‍යයෙන් බැඳීම හටගන්නවා. බැඳීම ප්‍රත්‍යයෙන් විපාක පිණිස කර්ම හැදෙනවා. විපාක පිණිස කර්ම හැදීමෙන් උපදිනවා. ඉපදීමෙන් ජරා මරණ හැදෙනවා.

මේ සිද්ධි එකිනෙකට උපකාර වෙන එකට කියනවා පටිච්ච සමුප්පාදය. ඒ එකිනෙකට උපකාරයෙන් හැදෙන එකක් එකක් පටිච්ච සමුප්පන්නයි.

ජරා මරණ කියන්නේ පටිච්ච සමුප්පන්නයි. ඒ කිව්වෙ පටිච්ච සමුප්පාදය තුලින් හැදුන එකක්. ජරා මරණ නිත්‍ය ද? අනිත්‍යද? අනිත්‍යයි. අනිත්‍ය වුනේ ඇයි? හේතු නිසා හැදිච්ච හේතු නැතිවීමෙන් නැතිවෙනවා.

එතකොට ඉපදීම කියන එක නිත්‍ය ද, අනිත්‍ය ද? අනිත්‍ය යි. පටිච්ච සමුප්පන්නයි. හේතු නිසා හැදෙනවා. හේතු නැති වෙන කොට නැතිවෙනවා.

භවය කියන එක නිත්‍ය ද, අනිත්‍ය ද? අනිත්‍යය යි. පටිච්ච සමුප්පන්නයි. පටිච්ච සමුප්පාදය තුළ තමයි හැදෙන්නේ.

උපාදාන නිත්‍ය ද, අනිත්‍ය ද? අනිත්‍යය යි. පටිච්ච සමුප්පන්නයි. පටිච්ච සමුප්පාදය තුළ තමයි හැදෙන්නේ.

තණ්හාව නිත්‍ය ද, අනිත්‍ය ද? අනිත්‍යය යි. පටිච්ච සමුප්පන්නයි. පටිච්ච සමුප්පාදය තුළ තමයි හැදෙන්නේ.

වේදනාව නිත්‍ය ද, අනිත්‍ය ද? අනිත්‍යය යි. පටිච්ච සමුප්පන්නයි. පටිච්ච සමුප්පාදය තුළ තමයි හැදෙන්නේ.

ස්පර්ශය නිත්‍ය ද, අනිත්‍ය ද? අනිත්‍යය යි. පටිච්ච සමුප්පන්නයි. පටිච්ච සමුප්පාදය තුළ තමයි හැදෙන්නේ.

ආයතන හය නිත්‍ය ද, අනිත්‍ය ද? අනිත්‍යය යි. පටිච්ච සමුප්පන්නයි. පටිච්ච සමුප්පාදය තුළ තමයි හැදෙන්නේ.

නාම රූප නිත්‍ය ද, අනිත්‍ය ද? අනිත්‍යය යි. පටිච්ච සමුප්පන්නයි. පටිච්ච සමුප්පාදය තුළ තමයි හැදෙන්නේ.

විඤ්ඤාණය නිත්‍ය ද, අනිත්‍ය ද? අනිත්‍යය යි. පටිච්ච සමුප්පන්නයි. පටිච්ච සමුප්පාදය තුළ තමයි හැදෙන්නේ. දැන් භවයෙන් භවයට සංක්‍රමණය වෙන විඤ්ඤාණයක් නෑ. විඤ්ඤාණය තියෙන්නේ හැම තිස්සෙම පටිච්ච සමුප්පාදය තුළ සකස් වෙන විඤ්ඤාණයක්.

## හැදෙන දේවල් නැතිවෙනවා...

එතකොට මේ දේවල් පටිච්ච සමුප්පාදයක් තුළ හැදෙන දේවල් කියලා මේ ලෝකය ගැන අවබෝධයක් ඇති කරගත්තු කෙනාට ඊළඟ අවබෝධය ඇති කරගැනීම පහසුයි. හේතූන් නිසා නම් හටගන්නේ, ඒ දේවල් නිරුද්ධ වෙලා යන ස්වභාවයෙන් යුක්තයි.

ජරා මරණ නිරුද්ධ වන්නේ ඉපදීම නිරුද්ධ වීමෙන්. ඉපදීම නිරුද්ධ වන්නේ භවය නිරුද්ධ වීමෙන්. භවය නිරුද්ධ වන්නේ උපාදාන නිරුද්ධ වීමෙන්. උපාදාන නිරුද්ධ වන්නේ තණ්හාව නිරුද්ධ වීමෙන්. තණ්හාව නිරුද්ධ වන්නේ වේදනාව නිරුද්ධ වීමෙන්. වේදනාව නිරුද්ධ වන්නේ ස්පර්ශය නිරුද්ධ වීමෙන්. ස්පර්ශය නිරුද්ධ වන්නේ ආයතන හය නිරුද්ධ වීමෙන්. ආයතන හය නිරුද්ධ වන්නේ නාම රූප නිරුද්ධ වීමෙන්. නාම රූප නිරුද්ධ වන්නේ විඤ්ඤාණය නිරුද්ධ වීමෙන්. විඤ්ඤාණය නිරුද්ධ වන්නේ සංස්කාර නිරුද්ධ වීමෙන්. සංස්කාර නිරුද්ධ වන්නේ අවිද්‍යාව නිරුද්ධ වීමෙන්.

## අවිද්‍යාව නැත්නම් පටිච්ච සමුප්පාදය ඉවරයි...

එහෙම නම් නිරුද්ධ වන්නේ ඔය ස්වභාවයෙන්. අවිද්‍යාව නිරුද්ධ වෙන තැන මේ ඔක්කොම දේවල් නිරුද්ධ වෙනවා. අතීතයේ ජරා මරණ නිරුද්ධ වුනා නම්, නිරුද්ධ වුනේ කුමක් නිරුද්ධ වීමෙන් ද? ඉපදීම නිරුද්ධ වීම නිසයි ජරා මරණ නිරුද්ධ වුනේ. ඉපදීම නිරුද්ධ වුනේ කුමක් නිරුද්ධ වීමෙන් ද? භවය නිරුද්ධ වීම නිසයි ඉපදීම නිරුද්ධ වුනේ. අතීතයේ භවය නිරුද්ධ වුනේ කුමක් නිරුද්ධ වීමෙන් ද? උපාදානය නිරුද්ධ වූ නිසයි. අතීතයේ තණ්හාව නිරුද්ධ වුනේ විඳීම නිරුද්ධ වූ නිසයි. අතීතයේ විඳීම නිරුද්ධ වුනේ ස්පර්ශය නිරුද්ධ වූ නිසයි. අතීතයේ ස්පර්ශය නිරුද්ධ වුනේ ආයතන හය නිරුද්ධ වූ නිසයි. අතීතයේ ආයතන හය නිරුද්ධ වුනේ නාම රූප නිරුද්ධ වූ නිසා. අතීතයේ නාම රූප නිරුද්ධ වුනේ විඤ්ඤාණය නිරුද්ධ වූ නිසා. අතීතයේ විඤ්ඤාණය නිරුද්ධ වුනේ සංස්කාර නිරුද්ධ වීම නිසා. අතීතයේ සංස්කාර නිරුද්ධ වුනේ අවිද්‍යාව නිරුද්ධ වූ නිසා. එහෙම නම් අතීතයේ දී ත් අවිද්‍යාව නිරුද්ධ වුනු නිසයි සංස්කාර නිරුද්ධ වෙලා තියෙන්නේ.

## හේතු ඵල අවබෝධ වෙන්නෙ කවදට ද?

අවිද්‍යාව නිරුද්ධ වෙන්නේ කවද්ද? විද්‍යාව පහළ වෙච්ච දවසට. විද්‍යාව පහළ වෙන්නේ කවද්ද? චතුරාර්ය සත්‍යය අවබෝධ කරන දවසට. චතුරාර්ය සත්‍යය අවබෝධ කරන්නේ කවද්ද? ආර්ය අෂ්ඨාංගික මාර්ගය සම්පූර්ණ වෙච්ච දවසට. එතකොට බලන්න අනාගතයේදීත්  මේ සිද්ධ වීමේ නිරෝධය ඒ විදිහ ම යි. එතකොට මේ විදිහට හටගන්නා දේ හේතූන් නිසා හටගන්නේ කියන එක අවබෝධයකට ආවා ම මරණින් මතු නැත කියන උච්ඡේද දෘෂ්ඨිය නැති වෙනවා. එතකොට ඒ හටගන්නා දේ හේතු නිරුද්ධ වීමෙන් නිරුද්ධ වී යන ස්වභාවයට අයිති දේවල් කියන අවබෝධයට එයා ආවා නම් ලෝක නිරෝධය මෙහෙමයි කියලා අවබෝධ වුනා නම් මරණින් මත්තේ සදාකාලිකව නො වෙනස් ව ස්ථිරව ඉන්නවා කියන දෘෂ්ඨිය නැති වෙලා යනවා. එතකොට ශාස්වත දෘෂ්ඨිය නැතිවෙලා යන්නේ ලෝක නිරෝධය පිළිබඳ අවබෝධයෙන්. උච්ඡේද දෘෂ්ඨිය නැතිව යන්නේ ලෝකය හටගැනීම අවබෝධ වීමෙන්.

දැන් දෘෂ්ඨි දෙකයි. මොනවද දෘෂ්ඨි දෙක ශාස්වත දෘෂ්ඨිය යි, උච්ඡේද දෘෂ්ඨිය යි. ශාස්වත දෘෂ්ඨිය කියන්නේ මරණින් මත්තේ සදාකාලිකව ඉන්නවා කියන එක. උච්ඡේද දෘෂ්ඨිය කියන්නේ මරණින්

මතු කිසිම දෙයක් නැත කියන එක. එතකොට මරණින් මතු කිසිම දෙයක් නැත කියන එක දෘෂ්ඨියක්. ඒක ඇත්ත නෙමෙයි කියලා අවබෝධ වෙන්නේ පටිච්ච සමුප්පාදය තුළ දිගින් දිගට ම පවතින ආකාරය අවබෝධ කරගැනීමෙන්. එතකොට දන්නවා මෙහෙම තමයි ලෝකය හටගන්නේ.

## මැරුණයි කියල ප්‍රශ්නෙ එහෙම්ම ම යි....

එහෙනම් මේ මේ කියන ආකාරයට මනුස්සයෙක් මැරුණු ගමන් මුකුත් නැතිව යන්නේ නෑ. එයා ආයෙමත් **භව පච්චයා ජාති**. උපතක් කරා යනවා. අතීතයේ දීත් සිදුවුනේ එහෙමයි. වර්තමානයේ දීත් සිදුවෙන්නේ ඒක ම යි. අනාගතයේ දීත් සිදුවෙන්නේ ඒක ම යි කියලා එයා අවබෝධ කරගන්නවා. එතකොට එයාට උච්ඡේද දෘෂ්ඨිය ඇතිවෙන්නේ නෑ. ශාස්වත දෘෂ්ඨිය ඇතිවෙන්නෙත් නෑ. එහෙනම් මේකෙ ස්ථිරව පවතින කිසිම දෙයක් නෑ. එතකොට එයා අවබෝධ කරගන්නවා මේකෙ තියෙන්නේ **(යං කිංචි සමුදය ධම්මං - සබ්බං තං නිරෝධ ධම්මං)** හේතූන් නිසා හටගන්නා ස්වභාවයෙන් යුතු යමක් ඇද්ද, හේතු නිරුද්ධ වීමෙන් නිරුද්ධ වී යන ස්වභාවයෙන් යුක්තයි. මේ නිසයි බුදුරජාණන් වහන්සේ පටිච්ච සමුප්පාදයේ ඇතිවීම, නැතිවීම හොඳින් නුවණින් විමසන්න කීවේ.

## ආර්ය න්‍යාය තේරුම් ගන්න...

**(පටිච්ච සමුප්පාදං මනසිකරෝති)** පටිච්ච සමුප්පාදය ම මෙනෙහි කරන්න කියලා විස්තර කරනවා **පංච භයවේර සූත්‍රයේ** දී. **(ඉති ඉමස්මිං සති ඉදං හෝති - ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති)** මෙය ඇති කල්හි මෙය වේ. මෙය උපදින විට මෙය උපදී. **(ඉමස්මිං අසති ඉදං න හෝති - ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති)** මෙය නැති කල්හි මෙය නැත. මෙය නිරුද්ධ වීමෙන් මෙය නිරුද්ධ වේ. දෙකම මෙනෙහි කරන්න ඕනෙ. එතකොට එයා ශාස්වත දෘෂ්ඨියෙන්, උච්ඡේද දෘෂ්ඨියෙන් මිදිලා මේ හේතු ඵල ධර්මයෙන්ගේ ස්වභාවය මේකයි කියලා අවබෝධ කරගන්නවා.

එතකොට මෙය ඇති කල්හි මෙය ඇත. මෙය උපදින විට මෙය උපදී. මේ දෙක ම මෙනෙහි කරන්න කියනවා. ඒක තමයි මේ ලෝකය හටගන්නා ආකාරය. එතකොට හටගන්නා හැම තැන ම අනිත්‍ය දෙයක් තියෙන්නේ. මේක නැත්නම් මේක නැතිවෙනවා. මෙය නැති කල්හි මෙය නැත. මෙය නිරුද්ධ වීමෙන් මෙය නිරුද්ධ වෙනවා.

## විශ්මිත අවබෝධය...

ඔය ආකාරයෙන් තමයි සසර දුක නැතිවෙන්නේ. මේ විදිහට අවබෝධ කරගත්තා ම එයාට තියෙන්නේ අවබෝධයක්. ඒ තමයි හේතු නිසා හටගන්නා වූ යමක් ඇද්ද හේතු නැතිවීමෙන් නිරුද්ධ වී යන ස්වභාවයෙන් යුක්තයි. බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා එතකොට මෙයාට ශාස්වත දෘෂ්ඨියත් නෑ, උච්ඡේද දෘෂ්ඨියත් නෑ කියල.

## ලෝක සත්වයන්ගේ සැබෑ ස්වරූපය...

බුදුරජාණන් වහන්සේ වදාළා කච්චාන ස්වාමීන් වහන්සේට, (**උපයුපාදානා අභිනිවේසවිනිබද්ධෝ ඛවායං කච්චාන ලෝකෝ යේභූයෙන**) පින්වත් කච්චාන, මේ ලෝක සත්වයා බොහෝ සෙයින් ඉන්නේ මේකෙ බැසගෙන. මේක හේතු නිසා හටගන්නා ස්වභාවයෙන් යුක්ත දේවල් මෙතන තියෙන්නෙ කියල අවබෝධයක් නෑ. එයා මේක ගන්නවා එක එක දෘෂ්ඨිවලින්. එතකොට එයා ඒකෙ බැසගන්නවා. **උපයු** කියන්නේ බැසගන්නවා. **උපාදාන** කියන්නේ ග්‍රහණය කරගන්නවා. **අභිනිවේසු** කියන්නේ එහි ම ගිලී වාසය කරනවා. **විනිබද්ධෝ** කියන්නේ එහි එකට බැඳී වාසය කරනවා.

අර අවබෝධයට ආවට පස්සේ මොකද වෙන්නේ (**තං ච උපායුපාදානං චේතසෝ අදිට්ඨානං**) එතකොට මෙයා දන්නවා බැසගත්තොත් බැසගන්න තියෙන්නේ පටිච්ච සමුප්පාදයෙන් හටගන්නා වූ පටිච්ච සමුප්පන්න දේවල් වල තමයි බැසගන්න තියෙන්නේ කියල. එතකොට උපාදාන කරගන්න තියෙන්නෙත් ඒවා. සිතෙන් අදිටන් කරගන්න තියෙන්නෙත් ඒවා. ගැටෙන්න තියෙන්නෙත් ඒවායේ. එතකොට මෙයා දකිනවා නම් මේ පටිච්ච සමුප්පන්න ඒවා හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත්තා වූ දේවල් කියලා එයාට අවබෝධයක් ඇති වුනා නම්, (**න උපේති**) ඒවා අර වගේ බැස ගන්න යන්නෙ නෑ. (**න උපාදියති**) ඒවා අල්ලගන්න යන්නේ නෑ. (**නාදිට්ඨාති අත්තාමේති**) මෙය මාගේ ආත්මය යි කියලා හිත පිහිටුවන්න යන්නෙ නෑ.

## මේක තමයි සම්මා දිට්ඨිය...

එයාට තියෙනවා අවබෝධයක් මේවා හේතු නිසා හටගන්නා දේවල්. හේතු නිරුද්ධ වීමෙන් නිරුද්ධ වී යන ස්වභාවයෙන් යුක්තයි. මේ හේතුව නිසයි ශෝක, වැලපීම්, දුක්, දොම්නස්, සුසුම් හෙලීම් සියල්ල ම උපදින්නේ.

එහෙනම් එයා දකින්නේ මොකක් ද? **(දුක්ඛමේව උප්පජ්ජමානා උප්පජ්ජති)** ඉපදුනොත් ඉපදෙන්නේ දුක විතරයි. **(දුක්ඛං නිරුජ්ඣමානා නිරුජ්ඣති)** නිරුද්ධ වුනොත් නිරුද්ධ වෙන්න තියෙන්නෙත් දුක විතරයි. **(එත්තාවතානු බෝ කච්චාන, සම්මා දිට්ඨි හෝති)** පින්වත් කච්චාන, මෙතෙකින් ම සම්මා දිට්ඨිය ඇත.

## අනේ අපිව බේරලා දෙන්න...

එතකොට බලන්න මේ සම්මා දිට්ඨියට හේතු වුනා පටිච්ච සමුප්පාදය හටගන්නා ආකාරය ගැනත්, නැතිවී යන ආකාරය ගැනත් අවබෝධ කිරීම. අවබෝධය කරා අපි යන්නෙ නැත්නම් අපට යන්න තියෙන්නෙ මිත්‍යා දෘෂ්ඨිය කරා. මේ වගේ අවබෝධයක් කරා යන්නෙ නැත්නම් අපට ජරා - මරණ ඇති වුණා ම මොකක් කරන්නද තියෙන්නෙ? ඉල්ලන්නයි. "අනේ අපිව මේ ජරා මරණ වලින් බේරල දෙන්න. අනේ අපිව නම් වයසට යවන්න එපා. අපේ නම් දත් වැටෙන්න එපා. කෙස් පැහෙන්න එපා. හම රැලි වැටෙන්න එපා. කොන්ද කුදු වෙන්න නම් එපා. අනේ අපිව නම් චුත කරවන්න එපා." පුළුවන් ද එහෙම කරන්න.

එතකොට ඒ එකක් වත් අපට කාගෙන්වත් ඉල්ලලා කරන්න බැහැ. නමුත් මේක අවබෝධ කරන තුරු අර දෘෂ්ඨි දෙකේ ඉන්න නිසා ලෝක සත්වයා නොයෙක් ආකාරයට දෘෂ්ඨිවලට පැටලි පැටලී යනවා. හිතන්නේ මේ නො පෙනෙන ලෝකයේ කැමැත්ත අනුව තමයි හැම දෙයක් ම සිද්ධ වෙන්නේ. එහෙම හිතලා තමයි ලෝක සත්වයා බොහෝ සෙයින් වැඩ කරන්නේ. එක්කෝ හිතනවා මේ නො පෙනෙන ලෝකය මවපු එක්කෙනෙක් ඉන්නවා. එහෙම නැත්නම් හිතනවා මවපු එක්කෙනෙක් නෑ. ලෝකෙ ග්‍රහවස්තු තියෙනවා. ඒ ග්‍රහවස්තු කැරකෙන විදිහට තමයි අපට කැරකෙන්න වෙලා තියෙන්නෙ.

## අන්ත දෙකට නො පැමිණ දහම් දෙසනවා...

බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙනවා **(සබ්බං අත්ථීති බෝ කච්චාන, අයමේ බෝ අන්තෝ)** පින්වත් කච්චාන, සියල්ල ඇත කියන එක මේකෙ එක අන්තයක්. **(සබ්බං නත්ථීති අයං දුතියෝ අන්තෝ)** සියල්ල නැත කියන එක මේකෙ දෙවෙනි අන්තය. **(ඒතේ තේ කච්චාන, උභෝ අන්තේ අනුපගම්ම)** පින්වත් කච්චාන, මේ අන්ත දෙකට ම එන්නේ නෑ **(තථාගතෝ)** තථාගතයන් වහන්සේ. **(මජ්ජේනං තථාගතෝ ධම්මං දේසේති)** තථාගතයන් වහන්සේ මේ අන්ත දෙකට ම එන්නෙ

නැතිව සියල්ල ඇත කියන අන්තයත්, සියල්ල නැත කියන අන්තයත් මේ අන්ත දෙකට ම එන්නෙ නැතිව තථාගතයන් වහන්සේ මැදින් ධර්මය දේශනා කරනවා.

අවිද්‍යාව හේතු කරගෙන සංස්කාර ඇතිවේ. සංස්කාර හේතු කරගෙන විඤ්ඤාණය ඇතිවේ. විඤ්ඤාණය හේතු කරගෙන නාම රූප ඇතිවේ. නාම රූප හේතු කරගෙන සළායතන ඇති වේ. සළායතන හේතු කරගෙන ස්පර්ශය ඇති වේ. ස්පර්ශය හේතු කරගෙන වේදනාව ඇති වේ. වේදනාව හේතු කරගෙන තණ්හාව ඇති වේ. තණ්හාව හේතු කරගෙන උපාදාන ඇති වේ. උපාදාන හේතු කරගෙන භවය ඇති වේ. භවය හේතු කරගෙන ඉපදීම ඇති වේ. ඉපදීම හේතු කරගෙන ජරා, මරණ, ශෝක, වැළපීම්, දුක්, දොම්නස් සියල්ල ම ඇති වේ. ඔන්න ඔය විදිහටයි දුකේ හට ගැනීම ඇතිවෙන්නේ.

ඒ අවිද්‍යාව ඉතුරු නැතිව නිරුද්ධ වීමෙන් සංස්කාර නිරුද්ධ වෙනවා. සංස්කාර නිරුද්ධ වීමෙන් විඤ්ඤාණ නිරුද්ධ වෙනවා. විඤ්ඤාණ නිරුද්ධ වීමෙන් නාම රූප නිරුද්ධ වෙනවා. නාම රූප නිරුද්ධ වීමෙන් ආයතන හය නිරුද්ධ වෙනවා. ආයතන හය නිරුද්ධ වීමෙන් ස්පර්ශය නිරුද්ධ වෙනවා. ස්පර්ශය නිරුද්ධ වීමෙන් වේදනාව නිරුද්ධ වෙනවා. වේදනාව නිරුද්ධ වීමෙන් තණ්හාව නිරුද්ධ වෙනවා. තණ්හාව නිරුද්ධ වීමෙන් උපාදාන නිරුද්ධ වෙනවා. උපාදාන නිරුද්ධ වීමෙන් භවය නිරුද්ධ වෙනවා. භවය නිරුද්ධ වීමෙන් ඉපදීම නිරුද්ධ වෙනවා. ඉපදීම නිරුද්ධ වීමෙන් ජරා, මරණ, සෝක, වැළපීම්, දුක්, දොම්නස්, උපායාස සියල්ල නිරුද්ධ වෙලා යනවා. මේ විදිහට යි මුළු මහත් දුක් රැස ම නිරුද්ධ වෙලා යන්නේ.

## කවදා නම් අපි නිදහස් වෙමු ද?

ඔබට දුක් විඳින විට හිතේවි අනේ අපිට කවදාද මේ දුක ඉවර වෙන්නේ? කවදාද මේ දුක නැති වෙන්නේ? දැන් ඔබ දන්නවා අවිද්‍යාව ඉතුරු නැතිව ඉවර වුණු දවසට මේ දුක සම්පූර්ණයෙන් ම නැතිවෙලා යනවා.

දවසක් බුදුරජාණන් වහන්සේ මේ පටිච්ච සමුප්පාදයේ හට ගැනීමත්, නැතිවීමත් තනියම සජ්ඣායනය කරමින් හිටියා. හවස් වරුවක විහාරේ හෙවනැල්ලේ වාඩිවෙලා **අවිජ්ජා පච්චයා සංඛාරා...** කියල. ඊට පස්සේ **අවිජ්ජායත්වේව අසේස විරාග නිරෝධා....** කියල පටිච්ච සමුප්පාදය නිරුද්ධ වීම සජ්ඣායනය කළා. එතකොට එක

ස්වාමීන් වහන්සේ නමක් ඇවිදිල්ලා අහගෙන හිටියා. බුදුරජාණන් වහන්සේ දැක්කා කවුද ආවා වගේ. දැකලා බැලුවා 'මෙහෙ එන්න' කියල කථා කළා. 'අහගෙන ද හිටියේ?' කියල ඇහුවා. 'එහෙමයි ස්වාමීනී' කීවා. 'මොකක්ද ඇහුනේ?' 'පටිච්ච සමුප්පාදයේ හට ගැනීම ගැනත් නිරෝධය ගැනත්.' හොඳට මතක තියාගන්න කිව්වා. හොඳට පාඩම් කරගන්න කීවා. අර්ථ සහිතව මෙනෙහි කරන්න කීවා. ඕක තමයි මේ නිවන් මගේ මුල.

## අපි අපි ම කරගන්න ඕනෙ

එතකොට මේ ධර්මය අපි දන්නේ නැත්නම්, නුවණින් මෙනෙහි කරන හැටි ඉගෙන ගෙන නැත්නම්, පුරුදු කරන්නා වූ ආකාරය අපි දන්නේ නැත්නම්, වචනයේ අර්ථ දන්නේ නැත්නම්, අපට පුලුවන් වෙයි ද මේ දුක් දොම්නස් වලින් නිදහස් වෙන්න. බැහැ. එතකොට බුදුරජාණන් වහන්සේ මහා කරුණාවෙන් මේක අපට දේශනා කළා.

හැබැයි මේක කරගන්න ඕනෙ කවුද? තම තමන් ම කරගන්න ඕනෙ. බාහිර කෙනෙක් මේක කරලා දෙන්නේ නෑ. බාහිර කෙනෙකුට මේක කරලා දෙන්න පුලුවන් කමකුත් නෑ. කොටින් ම බුදුරජාණන් වහන්සේටවත් තවත් කෙනෙකුට මේක කරලා දෙන්න බෑ. උන්වහන්සේටත් පුළුවන් මේක මෙහෙමයි මෙහෙමයි තියෙන්නේ කියල ක්‍රමය කියලා දෙන්න විතරයි. මේක තමන් කරගන්න ඕනෙ. මේක ධර්මයේ උපමා කරලා තියෙන්නේ කුමක් හැටියට ද? පහුරක් හැටියට.

## මෙතෙරින් එතෙරට...

**ආසිවිසෝපම සූත්‍රයේ** විස්තර වෙන්නේ කොහොම ද? සතර මහා ධාතු නැමති භයානක සර්පයෝ හතර දෙනාගෙන් බැටකාලා දුවන කොට, පංච උපාදාන ස්කන්ධය නැමති වධකයා පන්නනවා. නන්දිරාගය නැමැති හයවෙනි වධකයාත් පන්නනවා. පන්නන කොට එයාට යන්න තිබුණේ කොහාට ද? ඇස, කණ, නාසය, දිව, කය, මනස කියන හිස් ගෙරදට. එතකොට මංපහරන හොරු එනවා. රූප, ශබ්ද, ගන්ධ, රස, පහස, අරමුණු ඇවිල්ලා මංකොල්ල කනවා. බේරෙන්න ඕනෙ. මෙතෙර බය සහිතයි. එතෙරට යන්න ඕනෙ.

ගියා ම ගඟක් තියෙනවා. මොකක්ද ඒ ගඟ? **(කාම ඕඝය)** කාමය නැමති සැඩ පහර ගලාගෙන යනවා. **(භව ඕඝය)** භවය නැමැති සැඩ පහර ගලාගෙන යනවා. **(දිට්ඨි ඕඝය)** දෘෂ්ඨිය නැමැති සැඩ

පහර ගලාගෙන යනවා. (**අවිජ්ජා ඕඝය**) අවිද්‍යාව නැමති සැඩපහර ගලාගෙන යනවා. මේ සැඩ පරහට අහුවෙන්නේ නැති වෙන්න යන්න පාලමකුත් නෑ. ඔරුවකුත් නෑ. තොටියෙකුත් නෑ. ඇරලවන්න කෙනෙක් නෑ. හැබැයි එතෙරට ගියොත් නම් හරි.

## දෙගොඩතලා යන සැඩපහරින් එතෙර වෙන්න නම්...

කාමයට අහුවෙන්නෙ නැතිව, දෘෂ්ඨී වලට අහුවෙන්නෙ නැතිව, භවයට අහුවෙන්නෙ නැතිව, අවිද්‍යාවට අහුවෙන්නෙ නැතිව යන්න නම් පහුරක් තියෙන්න ඕනෙ. අන්න පෙන්වා දෙනවා ආර්ය අෂ්ඨාංගික මාර්ගය. පහුර හදලා දෙන්න කෙනෙක් නෑ. තමා විසින් මේ පහුර හදාගන්න ඕනෙ. තමන් ම ලී ටික මූට්ටු කරලා වැල් පට වලින් ගැටගහන්න ඕනෙ. මේක ඇදගෙන යන්න ඕනෙ ගඟට. තමන් ම වතුරට දාන්න ඕනෙ. තමන්ට ඒකට පනින්න ඕනෙ. තමන් ම පීනගෙන යන්න ඕනෙ වීරියෙන්.

## කොහොම හරි පහුර හදාගන්න ඕනෙ...

මේ ගඟ කියන්නේ මොකක් ද? සැඩ පහරවල් හතරක්. මේ සැඩපහරවල් වලට යට වෙන්නෙ නැති වෙන්න යන්න පුළුවන් වෙන්නේ පහුරෙන් විතරයි. මොකක්ද ඒ පහුර? ඒ තමයි ආර්ය අෂ්ඨාංගික මාර්ගය. ඒකෙන් විතරයි කාම ඕඝයට හසු නොවී, භව ඕඝයට හසු නොවී, දිට්ඨි ඕඝයට හසු නොවී, අවිජ්ජා ඕඝයට හසු නොවී යන්න තියෙන ක්‍රමය. මේක තමන් විසින් ම හදාගන්න ඕනෙ. බලෙන් කිසිම ආකාරයකින් කරන්න පුළුවන්කමක් නෑ.

බුදුරජාණන් වහන්සේ මහා කරුණාවෙන් පුදුම විදිහකට අපට මේවා කියලා දෙනවා. තම තමන් මේක ඇති කරගන්න. මේක තව කෙනෙක් තවත් කෙනෙක්ට ඇති කරලා දෙනවා නම්, බුදු රජාණන් වහන්සේ මොහොතක් නො බලා එක දිගට ම කරගෙන යනවා. කරන්න බැහැ එහෙම.

## මහණ වුනා කියලත් ප්‍රශ්ණය විසඳෙන්නෙ නෑ...

දැන් බලන්න නන්ද කුමාරයා. බුදුරජාණන් වහන්සේ දැක්කා නන්ද කුමරයා මේ ජීවිතයේ දී ම නිවන් දකින කෙනෙක්. ගිහි ජීවිතයේ පැටලි පැටලි සංසාරෙ යන අය නෙවෙයි. ඔක්කොම එකට ඉපදුනේ නිවන් දකින අය. බුදුරජාණන් වහන්සේ නන්ද කුමාරයාගේ අතට පාත්තරය දීලා ඉස්සරහින් වඩිනවා. එතකොට ජනපද කල්‍යාණී දැකලා

කිව්වා 'ආර්ය පුත්‍රය, ඉක්මනට එන්න' කියල. මේක නන්ද කුමාරයාගේ හිතට වැදුනා.

බුදුරජාණන් වහන්සේ නන්ද කුමාරයාගෙන් මහණ වෙමුද කියල ඇහුවා. මහණ කළා. ඒත් හිත මහණ කළේ නෑ. දැන් බලන්න බුදුරජාණන් වහන්සේට පුළුවන් නම් තව කෙනෙක් ධර්මයට දාලා දෙන්න, ඉක්මනට දාලා දෙනවා නේද? ටික දවසකින් නන්ද ස්වාමීන් වහන්සේට මතක් වෙන්නේ කාවද? ජනපද කළ්‍යාණිව. නන්ද ස්වාමීන් වහන්සේ ඇස් වල අඳුන් ගාන්න පටන් ගත්තා. ලස්සන දිලිසෙන සිවුරක් පොරවන්න පටන් ගත්තා. කැටයම් දාපු පාත්තරයක් පාවිච්චි කරන්න පටන් ගත්තා.

## කවදාද මම දකින්නේ?

බුදුරජාණන් වහන්සේ නන්ද ස්වාමීන් වහන්සේ දැකලා කියනවා මම මේ කල්පනා කරන්නේ නන්ද ඔය ඇස් වල ගාපු අඳුන් ටික හෝදල දාල, පාංශුකූල සිවුරක් පොරවගෙන මැටි පාත්තරයක් අතට ගන්නෙ කවද්ද කියල. නමුත් මේ ස්වාමීන් වහන්සේ ඒක කරන්නෙ නෑ. නමුත් අන්තිමේ දී නන්ද කුමාරයා තීරණය කළා සිවුරු අරින්න. අනිත් අයට කියනවා 'මට නම් දැන් ඇල්මක් නෑ. අමාරුයි මේක කරන්න. හිත පිහිටන්නෙ නෑ.' දැන් බලන්න තමන් ම යි මේක කරගන්න ඕනෙ බාහිර කෙනෙකුට මේක කරල දෙන්න බෑ.

බුදුරජාණන් වහන්සේ ළඟට නන්ද ස්වාමීන් වහන්සේ එක්කන් ගියා. 'නන්ද ඇයි මොකද?' කියල ඇහුවා. 'ස්වාමීනී, මට බඹසර පිහිටන්නෙ නෑ. මම යනවා' කිව්වා. 'ඇයි යන්නේ?' කියල ඇහුවා. 'මට මතක් වෙනවා. මම එන දවසෙ ජනෙල් පියන් දෙක ඇරලා ඔලුව පාත්කරලා බැලුවා. එතකොට මනාකොට කටු ගහපු කොණ්ඩෙ ගොතලා, ඇස් ලොකු කරලා බැලුවා. බලලා කිව්වා 'ආර්ය පුත්‍රය, වහා එන්න' කියල. ස්වාමීනී මේක ම යි මගේ හිතේ තියෙන්නේ.'

## දිව්‍ය ලෝකයේ අපූරු චාරිකාව...

දැන් මොකද කරන්නේ? මේකෙන් බේරෙන්න ඕනෙ නෙ. තමන්ට බේරෙන්න ශක්තියක් නෑ. බුදුරජාණන් වහන්සේ මොකද කීවෙ? 'නන්ද අපි ගමනක් යමු' කියලා අතින් අල්ලගත්තා. අල්ලගෙන තව්තිසාවට බුදුරජාණන් වහන්සේ වැඩම කළා. එතකොට බුදුරජාණන් වහන්සේ දැකපු ගමන් දිව්‍ය අප්සරාවෝ පෙළ ගැහි ගැහී ඇවිත් වන්දනා

කළා. නන්ද ස්වාමීන් වහන්සේ හොරෙන් බලනවා. හොරෙන් බලන කොට දකිනවා රෝස පාට දෙපා. රන්වන් සිරුරු. ආභරණ වලින් බබලන දිව්‍ය අප්සරාවෝ. 'නන්ද දැක්කද?' 'ස්වාමීනී, දැක්කා' 'ජනපද කල්‍යාණී ද හැඩ, රුවින් උතුම් මේ අය ද?' 'ස්වාමීනී, ජනපද කල්‍යාණී හේනේ පුළුටු වෙච්ච වැඳිරියක් වගේ' කියල. එතකොට බුදුරජාණන් වහන්සේ එහෙම එකක් පෙන්නගෙන ගියා නෙවෙයි. නන්ද ස්වාමීන් වහන්සේගේ හිතේ ඇතිවෙච්ච හැඟීම කීවා 'ස්වාමීනී, ජනපද කල්‍යාණී නම් හේනේ පිච්චිච්ච වැඳිරියක් වගේ' කියල.

ඊට පස්සෙ කියනවා 'එහෙනම් නන්ද, බඹසර හැසිරෙන්න මෙයාල 500 ක් පුළුවන් ගන්න' 'ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, ඇප වෙනව ද?' කියල ඇහුවා. බලන්න බුදුරජාණන් වහන්සෙගේ මහා කරුණාව. දැන් බුදුරජණන් වහන්සේ දන්නවා මෙයා ධර්ම මාර්ගයට ආවොත් නිවන කරා යනවා. 'හොඳයි මම ඇප වෙනවා' කිව්වා. එක්කගෙන ආවා.

## පොරොන්දුවෙන් නිදහස්...

ධර්ම මාර්ගය තුළ මොනවද තියෙන්නේ? **සතර සතිපට්ඨානය, සතර සෘද්ධිපාද, සතර සම්‍යක් ප්‍රධාන වීර්යය, පංච බල, පංච ඉන්ද්‍රිය, සප්ත බොජ්ඣංග, ආර්ය අෂ්ඨාංගික මාර්ගය.** මේක ප්‍රගුණ කරන කොට කායානුපස්සනාවේ හිත පිහිටියා. එතකොට මොකද වෙන්නේ? කයේ යථා ස්වභාවය අවබෝධ කරගත්තා. ජේන්න පටන් ගත්තා. වේදනානුපස්සනාවේ හිත පිහිටියා. වේදනාවන්ගේ යථා ස්වභාවය අවබෝධ කරගත්තා. චිත්තානුපස්සනාවේ පිහිටියා. හිතේ යථා ස්වභාවය ජේන්න පටන් ගත්තා. ධම්මානුපස්සනාවේ හිත පිහිටියා. පංච නීවරණයන්ගේ, පංච උපාදානස්කන්ධයේ යථා ස්වභාවය ජේන්න පටන් ගත්තා. මනාකොට සතර සතිපට්ඨානයේ හිත පිහිටියා. බොජ්ඣංග ධර්මයන් වැඩෙන්න පටන් ගත්තා. **සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපේක්ඛා** කියන මේ බොජ්ඣංග ධර්මයන් වැඩෙන්න පටන් ගන්න කොට මොකද වුනේ? කාමාශ්‍රවයන්ගෙන් හිත නිදහස් වුනා. භවාශ්‍රවයන්ගෙන් හිත නිදහස් වුනා. අවිජ්ජාශ්‍රවයන්ගෙන් හිත නිදහස් වුනා. උතුම් රහතන් වහන්සේ නමක් බවට පත්වුනා. බුදුරජාණන් වහන්සේ ළඟට ගියා. ගිහින් කියනවා 'ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, මං මේ ආවේ භාග්‍යවතුන් වහන්සේව පොරොන්දුවෙන් මුදවන්නයි' කියල. 'ස්වාමීනී, ඒ අය දැන් මට එපා.' 'පින්වත් නන්ද, ඔබ යම් මොහොතක අරහත්වයට පත් වුනා ද, ඒ අරහත්වයට පත්වීමත් සමඟ ම ඒ පොරොන්දුවෙන් මං නිදහස්' කිව්ව.

## තමන් හිසට තම අත ම ය සෙවණැල්ල...

දැන් බලන්න බුදුරජාණන් වහන්සේ ඒකෙන් පැහැදිලිව ම පෙන්වා දෙනවා මේ ධර්ම මාර්ගය දියුණු කරගන්න ඕනෙ තමා ම යි. තමාට ම යි මේක කරගන්න තියෙන්නෙ. එහෙම නම් අපි හොඳට තේරුම් ගන්න ඕනෙ තමා ම යි තමන්ව රැකගන්න තියෙන්නෙ. **(අත්තදීපා භික්ඛවේ, විහරථ අත්ත සරණා අනඤ්ඤ සරණා)** තමන් ම යි පිළිසරණ ඇතිකරගන්න තියෙන්නෙ. බාහිර කෙනෙකුට මේ පිළිසරණ ඇතිකරලා දෙන්න පුළුවන්කමක් නෑ. සිහිය උපද්දවාගන්න එක, සිහිය පිහිටන එක, අකුසල් දුරු කරන එක, සම්මා දිට්ඨිය ඇති කෙනාට හොඳට යෝනිසෝ මනසිකාරය ඇතිවෙනවා. අයෝනිසෝ මනසිකාරයත් දන්නවා. දෙකම දන්නවනෙ. එතකොට එයා සම්මා දිට්ඨිය තියෙන නිසා සම්මා වායාම ඇති කරගන්නවා. සම්මා වායාම කියන්නේ,

- **උපන් අකුසල් දුරු කිරීම,**
- **නූපන් අකුසල් නූපදවා ගැනීම,**
- **නූපන් කුසල් උපදවා ගැනීම,**
- **උපන් කුසල් දියුණු කර ගැනීම.**

මේ වීරිය කරන කොට වැඩෙන්නේ සම්මා සති. මේ තුළ ටිකෙන් ටික දියුණු වෙන්නේ සම්මා දිට්ඨි, සම්මා වායාම, සම්මා සති.

## සයුර මැද දූපතක් වේද ඔබ?

පින්වතුනි, මේකෙන් හොඳට පේනවා තමන්ගේ කැපවීම, උත්සාහය, සිහිය, නුවණ මත තමයි මේ ධර්ම මාර්ගය සම්පූර්ණයෙන් ම දියුණු වෙන්නේ. එහෙම නැතිව කිසිම බාහිර දෙයකින් මේක කරන්න බැහැ. එතකොට අපි මේකෙන් හොඳට තේරුම් ගන්න ඕනෙ තම තමන් විසින් තමයි තමන්ව රැකගන්න ඕනෙ. **(අත්තදීපා)** තමාව දූපතක් කරගන්න. **(අත්තසරණා)** තමාව පිහිට කරගන්න. **(අනඤ්ඤසරණා)** වෙන පුද්ගලයෙක්ව පිහිට කරගන්න එපා. **(ධම්මදීපා)** ධර්මය දූපතක් කරගන්න. **(ධම්මසරණා)** ධර්මය සරණ කරගන්න. **(අනඤ්ඤසරණා)** වෙනදෙයක් සරණ කරගන්න එපා.

## නිවන් දකින්නටයි ආවේ... ඒත් මේ මොකද?

මේකෙ අර්ථය හොඳට තේරෙන්නේ මේ ධර්මය නුවණින් විමස විමසා බලද්දි තමයි. හරියට ධර්ම මාර්ගය අල්ලගත්තොත් වෙන්න

ඕනෙ දේ තමයි, තමන් තුළ යම් මාන්නයක් තිබුණ නම්, ඒ මාන්නය නැතිවෙන්න ඕනෙ. නැති මාන්නය ඇති වෙනව නම් එයාට ධර්මය අහුවෙලා නෑ. පාඩම් හිටිනවා කියල, හැඩට කියන්න පුළුවන් කියල මාන්නයක් ඇති වුනොත් එහෙම එයාට වැරදිලා. ඒ නිසා ධර්ම මාර්ගය තුළ යනවා නම් තියෙන්නෙ ඕනෙ නිහතමානී වීම. සත්පුරුෂ ගුණධර්ම දියුණු කරගෙන, කෙලෙහි ගුණ දන්නා දක්නා කෙනෙක් වෙලා ධර්ම මාර්ගයේ ගමන් කරන්න ඕනෙ.

පින්වතුනි, තම තමන්ගේ ජීවිතය ගැන නුවණින් විමස විමසා යනකොට තම තමන්ට හොඳට පිහිටන්න ගන්නවා ශ්‍රද්ධාව, සිහිය, වීරිය, සමාධිය, ප්‍රඥාව. තම තමන් මනාකොට ධර්මයේ පිහිටීම තමයි තම තමන්ගේ රැකවරණය. බුදුරජාණන් වහන්සේ පෙන්වා දීලා තියෙනවා මේ ධර්ම මාර්ගයේ ගමන් කරන කෙනෙක් ධර්ම මාර්ගයෙන් වුවමනා කාරණයට යනකම් ම පටන් ගත්තු වැඩපිළිවෙල අතඅරින්න එපා කියල.

දැන් අපි ගත්තොත් ගෞතම බුද්ධ ශාසනය තුළ ධර්මය අවබෝධ කරන්න ඕනෙ කියල. මේ ජීවිතයේ ඔන්න තෙරුවන් සරණ ගියා. තෙරුවන් සරණ ගිහින් ධර්මය ශ්‍රවණය කළා. සිත පහදවා ගත්තා. සිල් සමාදන් වෙලා පිහිටියා. නුවණින් මෙනෙහි කරනවා. සිහිය උපද්දවා ගන්නවා. සතිපට්ඨානය වඩනවා. මේවා කරන්නේ අද කරලා අතඅරින්න ද? නැහැ. මේ බුද්ධ ශාසනය තුළ මේ දුකේ නිමාවක් දකින තුරු ම මේ ඉලක්කයට යන්න පුලුවන් වෙන්නෙ අපි ශක්තිමත් වුනොත් තමයි.

## කිලිටි වුනත්, පිරිසිදු වුණත් තමා ම යි...

තමන් පිළිසරණ කරගෙන යන ගමනේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, **(අත්තනාව කතං පාපං අත්තනා සංකිලිස්සති)** තමාගෙන් කෙරෙන පව් වලින් තමයි තමන් කිලිටි වෙන්නේ. **(අකතං පාපං අත්තනාව විසුජ්ජති)** තමන් විසින් පව් නො කිරීමෙන් තමයි පිරිසිදු වෙන්නේ. **(සුද්ධි අසුද්ධි පච්චත්තං නාඤ්ඤමඤ්ඤෝ විසෝධයේ)** පිරිසිදු වීම හෝ අපිරිසිදු වීම හෝ පෞද්ගලික දෙයක්. තව කෙනෙක් තව කෙනෙක්ව පිරිසිදු කරන්නෙ නැහැ. බලන්න කොයිතරම් පැහැදිලි දෙයක් ද කියලා.

ලොකු පොඩි කතාවක් නෑ. දුප්පත් පොහොසත් කථාවක් නෑ. උගත් නූගත් කථාවක් නෑ. ලාබාල වැඩිමහලු කථාවක් නෑ. මේකෙ

තියෙන්නෙ මෙයාට තේරෙනවා නම් මේ ජීවිත ගමනේ තමන් තමන්ව පිළිසරණ කරගෙන යන්න තියෙන ගමනක් කියලා එච්චරයි.

## හැබෑම අනතුර තේරුම් ගත්තොත් ඔබ දිනුම්...

බැරිවෙලාවත් මග ඇරුණොත් අන්න එතන තමයි අනතුර තියෙන්නෙ. දැන් අපි කියමු මනුස්සයෙක් මැරුණා. පෙරේතයෙක් වෙලා ඉපදුනොත් අන්න ඉවරයි. එතන ඉඳලා එයාට මේක දියුණු කරන්න බෑ. ඊට පස්සෙ ඕනෙ නම් එයාට පින් අනුමෝදන් වේවි. ඒකෙන් බඩගින්න නැතිවෙයි, ඇඳුම් ලැබෙයි, පෙරේත ලෝකෙන් මිදෙන්න බෑ. හිත දියුණු කරන්නත් බෑ. එතකොට එතනින් චුත වෙලා නිරයේ ගියොත් තවත් නෑ. ඔහොම ගිහින් තිරිසන් අපායට වැටුනොත් තවත් නෑ. මෙහෙම කැරකිලා යන ලෝකෙක ආයෙමත් මනුස්ස ලෝකොට එනකොට මේ ටික කියල දෙන්න කෙනෙක් නෑ. එහෙම අනතුරුදායක දෙයක් මේ සංසාරය කියන්නේ.

## සැක කරන්නෙ නෑ...

ඒ නිසා ධර්මයේ පිහිටලා, ධර්මය තුළ රැඳිලා, මේ ධර්මයෙන් පිළිසරණක් තමන් ඇතිකරගන්න ඕනෙ කියන අදහසට එන්න ඕනෙ අවබෝධයෙන් ම. කච්චානගොත්ත සූත්‍රයේ දී පෙන්වනවා දුකත්, දුකේ නිරුද්ධ වීමත් ගැන මෙයා පටිච්ච සමුප්පාදය ගැන තේරුම් ගත්තා නම්, **(න කංඛති)** සැක කරන්නෙ නෑ. **(න විචිකිච්ඡති)** විචිකිච්ඡා කරන්නෙ නෑ. **(අපරප්පච්චයා ඤාණමේවස්ස එත්ත හෝති)** පටිච්ච සමුප්පදාය හටගන්නා ආකාරය ගැනත් පටිච්ච සමුප්පාදය නිරුද්ධ වන්නා ආකාරය ගැනත් මෙයාට ඤාණයක් තියෙනවා, බාහිර කෙනෙකුගෙන් උදව් නො ලබන.

## බුද්ධිමතුන්ට ධර්මය...

ධර්මය තුළින් කෙනෙකුට කොයි තරම් ස්වාධීන මනුස්සයෙක් වෙන්න පුළුවන්කම තියෙනවද? එතකොට ඒ ස්වාධීනත්වය තියෙන්නෙ තමන් ඇති කරගන්නා වූ ධර්මය තුළ යි. මේ ස්වාධීනත්වය කියන්නේ ආඩම්බරකමක් නො වෙයි. නිදහස් කල්පනාවක්. **(පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි)** බුද්ධිමත් අය විසින් වෙන් වෙන් වශයෙන් අවබෝධ කරගන්නවා. ඒ කියන්නෙ එක එක්කෙනා නුවණින් විමසලා අවබෝධ කරගන්නවා. කවුරුත් නුවණින් විමසුවේ නැත්නම් කවුරුවත් අවබෝධ කරන්නෙ නෑ.

## කළණ මිතුරන් සමඟ නිති ඇසුර...

බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන්නා බාහිරින් ලැබෙන උපකාර අතර කල්‍යාණ මිත්‍රයා තරම් වටින දෙයක් බුදු ඇසින්වත් දකින්නෙ නැහැ කියලා. අභ්‍යන්තර අංගයක් විදිහට යෝනිසෝ මනසිකාරය තරම් දෙයක් දකින්නෙ නැහැ කිව්වා. අභ්‍යන්තර අංගයක් විදිහට යෝනිසෝ මනසිකාරය තිබ්බොත්, බාහිරින් කල්‍යාණ මිත්‍රයා මුණ ගැහුනොත් එයා තුළ චතුරාර්ය සත්‍ය ධර්මය ඇහෙන කොට ඒ යෝනිසෝ මනසිකාරය අවදි වෙනවා. ඒ ධර්මය තුළට යන්න හේතුවක් වෙනවා. ඒ නිසා මේ බුද්ධ ශාසනයේ දී ම උතුම් චතුරාර්ය සත්‍යය අවබෝධ වීම පිණිස ශාස්වත, උච්ඡේද දෘෂ්ඨි වලින් නිදහස් වෙලා හේතූන්ගෙන් හටගත්තා වූ යම් දෙයක් ඇද්ද, හේතු නිරුද්ධ වීමෙන් නිරුද්ධ වන්නා වූ ස්වභාවයෙන් යුක්තයි කියන උතුම් දහම් ඇස ඔබට පහළ කර ගැනීම වාසනාව උදාවේවා!

*සාදු! සාදු!! සාදු!!!*



# පිය සටහන් හඳුනයි නම්...

## ~චූල හත්ථිපදෝපම සූත්‍රය~

*ශ්‍රද්ධාවන්ත පින්වතුනි,*

පොසොන් පුන් පොහොය නිමිති කරගෙන වටිනා ධර්මයකට සවන් දෙන්නයි මේ සූදානම් වෙන්නෙ. පොසොන් පුන් පොහොය දවස සැබැවින් ම ශ්‍රී ලාංකික අපට මංගල්‍ය දිනයක්. ශ්‍රී ලංකාවාසීන් මේ ලෝකෙ අමරණීය ජනතාවක් බවට පත්වෙන්නට මූලික වුනු දවසක්. මේ ලෝකෙ බුද්ධිමත් ජනතාව සියලු දෙනා ම සෑම කල්හි ම ණය ගැති විය යුතු කරුණක් මේ පොසොන් පොහොය දිනයත් එක්ක අපට ලැබුණා. ඒ තමයි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය.

පින්වතුනි, පසුකාලීනව භාරතය පුරා නොයෙක් මතවාද හැදිල, බුදුරජාණන් වහන්සේගේ ධර්මය තම තමන්ට ඕන ආකාරයෙන් විස්තර කරගෙන යද්දී නොයෙකුත් නිකාය වලට ඒ ජනතාව බෙදුන. නමුත් මිහිඳු මහ රහතන් වහන්සේගෙන් අපට ලැබුන ඒ ශ්‍රී සද්ධර්මය, ධර්ම විනය, ජීවිත පරිත්‍යාගයෙන්, මේ ශ්‍රී ලාංකීය භික්ෂූන් වහන්සේලා ප්‍රමුඛ ජනතාව ආරක්ෂා කරගනු ලැබුවා. එපමණකුත් නොවෙයි. මේ ලෝක ඉතිහාසයේ ප්‍රථම වතාවට, මේ මහා භද්‍ර කල්පයේ පහළ වුණු සතරවෙනි බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය, ධර්ම විනය ග්‍රන්ථාරූඪ කිරීමේ ඓතිහාසික කාර්යය සිදු කළේ මේ ශ්‍රී ලාංකීය

ජනතාවයි. සිංහල අකුරෙනුයි එය ලියවුනේ. මේ සිදුවීමත් එක්ක ම, ලෝකයේ අමරණීය නාමයක් සිංහල ජනතාවට හිමි වුනා. පින්වතුනි, මේ පොසොන් කාල පරිච්ඡේදය, අපේ ඒ ප්‍රෞඪ ඉතිහාසය ගැන සිතමින්, අප ජීවිත වලට අළුත් ප්‍රාණයක්, අළුත් ජීවයක්, අළුත් ශක්තියක් උපදවා ගන්නට මේ ධර්ම ශ්‍රවණයමය පුණ්‍ය කර්මය හේතු වෙනව.

## බුදුන්ට පිදූ දේශය....

පින්වතුනි, මිහිඳු මහ රහතන් වහන්සේ මේ ලංකාවට වැඩම කරල ප්‍රථම වරට දේශනා කළ සූත්‍රය තමයි, **'චූළ හත්ථිපදෝපම සූත්‍රය'.** මේ දේශනය කළේ අපේ රටේ හිටපු රජතුමාට. ඒ තමයි දේවානම්පියතිස්ස රජතුමා. මෙතුමාට, චූළ හත්ථිපදෝපම සූත්‍රය වැනි ඉතා ගැඹුරු දේශණයක්, කොපමණ ලස්සනකට පැහැදිලි කරන්නට ඇති ද කියල හිතෙනව. ඒ සූත්‍ර දේශනාව අවසන් වෙනකොට රජතුමා තෙරුවන් සරණ ගිය බුදු රජාණන් වහන්සේගේ ශ්‍රාවකයෙකු බවට පත් වුනා. එතනින් නැවතුනේ නෑ. සියලු දෙනාට ම මේ සුන්දර පණිවුඩය අසන්නට සැලැස්සුවා. මේ සමස්ත ලංකාව ම බුදුරජාණන් වහන්සේ උදෙසා කැපවුනු භූමියක් බවට පත් වුනේත්, ලාංකික ජනතාව උන්වහන්සේගේ ධර්මයේ ආරක්ෂිත පිරිස බවට පත් වුනේත් මිහිඳු මහ රහතන් වහන්සේ විසින් ස්ථාපිත කරන ලද අඩිතාලම නිසයි.

චූළ හත්ථිපදෝපම සූත්‍රයෙන් විස්තර වෙන්නෙ හස්තියෙකුගේ පියවර සටහනක් උපමා කරගෙන සිදුවෙන කතා බහක්. ඒ දවස්වල බුදුරජාණන් වහන්සේ වැඩ සිටියෙ, **සැවැත් නුවර ජේතවනාරාමයේ.** ජානුස්සෝණි කියන බ්‍රාහ්මණයෙක් රථයක නැගිල සැවැත් නුවර පුරා ගමන් කරමින් සිටියදී, දිවා කාලෙක පිලෝතික කියන පරිබ්‍රාජකයෙක් මුණ ගැහුණා. පිලෝතික පරිබ්‍රාජකයා බුදුරජාණන් වහන්සේව මුණ ගැහිල කතා බස් කරල එන ගමන්. ඔහු බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෙකු නොවෙයි. මෙතැනදි ජානුස්සෝණි බ්‍රාහ්මණයා අහනවා,

## ප්‍රශංසා කරන්න පුළුවන් කාට ද?

"පින්වත, ඔබ මේ මධ්‍යහ්නයේ කොහි සිට ද එන්නේ?"

"මා ශ්‍රමණ භවත් ගෞතමයන් සමීපයෙහි සිටයි එන්නේ."

“හොඳයි, මා අසා තියෙනව ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ පෘථුල ඥානයකින් හෙබි කෙනෙකු බව.”

“ඔව්. එය සැබෑවක්. ශ්‍රමණ භවත් ගෞතමයන් ගේ ඥානය ගැන මට විස්තර කරන්නට අමාරුයි. සැබැවින් ම ඒ ඥානය ගැන නිවැරදි අවබෝධයක් ඇතිවෙන්නෙ තවත් එබඳු ම කෙනෙකුට තමයි.”

“එහෙම නම් පින්වත, ඔබ ඒ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ ගැන උදාර ලෙස ප්‍රශංසා කරන කෙනෙකු නේද?”

“ඇත්තයි. නමුත් ඒ ශ්‍රමණ භවත් ගෞතමයන් ගැන මට ප්‍රශංසා කරල අවසන් කරන්න බෑ. උන්වහන්සේ දෙව් මිනිසුන් අතර ශ්‍රේෂ්ඨ කෙනෙක්.”

“එසේ නම් පින්වත, ඔබ ශ්‍රමණ භවත් ගෞතමයන් කෙරෙහි පැහැදුනේ ඔය චිත්ත ප්‍රසාදය ඇති කර ගනු ලැබුවේ කුමන කරුණක් නිසා ද?”

## ඇත් පියවර උපමාව....

මෙතනදි පිලෝතික පරිබ්‍රාජයකයා උපමාවක් කියනව. “පින්වත් ජානුස්සෝණි, එය මෙවැනි දෙයක්. හස්තීන් ගැන මැනවින් දන්නා කෙනෙක් හස්තීන් සිටින වනයකට යනවා. එහි ඇවිදිමින් සිටියදී, ඇතෙකුගේ පියවර සටහනක් දකින්නට ලැබෙනවා. ඒ විශාල පියවර සටහන දුටු පමණින් ම, ඒකාන්තයෙන් ම, විශාල හස්තියෙකු මේ වනයේ ඇති බවට ඔහු නිශ්චයකට පැමිණෙනවා. එලෙස මම ද ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ ගැන ස්ථිර අදහසකට පැමිණුනා. **(සම්මා සම්බුද්ධෝ භගවා...)** ඒ භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධ වන සේක. **(ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ....)** ඒ භාග්‍යවතුන් වහන්සේගේ විසින් මනාකොට දේශනා කළ ධර්මයකි. **(සුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ....)** ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකත්වයට පත්වෙන පිරිස මනා ප්‍රතිපත්තියකින් යුක්ත වූවෝය.. යන තීරණයට මම ආවා.”

## ක්ෂත්‍රියන්ගේ ප්‍රශ්න පත්‍රය...

ඊට පස්සේ පිලෝතික පරිබ්‍රාජකයා විස්තර කරනව ඒ කාරණා ආව හැටි. ඒ ලක්ෂණ පිළිවෙලින් කියන්න ගත්තා මෙහෙම. “ඉතාමෙ

දක්ෂ ලෙස වාද විවාද කරන මතවාද ඛණ්ඩනය කරන ක්ෂත්‍රිය පණ්ඩිතයෝ ප්‍රශ්න සකසා ගෙන බුදුරජාණන් වහන්සේ හමුවට යනවා. උන්වහන්සේ විසින් මේ ජීවිතය අවබෝධ කොට ගත යුතු අයුරු දේශනා කළ විට, තමන් කලින් සකසා ගන්නා ලද ප්‍රශ්න නො අසා ම ඔවුහු භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයන් බවට පත්වෙනවා. එලෙස ම බ්‍රාහ්මණ පණ්ඩිතයෝ ද, ගෘහපති පණ්ඩිතයෝ ද, ශ්‍රමණ පණ්ඩිතයෝ ද, උන්වහන්සේ සමඟ වාද විවාද කිරීමට ගොස්, උන්වහන්සේ ප්‍රකාශ කරන කරුණු තුළ ඇති බුද්ධිමත් භාවය අවබෝධ කරමින්, බුද්ධ ශාසනයෙහි පැවිදි වීමට ඉල්ලා සිටිනවා...."

මෙන්න මේ කරුණු හතර ඉදිරිපත් කළාට පස්සේ ජානුස්සෝණි බ්‍රාහ්මණයාටත් ලොකු ශ්‍රද්ධාවක් ඇතිවුනා බුදුරජාණන් වහන්සේ ගැන. ඔහු ගමන් කරමින් සිටි රථයෙන් බැහැලා, උතුරු සළුව ඒකාංශ කරල පොරවල, ජේතවනාරාමය පැත්තට හැරිල "ඒ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!" කියල වන්දනා කළා. උන්වහන්සේ බැහැදකින්නට කැමැත්තක් ඇතිවුනා.

දවසක් ජානුස්සෝණි බ්‍රාහ්මණයා, බුදුරජාණන් වහන්සේව මුණගැහෙන්නට ගියා. මේ බුද්ධ ශාසනයේ උන්වහන්සේගේ ශ්‍රාවක පිරිස් ඇති වෙන හැටි පිලෝතික පරිබ්‍රාජකයාගෙන් අසා දැන ගත් බව කිව්වා. හස්තියෙකුගෙ පිය සටහන උපමාව කිව්වා.

## නියම ශාසනය කුමක් ද?

පින්වතුනි, මෙතනදි තව කාරණයක් තියෙනව අපට දැනගන්න. මොකක් ද? මේ ශාසනය බුදුරජාණන් වහන්සේගේ ශාසනය යි. නමුත් වර්තමානයේ මේ රටේ ව්‍යවහාර වෙනව වැරදි ව්‍යවහාර කීපයක්. ඒ තමයි භික්ෂු ශාසනය, භික්ෂුණී ශාසනය කියල ව්‍යවහාර කිරීම. ශාසනය කියන වචනය පිරිස කියන අදහසට කිසිම තැනක පාවිච්චි වෙන්නෙ නැහැ. ශාසනය කියන වචනය පාවිච්චි වෙන්නේ බුදුරජාණන් වහන්සේ ගැන නම්, උන්වහන්සේ වදාළ ධර්ම විනයට යි. භික්ෂු, භික්ෂුණී කියල කියන්නේ ශ්‍රාවක පිරිසක්. භික්ෂු ශාසනය, භික්ෂුණී ශාසනය කියල එකක් නැහැ. සංඝ කියල කියන්නේ ශ්‍රාවක පිරිසටයි. එහෙම නම් නිවැරදි ව්‍යවහාරය විය යුත්තේ භික්ෂු සංඝ, භික්ෂුණී සංඝ කියලයි. ශාසනයක් පිහිටුවන්න පුළුවන් එක ම එක්කෙනෙකුටයි. ඒ බුදුරජාණන් වහන්සේ. උන්වහන්සේ ගේ ශාසනය බුද්ධ ශාසනය යි.

ඉතින් බුදුරජාණන් වහන්සේ ජානුස්සෝණි බ්‍රාහ්මණයාට කියනවා, "ඔය හස්තීන්ගේ පිය සටහන් තෝරා ගන්න ක්‍රමය ඔයිට වඩා පරිපූර්ණ විය යුතුයි. ඒක මෙන්න මේ ආකාරයටයි විස්තර විය යුත්තේ." කියල ඒක බොහොම ලස්සනට පිළිවෙලින් කියා දෙනව.

## පියවර සටහන දුටු පමණින්....

එකපාරට ම කෙනෙකු හස්තියෙකුගෙ පියවර සටහනක් දුටු පමණින් ම, මේ වනාහී මහා හස්තිරාජයෙකුගේ පියවර සටහනයි කියල නිශ්චයකට පැමිණෙන්නෙ නෑ. හොඳට ඇතුන් ගැන දන්න හොඳට අධ්‍යයනය කරන කෙනෙක් වනයට යනව. එයා දකිනව පුළුල් ඇති පියවර සටහනක්. ඔහු කල්පනා කරනව, මේ සටහනේ හැටියට නම්, මේ කැලේ ඉන්න **'වාමනිකා'** කියන ඇතින්නියගෙ විය යුතුයි. තව දුරටත් ඉදිරියට යන කොට එයා දකිනව තව ඇත් පියවර සටහනක්. ඒ අවට උස් තැන් වල අතු බිඳී ගිහින් තියෙනව. එපමණකින් ම මේ මහා හස්ථියා තමයි කියන නිගමනයට එන්නෙ නෑ. එයා කල්පනා කරනව **'උච්ඡා කාලාරිකා'** කියල ඇතින්නියො ඉන්නව. මේ නම් ඒ ඇතින්නියගෙ සළකුණ වෙන්න ඕනෙ කියල හිතනව. තවත් විමසමින් ඉදිරියට යද්දී, උස් තැන් වල පිට ඉලූ, දළින් පහර දුන් ගස් හමුවෙනව. ඒ වගේම ලොකු පළල් ඇත් පියවර සටහන් දකිනව. මේ නම් **'උච්ඡා කණේරුකා'** කියන ඇතින්නගෙ විය යුතු බව සිතනවා. තවදුරටත් විමසමින් යනකොට ඔහු දකිනව, උස් ගස් වලට දළින් පහර දුන්, උස් ස්ථාන වල අතු ඉති බිඳී ගිය, පිට ඉලුව තැන්. ඒ අසල ඉතා දිගු පුළුල් ඇත් පියවර සටහනක් දකින්ට ලැබෙනව. එතැනදි නිශ්චයකට පැමිණෙනව මේ නම් මහා හස්තිරාජයෙක් ම විය යුතුයි කියල. වටපිට බලද්දී නිශ්චය කරගත් විදිහට ම මහා හස්ථිරාජයෙක් ගහක් යට ඉන්නව දකින්නට ලැබෙනව. බුදුරජාණන් වහන්සේ වදාළා, අන්න ඒ විදිහට තමයි නිශ්චයකට එන්න ඕනෙ... **(සම්මා සම්බුද්ධෝ භගවා,)** භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුද්ධ බව, **(ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ,)** භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ මනාකොට මේ ධර්මය වදාළ බව, **(සුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ...)** භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක පිරිස මනා ප්‍රතිපත්තියෙන් යුක්තයි කියල.

## බුද්ධිමත් නම් මොකද කරන්නේ...

උන්වහන්සේ ඒක විස්තර කරනව මේ විදිහට. හස්තියෙක්

දැකගන්නට කැමති කෙනෙක් ඇත් පියවර දුටු පමණින් සෑහීමකට පත්වෙන්නෙ නෑ වගේ, සම්මා සම්බුදු රජාණන් වහන්සේ කෙනෙකුගේ ධර්මය පැහැදිලිව වටහා ගන්නට පුළුවන් ආකාරයේ ප්‍රකාශන මාධ්‍යයකින් යුතුව, **(සාත්ථං සබ්‍යංජනං)** පරිපූර්ණ පාරිශුද්ධ උත්තම ජීවිතය මනුෂ්‍යයෙකුට අත් දකින ආකාරය, අත්දැකීමක් හැටියට ප්‍රත්‍යක්ෂ කරගන්නා විදිහ විස්තර කරනව. බුද්ධිමත් මනුෂ්‍යයා මොකද කරන්නේ? මේ ධර්මය අහනව, අහල ඒ තුළින් තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව පිහිටුවා ගන්නවා. **(සෝ තං ධම්මං සුත්වා තථාගතේන සද්ධං පටිලභති)** පින්වතුනි, මේ ශ්‍රද්ධාව නිකම් ම නිකන් ශ්‍රද්ධාවක් නොවේ. දැන් අප ශ්‍රද්ධාව කියන වචනෙ පාවිච්චි කරන්නෙ, භක්තිමත්ව වැඳුම් පිදුම් කිරීමකටයි. ප්‍රඥාවන්ත වැඩපිළිවෙලකට ශ්‍රද්ධාව අර්ථවත් කරගෙන නැහැ.

## දුටු දුටු තැන පහදිනව නම්,

පින්වතුනි, ශ්‍රද්ධා දෙකක් තියෙනව. පළවෙනි එක **අමූලිකා ශ්‍රද්ධාව**. අනෙක **ආකාරවතී ශ්‍රද්ධාව**. අමූලිකා ශ්‍රද්ධාව කියන්නේ මුලක් නැති ශ්‍රද්ධාව. සමහර විට රූපෙ දිහා බලල, හඬ දිහා බලල, පැහැදෙනව මිසක්, නිවැරදි තේරුම් ගැනීමකින් පැහැදිලා නොවෙයි. ඒ මුලක් නැති ශ්‍රද්ධාව ඇති කෙනා පාවෙන චරිතයක්. දුටු දුටු කෙනාට, ඇසූ ඇසූ කෙනා කෙරෙහි, ශ්‍රද්ධාව ඇති කරගන්නව. ආධ්‍යාත්ම නායකත්වයක් තෝරා ගන්නට ශක්තිය නෑ. ආකාරවතී ශ්‍රද්ධාව කියල කියන්නෙ, ඒ බුදුරජාණන් වහන්සේගේ ධර්මය මනාලෙස ශ්‍රවණය කරල, ජීවිතය පිළිබඳ පරිපූර්ණ වූ විසඳුම, පූර්ණ සැනසුමක් අත්විඳීමට හැකිබව. ඒ අත්දැකීමේදී බුදුරජාණන් වහන්සේගේ ආධ්‍යාත්ම නායකත්වය ධර්මය තුළින් ලැබිය හැකි බවට ඇතිවුන ශ්‍රද්ධාවයි.

## නියම ධර්මය නම්...

පින්වතුනි, මේ ශ්‍රද්ධාව අප විසින් පිහිටුවාගත යුතු ම ශ්‍රද්ධාවක්. වර්තමානයේ බොහෝ දෙනෙකු තමන්ගේ පුද්ගලික මත වල සිටිමින් තමන්ගේ අදහස් අනුව, තමන්ගේ පුද්ගලික පිළිගැනීම ග්‍රහණය කරගෙන තමයි බුදුරජාණන් වහන්සේගේ ධර්මය විස්තර කරන්න හදන්නෙ. ඒකෙන් උන්වහන්සේගේ ධර්මය තේරුම් ගන්නට තියෙන අවස්ථාව මනුෂ්‍යයාට අහිමි වෙලා යනව. පැහැදිලිව ම ධර්මය වනාහී බුදුරජාණන් වහන්සේගේ ධර්මය විය යුතුයි. වෙන ධර්මයක් නො විය

යුතුයි. බුදුරජාණන් වහන්සේගේ ධර්මය හොයන්නෙ කොහොමද? උන්වහන්සේගේ ධර්මය පිළිබඳ ඓතිහාසික සාක්ෂි ඇතව තමයි ඒවා විස්තර වෙලා තියෙන්නෙ. ඒ ධර්මය විස්තර වෙලා තියෙන්නෙ. ඒ ධර්මය මනාකොට අධ්‍යයනය කරල, එය මනාකොට නුවණින් ගලපා ගත්තු කෙනෙකුට තේරෙනව, මේ ධර්මය අයිති භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට කියල.

## ඔහේ හිත හිතා හිටියොත්....

පින්වතුනි, සාමාන්‍යයෙන් පොදුවේ මතයක් තියෙනව, ඔහේ හිතාගෙන හිතාගෙන ගිය වෙලාවට මේ ධර්මය ඉබේ මතුවෙනව කියල. කිසිදවසක ඉබේ මතුවෙන්නෙ නෑ. එහෙම මතුවෙනව නම් ධර්මය, අප බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකත්වයට පත්වෙන්න ඕනෙ නෑ නේද? ඉබේ හිතල පුළුවන් වෙන්න ඕනෙ. එහෙම වෙන්නෙ නෑ. සැරියුත් මුගලන් දෙනම ධර්මය හොයාගෙන ඇවිද්ද. බුද්ධ වචනය කණට වැටෙන තුරු ම ධර්මය අවබෝධ කළේ නෑ. අන්න ඒ නිසා පින්වතුනි, හැම තිස්සෙම අප ඉන්නට ඕනෙ ශ්‍රාවකයො කියන මට්ටමේ. එහෙම නැතුව අපි බුදුරජාණන් වහන්සේවත් අපේ මට්ටමේ දාල මනින්න හැදුවොත් විශාල වරදක් අපේ ජීවිතයට අපි ම කර ගන්නව.

ඒ වගේ ම තමයි, එලෙස නො මඟ ගිහින් ධර්මය දෙසන්නට පටන් ගත්තොත් විශාල අනර්ථයක් ලෝකයාට සිද්ධ වෙන්නෙ. බුදුරජාණන් වහන්සේගේ ධර්මය අවබෝධ කළ හැකි එකක්. ඒ නිසා මේ ධර්මයේදී ගිහි පිරිසට නිවන ගැන හොඳ නැහැ. ගිහි පිරිසට ඒ අනිත්‍ය ධර්මය අයිති නෑ කියන මතයක් අපෙන් ප්‍රකාශ වුනොත්, අප සිටින්නේ බුදුරජාණන් වහන්සේගේ පැත්තෙ නොවෙයි. අප ඉන්නෙ අන්‍ය තීර්ථයකයන්ගෙ පැත්තෙ.

බුදුරජාණන් වහන්සේ මේ ලෝකෙ අනිත්‍යය යි කියල කරපු ප්‍රකාශය සත්‍යයක්. ඒක මේ ලෝකෙ කාටවත් අසත්‍යයක් කරන්න බැහැ. ගිහි හෝ වේවා, පැවිදි හෝ වේවා මේ ලෝකෙ දුක් සහිත බවක් තියෙනවා කියල, දුක හැටියට උන්වහන්සේ වර්ග කරල පෙන්නුව දේ, මේ ලෝකෙ කාටවත් සැපයි කියල කියන්න බැහැ. උන්වහන්සේ පෙන්නල දුන්න, ස්ථිර පදාර්ථයක් මේ කිසිම ක්‍රියාකාරීත්වයක නැති බව, අනාත්මයි. ඉතින් මේවා ගිහි ජීවිතය තුළ කල්පනා කරන්න හොඳ නැද්ද?

## ජීවිතයට ශක්තිය ලැබෙන්න නම්...

අනිත්‍යය යි කියන අනිත්‍යය ධර්මය අප බැහැර කරනව නම්, කිසි දවසක මේ ප්‍රශ්න ඉදිරියේ කම්පා නොවී සිටින්න ශක්තිය ලැබෙන්නෙ නැහැ. මේ අනිත්‍ය ධර්මය අනිත්‍යය හැටියට අවබෝධ කරගන්නට පුළුවන් උනොත් අප යථාර්ථය කරා යනව විතරක් නෙවෙයි, මේ පෘතග්ජනභාවය ඉක්මවා ගිහින් ආර්ය ශ්‍රාවකයෙකු බවට පත්වෙනව. මේ සඳහා බුදුරජාණන් වහන්සේ වදාළ සමථ විදර්ශනා භාවනා සියළු දේ අප කළ යුතුයි. ඒවා ගිහි ගෙදරත් කරන්න පුළුවන්. පැවිදි භාවයට පත්වෙන්නෙ වඩා පහසුවෙන් ඉක්මණින් කර ගැනීම පිණිසයි. බුදුරජාණන් වහන්සේගේ කාලෙ මාර්ගඵල ලාභීන් හිටියෙ පැවිදි සමාජයේ විතරක් නොවෙයි. ගිහි සමාජයෙත් මාර්ගඵල ලාභීන් බිහි වෙන්න, පැවිදි සමාජය තුළින් සත්‍ය වූ ධර්මය අහන්න ලැබෙන්න ඕනෙ. එහෙම නැතිව කෘතිම විදිහට අධිෂ්ඨාන කර සත්‍යය ලබා ගන්න බැහැ. සත්‍යය වනාහී ක්‍රමික වැඩපිළිවෙලක් තුලින් අත්දැකිය යුතු දෙයක්.

මෙන්න මෙතැනට මනුෂ්‍යයෙක් ආව ම, බුදුරජාණන් වහන්සේ පෙන්වන ලද ශ්‍රද්ධාව පිහිටුවාගෙන ඉතා ඉක්මනින් මෝක්ෂය කරා යන්නට හිතපු කෙනා පැවිදි භාවයට පත්වෙනව. ඒ පැවිදි ශ්‍රාවක භාවයට පත්වීම එයාගෙ ජීවිතයට සුවිශේෂ දෙයක්. කොහොමද පැවිදි ශ්‍රාවකයෙක් බවට පත්වෙන්නෙ? හිස රැවුල් බාලා, කුඩා වූත් මහත් වූත් සම්පත් අතහැරල, කුඩා වූත් මහත් වූත් ඥාති පිරිස අත්හැරල දාල තමයි මේ උතුම් ජීවිතයට පත්වෙන්නෙ.

## සිල්වත් වෙමු අපි මේ විදිහට...

ඊට පස්සේ පැවිද්දෙක් තුළ තියෙන මූලික ලක්ෂණ උන්වහන්සේ පෙන්වා දෙනව. හික්මෙන්න ඕන ක්‍රම, ශික්ෂා පද. ප්‍රාණඝාතයෙන් වැලකෙනව. සියලු සතුන් කෙරෙහි හිතානුකම්පී වෙනව. සොර සිතින් බැහැර වෙලා, පාරිශුද්ධ සිතින් වාසය කරනව, බ්‍රහ්මචාරී වෙනව. බොරු කීමෙන් වලකිනව. ආරවුල් ඇතිවෙන, මතුවෙන කතා බස් වලින් වලකිනව. කේලාම් කීමෙන් වැලකිල සමගිය පිණිස කතා බස් කරන කෙනෙක් බවට පත්වෙනව. හිස් වචන කීමෙන් වැලකිනව. මේ වගේ බොහොම ධාර්මික සංතෝෂයක් ඇති ජීවිතයක් ගෙවනව. ඒ වගේ ම බොහොම සරළ ජීවිතයකට පුරුදු වෙනව. කය වසා ගැනීමට ප්‍රමාණවත් සිවුරකින්, කුස ගිනි නිවාගැනීමට ප්‍රමාණවත් ආහාරයකින්

සෑහීමකට පත්වෙනව. කුරුල්ලෙක් පියාසලද්දී අත්තටු පමණක් රැගෙන යන්නා සේ, භික්ෂුවක් පාත්‍රා සිවුරු පමණක් රැගෙන යනව. මෙහෙම උතුම් ජීවිතයකට අදාළ සිල්වත් බවෙන් යුතු කෙනා ඇස සංවර කරගන්නව. කණ සංවර කරගන්නව. නාසය, දිව, කය, සිත සංවර කරගන්නව.

## ඉඳුරන් රැකගෙන ගෙවන ජීවිතය....

ඉන්ද්‍රියන් සංවර කරගෙන සිටිද්දී, යම් පාපී ලාමක අකුසල ධර්මයක් හටගන්නව ද, එය වැලැක්වීම පිණිස, ඇහෙන් රූපයක් දැක්කම, කණෙන් ශබ්දයක් ඇහුවම, නාසයෙන් ගඳ සුවඳ දැනුනම, දිවෙන් රස වින්දම, කයෙන් පහසක් ලැබුවම, සිතෙන් සිතුවම අර වගේ නිමිති සටහන් ගන්නෙ නැතිව, බුද්ධිමත් ව ඒවායේ අභ්‍යන්තරික ක්‍රියාකාරීත්වය ගැන මනා කල්පනාවකින් වාසය කරනව.

ඊළඟට යාම් ඊම්, අත් පා දිග හැරීම්, හැකිලීම්, සිවුරු පාත්‍රා පරිහරණය කිරීම්, ආහාර පාන අනුභවය, වැසිකිළි කිස කිරීම පවා මේ හැම දෙයක් ම අවබෝධයෙන් යුතුව කරන්නට පුරුදු වෙනව. දැන් මෙයාට කරුණු තුනක් තියෙනව. **සිල්වත් බව, ඉන්ද්‍රිය සංවරය, සති සම්පජඤ්ඤය.**

## කටු අකුල් ශුද්ධ කරමින්....

දැන් මේ පැවිදි ශ්‍රාවකයන් වහන්සේ විවේක ස්ථාන ඇසුරු කරමින්, අභ්‍යන්තරික ජීවිතය සිතෙන් විමසමින් බලනව. සිහිනුවණ දුර්වල කරන, සිතේ ශාන්තියට බාධා පමුණුවන, සිත කිලිටි කරන දේවල් හිතේ තියෙනව. ඒව තමයි **නීවරණ** කියන්නේ. නීවරණ පහක් තියෙනව. **කාමච්ඡන්ද** (රූප, ශබ්ද, ගන්ධ, රස, පහස කෙරෙහි සිත ඇදී යාම), **ව්‍යාපාද** (ද්වේෂය කෙරෙහි සිත ඇදී යාම), **ථිනමිද්ධ** (නිදිමත, අලස බව), **උද්ධච්ච කුක්කුච්ච** (හිතේ විසිරීම - පසුතැවීම), **විචිකිච්ඡා** (කරන කාර්යය පිළිබඳව සැක සහිත බව, පැහැදිලි ස්ථාවරයකට පත් නො වීම.). මෙන්න මේවා සාමාන්‍ය හිතක පොදු ලක්ෂණ. බුදුරජාණන් වහන්සේ කියනව මේ ලක්ෂණ ටික පාලනය කරන්න.

## තථාගත සිරිපා සටහන

ඉතින් මේ පැවිදි ශ්‍රාවකයා විවේක තැනකට ගිහිල්ලා මේ ලක්ෂණ පාලනය කරනව. පාලනය කරන්නෙ සතිපට්ඨානය තුළ සිත

රැඳවීමෙන්. මෙය දියුණු කිරීමෙන් සමාධියක් දියුණු කරල, ඔන්න ඔහු ප්‍රථම ධ්‍යානය ලබාගන්නව. සමාධිය තුල ම සිත පවත්වන්නට පුළුවන් හැකියාව ධ්‍යානය යි. ඒක ඇතිකර ගන්න පුළුවන් එකක්. ඒ ධ්‍යානය තවදුරටත් ගැඹුරෙන් දියුණු කරන්න පුළුවන්. ඇතා ගැන තොරතුරු හොයන්න වනයට ගිය කෙනෙක්, ඇතෙකුගේ පියවර සටහන් දිහා බලල, වාමනිකා, කනේරුකා මේ නොයෙක් නම් වලින් ඇතින්නියො ඉන්නව කියල තේරුම් අරගෙන ඒකාන්ත නිශ්චයකට එන්නෙ නෑ. අන්න ඒ වගේ එක්තරා අදහසකට පැමිණෙනවා, තථාගතයන් වහන්සේගේ පියවර සටහනයි මේ ප්‍රථම ධ්‍යානය කියන්නෙ. එනමුත් එපමණකින් ම පරිපූර්ණ නිශ්චයකට පැමිණෙන්නෙ නෑ. බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුද්ධයි, මේ ධර්මය මනාකොට දේශනා කරන ලද්දක්. ඒ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෝ සුපටිපන්නයි කියල පරිපූර්ණ නිශ්චයකට පත්වෙන්නෙ නෑ.

තවදුරටත් එයා භාවනා කරමින් දෙවෙනි ධ්‍යානය උපදවා ගෙන වාසය කරද්දී තේරුම් ගන්නව.... මේ වනාහී තථාගතයන් වහන්සේගේ පියවර සටහන. ඊළඟට තවදුරටත් දියුණු කිරීමෙන් ඔහු තුන්වෙනි ධ්‍යානයටත් එනව. ඔහු කල්පනා කරනව මේක තමයි තථාගතයන් වහන්සේගේ පියවර සටහන. හතරවෙනි ධ්‍යානයටත් එයා සිත දියුණු කරනව. කල්පනා කරනව මේ තමා තථාගතයන් වහන්සේලාගේ පියවර සටහන.

## තථාගතයන් වහන්සේ පිට ඉලූ තැන.

බලන්න පින්වතුනි, බුදුරජාණන් වහන්සේ පාවිච්චි කරන ලස්සන වචන. තථාගත පාද, තථාගතයින් වහන්සේලාගේ පියවර සටහන, තථාගතයන් වහන්සේලා පිට ඉලුව තැන්, තථාගතයන් වහන්සේලා නැමැති මහා හස්ථීන් පිට ඉලූ, අතු බින්ද තැන් මොනවද? ප්‍රථම ධ්‍යානය, ද්විතීය ධ්‍යානය, තුන්වෙනි ධ්‍යානය, හතරවෙනි ධ්‍යානය. ගිහි ජීවිත ගතකරන අයට ධ්‍යාන ඇතිකර ගන්න බැහැ කියල සමහරු කියනව. ඒක අසත්‍යයක්. ගිහි ජීවිත ගත කරන ධ්‍යාන ලබාගත් අය ඕන තරම් ඉන්නවා. ඒක නො කරන ලද තැනැත්තා කියන දෙයක් මිස එය ප්‍රත්‍යක්ෂ කරපු කෙනා කියන දෙයක් නොවෙයි.

## පෙර ජීවිත දකින්නේ මෙහෙමයි...

ඊළඟට පින්වතුනි, හතරවෙනි ධ්‍යානයෙ ඉඳලා ඔහු මොකද කරන්නේ? **(සෝ ඒවං සමාහිතේ චිත්තේ)** සිත සමාහිත වුනා ම,

**(පරිශුද්ධේ පරියෝදාතේ)** පාරිශුද්ධ වුනා ම, බබලන කොට, **(අනංගනී)** පංච නීවරණයන් බැහැර වුනා ම, **(විගතෝපක්ලේසී)** උපක්ලේශයන් දුරු වුනා ම, **(මෘදුභූතේ)** මෘදු භාවයට පත්වෙලා **(කමනීය ඨිතේ)** සිත වැඩට සුදුසු ඉතා කාර්යක්ෂමක බවට පත් වුනා ම, **(ආනෙඤ්ජප්පත්තෝ)** බාහිර දේකින් මේ සිත කම්පනයට පත් කරන්න බැරි ප්‍රබල සමාහිත බවකට සිත දියුණු කළා ම අන්න ඒ තැනැත්තාට පුළුවන් කියනව, **(පුබ්බේනිවාසානුස්සති ඤාණා චිත්තං අභින්නනාමේති)** හිත මනාකොට යොමු කරනවනව, අවබෝධ කරගන්නට තේරුම් ගන්නට, තමන්ගේ පූර්ව ජාතීන් පිළිබඳ විස්තර.

## විද්‍යාවෙත් පෙර ජීවිත....

දැන් අපේ රටට පුරුදු වෙලා තියෙන්නෙ මේ ක්‍රමය නොවෙයි. බටහිරින් ආ ක්‍රමය. ඔය කවුරු හරි හාන්සි කරවල මෝහනය කරනව. ඊට පස්සෙ එයාගෙන් මොනව හරි ප්‍රශ්න කර කර අහල, මෙන්න පූර්ව ජන්මය විස්තර කළා කියනව. මේ වගේ පුංචි දේවල්, ඒ කියන්නෙ ප්‍රායෝගික වශයෙන් ආධ්‍යාත්මික වශයෙන් ශක්තිමත් නො වුනු බොහොම ලාමක පැති ඔස්සේ තමයි අද මේ රට යන්නේ. මේක හරි නිගමනයකට පත්වෙන්න බැරි දෙයක් හරියන්නත් පුලුවන්. වරදින්නත් පුළුවන්. මොකද හේතුව? මෝහනය වෙන කෙනාගෙ සිත මෝහනය කරවන කෙනාගෙ සිතට යටවෙලා තියෙන්නේ. ඒ නිසා මෝහනය වුන කෙනා ස්වාධීන තීරණ ගන්නව කියල අපට කියන්න බෑ. නමුත් මේ හතරවෙනි ධ්‍යානය දක්වා සිත දියුණු කළ කෙනෙක් තමන්ගේ ජීවන ප්‍රවෘත්තිය ගැන ආපස්සට සිත යොදා බැලීම, තනිකරම තමන්ගේ ස්වාධීන සමාධි බලයක්. නිකන් සමාධි බලයක් නොවෙයි, හෙණ හඬ පිපිරුණත් ඒ වෙලාවට ඒ සිත හෙණ හඬ ග්‍රහණය කරන්නෙ නෑ. එච්චරට ම අකම්පිත සිතක් දියුණු කරගන්නව. ඒ කිසිම දෙයක් නැතිව ඔය මෝහන පස්සෙ යන්නෙ. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය පැත්තට අප යන්න ඕනෙ.

මෙහිදී පෙන්නනව පෙර විසූ ආකාරය හොඳින් එයා තේරුම් ගන්නව. ඤාති ගේකට ගිහිල්ලා පිරිසක් එක්ක හිනාවෙලා කතා කරල කාල, බීල ගත කරල ඇවිල්ලා යළිත් ඒ ගැන සිහිකරනවා වගේ පෙර ජන්මය සිහි කරන්නට පුළුවන්, පුබ්බේ නිවාසානුස්සති ඤාණය ලබාගත්තම. එයා එපමණකින් ම තේරුම් ගන්නව, මේ නම් තථාගතයන් වහන්සේලාගේ පියවර සටහන කියල.

## ගන්ධබ්බ කථා

ඊළඟට එයා නැවත සිත හරවනව. අනිත් සියළු සත්වයන්ගේ ජීවිත කොහොමද? එවිට පෙනෙනව, සිත කය වචනය යන තුන් දොරින් පව් කරල, සත්වයන් චුත වෙලා නරක තැන් වල උපදින ආකාරය. මේ විදිහට චුති උප්පත්ති කියන දෙක මෙයා පැහැදිලිව තේරුම් ගන්නව. දැන් පින්වතුනි, මේ විදිහට චුති-උප්පත්ති දෙක පිළිබඳව හතර වෙනි ධ්‍යානයක් කරා සිත දියුණු කරල පැහැදිලිව ප්‍රත්‍යක්ෂ කරගත යුතු දෙයක් තිබියදී, මේ පින්තූර දිහා, බෝඩ් ලෑලි දිහා බලල, කතන්දර ඔස්සේ ගන්ධබ්බයො ගැන කතාකරන මට්ටමකට ආව කියන්නෙ අපි කොච්චර ලාමක අදහස් තුළ හිරවෙලා ද? බටහිර ජාතීන්ට තිබුනෙ නෑ බුදුරජාණන් වහන්සේගේ ධර්මය. මෑත කාලෙත් විශාල පිරිසකට නෑ. ඒ පිරිස තේරෙන මට්ටමෙනුයි ගවේෂණය කළේ. ඒ ප්‍රේතයින්ගෙ ෆොටෝ ගන්න ඒවා, මේ බෝඩ් කෑලි හොයාගෙන බෞද්ධයෝ යන්නේ මොකද? මේ ධර්මයෙ ගාම්භීරත්වය බැහැර වෙලා. එය හඳුනන්නෙ නෑ. බුදුරජාණන් වහන්සේ පෙන්නනව, ඒ චතුර්ථ ධ්‍යාන මට්ටමට හිත දියුණු කරල, මේ ලෝක සත්වයන්ගේ චුති-උප්පත්ති පිළිබඳ දැකීම - **චුතූපපාත ඥාණය** තුළින් දකිනව භව ගමන ඇතිවෙන ආකාරය. අන්න එතනදි එයා තේරුම් ගන්නව මේක තථාගතයන් වහන්සේලාගේ පියවර සටහන.

## පටිච්ච සමුප්පාදය අවබෝධ කළොත්...

ඉන්පස්සේ මේ භව ගමනට හේතුව විමසද්දී තේරුම් යනවා මෙය හේතුඵල දහමක් කියල. එතැනදි තමයි පටිච්ච සමුප්පාදය කෙරෙහි සිත යොමු කරන්නෙ. පටිච්ච සමුප්පාදය කියන වචනෙ තේරුම දුක පිණිස මේ පැවැත්ම සකස් වෙන බවයි. බුදුරජාණන් වහන්සේ පටිච්ච සමුප්පාදයෙ අන්තිමට සඳහන් කරන්නේ **(ඒව මේ තස්ස කේවලස්ස දුක්ඛක්ඛන්දස්ස සමුදයෝ හෝති)** ඔන්න ඔය ආකාරයටයි දුක හටගන්නෙ කියල. එහෙනම් දුක හට ගන්න ආකාරය යි පටිච්ච සමුප්පාදයෙන් විස්තර වෙන්නෙ. මේ බව ඒ ශ්‍රාවකයා තේරුම් ගන්නව. එහෙනම්, දුක, දුකට හේතුව, දුක නිරුද්ධ කිරීම, නිරුද්ධ කිරීමේ මාර්ගය කියන චතුරාර්ය සත්‍යය තේරුම් ගත්ත දවසට එයා ස්ථිර තීරණයකට එනව, නිශ්චයකට පත්වෙනව භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුද්ධයි කියල. ශ්‍රී සද්ධර්මය මනාකොට දේශනා කළ එකක් කියල. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක පිරිස සුපටිපන්නයි, මනා ප්‍රතිපත්තියේ යෙදෙන පිරිසක් ය කියල.

පින්වතුනි, එතනින් නවතින්නෙ නෑ. එයා තවත් ගැඹුරින් නුවණින් විමසනවා, විමසද්දි මේ හේතු ඵල දහම තුළ දුක සකස් කරල, ඒ දුක යළි යළි හැදෙන හැටි හඳුනාගන්නව. කොහොමද හඳුනාගන්නෙ? රූප, ශබ්ද, ගන්ධ, රස, පහස ට සිත ඇදී යන යළි යළි එය සකස් කරල දෙන දේ දකිනව. ඒක තමයි **කාමාශ්‍රව**. මේ භව පැවැත්ම යළි යළි සකස් කරල දෙන හැටි දකිනව. ඒක තමයි **භවාශ්‍රව**. ඒ වගේ ම මේ නො වැටහීම යළි යළි සකස් කරල දෙන මානසිකත්වය දකිනව. ඒක තමයි **අවිජ්ජාශ්‍රව**. මේ කාමාශ්‍රව, භවාශ්‍රව, අවිජ්ජාශ්‍රව කියන මේ ආශ්‍රවයන් දැකල තමයි, මේවා භව පැවැත්මට හේතුවෙන නිසා ප්‍රහාණය කරන්නෙ. අන්න ඊට පස්සේ නිකෙලෙස් බවට පත්වෙලා අමා මහ නිවන සාක්ෂාත් කරනව.

## මෙන්න නියම විනිශ්චය....

අන්න ඒ තත්වයට හිත දියුණු කරපු කෙනා නිශ්චය වශයෙන් ම පරිපූර්ණ වූ නිගමනයකට පැමිණෙනව, **(සම්මා සම්බුද්ධෝ භගවා)** භාග්‍යවත් සම්බුදු රජාණන් වහන්සේ සම්මා සම්බුද්ධයි. **(සම්මා සම්බුද්ධෝ භගවා)** ඒ ධර්මය මනාකොට දේශනා කළා **(ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ)** කියල. ඒ ශ්‍රාවක පිරිස සුපටිපන්නයි **(සුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ)** කියල. මහ ඇති දකින්නට වනයට ගිය පුද්ගලයා ඇත් පියවර සටහන අනුව, පිට ඉලූ දළ ගැසූ ස්ථාන අනුව, මේ නම් මහා හස්ථි රජයාගේ ම පියවර සටහන ම යයි නිශ්චයකට පැමිණෙන්නා සේම මේ තත්වයට පත්වුණු පුද්ගලයා භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ කෙරෙහි, උන්වහන්සේගේ ධර්මය කෙරෙහි, උන්වහන්සේගේ ශ්‍රාවක පිරිස කෙරෙහි මනා වැටහීමකට ස්ථිර විනිශ්චයකට පැමිණෙනවා කියල වදාළා.

## බුදු සමිඳුන් පෙන්වා වදාළ සදාකාලික සුවය සොයා යමු

මෙන්න මේ දේශනය අපේ රජතුමාට, දේවානම්පිය තිස්ස නිරිඳුන්ට දේශනා කරපු වෙලාවෙ, එතුමා මුළු හදවතින් ම තෙරුවන් සරණ ගියා. පින්වතුනි, එහෙනම් අපටත් තියෙන්නෙ මේ ධර්මය දිහා නුවණින් බලන්න. මේ ලෝකෙ මොන ශාස්තෘවරයක් ද, මේ ආකාරයට තමාට විමුක්තියක් ප්‍රත්‍යක්ෂ කරගන්න හැටි පෙන්නල දීල තියෙන්නෙ. නුවණින් මැදහත්ව විමසල බලන්න පින්වතුනි, එහෙම බලන කොට ශ්‍රද්ධාව ඇතිවෙනව. ඒක ආකාරවතී ශ්‍රද්ධාව. නිකම් ම නිකම් හිතේ ඇතිවෙන ඉල්පෙන ශ්‍රද්ධාවක් නො වෙයි. අන්න ඒ ශ්‍රද්ධාව තුළ තමයි

එයා තේරුම් ගන්නෙ, මේ ජීවිතය සුරක්ෂිත බවක් කරා ගේන්නට නම්, වෙන සරණක් නොයා ඒකාන්තයෙන් ම බුදුරජාණන් වහන්සේ සරණ යා යුතුයි, ඒ ධර්මය සරණ යා යුතුයි, ඒ ශ්‍රාවකත්වය සරණ යා යුතුයි කියල. අන්න ඒ කාරණය තමයි මිහිඳු මහ රහතන් වහන්සේ පොසොන් පුන් පොහොය වගේ දවසක මේ සිරිලක් ධරණීතලයෙ හා හා පුරා කියල ස්ථාපිත කළේ. අද මේ රටේ බෞද්ධ ජනතාවගෙන් බැහැර වෙමින් පවතින්නෙත් ඒ තෙරුවන ම යි. පින්වතුනි, මතක තියාගන්න. ඒ තෙරුවන තුළ සිටිනකම් ම අපට කිසිම දවසක හානියක් නො වෙන බව.

අප මේ ධර්ම ශ්‍රවණයෙන් රැස්කරගත් පින් මේ සෑම සියළු දෙනාට ම තෙරුවන් සරණේ ආශිර්වාදය පිණිස, අපට ද ඒ ධර්මය අවබෝධ කර ගනිමින් නිසැක භාවයට පත් වීම පිණිස, ඒ තථාගතයන් වහන්සේලාගේ පියවර සටහන් දැක ගැනීම පිණිස ම හේතු වාසනා වේවා!

*සාදු! සාදු!! සාදු!!!*